# පියවරේ මල්දම

ජෝ. ඩී. පී. වික්‍රමසිංහ

R
1.481
Y

ශ්‍රී වජිරාරාම පුස්තකාලය
27 OCT 2010
බම්බලපිටිය

0001856

# සිය බස් මල් දම

# SIYABAS MALDAMA

හැඳින්වීම, පෙළ, අන්වය, අර්ථය, විස්තර, හා
සිංහල ඉංග්‍රීසි ගැටපද විවරණයෙන් ද යුතු ය.

සංස්කාරක

කේ. ඩී. පී. වික්‍රමසිංහ
( බී. ඒ. ගෞ. )

| | |
|---|---|
| Acc. No. | 0001856 |
| Class. No. | 891.481 SIY |

සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

1953

## ඇතුළු පිටු

හැඳින්වීම 1

පෙළ 17

අන්වය, අර්ථය හා විස්තර 49

සිංහල-ඉංග්‍රිසි ගැට පදය 155

**කේ. ඩී. පී. වික්‍රමසිංහයන්ගේ**

**අනෙක් පොත්**

සාවියාගේ විවාහය

ජ්‍යෙෂ්ඨ සාහිත්‍යය

සේනානායක චරිතය

ධනවතා

ප්‍රේමයේ ශෝකය

ඉංග්‍රිසි පරිවර්තනය සහිත හංස සන්දේශය

ඉංග්‍රිසි පරිවර්තනය සහිත අමාවතුර ( පරි. 9–14 )

සිංහල ඉංග්‍රිසි ගැටපදය සහිත එළු අත්තනගලු වංසය

**සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම**

**කොළඹ 11.**

# හැඳින්වීම

කිරම ධම්මානන්ද හිමියන්ගේ කෘතියක් වූ සිය බස් මල් දම, සිංහල සාහිත්‍යයෙහි අඳුරු යුගයකට පසු යන්තමින් ශාස්ත්‍රාලෝකය බැබැළෙන්නට වූ මාතර යුගයට අයත් කාව්‍යයකි. විජයාවතරණයෙන් හා මහින්දාගමනයෙන් පසු මෙ රට වැසියන් අතර සිංහල ය යි භාෂාවක් හැඩ ගැසී මඳ කලෙකින් ම එය ඉතා උසස් තත්ත්වයකට පැමිණි අයුරු වෙස්සගිරි, තෝනිගල හා රිටිගල ආදි සෙල් ලිපි වලින් පටන් ගෙන, අනුරාධපුර යුගයෙහි බිහි ව ඉතිරි ව ඇති සිය බස් ලකර හා ධම් පියා අටුවා ගැට පදයෙනුත්, පොලොන්නරු යුගයෙහි නිපැදවුණු ජාතක අටුවා ගැට පදය, අමාවතුර, ධර්ම ප්‍රදීපිකාව, බුත් සරණ, සසද වත හා මුව දෙව්දා වත ආදි පද්‍ය ගද්‍ය ග්‍රන්ථයන්ගෙනුත් මනා ව පැහැදිලි වේ. අනතුරු ව දඹදෙනි හා ගම්පොළ යුගයන්හිදී රචිත කුසදා කව් සිළුමිණ, සද්ධර්ම රත්නාවලිය, මයුර සන්දේශය, හා තිසර සන්දේශයනුත්, ජයවර්ධන පුර කෝට්ටේ යුගයේ බිහි වුණු කාව්‍ය ශේඛරය, ගුත්තිලය, සැළලිහිණි, ගිරා, හංස, කෝකිල ආදි සන්දේශයනුත් සිංහල සාහිත්‍යයේ ප්‍රෞඪත්වයට මෙන් ම ශ්‍රේෂ්ඨත්වයට ද දෙස් දෙන බව නො කිව මනා ය.

කෝට්ටේ යුගයෙන් පසු ව සිංහල රාජ්‍යයේ මෙන් ම සිංහල සාහිත්‍යයේ ද අදීනත්වයත්, ශ්‍රේෂ්ඨත්වයත් පිරිහී ගියේ ය. ආත්මාර්ථයෙන් මඩනා ලද රජ දරුවන් ඔවුනොවුන් අතර කල කෝලාහල කර ගැනීමත්, රටේ සාරය පිරිහී ගිය අතර, අළුත් සංවර්ධන ව්‍යාපාරයන් කිසිවක් නැතිවීමත් ආදි කරුණු නිසා මහත් දුක්ඛිත තත්ත්වයකට රට පා තබා සිටි අවදියකදී හෙවත් දහසය වන සිය වස මුලදී ම යුරෝපයෙන් පෘතුගීසින් මෙහි පැමිණ, මෙහි තත්ත්වයෙන් ප්‍රයෝජන ගෙන ලංකාවේ මුහුදු බඩ පෙදෙස් සතු කර ගැනීමත් සමග ම සිංහලයාගේ විහල් යුගය ඇරඹිණි. භාෂා සාහිත්‍යයත්, කලා ශිල්පත් පහතට ම ඇද වැටිණි.

කෝට්ටේ රාජ්‍ය කාලයෙන් පසු ව මඳ වුව ද ශාස්ත්‍රාලෝකයක් ඇති වූයේ සීතාවක රාජ්‍ය කාලයෙහිදී ය. ධර්මධ්වජ පඬිතුමන්ගෙන් හා එතුමන්ගේ පුත් අලගියවන්න කවියාගෙන් සිදු වූ ශාස්ත්‍රීය සේවය නිසා මේ රටේ සාහිත්‍ය කලාවන් පිළිබඳ ඇති වූ ප්‍රබෝධය පවා, සීතාවක රජ පැමිණි පළමු වෙනි රාජසිංහ රජු විසින් බුදු සමය හැර, ශිව සමය වැළඳ ගෙන, ඇති තාක් පොත් පත් සොයා ගිනි බත් කිරීම නිසා නැති වී, රට අවිදු අඳුරෙහිත් අ වාසනාවෙහිත් ගිලී ගියේ ය.

සිංහල රාජ්‍යයෙහි අවසාන කාල පරිච්ඡේදය වූ මහ නුවර සමයෙහි යළිත් මදක් දුරට සාහිත්‍ය කාරණය ඇති විය. මහ නුවර සමයෙහි අවසාන භාගයේ හෙවත් ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ නර දේවයාගේ රාජ්‍ය කාලයෙහි ඇරඹුණු මේ සාහිත්‍ය නිෂ්පාදනය එ තරම් උසස් පක්ෂයක නො වූවත්, එයින් ශාස්ත්‍රාලෝකය පිළිබඳ නව යුගයක් උදා විය. ගන අඳුර තුළින් ආලෝකයක් උදා කරවමින් මේ නව යුගය ගොඩ නැංවූ ජාති හිතෛෂියා වැලිවිට සරණංකර සංඝ රාජ මා හිමියාණෝ ය.

1698 දී ජනිත වූ වැලිවිට සරණංකර හිමියෝ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ, ශ්‍රී විජය රාජසිංහ හා කීර්ති ශ්‍රී රාජසිංහ යන රජවරුන් ති දෙනගේ රාජ්‍ය කාලයන්හි (1707—1780) බෞද්ධ ශාසනයත් සිංහල භාෂාව හා සාහිත්‍යයත් නඟා සිටුවීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළහ. සරණංකර හිමියන් පැවිදි බිමට පිළිපන්නේ මෙ රට උප සපන් භික්ෂූන් වහන්සේලා පස් නමක් වත් සොයා ගැනීම අපහසු කාලයක ය. ඉතා වෙහෙස ගෙන, මහත් දුෂ්කරතාවයන් මධ්‍යයේ සිංහල හා පාලි භාෂාවන් ඉගෙන ගෙන, එ පෙක් සොයා ගත හැකි ව තිබුණු හැම පොතක් ම එකතු කරවා යළිත් පිටපත් කරවීමෙහි යෙදුණු මේ හිමියෝ මෙ රටෙහි උපසම්පදාව ඇති කරවා ගැනීමෙහි මාවත් ද සොයන්නට වන්හ. අනතුරු ව සියම් රටට පණිවිඩ යවා කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජුගේ උපකාරය ද ඇති ව සියම් රටෙන් වැඩම වන ලද භික්ෂූන් වහන්සේලා වෙතින් යළිත් මෙහි උපසම්පදාව පිහිටුවන ලදී. සරණංකර හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා හය නමක් මෙහිදී උපසම්පදාව ලැබූහ. එ වකට සරණංකර හිමියන්ගේ වයස පණස් වසකි. නොබෝ කලෙකින් කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජුන් අතින් සංඝරාජ පදවිය ද ලැබූ සරණංකර මා හිමියන් විසින් භාෂා සාහිත්‍යය සඳහා කරන ලද සේවය ඉතා විශාල ය. එ තුමන් විසින් කොරුණු පොත් කිපයක් ම විය.

ඉන්, සාරාර්ථ සංග්‍රහය, බුදු ගුණය වනමින් ලියැවුණු දහම් පොතකි. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ ප්‍රසාදය දිනා ගැනුම් වස් රචිත මෙය එම රජුට ම පිළිගන්වා තිබේ.

මධුරාර්ථ ප්‍රකාශිනී වූ කලී දහ වැනි සිය වසෙහි දඨානාග හිමියන් විසින් ලියන ලද පාලි මහා බෝධි වංසයට ලියන ලද විස්තර සන්නයකි. එ හෙයින් ම එය මහා බෝධි වංස සන්නය යන නමින් ද හැඳින් වේ.

අත්ථදස්සි නම් තෙර නමක් විසින් ලියන ලද පාලි වෛද්‍ය ග්‍රන්ථ කිපයක් ම සහාස් කර සිංහලයට නඟා දක්වන ලද ග්‍රන්ථයකි, භේසජ්ජ මංජුසා. මෙය ද නරේන්ද්‍ර සිංග මහ රජුගේ අයැදුම පරිදි රචිත ග්‍රන්ථයකි.

සාරාර්ථ දීපනී හෙවත් සතර බණ වර සන්නය, පිරිත් දෙසුම්හි ප්‍රධාන බණ වර සතර සඳහා ලියන ලද සිංහල සන්නයකි.

අභි සම්බෝධි අලංකාරය, සුමේධ තාපස කාලයේ සිට බුද්ධත්වය දක්වා බුදුන්ගේ චරිතය විස්තර කරමින් ගාථා සියයකින් පරිමිත පාලි කාව්‍යයකි.

රූප මාලාව හා මුනි ගුණාලංකාරය, සරණංකර හිමියන්ගේ සෙසු ග්‍රන්ථ ය.

1779 දී සරණංකර සංඝ රාජ හිමියන් පර ලෝ සැපත් වුව ද, එ තුමන්ගේ ගිහි පැවිදි ශිෂ්‍ය සමූහයා විසින් භාෂා සාහිත්‍ය පෝෂණය නො නවත්වා ම කර ගෙන යන ලදී. වැලිවිට සරණංකර මා හිමියන්ගේ ශිෂ්‍යයන් අතර තිබ්බොටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත නායක හිමියෝ ප්‍රධාන වෙති. හතර වෙනි පණ්ඩිත පරාක්‍රම බාහු රජු දවස සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජු දක්වා ලංකා ඉතිහාසය ලියා මහා වංශයට එකතු කරන ලද්දේ මේ ස්ථවිරයන් වහන්සේ විසිනි.

සරණංකර මා හිමියන් හා එක් ව බොහෝ කලක් එ තුමන්ගේ ශාසනික හා ශාස්ත්‍රීය සේවයට ආධාර කළ සංඝ රක්ඛිත නා හිමියන් ද මේ ශාස්ත්‍රීය ව්‍යාපාරයේ ප්‍රමුඛයකු වසයෙන් සැලැකිය හැකි ය. පහළ දෙළොස් පත්තුවේ නායක පදවිය දැරූ මෙ තුමන් ග්‍රන්ථ කරණයෙන් නො ව, දේශනා මාර්ගයෙනි මේ සටනට ආධාර කරන ලද්දේ.

බෞද්ධ විනය පිළිබඳ විශේෂ ඥානයකින් යුතු ව වැජැඹි දරම්ටිපොළ ධම්මරක්ඛිත හිමියෝ ද සරණංකර මා හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යයෙකි. ඉහළ දෙළොස් පත්තුවේ නායක පදවිය දැරූ මෙ තුමෝ සංඝරාජ හිමියන්ගේ අභාවයෙන් පසු සංඝරාජ පදවියක් පවරනු නො ලැබුව ද, මෙ රට ප්‍රධාන නායක ස්වාමින් වහන්සේ වූහ. මෙ තුමන්ගේ ගෝලයෙකි සාලි ඇලේ මණි රතන හිමියෝ.

සරණංකර හිමියන්ගේ සෙසු පැවිදි ශිෂ්‍යයින් අතර රඹුක්වැල්ලේ ධම්මරක්ඛිත, මොරතොට ධම්මක්ඛන්ධ, කොටිකාපොළ රතනජෝති, මැදවෙල ආනන්ද යන ස්වාමින් වහන්සේලා ගේ නම් වෙසෙසින් සඳහන් කළ යුතුය.

එ තුමන්ගේ ගිහි ශිෂ්‍යයන් අතර ප්‍රධාන වසයෙන් සැලැකිය යුත්තේ අත්තර ගම රාජගුරු බණ්ඩාර පඬිවරයා ය. පාලි මිලින්ද පඤ්හය සිංහලයට නැඟූ හීනටිකුඹුරේ සුමංගල හිමියෝත්, ග්‍රන්ථ බොහෝ ගණනක් කළ කොරතොට ධම්මාරාම මා හිමියෝත්, දෙහිගස්පේ අත්ථදස්සි ස්ථවිරයෝත්, සිටිනාමලුවේ සාමිත්, මේ පඬිවරයා වෙතින් ශාස්ත්‍රය හදාරා ශාස්ත්‍රාලෝකය ඉදිරියට ගෙන ගිය පඬිවරුයෝ ය.

වැලිවිට සරණංකර මා හිමියන්ගේ ශිෂ්‍යයින් අතර ප්‍රධාන තැනක් ගත් දරම්ටිපොළ ධම්මරක්ඛිත ස්වාමින් වහන්සේගේ ශිෂ්‍යයෝ දෙ දෙනෙක් වූහ. බෝවල ධම්මානන්ද හිමියෝත්, සාලි ඇලේ මණිරතන හිමියෝත් ඒ දෙ දෙනා ය.

සාලි ඇලේ මණිරතන මා හිමියන්ගෙන් ශාසනයටත්, ශාස්ත්‍රයටත් ඉමහත් සේවයක් සිදු විය. මාතර ගහබඩ පත්තුවේ සාලි ඇලෙහි ජනිත මේ හිමියෝ මාතර කන්ද බඩ පත්තුවේ දෙයියන්දර කළුගල විහාරාධිපති ව වැඩ විසූහ. පන්සිය පණස් ජාතකයෙහි එන දස රථ ජාතකය කවියට නඟා කව් මුතුහර නමින් මෙ තුමන් විසින් කවි හත් සිය හතළිස් හතරකින් යුතු කාව්‍යයක් නිපදවන ලදී. දස රථ ජාතකය, මහා භාරතයේ ද එන කථා වස්තුවකි. එහෙත් මේ කාව්‍යය පන්සිය පණස් ජාතකයේ කථාව ම විස්තර සහිත ව කවියට නඟා දැක්වුණකි. බාල වියෙහි ම තම පුතකු මිය ගිය හෙයින් ඔහුට පින් පැමිණවීමෙ අදහසින් අභයරත්න ඒකනායක නම් මහතකු විසින් කරන ලද ඇරයුම් පරිදි ය මේ කාව රචනා කර ඇත්තේ.

මණිරතන හිමියන්ගේ ප්‍රාතිහාර්‍ය්‍ය ශතකය බුදුන් වහන්සේගේ යමා මහ පෙළහර පිළිබඳ ව විස්තර කෙරෙන රමණීය කාව්‍යයකි. නොයෙකුත් විරිතින් යුත් ගී එක සියයකින් සමන්විත මේ කාවෙන් මණිරතන හිමියන්ගේ කවිත්වය පැහැදිලි වේ.

සාලි ඇලේ මණිරතන හිමියන්ගේ ශිෂ්‍යයෝ සතර දෙනෙක් වූහ. කිරම ධම්මානන්ද මා හිමියෝ එයින් අග්‍ර තැන් ගතිති. සෙසු තිදෙන වූ අකුරැස්සේ සුවර්ණජෝති, ගල්ඇටුඹේ පියදස්සි, හා පරපාමුල්ලේ ධම්මාරාම යන ස්වාමීන් වහන්සේලා විසින් ලියන ලද කිසියම් පොතක් ගැන දැනගන්නට නැත. එහෙත් මණිරතන හිමියන්හට ද වඩා උත්කෘෂ්ට ලෙස සාහිත්‍ය සේවයක් කිරීමට, සිය බස් මල් දම් කතුවර කිරම ධම්මානන්ද මා හිමියනට හැකි විය.

සරණංකර සංඝරාජ මා හිමියන් විසින් දල්වන ලද ශාස්ත්‍රාලෝකය සුරැකි ව ගෙන යාමට මහත් සේ ආධාර දුන්නා වූ ද, අසදිස කාව වැනි කාව්‍ය ග්‍රන්ථයන් රචනා කිරීමෙහි සමත් කවියකු වූ ද, රාජාධි රාජසිංහ මහ රජ තුමන් විසින් පහත රට නම ගිනවතකුගෙන්, පහත රට එ වකට සිටි උගතුන් ගැන අසා ‍ලිවන ලද සි සැලැහෙන කවියකි මේ.

“ස ං වර සතර සිල් පිරිසිදු මිතුරු සො ඳ
ලෙ න් දූරු සසුන සිව් සික පද කාසුන බ ඳ
මෙ න් සුර ගුරු ලකුණු දූරු එළු සකු මග ද
දූ න් විසි උතුරු යති මාතොට කොපමණි ද”

මීට යවන ලද පිළිතුරු කවියෙහි එ වකට පහත රට ප්‍රසිද්ධ උගතුන් ගේ නම් දැක්වෙන තැන කිරම ධම්මානන්ද හිමියන් ගැන ද මෙ සේ සඳහන් වේ.

“කා ර තොට බෝවල ද ගාලකුරුස නමි ත
කි ර මද කිවිදු දෙනගම දම්කිත් පටු ත
තෙ ර සත් දත් ගල් ඇටුඹේ බනු වටි ත
ප ර සිදු සමත් යති රට පාත මෙ පම ණ”

මෙහි කිරම යනුවෙන් දැක්වෙන්නේ කිරම ධම්මානන්ද හිමියන් බව පැහැදිලි ය. දකුණු පළාතේ බටහිර පත්තුවේ කිරම ජන්ම දසාදය ලද ධම්මානන්ද හිමියෝ අගලකඩ නායක හිමියන්ගේ ගෝලයකු වශයෙන් පැවිදි බිමට ඇතුළු වූහ. භාෂා ශාස්ත්‍රයන් පිළිබඳ ව එ තුමන්ගේ ආචාර්‍ය වරයා වූයේ සාලි ඇලේ මණිරතන හිමියෝ ය. ගොඩපිටිය විහාරාධිපති ව වැඩ වුසූ කිරම ධම්මානන්ද මා හිමියන්ගෙන් සිංහල සාහිත්‍යයට වූයේ ඉමහත් සේවයකි. එ හෙයින් ම එ තුමෝ මාතර යුගයේ කවියන් අතර වෙසෙසි තැනක් ලා විද්වතුන් විසින් සම්භාවිතයහ.

මෙ තුමන් විසින් සද්ධර්මාලංකාරයෙහි ස වන නන්දිරාජ වග කාංචන දේවි කථා වස්තුව කවියට නඟා කාංචන දේවි කථාව හෙවත් කව් මුතුහර යනුවෙන් ප්‍රසිද්ධියට පමුණුවන ලදී.

සද්ධර්මාලංකාරයෙහි ම දෙ විසි වන නන්ද වාණිජ වග, නන්දි වාණිජ වත ද මෙ තුමන් විසින් කවි කර ඇත. මහා කණ්හ ජාතකය, දේව ධර්ම ජාතකය හා සඹුලා ජාතකය ද මෙ තුමන් විසින් රචිත ජාතක කවි කථා පොත් ය. සිංහවල්ලි කථාව, ප්‍රේත වස්තුව, ගංගාරෝහණය හෙවත් සතුති පූජා කාව්‍යය හා විබත් මල් දම ද මේ හිමියන්ගේ අනෙක් කෘති ය.

කිරම ධම්මානන්ද හිමියන්ගේ ඉතා ම ජනප්‍රිය වූ පොත සිය බස් මල් දම යි. විජය රජ තුමාගේ පරපුර හෙවත් සිංහලයන්ගේ පරපුර මේ කවෙහි වස්තුව වීම මෙහි ජනප්‍රිය භාවයට ප්‍රධාන හේතුව වශයෙන් සැලැකිය හැකිය. මෙහි කථා පුවත සම්පූර්ණයෙන්ම මහාවංසයෙහි හය වන පරිච්ඡේදයෙහි මෙසේ දැක්වේ.

"අතීතයෙහි වඟු රට වඟු නුවර වඟු නම් රජෙක් විය. කාලිඟු රජුගේ දුවක් ඔහුට අග මෙහෙසුන් බිසව් වූවා ය. ඔවුනට එක් දුවක් ලැබිණි. නිමිති දන්නෝ, ඈය සිංහයකු හා වසතියි කීහ. ඉතා රූමත් ඕ කාම යෙන් මඩනා ලද්දී දෙ මව්පියන්ගේ පිළිකුළට භාජන වූවා ය.

සිය සිතැඟි අනුව ජීවත් වීමට කැමති ඈ හුදෙකලා ව අ ප්‍රසිද්ධ වේසයෙන් පිටත් වී මගධ රට බලා යන වෙළෙඳ සමූහයකට එකතු ව ඔවුන් කැටුව ගමන් කරන්නට විය. ලාට රට මහ වනයෙහිදී සිංහයකු ඔවුන් වෙත දිව ආයෙන් වෙළෙන්දෝ ඔහුගෙන් බේරී දිව ගත්හ. කුමාරිකාව සිංහයා පැත්තට ම දිව්වා ය. දුරදී ම ඇය දුටු සිංහයා ඈ කෙරෙහි සිත් අලවා කන් හෙලා නගුට සොලවමින් ඈ කෙරෙහි පැමිණියේ ය. නිමිති දන්නන්ගේ වදන් දැන සිටි කුමරිය කිසිත් බියක් නැති ව ආදරයෙන් සිංහයාගේ සිරුර පිරිමැද්දා ය. ඇගේ පහසින් ඉතා සතුටට පත් සිංහයා විසින් ඈය තම පිටෙහි නංවාගෙන සිය ගල් ලෙනට ගෙන ගියෙන් එ තැන් සිට ඔවුන් දෙ දෙන හට එක් ව විසිය හැකි විය.

එසේ එක් ව විසීමෙන් ඔවුහු පුතකු හා දුවක් තිවුන් දරුවන් වසයෙන් ලැබූහ. පුතණුවන්ගේ අත් පා සිංහාකාර වූහෙයින් සිංහබාහු යයි ඔහු නම් ලද්දේ ය. දියණිය සිංහ සීවලී නම් වූහ. සොළොස් වියට පත් සිංහබාහු කුමාරයා, "මෑණියෙනි, අප පියා හා සම නොවන්නේ කුමන හේතුවක් නිසා දැ"?යි මවගෙන් ඇසූ විට ඇ විසින් ඔහුට සියලු පවත් දන්වන ලදී.

"කුමක් හෙයින් මිනිස් පියසට නො යන්නෙමු දැ"?යි ඇසූ විට, "සිංහයා ගල් ලෙන ගල් දොරකින් වසා යන හෙයින් පිටතට යා නො හැකිය"යි ඇ පිළිතුරු දුන්නා ය. දිනක් කුමාරයා ගල් දොර උසුලා ගෙන පණස් යොදුනක් යාම් ඊම් කර බලා, පසු දිනෙක සිංහයා ගොදුරු සොයා ගිය විට දකුණු කර මෑණියන් ද, වම් කර නැඟනියන් ද හිඳුවා ගෙන ගල් ලෙනෙන් පිටත් ව කොළ අතු හැඳ ගෙන පසල් දනව්වකට පිවිසියේ ය. එ වකට එ පසල් දනව්වෙහි වූයේ එ රජ දුවගේ මයිලණුවන්ගේ පුත් සෙනෙවියෙකි. තුග රුකක් මුල කර්මාන්තයෙන් විධානය කරමින් හුන් සෙනෙවියා ඔවුන් දැක, "තෙපි කවරහුදැ"යි අසා, "අපි වනයෙහි වසන්නෙමු"යි කී කල ඔවුනට වස්ත්‍ර දුන්නේ ය. ඒ වස්ත්‍ර ඉතා වටිනා බවට පත් විය. ඔවුනට කොළවල බත් දෙවන ලදී. ඒ කොළ ද රන් බඳුන් බවට පත් විය. මෙයින් පුදුමයට පත් සෙනෙවි තෙමේ නැවතත්, "තෙපි කවුරුදැ"යි විචාළේ ය. එ විට රජ දුව තම පරපුර ඔහුට කීයෙන්, ඇ තම නැන්දනියගේ දියණිය බව දැන, ඇය රැගෙන වනු පුරයට ගොස් ඇය හා ජීවත් විය.

ගුහාවට පැමිණි සිංහයා ඒ තිදෙන නොදැක, ශෝකයෙන් පෙළෙමින් නො කා නො බී හිඳ, ඔවුන් සොයා පසල් දනව්වට පිවිසියේ ය. සිංහයා පිවිසි හැම ගමක් ම ඔහු අතින් විනාස වූ හෙයින් පසල් දනව් වැස්සෝ රජු වෙත ගොස්, "දේවයෙනි, සිංහයෙක් පැමිණ ඔබගේ රට නසන්නේ ය. ඔහු වළක්වුව මැනව"යි කියා සිටියහ. සිංහයා නැසීමට කෙනකු නො ලද රජ තුමා දහසින් බැඳි පියල්ලක් ඇතකු පිට තබවා 'සිංහ හිස ගෙන දෙන තැනැත්තේ ගනීව'යි නුවර බෙර පියවි කර වී. එය දෙ දහසක, තුන් දහසකැයි නැවත ද බෙර පියවි කරවන ලදී.

මවු විසින් දෙ වතාවක් ම නවත්වන ලද සිංහබාහු කුමාරයා තුන් වන වර, සිංහයා මරන්නෙමැ යි රන් තුන් දහස ගත්තේ ය. කුමාරයා රජහට දක්වන ලදී.

"තොප විසින් සිංහයා නසනු ලබන්නේ නම්, එම රට තොපට ම දෙන්නෙමැ"යි රජ තුමා කුමාරයාට කීවේ ය. කුමාරයා ලෙන් දොරට ගොස්, පුත්‍ර ප්‍රේමයෙන් ඉදිරියට ආ සිංහයාට ඊ පහරක් විද්දේ ය. උහුගේ නළලෙහි වැදුණු හීය උහුගේ මෛත්‍රිය නිසා ආ පසු විත් කුමාරයාගේ පා මුල වැටිණි. තුන් වෙනි වර දක්වා එය එ සේ විය. ඉන් පසු සිංහයා

කෝපයට පත් විය. එ විට යවන ලද හීය සිංහයාගේ සිරුර විද තීම පතිත වූයෙන් කුමාරයා කේසර සහිත හිස කපා ගෙන නගරයට ගෙන ගියේ ය.

ඒ, වගු රජ මිය ගොස් සත් වෙනි දවස ය. රජතුමා අ පුත්‍රක වූ හෙයින් ද, මොහුගේ කාර්‍ය්‍යයෙන් ජනයා සතුටට පත් හෙයින් ද, ඔහු රජුගේ ම මුණුබුරකු බැව් ද අසා ඔහුගේ මව ද හැඳින "රජ කමට පත් වනු මැනවැ"යි ඇමැතියන් වෙතින් ආරාධනා ලද්දෙන් කුමරු එම රාජ්‍යය තම මවගේ සැමියාට බාර දී, නැඟනිය රැගෙන තම ජාත භූමියට ගොස් එහි සිංහ පුරය යි නුවරක් ඉදි කරවා, වෙනෙහි සියක් යොදුන්හි ගම් ද පිහිටුවා සිංහ සීවලිය අග මෙහෙසුන් කොට ලාට රට රජ කළේ ය. ඒ අග මෙහෙසිය වරෙක ට පුතුන් දෙ දෙන බැගින් සොළොස් වරෙක පුතුන් දෙ තිස් දෙනකු වැදුවා ය. ඉන් වැඩි මහල් තැනැත්තේ විජය නම් ය. දෙවැන්නා සුමිත්‍ර ය. සුදුසු කල විජය කුමරු යුව රජ වසයෙන් අභිෂේක ලැබුවේ ය.

විජය කුමාරයා විෂම ආචාර ඇත්තේ විය. ඔහුගේ පිරිස ද එ සේ ම විය. ඔවුන් ඉවසිය නොහෙන සේ නොයෙකුත් බලහත්කාර කම් තරන්නට වූයෙන් කිපුණු මහජනයා ඒ බව මහ රජුට දැන්වූහ. රජ තුමා ඔවුනට කාරුණු කියා, පුතුට අවවාද කළේ ය. දෙ වෙනි වර ද එ සේ ම විය. තෙ වෙනි වර කිපුණු ජනයා "ඔබගේ පුත් කුමරුවා මැරිය යුතුය"යි හඬ නහා සිටියෙන් රජ තුමා විජය කුමරුත් ඔහුගේ පිරිසත් යන සත් සිය දෙන හිස මුඩු කරවා නැවක පටවා මුහුදට දැම්මේ ය. ඔවුන්ගේ භාර්‍ය්‍යාවන් ද, දරුවන් ද, වෙන වෙන ම නැව් නංවන ලදින් ඔව්හු වෙන වෙන ම දිවයින්හි ගොඩ බැස්සෝ ය. දරුවන් ගොඩ බැස්ස දිවයින නග්නදීපයයි ද, භාර්‍ය්‍යාවන් ගොඩ බටු දිවයින මහින්ද දීපයයි ද ප්‍රසිද්ධ විය. විජය කුමාරයා සුප්පාරක දිවයිනට ගොඩ බැස්සේ ය. එහි ජනයා ගේ බිහිසුණු ක්‍රියාවන්ගෙන් බියට පත් ඔව්හු යළිත් නැව් නැඟ, බුදුන් වහන්සේ පිරි නිවන් පෑම සඳහා සල් රුක් දෙක අතර සැතැපුණු දා ලක්දිව තම්බ පණ්ණි පෙදෙසට ගොඩ බැස්සෝ ය."

. මහා වංසයෙහි එන මේ කථා පුවත ඡන්දස් අලංකාර ආදියෙන් විසිතුරු කොට, විස්තර සහිත ව සිය බස් මල් දම්හි දක්වේ.

කාව්‍ය කර්තෘහුගේ නම හා වාසයත්, කාව්‍යය කර නිම වූ දිනයත් කාව්‍යය අවසානයේ 225 වෙනි කවියෙන් මෙසේ දැක් වේ.

"ස ක ව සි න් එක් දහස් සත් සිය දෙ සාළිසකට පැමිණි මෙ ව සේ
රි ක හයෙ න් යුත් බක් මසෙහි පුර පෑල විය ලත් සිකුරු දව සේ
තෙ ක සි රි න් සැදි ගොඩසිටියෙ මහ වෙහෙර නිරතුරු වසන සුව සේ
සි ක පෙමි න් රැකි කිරම දම්නඳ යති මෙ කව් කරු නිමව් සිත සේ"

මේ අනුව මේ කාව්‍යය කර නිමවන ලද්දේ ක්‍රි: ව: 1820 දී හෙවත් සිංහල රාජ්‍යය ඉංග්‍රීසීන්හට පවරා දී අවුරුදු පහක් ගත වූ තැන ය. මේ වූ කලී ලංකා ඉතිහාසයේ ඉතා ම අඳුරු යුගයකි. උඩ රට රදළ වරුන් අතර පුද්ගලික ඊර්ෂ්‍යා, ක්‍රෝධාදිය උත්පන්න වීමෙන් කුමන්ත්‍රණ, හා කැලැඹිලි ආදියත්, මහජනයා තුළ අ සමගියත් තම රජු කෙරෙහි අප්‍රසාද සත් ඇති වී අන්තිමට සිංහල රාජ්‍යය වැටුණේ ය. 1818 ඌවේ මහ කැරැල්ල නිසා ද රටෙහි බොහෝ පළාත් හා බොහෝ ජනයා විනාශ වී ගිය මෙ කල, කිසි ලෙසකිනුත් රට සමෘද්ධිමත් හෝ භාග්‍යවත් හෝ නො වූ බව පැහැදිලි ය. කරුණු මෙසේ පවතිද්දීත් රටෙහි භාෂා සාහිත්‍යය අභාවයට යැමට නො දී, රැක බලාගත් පඬිවරුනට අපගේ කෘතඥතාවය හිමි විය යුතුය.

මෙ වැනි යුගයක බිහි වූ පොත පතෙහි ඉතා උසස් තත්ත්වයක් බලාපොරොත්තු වීම උගහට ය. ඒවායෙහි අඩු ලුහුඬු කම් ඇති වීම ස්වාභාවික ය. මෙ කල බිහි වූ උසස් කෘතීන් වසයෙන් සැලැකෙන ගංගාරෝහණ වර්ණනාව, කව් මුතුහර, ප්‍රාතිහාර්‍ය්‍ය ශතකය, ආදි පොත් මෙන් ම මේ සිය බස් මල් දම ද දෝෂින් ගහන බව කීමට සිදු වී තිබේ.

ක්‍රියා කාරක පද සම්බන්ධය පවා වරදවා යෙදුණු තැන් මෙහි බොහෝ ය.

61 වෙනි, "හි මි ස ඳ   එ කුමරි තොමෝ මන ක   ලා
ළි රි ස ඳ   මෙන් යොවුනග පත් ක   ලා
නොම හිඳ   මෙ පුරෙන් ගොස් සැඟ වි   ලා
රු දු න ද   මිහිදෙක් හට අසු වෙ   ලා"

යන කවෙහි අන්තිම පදයත්,

106 වෙනි, "සො ඳු රු   මැණියනි තද   නා–මෙම
න පු රු   වෙනෙහි නිරතුරුව ම වස   නා
කො ස රු   ට දු අපි දෙ දෙ   නා–පිය
අ යු රු   නො වන්නට කාරණ කුම   නා

යන කවෙහි තෙ වෙනි පදයක්,

110 වෙනි, "මෙලෙස   කිසෝ වර කී බ   සා–ඇසු
නි දෙ ස   සිංහබා කුමරිඳු විම   සා
දි ගැ ස   කොනෙක් පෙර දව   සා–මෙම
වි ල ස   මිගෙක් සහ විසුවෙද කොදෙ   සා"

යන කවෙහි අන්තිම පදයත්,

129 වෙනි, "තු රු පනි සස ලප ලෙස සම්ගි නෝ
ද රු දෙ දෙනෙක් වන තුරු වසම් නෝ
දු රු කර ම වෙතට තුබු තද සෙ නෝ
සා රු මය ම සි මගෙ උන් සැහවු නෝ"
යන සාවෙහි දෙ වෙනි පදයත්,

130 වෙනි, "සැ ම සැප දෙන හිමි ගට කර ම ද
ස ම දරු දසයක් ඇතිවන් ව ද
සා ම නැති හොර හිමියෙක් දුටු ස ද
පෙම වෙති කාන් ඔහුට ම වැඩි න ද"
යන සාවෙහි තෙ වෙනි පදයත්,

155 වෙනි, "බ ල න ර යුද කර පෙර දිනුමට සෙනෙහැති ඇමතිවරු නි
රු දු න ර මිග රදෙක් අවුත් අප සතු රට නසන බැවිනි
පු ව න ර මිවි රහ සෙන් ගෙන ගොස් යුදකර එහු මරම් නි
දු රු කා ර එවි අප රට පත් විපත් එ බිය නොප බලයෙ නි"
යන සාවෙහි දෙ වෙනි පදයත්,

169 වෙනි,
"මැනි වරුනි මසු දහසකින් බැඳි පියල්ලක් ගෙනැ තබා ඇතු ම් ට
අ නි දරුණු මිග රදුගෙ ඉස සිඳ යමෙක් ගෙනැවුත් දුනොත් මෙඅපට
ව නි සුරු ද සහ මෙ රන් දහස ද ඔහුට දෙන බව කියා තුටු නො ට
ඉ නි සියලු වගු රටෙහි අප සතු ලවවි අණ බෙර ඉතා විගස ට"
සාවෙහි දෙ වෙනි පදයත්,

207 වෙනි, "හිමි සඳු පල වැල සඳ' පට වන මැඳ ගිය කල සෙ ඳ
ලෙන හිඳ සැඟවී ඒද අපි නොම රඳු මෙහි ආ ස ඳ
තද ලෙඳ සිත දුක් වැඳ ගිරි ලෙන රඳලා නොම හි ඳ
රට මැඳ විත් මෙම ලෙඳ දුක් විඳා වදලේ අප ස ඳ"
සාවෙහි දෙ වෙනි පදයත්,

මෙ සේ වියරණය වරදවා යොදන ලද තැන් කීපයකි. මේ තැන්හි වියරණය තිසි සේ යෙදීමට කිසි ම අපහසුවක් නො පෙනේ. කාව්‍ය කර්තෘ වරයා න, ණ, ල, ළ භේදය ගැන දැනුමක් ඇති ව සිටි බවක් මේ සාවෙන් නො පෙනේ. බොහෝ තැන්හි න, ණ, ල. ළ අකුරු වරදවා යොදා ඇති සැටි මේ සාවෙහි සඳහන් පෙළින් බලා ගත හැකි ය. ඒ සියල්ල අපගේ පෙළෙහි ශුද්ධ නො කරන ලද්දේ ඒ කාව්‍ය කර්තෘහු ගේ ම දෙස් හෙයින්, එය පොත හඳුරන්නවුන් විසින් දැන ගත යුතු නිසා ය.

කවි වල සක්සා ගැසූ තැන් ද බොහෝ ය.

"ලොබ බැඳ තමදිම් එ සුගත් දම් රද" (1 වෙනි කව)

"දිව සර ලෙසින් තනි ව, කම් සැප ලොබින් එ දින කිසි බිය නොවී එ යන සදෙහි ලසිනා"(82 කව)

"සැක නොව දෙ දෙන එ දින උමයඟ නිසුරු සිරින වත මැද තුරට පැමිණ ගියෝ එ රුදු"(83 කව)

"එ වත මැද එ විඳ විදු දෙ දෙන සෙද ගියෝ එද" (86 කව)

"ඉදුනෙවුරු එ පෙල ඉරු රසය උරු බී මදුරු" (88 කව)

"තිබෙන මෙ නුඹ බලා විය මට දුක් දළා" (185 කව)

"එතුරු ලිය මුල් ගල් උගුළුවා එ තිම සම කරු සදමිනා" (216 කව)

"මෙ සිය බසින් කවි කළ නොක විරිත යුත" (226 කව)

යනාදි තැන්හි කවි පදවල මාත්‍රා පුරවීම සඳහා එ යන්න සහ මෙ යන්න සක්ක වසයෙන් ගසා තිබීම දුබල කවිත්වයක ලක්ෂණය යි කිව යුතු ය. එළි සමය රැක ගැන්ම සඳහා ද මාත්‍රා වැඩි කරන ලද තැන් මෙන් ම, හානි කරන ලද තැන් ද බොහෝ කවිහි දක්නට ලැබේ.

පසු තැවිලි හා විලාප ආදිය දක්වන බොහෝ තැන්හි ඉතා ග්‍රාම්‍ය භාෂාවක් යොදා තිබීමෙන් කාව්‍යයෙහි අලංකාරය බොහෝ දුරට අඩු වේ.

"ම ත් වුණ මම කම් සැපතෙහි අ ටින්
ක ත් සමග වැ වැසලා මන තු ටින්
ල ත් සැප දූන් නැති වී යෙහෙම පි ටින්
අ ත් පිට පව පල දුන් සැටි දු ටින්"

(124 කව)

"ඉ න් අප කුල සි දෙනුන් දුටු තැ නෝ
උ න් වත කෙසෙ බලමිනෙ දෙවිය නෝ
පි න් නැණ මද තිරිසන් බව ගැ නෝ
දූන් ලියො තිර නැති වග නො දැනු නෝ"

(127 කව)

"මෙ වෙනෙහි විසු තිතිනේ බල තර තද තෙද නෙ දෙවිය නෝ
වියො දුක් ගිනි කඳිනේ මට වන් හදවත දයි තදි නෝ
නිදිමින නැන එසිනේ ටිකකුත් බඩ ගිනි මට නො දැ නෝ
නොකි හැකි තද දුකිනේ මගෙ දිවි නො රැකෙහි අද මෙයි නෝ"

(140 කව)

විලාප වසයෙන් කියන ලද මේ කවි කො තරම් ග්‍රාම්‍ය ද?

"ලොවට අග පත් හිමි සඳිති පසි නො ලැබෙහත් අප හැමට අද සි ට
අ ප ට බැරි මය යුද කරන්නට තද වීකුම් මිග රදකු ළහ සි ට
නු ඹ ට අපගෙන් වැඩක් ඇතහොත් කුමට ඇරියෙද මෙ බඳු සටන ට
දූ ත ට මිගිඳකු ලවා අප මැරවුමෙන් වන පල මොකද තිරිදු ට"

(166 කව)

"ඝ වි ස වනයට එසිරද දූකැ වරෙන් සිහ රද යුදට නො ලසි ත
කි බ ස අසමින් ඉතා සතුටු වැ මිගිඳු එ කුමරු ළහට එන තැ ත
වි ග ස විස පෙව් සාරල් හියක් රැගෙනැ කෙසරුට විදපි සරෙසි ත
එලෙස විදි ඒ සැරය ආ පසු බලා වැටුණෙය මිගිඳු කුළුණෙ ත"

(177 කව)

ග්‍රාම්‍ය යෙදුම් වලින් ගහන මෙ වැනි කවි බොහෝ ගණනක් මේ කාව්‍යය කියවන විට හමු වේ.

සිය බස් මල් දම කාව් සාතාවකි. මහ නුවර සමයෙහි නොනෙකුත් පළ වූ විරහ කාව්‍යයන් ද, ප්‍රශස්ති කාව්‍යයන් ද මේ කාව්‍යය කෙරෙහි බල පා ඇති බව පැහැදිලි ව පෙනේ. අලගියවන්නයන්ගේ කුස ජාතකය ද මේ කාව ලිවීමෙහි දී ගුරු කොට ගත් බව පෙනේ. සක් රජුන් පැමිණ යුදට සැරසෙද්දී, පිය රජු තමා සත් කඩකට කපා දීමට සැරසෙන බව දකින පබවත වැළපුණු අයුරු දක්වන කවි පෙළ මෙහි ගිරි ලෙනෙහි අඹු දරුවන් නො දුටු සිංහයාගේ විලාපය දක්වන කවි පෙළට ගුරු වන්නට ඇතැයි සිතිය හැකි ය.

තම අඹු දරුවන් වනයෙහි සොයා නො දැක ළ තවන සිංහයාගේ විලාප ද, කුස ජාතකයෙහි දෙ පොළකට ණය ගැති කම් දක්වයි.

"එ වු ය ත ලිය ලියෝ තුරු හිමි වැළඳ ගෙ ත
ලෙ ල දෙ ත අතු අතින් සා–මුව සුතන් ගෙ ත
සු සි පෙ ත ලතු ලවන් යුත් කුසුමන් වති ත
ත ල ව ත වැන්න බිගුසන් සුරහල් බසි ත"

යන කුස ජාතක කව, මෙහි

"තුරු හිමි වලඳමිනා ලිය ලිය ලෙල දෙන අතු අති තා
සා මුව දරු රැගෙනා බිගු රැව් සුරහල් පිය බසි තා
මුව රඳ මුදු දසනා පුල් මල් මනහර දුල් වනි තා
අම පල යුග නෙනෙනා දිගු නිල් දල නොහගින් වැහෙ තා"

(135) යන කවට කොතෙක් ගුරු වී දූ යි පරීක්ෂා කිරීම වටී.

එ මෙන් ම මෙහි.

ඌර පිය පලු සමඟා පුල් මල් වැද එන මඳ සුල හා<br>
ඝොර ගිනි සිළු සෙ ඇඟා වැද දයි සඳ හිම දුනි තර හා<br>
මියුරඬ ඇති විහඟා තද වනි දෙ කණට යවුල් ර හා<br>
මගෙ අඹු දරු නො ලහා විය ඉන් මට වනි මෙ දුක් සු හා

(111) ඝන සිංහ විලාපය, පබවත වෙන් ව ගියෙන් හඬන කුස රජුගේ

'සි හි ල් සොම් තරිඳු රිවි මෙන් දිසේ යා<br>
කොවුල් තද ඇසෙසි යකු හඬ ලෙසේ යා<br>
ල ක ල් පබාවති සහ නොම වැසේ යා<br>
මෙ කල් මෙ මා සිතු තලවම් කෙසේ යා''

ඝන විලාපයට සො හෙක් ණය ගැනි සාම් දක්වන්නේ ද?

සිය බස් මල් දම් කපු වරයාට ම විශේෂ යෙදුම් කිපයක් ද මේ කාවෙහි නැතින් තැන දක්නට ඇත. සර යනු අප්සර වෙනුවට ද්‍රෙ කාන්තාව යන අරුතෙහි මෙහි යෙදී තිබේ. තර යන සකු හා පෙළ බස්හි අධිකාර්ථය දෙන නිපාත, සුද්‍ර තර ආදි වසයෙන් නො සැලකිලි ලෙස යොදා තිබෙනු පෙනේ. උමයහනිසුරු, සරුහිලි, ඉඳුනෙවරු, සනිසුරු ආදි වසයෙන් අස්වාභාවික ලෙස සන්ධි වූ පද ද බොහෝ ගණනකි.

සාහිත්‍ය කලා පිරිහී ගිය කාලයක නිෂ්පාදිත ග්‍රන්ථයක් හෙයින් මෙ සේ දෙසින් ගහන වුව ද, කිරම ධම්මානන්ද හිමියන්ගේ කවිත්වය පළවෙන තැන් ද මේ පොතෙහි කොතෙකුත් ඇත. සිහල බසෙහි මෙන් ම කාව්‍ය කරණයෙහි ද සැහෙන දැනුමක් ඒ හිමියන් තුළ තිබුණු බවට මේ පොත දෙස් දෙන්නේ ය.

පොතෙහි මුල් භාගය අවසාන භාගයට වඩා හැම අතින් ම උසස් බව කිව හැකි ය. සංස්කෘත හා සිංහල මහා කාව්‍යයන් අනු ව යමින් වුව ද කාර ඇති දඹදිව් වැනුමෙන් කාව්‍ය කර්තෘහුගේ වර්ණනා ශක්තිය පිළිබිඹු වේ. වගු රදුගේ බිසව පිළිබඳ කාර ඇති වැනුම ද අගනේ ය. වගු රදුගේ දූ කුමරියගේ රූ සිරි වැනුම ද උසස් තැනක් ගන්නකි.

"සො බ න කනක ගිරි මුදුනහ රහ දෙන රන් මයු රා<br>
ඝ ර ණ සුමුදු දිගු වරලස නිල් ව බැබැලි නො ව රා<br>
වැ සු ණ අඩක් මේ ගැබකින් සඳුගේ සිරි අයු රා<br>
න ද න වේය දුටු දන මන ඇගෙ තළලත පව රා''

ආදි වසයෙන් දැක්වෙන ඒ වර්ණනාව කාව්‍ය කර්තෘගේ ප්‍රතිභා ශක්තියට දෙස් දෙන්නකි.

සිංහයා රට පෙළූ සැටි වැසියන් රජුට පැමිණිලි කළ අයුරු දක්වෙන කවි කීපය ද උසස් තත්ත්වයක් ගන්නා බව කිව හැකි ය.

"සිරි සඳ සොමි උවන පියයුරු රණ තිස ර
මදරද දුනු මිටෙව් මැද දෙස ඇති පව ර
සුරරද ලියෙව් රුසිරැති අඟනන් නො හැ ර
මිගරද ගම් මැදට පැන මැරිය තද ස ර

වැනි කවි හැම අතින් ම උසස් කවියකුගේ නිර්මාණ වශයෙන් උසස් තැනක් ගනු ඇත.

මාතර යුගයේ සාහිත්‍ය ග්‍රන්ථයන් අතර ඉතා ජන ප්‍රිය ග්‍රන්ථයක් වුව ද සිංහල සාහිත්‍ය වංශයෙහි සිය බස් මල් දමට එ තරම් උසස් තැනක් හෝ ජනප්‍රිය භාවයක් හෝ ලැබී ඇති බවක් නො පෙනේ. මෙහි කථා වස්තුව රසවත් වුව ද, සිංහල පාඨකයාට වඩා හුරු පුරුදු නැති යෙදුම් වලින් පොත ගහන ව තිබීමෙන් මෙය සමාන්‍ය පාඨකයා ගේත්, පොතෙහි සදෙස් තැන් අනූන වීමෙන් මෙය විද්වතුන්ගේත් සැලකිල්ලට එ තරම් නො ලක් වූ බව පෙනේ.

සිය බස් මල් දම පිළිබඳ ව මඳ වුව ද ප්‍රබෝධයක් ඇති වූයේ මෑතක සිට එය උසස් පාඨ පරීක්ෂණ වලට නියම වූවාසින් පසු ව ය. මේ ග්‍රන්ථයෙහි ගැට මුසු තැන් සියල්ල ලිහා, හැම කවියක ම අන්වය ද, අර්ථය ද, විස්තර කළ යුතු තැන්හි විස්තර ද සහිත ව අපහසු වචන සඳහා සිංහල ඉංග්‍රීසි ගැට පදයකින් ද, යුතු ව මෙ සේ මේ සංස්කරණය පිළියෙල කරන ලද්දේ මේ පොත පාඨ පරීක්ෂණයන් සඳහා හදරන්නන් ඇතුළු හැම ආධුනිකයන්ගේ ම ප්‍රයෝජනය සලකමිනි.

මේ රටෙහි ජනතාවගේ හිත සුව සඳහා තම කාලයත්, ධනයත්, මොළයත් නො මසුරු ව යොදවා, රටටත්, ජාතියටත්, සාහිත්‍යයටත් උදාර සේවයක් කර පරලෝ සැපත්, ඩබ්ලිව්. ආතර් ද සිල්වා මහතා විසින් පළ කරවන ලද සිය බස් මල් දම් පෙළ අපගේ සංස්කරණය සඳහා ප්‍රයෝජන වූ බැවි කෘතඥ භාවයෙන් යුතු ව සඳහන් කරනු කැමැත්තෙමි. ඒ පෙළෙහි ඇති කොතෙකුත් දෙස්, පොත පිටපත් කළ අයගේ නො ව, කාව්‍ය කර්තෘහුගේ ම බව මේ යුගයේ නිපදවන ලද සෙසු පොත් වලින් මෙන් ම, ඔහුගේ අනෙක් කෘතීන්ගෙන් ද පැහැදිලි වපෙනේ. පෙළෙහි ඒ කිසිවක් වෙනස් කර දක්වීම අප සතු වැඩක් නො වේ. පොත හදරන්නවුන් විසින් කාව්‍ය කර්තෘහුගේ ඒ දෙෂ ස්ථානයන් දැන ගත යුතු හෙයිනි. කවි වල අන්වයෙහි දී ඒ හැම දෙසක් ම ශුද්ධ කර දක්වීමටත්, බොහෝ සදෙස් තැන් පිළිබඳ ව වෙන ම විස්තර වශයෙන් සඳහන් කිරීමටත් වෙහෙස දැරුවෙමු. එ හෙයින් කවි වල

ස දෙස් තැන් නි දෙස් විය යුතු අයුරු අන්වය හා විස්තර බැලිමෙන් වටහා ගත හැකි ය.

යම් ආධුනිකයකු මේ සංස්කරණයෙන් ප්‍රයෝජන ගෙන සිය බස් මල් දම හැදෑරීමට වෙහෙසෙතොත්, ඔහු බලාපොරොත්තු වන හැම උපකාරයක් ම මෙහි ඇතැයි සිතමු. යම් නො පැහැදිලි තැනක් වෙතොත් එය සඳහන් කර එවන කාහට වුව ද එය විස්තර කර දීමට මැලි නො වෙමු.

කෙසේ වෙතත්, මේ සංස්කරණය විවේචනය කිරීම විද්වතුන්හට ම බාර වැඩකි. භාෂා සාහිත්‍යයන් පිළිබඳ උසස් අවබෝධයක් ඇති විචාරකයන් විසින් කෙරෙන වැදගත් විවේචනයන් නිසා සාහිත්‍ය පෝෂණයට ලැබෙන්නේ මහත් රුකුලකි.

නොබෝ ද ප්‍රකාශයට පමුණු වන ලද අපගේ හංස සන්දේශ සංස්කරණයෙහි දූත වැනුම්හි "තොප පිට පිහිට කැරැ බඹ තෙ දිය ඇවිදි ය" යනු "Standing on your back, Brahma wanders about in the three worlds" යනුවෙන් අප විසින් කෙරුණු ඉංග්‍රීසි අනුවාදය ස දෙස් තැනෙකැයි කවුදෝ පින්වතකු පුවත් පතක පළ කර තිබෙනු දක්නට ලැබිණි. එහෙත් කුමන හේතුවකින් ඒ ස දෙස් දූයි නො දක්වීම දුබල කමකි. ඔහු එ සේ ලියන්නට ඇත්තේ, හංසයකු පිට බ්‍රහ්මයා නැඟිට යෑම අස්වාභාවික යැ යි සිතා විය හැකි ය. බ්‍රහ්මයා හංස පිට වාහනයක් කර ගෙන යන බව නම් කාවෙහි සඳහන් හෙයින්, ඔහු හංස පිටෙහි යන්නේ කෙසේ ද? නො නැඟිට යාම අ පහසු නම් හිඳ ගෙන හෝ නිදගත් ගමන් බ්‍රහ්මයා හංස පිටෙහි යන්නේ යයි අදහස් කරනු ලැබේ ද?

අපගේ අදහස ස දෙස් ය යි කී තැනැත්තා, එ සේ කීවේ, බ්‍රහ්මයා හංස පිට පිහිට කර ගමන් කරන සැටි දැකීමෙන් පසු ව දෑ යි නො දනිමු. ඔහු යම් දිනෙක මේ අපූරු ගමන දැක ඇත් නම්, එය අප කාහටත් විස්තර කර දීම ඔහුගේ යුතු කමකි. නො එ සේ නම්, මේ ප්‍රශ්නය දෙස බැලිය යුත්තේ තර්කානුකූල ව ය. බ්‍රහ්මයකු හංසයකු පිට වාහනය කර ගෙන ඇවිදීමක් ගැන සඳහන් වන්නේ කාවි සමයෙහි හා හින්දු දේව කථාවන්හි ය. බ්‍රහ්මයාගේ ප්‍රමාණය නො දනිතත් හංසයකුගේ ප්‍රමාණය නම් අපි කවුරුත් දනිමු. බ්‍රහ්මයා යටත් පිරිසෙයින් මිනිසකු තරම් වුව ද, ඔහුට හංසයකු වාහනය කර ගෙන ඇවිද්ද හැකි ද? මෙය අතිශයින් ම අස්වාභාවික ය. එසේ වූ විට බ්‍රහ්මයා හංස පිටෙහි නැඟිට යෑම අ පහසු ය යි ද, ඔහු හිඳගෙන හෝ නිදා ගෙන යනු ඇතැයි ද සැලකීම මහත් අ නුවණ කමෙකි, ඔහු හංස පිටෙහි හිඳ ගෙන යන්නේ කෙසේ ද? හංසයා වැනි කුඩා සතකුට බ්‍රහ්මයකු පිටෙහි හිඳුවා ගෙන ගිය හැකි ද? මෙය අස්වාභාවික වැඩකි. යම් හෙයකින් බ්‍රහ්මයාට

හම දේව බලයෙන් එ සේ යත හැකි නම්, එම බලයෙන් ම හංසයා ඊට නැඟිට යාමට බැරි ඇයි?

කාව් සමයෙහි දෙවි බඹුන් පිළිබඳ ව දක්වෙන අස්වාභාවික දේ බොහෝ ය. ඒ කාව් වෙන බසකට අනුවාදය කරන්නා ඒ අස්වාභාවිකත්වය ගැන වග කිව යුත්තෙක් නො වේ. අනුවාදකයා විසින් කළ යුත්තේ මුල් අදහස අනෙක් බසකින් දක්වීම පමණකි. එක ම දේ ඇතැම් තැනෙක දෙ තුන් අයුරෙකින් දක් විය හැකි ය. එහෙත් ඒ කිසිවක් ස දෙස් යැ යි කියා පෑමට පෙර මඳක් වත් ඒ ගැන නුවණ මෙහෙයවා බැලීම පරෙස්සම් සහිත ය. නැතහොත්, ඒ තමාගේ ම අනුවණ කම ලෝකයාට පෙන්වා දීමක් පමණක් වන හෙයිනි.

එ හෙයින් එ වැනි ආධුනිකයින්ගේ නො ව, අපේ සාහිත්‍ය ග්‍රන්ථයන් පිළිබඳ සැබෑ අවබෝධයක් ඇති මධ්‍යස්ථ විද්වතුන්ගේ ම විවේචනාත්මියට මේ සිය බස් මල් දම් සංස්කරණය ද ලක් වනු ඇතැ යි බලාපොරොත්තු වෙමු.

කේ. ඩී. පී. වික්‍රමසිංහ

ලංකා නීති විද්‍යාලය,
කොළඹ.
10. 1. 53.

# සිය බස් මල් දම

## නමව් මුනි සරණ

1 සු බ අඟ අප විග දුන් සත්ත්ව සො ද
බ ඹ සුර’සුර නර මතැ සැදු සිරි ප ද
පො බ යන විතෙ දන ගණ සර දින ර ද
ලො බ බැඳැ නමඳිමි එ සුගත් දම් ර ද

2 සු ර දෙව අයදුම පිළිගෙන මොනව ට
ව ර දෙ සතර මඟ පල මොක් පළ කො ට
සු ර නට සුර සුගතිඳු දෙසූ දහම ට
තො ර තො ම නමඳිමි අදරින් තුති කො ට

3 සි රි ගණ වදහළ සදහම් සිතෙල ට
පි රි සිඳු රන් පා වන් සුත දිනිඳු ට
සැ රි යුත් මුගලන් ඈ මහ සඟන ට
පි රි සතුටින් මම නමඳිමි හැම වි ට

4 බ ඹ සුර පති සුර ගුරු සුර ගුරු ත න
නැ බ සර සිරි සර සරකාර බරනෙ න
බ ඹ කත ඈ හැම සුර ගණ කර මෙ න
සු බ සෙත දී රකු මේ හැම ලෙව් ස න

5 තු න් ලොව ඇති හැම රුවනට තුම් ව න
තු න් සිත සතුටු ව වැඳැ පිදු හැම දෙ න
තු න් සැප දීමෙන් සුවපත් කර ව න
තු න් රුවනට වැඳ පුදමින් මෙ ලෙසි න

6 හැ ම ස ද ලෙව් සත සුව පත් කරමි න
සි ත ලෙ ද ආසිරි දී රක්නා මෙ න
එ ක ලෙ ද ලො සසුන රැක නිති බබල න
න ද තෙ ද දෙවියන් යදූ මෙත් කරමි න

7 පෙර මෙම සිරි ලක පලමු ව රජක ළ
එ ර තර එ විජයබා රජහුගෙ දූ ල
ප ර පුර ගෙණ හැර දක්වමි මත සා ල
ක ර 'දර පුදනෙති'සව් එහි පිළිවෙ ළ

## දඹ දිව

8 සි සි ර කර හර සිසිර හර ගිරි පඬෙර සුර ගජ කිරණ සොඳ රස
අ ම ර ගඟ තුඟු තරඟ රඟ හෙළ විපුල යස රැස පතළ දස දෙස
ත ඹ ර කර'පුරු පුගත දිලිගෙන අනත තද තෙද ගහණ දිය කුස
ස ත ර මර මත මතඟ ඉත බිඳි අනගි විකුමෙන් සැදිසි නතප ස

9 දිරි බෙලෙන් දිනු මිදුරු ගිරි රද සොම් ගුණෙන් පිරි සුරද දද රද
නත ගුණෙන් මහ වියත් ජයගත් ගැඹුරු ගුණයෙන් පැරයු ගිරි රද
ලොව සතුන් හට උතුම් දෙ ගුරුන් ගුරුන් මිතුරන් හරණ නිවරද
සුර නර න් හිණි කිරුළු මිදුනත සැදූ සිරි පද කමල් ඇති සොඳ

10 ස ත ර දස බුදු නැණ ද සබි නැණ කබල නැණ බල දසය දසය ද
ස ත ර දෙක විදු දසට අවෙණික දහම් තෙපසක් සරණ දහම ද
ස ත ර වෙසරද සතර ඉදිපා සතර සිව්ටන් බොදග සත්වි ද
ස ත ර පිළිසිඹි පත ද යන ඈ අනත ගුණ මිණි පිරුණු සිඳු ර ද

11 ස ත ර අව මඟ අවරණය කර සුර පුරට මග සැරසූ මනග ර
ස ම ර සුර දෙට පැරයු තුන් සිය විසි අටක් වර ලකුණු සිරිද ර
ත ඹ ර කර කුල කමලකර පොබයනට සහ මොහඳුරට සැඩකර
ස ම ර කළු සත් සමර සමරෙන් මිදෙන සදහම් දෙසූ ගරුත ර

12 බු දු පසේ බුදු මහ රහත් ගණ සඟ සක්විති රදහු දියත ද
සු දු කිරණ බිඳු නිමල ගුණ විල අනෙක නවසුන් උතුම් පඩිහු ද
රු දු බලැති යෝ බලන් ඈ හැම පින්විතුන් ඉපදුනු ඉතා හො ද
ඉ දු රු පුර දිනු මහත් සැපතැති පවර දඹදිව් තෙලෙහි මතන ද

## වගු පුර

13 ස ව න සුරපුරෙනඩික් මිහි බට ඊලස හැම පිරිපුරෙන් බබල න
ස ව න දම් සහ දෙ ලොව පිහිටිය සිතා තිසරණ දිවි සෙ සුරකි න
ස ව ණ කර දම් පෙවෙන් වැළකී පුරණ දස විද කුසල අපම ණ
ස ව න ගුණ නැණ'බරණ සිය ගත පැලඳි දනගණ ගහන හැම දි න

14 විපුල සැප දල සපිරි මනකල දවන සග රල රලැති සැම ස ද
නිසල නිලපෙල රසල කැල දුල නතවි දලසර සරණ මින න ද
තුමුල පලු හෙළ මනහ පෙළ නැවී මහගු වර රද බවන ගිරි ර ද
ලකළ වගු නම් පුරවරෙක් විය සිදු රදුණෙහ සිරි ඉසිලූ එක ලෙ ද

15 එපුර සුපිරි ඉසුරු වතුර එයින් පිටත නොයන විල ස
සතර වනහු මවා ලූවයි දුටුවන් හට සිතෙනා ලෙ ස
විතර නොවන බලැති දස'ට රියන් උසැති පවුර තිදෙ ස
එපුර අවට බැබලූ නිති දවල රසින් විලස කෙශෙල ස

16 ඉදුවර රතු පුල් හෙල්මැලි ඈ පස් පියුමෙන් සුසැදු න
සැම්වර තද දෙන බිගු කැන් දියරට හංස රදුන් කෙලි න
බලතර කිඹුලන් දුනි මුවරුන් සහ රුදු මසුන් ගණ න
පුරඳර පොකුණට සම විය දියගල එ පුරෙහි බබල න

17 දසවිද රුවණින් නිමි කිතු වැඹ ජේකඩ දූව ගෝනැ ස
දඹනද රන් උළු සෙවනැති මිණිකොත් ඇති නේ සුවන ස
සුරරද විමනෙව් දිලිසෙන තර රද බවනට සිවු දෙ ස
හිරසඳ බඳු රුස් විහිදෙන අපමණ තිල පෙල විය ය ස

18 මනහර සත් රුවනින් කළ දොරටු අවලූ සහ කිහි දෙ ර
පුරවර තුර අතුරු නොවන අනන විහිදි සැදි එහ යු ර
පුවතර මිණි නිකර සපිරි නන් වග සුදු රතු නිලඹ ර
දොරදොර වල සඳ තිබෙන අවන් හලින් නො විය අතු ර

19 සුසැම කලා සිප් පර තෙර පැමිණි අනෙක විදු දන හු ද
සුදම ඉතා නිපුණ සිසුලු සරම සතර වෙරුනි අය ද
ලොවට පිහිට රජ මැති සිටු ඈ නනතුරු ලත් සෙට හු ද
රුවම එ පුර දෙවියන් මෙන් සැරු පමණ නැති ව තිබ ද

20 ලකළ කමල හරණ සරණ දිව් සිළු එව් යුත දඟ දු ල
නිමල කනක රඹ කද'යුරු වටොර මිදන රියෙ'ව් උකු ල
දවල කිරණ සදිසි වනැති දෙ නුවන් සිරිවන නිලුපු ල
සකල රුවින් සුර'ඟන දිනු පුර'ඟන විසුනු ය පුර තු ල

21 අ ඟ රු සඳුන් දෙව්දුරු කළුවැල් සිරි පල දූරු පොසො න
ම හ රු නෙරළු පණස කුඹුකු ඇ මල් පල තුරුති නොමි න
ඉ දු රු හඳුන් උයන විලස සව් ඉසුරෙන් පිරි අපම ණ
සො දු රු උයන් පොකුණු දහස් සුවහස් විය එහි නැන තැ න

22 උ ර ණ ත රු ණ රඹ රණ බිඳ හරණ දෙරණ සතඟ පිහි ටි
තරුණ කි ර ණ හරණ දවල දළු දූරු තද පුදෙහි බුහු ටි
සු ර ණ ව ර ණ සදිසි සියලු සුබ ලකුණෙන් පිරෙමින් සි ටි
ව ර ණ ව ර ණ සෙත් එ පුරෙහි කෙළ සුවහස් විසූ ගැහැ ටි

23 පොරණ න ර ණ මඳර ගිරෙන් කිරණ මතන තරණ තල ට
ව ර ණ නෙ වණ දෙසෙහි උලැඟි නිමල දවල තරඟ රඟ ට
අ ර ණ හ ර ණ උරණ රජුන් තද ඇටතට සපැමිණි වි ට
දෙ ර ණ ස ර ණ හය පෙළ එහි බැබළු දිව හසුන් ලෙස ට

24 සු දු සිදු යොදමින් මතරම් රන් දද බැඳැ තිබෙන අව ට
මු දු විසිතුරු වතුරු අතුරමින් සැරසිලි කළ මොන ව ට
රු දු සෙබළන් අවි දරමින් උර සදලා සිටි හැම වි ට
ස දු රිවි මඬලෙව් දිලියෙන රිය පෙළ වැඩි විය කොළහ ට

25 ස ර සත සර සිරි මඬලඟ සඳ සක් ඈ නතවි රැගෙ න
උ ර සදලා සුර බටයන් යුරු උරෙතුර ගැටී සිටි න
ගො ර යුදයට වැදූ එඩියෙන් අඩියක් වත් පසු නො තබ න
ම ර සෙනඟට වැඩි පා බල සෙන් එ පුරෙහි විසූ වටි න

26 ස ත ත සතත තලත තිතෙත බඹ තත සිරි තත කිවි ගු රු
ස ච ත චතත අනත තරිඳු දිය නෙත් බුදු රුදුරු මිතු රු
දි ය ත පසිඳු අනත නැණැති තෙද බල දූරු සමත මෙමූ රු
වී ත තා යසැති එ පුර ඉසුරු වණත සමති වෙන කොද සු රු

## වගු රද

27 මෙ ලෙ ස   පිරි හැම පුරග සිරි තොම්නා, ගරුතර,
එ වගු නම් පුරවරෙහි මතනඳ   නා
දි ගැ ස   කුලවර තිලක වන සොබනා, රුපු ගජ,
වන සකල සරි විකුම් සිරි දර   නා
තු නැ ස   රුපු දිනු අනගි තුනු රුවිනා, සුර පති,
සදිසි සව් සිරි බරින් නිති දිලෙ   නා
ස මනා ස   කරමින් පමණ නැතී තෙදනා, වගු නම්,
රජ තුමෙක් විය ගුණ දහම් රකී   නා

28 ප ව ර   දස විද ලකුණු දූරු සකසා, මෙම රජ, මෙතින්
ජය ගෙණ හලේ රුපු තොත   සා
වි ත ර   නැති තද තෙදින් සරි දියැසා, කුළුණෙන්,
අමා කිරණෙව් බැබලි හැම දව   සා
අ ම ර   ගුරුතත සවත කිවි අටැසා, විදුරත, පැත
මිණි රුවන කර සදි   සා
ති ත ර   දෙන යදි ගණට එක විලසා, තිළිණෙන්,
සුරබි සුර තුරු ගණට කෙළෙ අය   සා

29 ති ස ල   වන දිරි බෙලෙන් ෂමර අසුරු, හරිසඳ,
තිරිඳු වැනි සබවසට අතිමිහි   රු
ත කු ල   රජ දිනු භය සරම සතරු, සිව් සැට, කලා
සිප් සමුදුරෙහි පත් එත   රු
වි පු ල   දසවිද දන් වතුන් නිතරු, වෙසතුරු,
තිරිඳුමෙන් දුති සතන් සිත් සපු   රු
ස ක ල   රජදම් නොහැර එක අසුරු, රකිමින්,
මෙ රජ සත තුටු කළේ නො ම විත   රු

30 එ පු ර   ඔර මැති බදුරු තුරු පබඳු, මැද තිති,
දිලෙන ලෝ වැඩ පිණිස රජ තරි   ඳු
ප ත ර   අමිතුරු සතුරු රජ සමුඳු, සියපත්, මුකුළු විය
එක ලෙසට ලෙව් සැම   ඳු
ප ව ර   නැසිය මිතුරු කොඳ තොමඳු, පොබ විය,
ගුණ සුවඳ රැස් දෙසනුදෙස විහි   ඳු
ල ත ර   තුබු දුක් අඳුරු හැම තොරඳු, දූරු විය,
මෙත් කිරණ සත් ලොවට වැද තිබ   ඳු

31 එ ර ද  දිනිසුරු තද තෙදින් දිලෙනා, රද නිය,
සොඳුරු සුගඳුරු මුදුන්පත් කෙණෙ  නා
නොමද  රෝ දුක් දුබික් බිය නොමිනා ගනඳුරු,
අතුරුදන් විය මිහි තෙලෙහි තිබෙ  නා
සු භ ද  නැසිය වර තඹර අරණා, තද විය,
ඔවුන් සහ සපදනට මදු දෙමි  නා
දු භ ද  රුපු මහවත්හු ලෙව් වසනා තැන තැන,
ගියෝ මහ වනලැහැප් වැද සෙදී  නා

32 පෞ ර  සුසිරි තෙලු'ඹ'ලින් දිනු ලකලා, වනුපුර
තඹර කර මැද දිලෙන නිති විපු  ලා
තො ර  නොවම ගුණ සුවඳ පිරි නිමලා, දස රද,
දහම් පිවිතුරු මුව රඳිති අව  ලා
ස ර  අටට සිප් කොමල දලිනුදුලා, සත එවන,
පතල මහ මෙත් කෙමි සිරිනි බබ  ලා
ව ර  මිතුරු නෑ සපද තඳ කරලා, දිලුමෙන්,
කමල සිරි ලදි එ රජ කල් සිය  ලා

33 ස ත ර  වත සර රුඳු මුව තඹරු, සිරිසඳ,
නිතර විසු වර රුසිරු උර මැදු  රු
ස ත ර  සදහම් තබා සිත අතරු, දුසිරිත,
දුරින් දුරු කර ලමින් එක පැහැ  රු
ස ත ර  අව දුක් මුලින් සිඳ උදුරු, මොක් සිරි,
ලබනු වස් පින් කර වැජඹි නිත  රු
ස ත ර  සහරාවතින් දන නිතරු, තුටු කර,
රජ කරණ සඳ එ රජ නර වප  රු

## රද බිසව

34 මෙලෙස කළ දිය ත  ද
එ රදු ට උතුම් ගුණ බ  ද
දූ වන කලිගු ර  ද
සිසෝ රුවතක් වීය මන ත  ද

35 සුරගණ පරදව  න
එ බිසව රුවැති අපම  ණ
නලලතෙහි වරග  න
සැදූ තිලකෙව් බැබලි හැමදි  න

36 සැමතිරි ලකුණු දෑ    රු
ගුණමයන් සපිරි සිසියු    රු
එබිසවගෙ පියක    රු
රුසිරු සැකෙවින් සියම් විසිතු    රු

37 ව ර ල  මියුරු පිල් අයු    රා–පටු
ත ල ල  ඩ දද රද මෙන් දිලි පව    රා
උ දු ල  දෙබැම තිඹ පත    රා–දිසි
ල සා ල  ගහණ රණ'කුස ලෙස නිත    රා

38 සු ති ල  තෙතිදු වර හර    තා–තව
ප බ ල  දලසෙ දෝ'යදර දිලි තොම    තා
ති ම ල  දසන් සොඳ පෙලි    තා–පුතු
සා ම ල  සදිසි විය එ බිසව මුහු    තා

39 ගෙල  කුමුකු වට සෙ බබ    ලා–පිරි
දු ල  පියයුරු රන්හස පැටි යුව    ලා
අ ල  ගද රද සාර සභ    ලා–වර
ම ල  විය රිය සසා සිරි ගත් උකු    ලා

40 ව ර ණ  සාරෙවු මුදු වටො    රා–දන
දි ලෙ න  උතුරු සිඳු බුබුලු සෙ නිත    රා
ත රු ණ  තැඹිලි මල් අයු    රා–දහ
ම ද න  සතුටු සාර බැබලි තොව    රා

41 සො ම ල  සුපිපි සර සදි    සා–පද
යු ව ල  මලවි රද තුටුසාළ තෙලෙ    සා
නි ම ල  සානසා පලු විල    සා–දිගු
ල සා ළ  ඇඟිලි පෙළ දිලි පද සර    සා

42 ව ර  වදන සු පිරි    සදිනා–පද
ස රු'  ගිලි දල රුදි අම බිදු    ලෙසිනා
තොර  තොව දිලි නිය පෙලි    නා–යස
ස ර  එබිසව රුසිරි සො    වණා

43 හෙ ල්  මැලි සිවුමැලි සොම    ලී–මිහි
ප ල්  මිහිලොල් ලොබ සාළ පුල්සාම    ලී
දු ල්  සිරිසාල් දිනු ලසා    ලී–හැම
සා ල්  මුදුනන මල් සාඩමෙන් බැබ    ලී

44 සු ර තු ර  මනහර  හරණා–යදි
තු ඳ සර  නිරතුර දෙන සර  තිලිනා
ග රු ත ර  පුරඳර  අගණා–යුරු
හැ ම ව ර  එකිසව ඉසුරෙන්  දිලුණා

45 ස හ ත  පමද සිරි  හිරිඳු–සරි
අ න ත  ගැඹුරු පැනයෙන් ලොවැ  පසිඳු
ස ම ත  සතුන් මත  සුසැඳු–මිණි
ස හි ත  කිරුළ මෙන් දිලි එම  රජඳු

46 සි රි ප ති  පුරපති  නතනා–ගුරු
තු රු ප ති  පසුපති රතිපති  සුමනා
ග ණ ප ති  සහ මෙමුරු  ගනා–හැර
නො සමති  කිමට වෙත අය  ඇගුනා

47 මෙ ලෙ ස  රුසිරු ගුණ  ගහණා–සොඳ
එ කි  ස  ව අග මෙහෙසුන් සර  පෙමිණා
ස තො ස  ව සුරපති  සිරිනා–තොව
වෙ න ස  සඳේ ලප ලෙස විසු දෙ  දෙණා

48 පු ව ත ර  එවගු නම් තරවර  ණා
ම න හ ර  කිසව, සමගින් යෙහෙ  නා
පි ය ත ර  එපස්, කාම් සැප නොම්  ණා
සි ත යු ර  විඳින, කල සහතොසි  ණා

## දරු උපත

49 ය ස  පිරි එ රජු, වෙනුවට සතු  ටා
කු ස  දරු ගැබෙක්, විය එ කිසව  ටා
කි ස  වුන් එ බව, කි සාල රජු  ටා
අ ස  මින් සතුටු, තරතිඳු එවි  ටා

50 රු ස්  කරවමින්, නුවරුන් සිය  ලූ
දෙ ස්  තොව එ පුර, සරසා ලකු  ලූ
තොස්  වඩවමින්, සතියක්ම මූ  ලූ
වි ස්  තරව ගැබ, පෙලහර සාර  ලූ

51 පි ළි  මිණි මදොස, තුල දිලි නොම්  නා
පි ළි  කිඹු රුවක්, ලෙස බබල මි  නා
පි ළි  සිඳ පටන්, දසෙසාඩ මසි  නා
වි ළි  රද පැහැර, එ කිසව කුසි  නා

52 නි ක් මුනු සඳක් සේ මේ ගැබෙ සින්
දු ක් නො ව කිසිත් සුබ යෝගය සින්
එ ක් කුමරියක් පසුත ව සැණෙ සින්
දු ක් සිත මිදිය දෙගුරුන් තිසැ සින්

53 තු ට වත කුමරි වැදූ එ බිසව වා
සා ට සුතු නිමවමින් පෙර ලෙස වා
ඉ ට කිරි මවුන් තොරා සොඳ වා
සැ ට දහසක් ම සලසා එ වි වා

54 පි න් සර කුමරි, යට එ උපන් දු
ර න් කිරි දෙමින්, සුබ මොහොත් යො දු
ත න් රැකාවලුන්, තබමින් තො ම දු
අ න් සියලු දෙය, සිදුකර එම දු

55 වි සි තු රු දවල, සහයට සුස දු
තු බු තු රු අතගි සිහසුනෙහි මැ දු
යු ග දු රු මුදුන, බබලන දිනි දු
ලෙ ස ග රු එ රද, වැඩ හිඳ එ ස දු

56 වෙ ද ස ත නිපුණ, බමුණන් මහ රු
ත ම වෙ ත ගෙන්ව, මින් සිත අයු රු
සෙ ද බ ත බුලත, දීලා'තතු රු
ඇ ති සි ත මෙ ලෙස, කි එ තර වි රු

57 ස ත ර වෙද සොළ පැමිණි බමුණනි ම දුව ඇඟ ඇති ලකුණු බලමි න
වි ත ර සාර සුබ අසුබ වෙත වෙත සොයා තෝරා සතර නැණැසි න
ල ත ර සැසා හැර මෙ මට කී සඳ තොපට තිබෙනා කුසල් සාරමි න
නි ත ර රැක්මට මහත් දන දෙමි තිලිණ සොට එ ම ගණිව් විගසින

## බමුණන්ගේ අනාවැකි

58 මෙ ලෙසට එ වගු ර ද
පැවසූ සඳෙහි මන න ද
දදවරහු නිවර ද
සතර නැණැසින් බැලූ මෙම ලෙ ද

59 එ කුමරියගෙ සොබ න
නිසැකින් ඇඟ ලකුණු දු න
නැවත ද පසුත වූ න
නැකත හෝරා රැස ද සොයමි න

60 බොලු පඩිලා එ තැ ත
ගැණිගෙණ සුබා'සුබ දූ ත
එ රදහට පිය ව ත
මෙ සේ පැවසූ අගුණ මතු ව ත

61 හිමි, සඳ එ කුමරි හොමො මතක ලා
පිරි, සඳ මෙන් සොමූනග පන් ස ලා
තො ම හිඳ මෙ පුරෙන් ගොස් සැහවි ලා
රැදු, තද මිගිදෙක් හට අසුවෙ ලා

62 එම, සි රද සරණ ව තො සා
සැම සැප හැර මහ වන මැද වැ සා
කම, නැති දුක් විදිනෙය පව ති සා
මෙ ම, අගුණය පැමිණෙසි තො ව ල සා

63 දද වරහු මෙ ලෙස ට
අසා කි බස් එ රදු ට
තද දුක් වැද සිත ට
මෙ ලෙස සලක තැණින් එම වි ට

## රැකවරණ

64 සැහවී තොයන ලෙ ස
එක් ටැඹ ගෙයක් තො ව ල ස
සදවමින් කර උ ස
ලමින් රැකවල් අවට දස දෙ ස

65 එ විමන තුළැ ලමි න්
තො දක්වා හැම පිරිමි න්
එ කුමරිය වඩමි න්
සුරැකා ගන්නෙමි සිතා ල පෙමි න්

66 වඩු සත සොළ පැමි ණි
වඩුවන් රැස් කරවමි ණි
එ රද තුම ගුණ මි ණි
ඇරඹි විමනක් කරන විලසි නි

67 තො ම දු රු රජ විමනට එක් පෙදෙස ක
පි වි තු රු කර බිම් සදමින් විගස ක
වැ ඩ ක රු මොහොතක සිටවූ ටැඹය ක
පු ර ළු රු පහයෙව් සැදවූ විමන ක

68 සො ඳු රු  විලස හැම සටසුතු තිමම්  ත
වි ඳු රු  ගිර සෙ එහි අවටින් බබල  ත
ප වු රු  පදනමුත් බඳවා තරයෙ  ත
අ තු රු  තැති ව මුර සිටුවා හැත හැ  ත

69 අ ප ම ණ  කිරි මව'හණ සහ කුමරි  ද
එ වි ම ණ  තුළ ලා වැඩුමට යුතු ලෙ  ද
තො ප මණ  මහ සැප දී පිරිවරට  ද
සු ර කි ණ  ලෙස සැලසී තරතිදු ස  ද

## කුමරියගේ රූසිරි

70 මෙ ලෙ ස  වලා තුළ වැඩෙනා පුර ස  ද
වි ල ස  සොමෙන් වැඩෙමින් එ කුමරි ස  ද
ස තො ස  වඩන දුටුවන් සිරි සාත ලෙ  ද
සො ළ සැ  විරිදි වී යොවුනෙන් පිරිස  ද

71 සො බ න  සානසා ගිරි මුදුනත රහ දෙන රන් මසු  රා
හ ර ණ  සුමුදු දිගුවරලස නිල් ව බැබලි නොව  රා
වැ සු න  අඩක් මේ ගැබකින් සඳුගේ සිරි අයු  රා
න ද න  වේය දුටු දන මන ඇගෙ නළලත පව  රා

72 බ ඹ  සාත දිනු එ සාතගෙ දෙව් දුනු සරි බැම සහ  ලා
නි ඹ  පත මෙන් බබලසී දුටු ලෙව් සත සිත ලොබ  ලා
ර ඹ  පැල වන් යුග පත් තැහැ රණකුස සිරි උසු  ලා
බි ඹ  පල වැනි රතු දෙයදර සම විය දල පබ  ලා

73 ඉ ඳු ව ර  ඉදු නිල් මිණි සරි එ කුමරි දිගු නුව  නා
සි රි ස ර  දෙ අදර දළ දිව් සොමි මුව සර රද  නා
සු ඳු හ ර  දත් මුවරද පෙළ සම විය තිති දිලෙ  නා
පි ය ක ර  තුන් හිර රූදි ගෙළ සක ජය ගෙණ සොබ  නා

74 එ ර ව ණ  සාර සාත මල් දම් වැනි විය ඇගෙ දෙසා  රා
ස පි රු ණ  පියයුරු යුග රන්තිසර රදහු අයු  රා
පි ය ව න  තැබ රන් පියුමෙකි වසා රොදලි නිසා  රා
ස සො බ න  සිහිනිහ මද රද දුනු මිට වැනි පව  රා

75 උ තු රු  එ සාත යොවුන් ගනෙහි පුලින හලෙව් උකු  ලා
සො ඳු රු  වටොර මත රම් රඹ සාද සිරි ගෙන බබ  ලා
උ තු රු  සයුර තැගි බුබුලෙව් සපිරුණු දණ සහ  ලා
මි යු රු  ගෙලෙ'වි දුටු දන මන පිණවන දහ යුග  ලා

76 ර ත හි ලි  දල සුසැඳුනු එ කුමරිවර පද හඹ  රා
ග ත දි ලි  යෙත මෙ බඳු රුවින් ජය ගෙන සාහ් නිත  රා
සි ත දි ලි  වන යොවුන් සයුර සපැමිණ සිටි එත  රා
නැ ත පි ලි  රූ ලිය මෙ සාහට සුර සර හැර ලො'න  රා

77 මෙ බ දු  අනගි ලකුණු දූරූ එ කුමරි සිරි රඳ  නා
නො ම දු  වරඟණින් තළලත තිලසොව් දිසි සොබ  නා
ත රි දු  විලස සාලා සපිරි යොවුනග පත් වෙමි  නා
ප සි දු  ව මුලු දඹ දිවැ තුළ බැබලූ රූ සිරි  නා

78 දි ව ම පු රෙ න්  දපණය සළ නා මෙතෙවිය ලෙසි  නා
න ව දි මු තෙ න්  වැසි නොදිලුන සඳ මෙන් සොමි කිර  ණා
ලො ව පි රි මි න්  නො දූස ම එක් පා ව්මතෙහි වස  නා
සි ව ස ත ව න්  එකුමරි සඳ පස්සාම් රස නොදූ  නා

79 ය හ ලු  ලියන්ගෙන් ඇසු සාල පස් සාම් රස වෙසෙ  සා
සි ය ලූ  ගපෙහි ඇවිලි ගිය රාග ගින්න තෙ ල  සා
ම හ ලු  දෙමව් පියනට වත් ලජ්ජා නැති පිණි  සා
සි ය ලු  ලොවෙහි ගින්නක් නැත රාග ගින්න විල  සා

80 ර ද සො ර  සතුරන් දිය ගිනි යන රුදු බිය මෙප  සා
අ ද ග ර  නා පොළොන් මතඟ සිහ දිවි වග වල  සා
ප ද ගො ර  යක් බූ රකුසන් ගෙන් වන බිය වෙසෙ  සා
සෙ ද තො ර  නො ව රාග ඇල්ම ඇතිහට වෙයි අව  සා

81 ලො ව  ඇති හැම බිය හැම දුක් හැම විපත් ද නපු  රූ
නො ව  ලඟ පැමිණෙයි රාගාලය සාළහට තිබො  රූ
සූ ව  විදෑ විසු එ කුමරි සඳ රාග සිතින් රුදු  රූ
ලො ව  පවතින විලස රාජ කුලයට සාළෙ නිස  රූ

## පලා යෑම

82 එ ලෙ ස ට  කුමරි තොම ද, පස් සාම් රසෙහි තොමඳ,
ඇලුමෙන් උම්තු සාතසෙ කිසිත් නො දූ  නා
ග ඟ සෙ ට  දිනිඳු පවර, අත් හැර විළඹු නිසාර, පත් සඳ
අවර ගිරට පබා රුගෙ  නා
ඇ ය ඟ ට  සිහිට දෙ ගුරු, කිරි මව් සමඟ ඇමති, මූර සාළ
සෙබළ යො බළ, යෙහෙළි අඟ  නා
මෙ යෑ මි ට  සොරා ගෙසින්, නික්මී හැරිය දෙරින් වේ මහ
-ගෙවා ගොසින්, ඇතුළ පුරෙ  නා

83 නි ල ඹ ර තැඟුණු සොඳුරු, උල්කාපත අයුරු,
මැඩගෙන අඳුරු රැඳුරු, මහට පැමි ණා
හැ ම ව ර යකුන් වසත, මහ අමු සොහොන් තිබෙන,
නෙකා ගොර සපුන් ගහණ, එ මහ මිහි නා
පි රි ව ර වෙමින් දිලෙන, හැම තරු කැලන් බැහැර,
හරිමින් තනි ව දුවන, සඳුගෙ සිරි නා
දි ව ස ර තනි ව, කම් සැප ලොබින් එදින,
කිසි බිය නො වී ඒ යන, සදෙනි ලසි නා

## වෙලෙඳුන් හමුවීම

84 නෙ සා බඩු රැගෙන එ විට, වෙළඳම් පිණිස එ රට
සපැමිණි වෙළඳු පෙරට, පැමිණි එ ර ඳූ
දෑ සා එ ම වෙළඳු සොඳට, සතුටු ව, තමන් වෙතට,
කැඳ වූ වෙළඳ දෙටුට, වී ය කිරි ඳු
ඳු සා හැර එවුන් සමඟ, විදිමින් එ කම් සැපත,
ලඑ රට නමැති රටට, යත සෙ පසි ඳු
සැ සා නොව දෙ දෙන එ දින උමයඟ තිසුරු සිරිත,
වන මැද'තුරට පැමිණ, ගියෝ එ රු ඳූ

## මග වැනුම්

85 ස ත් ද ලි නා සල දලිනා කුදු දලිනා දිගු දලි නා
හෙ ම් ද ලි නා කිරි දලිනා සිරි දලිනා සිරි පෙලි නා
යු ග ද ලි නා තුන් දලිනා සිව් දලිනා පස් දලි නා
සැ දි එ ව නා යන දෙදෙනා දුටු එදිනා තුටු සිති නා

86 සො ර සා දි රු රිටු මහරු කුමුකු තුරු එ සාළඟ රු
ප ර ම ද රු එසමදරු තිදර ද රු අගරු තු රු
සු ව ඳ හ රු දවලහ රු පණස වරු මිදි තුව රු
යු තු මෙ තු රු වන අතුරු කුමරිවරා දුටි එ ව රු

87 ලි ය ස බ ඳ තුරු සමුඳ මල් පලඳ සිටි එස ඳ
වැ ද ස ප ඳ එහි තිබඳ මල්හි හිඳ කළු තිත ඳ
සො ඳ සු ව ඳ ඇති තිබඳ වන සමුඳ ඇසුවන ඳ
එ ව න මැ ඳ එ විද විඳ දෙදෙන සෙඳ ගියෝ එ ඳ

88 ම ලි න ව'ලා ලියෙනි වෙලා සිටි ලසාළා රැකිත'ව ලා
ප ල බ ර ලා අතු නැමිලා මුහු සාරලා එම ඉදි ලා
නෙ ද ද සැ ලා සාන එ සාලා බිම වැටිලා තුබු එප ලා
ගෙ න අ වු ලා වෙන අවුලා නොදෑනෙසාලා ගියෝ ප ලා

89 ද ද ති ස රා   එවන පුරා පුරු සිසරා හිඳැ නොව   රා
ඉ දු නෙ ව රා   එපල ඉරා රසය උරා බි මදු   රා
පුටි තෙ ත රා   උනුන් කරා පැන පියරා හඬන ස   රා
කු ම රි ව රා   සවන් පුරා ඇසිනොවරා යන අත   රා

90 ර ඹ අ ර ණා   හිඳැ ගරණා තද සාරණා නෙක වර   ණා
තුටු සි ති නා   රුව් දෙමිනා තිකි රඟණා මියුරුඟ   ණා
ස ර ඟ ග ණා   විඳු මරණා එහි සරණා සබර ග   ණා
දූ ක එ ව තා   යන දෙදෙනා තුටු සිතිනා ගියෝ එ දි   නා

91 නෙ ග ජ රැ ලා   මැද පැතලා මුදුන පලා රැගෙන මෝ   ලා
ස ත එ සා ලා   විකුම්බලා ඇති ලකලා මිහිදු සෑ   ලා
තෙ මු ව සෑ ලා   බිය සාරලා විසු එසාලා නෙක සඳු   ලා
දූ ස නො ව ලා   සිත බියලා දෙදෙන සාලා ගියෝ ව   ලා

92 ම ග දෙ ප සා   සිරි සරසා නෙපුරු රුසා එසා විල   සා
එ ව න ති සා   සිරිය වසා හැම දවසා සිල් විම   සා
හැ ර අ ල සා   වඩන උසා රැකි තවසා නෙක තව   සා
ය ත එ ලෙ සා   කුමරි තොසා දූකා සකසා ගිය තොල   සා

93 ඉ දු රු ස ඳ   මත තන්ද සාළ තන්ද සරමෙ   න්ද
පි පි නො ම ඳ   නෙක කුන්ද අර වින්ද හස ස   න්ද
ඇ ති හැ ම ඳ   පිරි වන්ද සර මෙන්ද දලක   න්ද
දු ටි එ ස ඳ   සර කාන්ද දුක් සින්ද මනබ   න්ද

94 සො ද එ ම ගා   සිටිය ලහා මත මනහා අනෙක ව   ගා
පැ ත මු ර ගා   යනෙත මහා නෙක සරහා කෙළින ර   ගා
නැ ගි ගි ර ගා   කිඳුරු රහා සිටින රහා එම නර   ගා
ය ත මෙ ර හා   කුමරි මහා නොව මලහා ගිය එම   ගා

## සිංහයාට අසුවීම

95 මෙ බ දු   වන සිරි බලා එ කුමරි වෙළඳ දෙටු සමගින් එ   දූ
ප සි දු   වුන මැද සුදුසු ඉඩමක රැ තවාතැන් ගත් ස   දූ
තො ම දු   තද රුළු පරළු බලතර මිග රදෙක් අවුදින් සෙ   දූ
වෙ ළ දු   දූකෑ උන්තුරට සෙන හඬ විලස නදසාරු පිනු ස   දූ

96 එ ත ද   අසමින් වෙළඳු බිය ගෙන බිසව ඇරලා ගිය ක   ලා
තෝ ම ද   රුසිරෙන් සුරගණිය මෙන් දිලෙන
එ තරුණි බිසව දූකා   ලා
සි ර ද   රති සැප විඳිමි සිතමින් පැමිණි බිය හැර පසන් සාර   ලා
එ ල ඳ   නම පිට ඉඳුවමින් ගෙන ගොසින් ගිරි ලෙන තුලෙහි   ලා

97 ර ති  සැපත විඳ එ ලඳ සමගින් සත් දිනක් එහි වසමි  තා
රැ ති  ගොදුර කන පිණිස පිටතට යන්ට නික්මී සැනයෙ  තා
නි ති  නොයන මෙන් එ කන වෙත'තක ගල් දෙරක්
එහි වසමි  තා
නැ ති  සියලු උපකරණ ගෙන දී බිසව තුටු කරමි  තා

98 ස තො ස  විය යුතු තමන් සිය කුල සිහ දෙනුන්ටත්
ලොබ නො සොට හැ  ර
එ අ ස  යන එන ඇතුන් දුටුවන් ගොදුරු ආලය
සිතිනි දුරු ක  ර
නි දෙ ස  දෙවඟණ සිරින් බබලන බිසව සහ
සිහ රදහු ගොරන  ර
මෙ ලෙ ස  තිරිසන් මිනිස් එ දෙදෙන සඳේ ලප ලෙස
විසූ පෙමක  ර

99 ක රු  මියෙන් පෙර මෙ ලෙස මිහිඳුව අසුව වසනා නිසව  වා
ද රු  ගැබෙක් විය මහත් පින් ඇති සිහි ව මවු පිය එම වි  වා
දු රු  ව ආ බව සිනා ඔවු'නැර ඉනා තද දුක් විඳින කල  වා
දූ රු  නෙ දෙල දුක් ලකුණු එබිසව දරු පතුව වන විලස  වා

100 සො ඳු රු  සිහිනිඟ ඉනා දළවිය සුරත'දර සුදුමැලි  වියේ
ම හ රු  රන් සඳ ලෙසට බැබළුන පිරි සිරුර සුදු මැලි  වියේ
න ඹු රු  වන් වන මලානිකා විය පියයුරන් පුඹු කළු  වියේ
බ දු රු  රති සොළි ඇලුම් මඳ විය දුඹුලැඹුල් රස පිය  වියේ

## දරුවන් ලැබීම

101 මෙ යු රු  දෙලදුක් ලකුණු දැක එම මිහිඳු තැන තැන
ඇවිද වන මැ  ද
මි යු රු  පල වැල ගෙනැත් කවමින් වෙනත් උවටැන්
කරන එම ස  ඳ
එ ද රු  ගැබ මොහොරමින් දසෙකඩමස් පිරීමෙන්
පැහැර විළි ර  ද
කු ම රු  කුමරිය යන දෙ බින්නක් පසුත කාලෙ එම
බිසව මත න  ඳ

102 එ ස ඳ  දෙ ගුරු වර සොඳි  තා– සෙද,
පැ හැ ද  තරිඳු රුස් වන් මෙන් කිර  ණා
සු හ ද  කුමරුනට සොබ  තා–යලි
පෙ ම ද  ව බන් දී ලා සත් මසි  නා

103 කු ම රු ව  සිහබා නම්  තා–තං
කු ම රි ව  සිහවල්ලිය සත නම්  තා
මේ ලෙසට  නම් ලහ් දෙ දෙ  තා–පුර,
හ රි ඳු ම  සම වී වැඩුණහ සොමෙ  තා

104 සක්විනි මිහි පති සදි  සා–සක්
රුවන ලැබූ සිත තුටු සාර විග  සා
දුක් නො ව මව් පිය සනො  සා–සක්
දෙස මෙන් කුමරුන් රැකිහු ය වෙසෙ  සා

105 සිහබා කුමරිඳු සඳු  වා–වස්,
සොළස සපිරි සඳ ගොස් මවු වෙත  වා
සුරතල් පෙපුලෙන් එවි  වා–තම,
වෙතස අසයි මවගෙන් මේ ලෙස  වා

106 සො ඳු රු  මැණියනි තද  තා–මෙම,
න පු රු  වෙණෙහි නිරතුරු ව ම වස  තා
සො ස රු  ව දු අපි දෙදෙ  තා–පිය,
අ සු රු  නො වන්නට කාරණ කුම  තා

107 මෙ ලෙ ස  ඇසූ විට කුම  රු–යළි
එ බ ස  ට එ බිසව පවසයි මෙ යු  රු
දි සැ ස  කුලග තිලක යු  රු–දස;
දි සැ ස  සදිසි වගු නිරිඳුට මහ  රු

108 දු ව  නොයෙක් සැපතින් වැඩි  ලා–මම,
බෝව  සාරපු පවකින් පෙර මෙ සා  ලා
මේ ව  න මැදට ම වැදි  ලා – විත්,
සි ර  ද හට අසු විමෙන් මෙ සා  ලා

109 දූ න්  විදුනා දුක් නොම  දේ–හැම්,
අ න්  නිම සාර කියනට බැරි මෙ ස  දේ
වෙ න්  ව උපන් බව මෙ ලෙ  දේ – පුත,
මෙ න්  න මෙ කාරණ ය යි කී එ ස  දේ

110 මෙ ලෙ ස  තිසෝවර කී බ  සා–ඇසූ,
නි දෙ ස  සිංහබා කිමරිඳු විම  සා
දි ගැ ස  කොතෙක් පෙර දව  සා–මෙම,
වි ල ස  මිගෙක් සහ පිසුවෙද සො දෙ  සා

111 ය ත  බස කියමින් එක  ලා– ගුණ,
තෑ ණ  බල ඇති කුමරිඳු සඳ ලක  ලා
ව ත  සෙන් යත මෙයා් සිත  ලා– ගෑ ල,
වෙ ත  උවමක් කළෙ මෙ ලෙසින් තුමූ  ලා

112 මි ග ප ති  ගොදුරට ගිය විට වල  වා
ර ති ප ති  සම වන් කුමරිඳු රුව  වා
බ ල ඇ ති  බව දූත ගැණුමට ඔහු  වා
බ ර ඇ ති  මහ ගල් දෙර හැර පිට  වා

113 දු ර  ට පතස් යොදුනක් ගොස් නො ලසි  ත
පෙ ර  වරු අවුදින් ගල් දෙර වසමි  ත
පෙ ර  සිරි විලසට හුන් සඳ ගිරි ලෙ  ණ
ගො ර  සී රද සපැමිණී ඒ නො ම දු  ත

## සිංහයාගෙන් වෙන් වී යෑම

114 මෙ ම ලෙ ද  තම බල විමසා එ දි  නා
පෙ ර ලෙ ද  සී රද ගොදුරට ලොබි  නා
ගි ය ස ද  වන මැද දිනයක සෙදි  නා
ම වු ල ද  තැගණිය යන එම දෙ දෙ  නා

115 ත ම  දෙ කරත හිඳුවා නික්මෙමි  නා
හැ ම  බිය ඇති එම වන පෙත මැදි  නා
නොම  දුරු මගෙකින් දිවගෙන ගොසි  නා
ග ම  කට සපැමිණී මිනිසුන් වස  නා

116 තො ම තු රු  සෙවනෙහි දන ගණ හැසිරෙ  න
වි සි තු රු  මහ තුගයක් දුක බබල  න
එ කු ම රු  එම රුක් සෙවනෙහි උන් තැ  න
තො ර තු රු  අසමින් ගම් වැසි හැම දෙ  න

117 එ ක ල  බිසව මගිල් රජුගෙ පුත් වන කුමරෙක් ගරු ත  ර
ප බ ල  සෙනෙවිරත් තනතුරු ලබා වැජඹි එ ම පුරව  ර
ල ක ළ  බිසව කී තොරතුරු නො වරදවා ඇසු එ ම ව  ර
සෙ බ ළ  නොනොක් ගොස් එ පුරට සෙනෙවි රදුට සැලකළ ව  ර

118 එ බ ස  අසා ඉතා සතුටු සෙනෙවි රදහු එ පුර සම  ත
බෙ රැ ස  විලස සම් සාරවා ලද පස් මල් ඉසැ මහව  ත
නි යැ ස  මිතුරු නුවර විලස සැරසිලි කර නිමවි අත  ත
එ ලෙ ස  වෙනෙන් ආ තුන්දෙන මගුලෙන් කැඳවා තම වෙ  ත

119 ස රි ච ත  සුරඟණ එ බිඳව රුවන් රුසෙක සිටුවා සෙ  ද
සි රි  ත  විලස සෙනෙවි රදුට අබිසෙස් කරමින් මනන  ද
පි රි ය ත  කර තිරිසන් භව අසුව පලමු විඳි දුක් ත  ද
සි රි කත  සිරිපති විලසින් එ දෙදෙන සැප විඳිනා  ස  ද

120 ගො ඳු රු  පිණිස ගිය සී රද තද කර පැහ ඇතුන් මැද  ච
රු ඳු රු  තියෙන් ඔවුන් සිරස පලමින් මොල කමින් සොඳ  ච
ගැ ඹු රු  කෙසර තද කරමින් සතුටින් පිණ පිණා එවි  ච
සො ඳු රු  තමන් බිසවුන් සහ පස්කම් සැප විඳින ලෙස  ච

සිංහයාගේ විලාප

121 වි ග ස ච  ගිරි ලෙණට අවුත් බලා දෙ දරු සහ බිස ව  ද
එ ම වි ච  නො ම දක බලවත් සෝ ගිනි ඇවිලී තම ග  ද
ද ස ත ච  වැනි වැනී බලා නෙත් කඳුලැලි ගලා නොම  ද
ත ම හ ච  ඉවසිය නො හැකි ව විලාප බස් කියයි මෙ ලෙ  ද

122 එ  ක,  දිවි ලෙස විසු මකිසෝ ස  දා
නෙ ක,  සුරතල් බස් දෙන හැම ස  දා
ස  ක,  පුරු මඟ දරු දෙදෙනා සො  දා
කි  ක,  ලක දකිනෙම් මම සිත ලෙ  දා

123 අ  න්,  තිරිසන් සත් ලොව නො කළ  දේ
දු  න්,  කළ මට ළය දුක් විය ත  දේ
සු  න්,  කළ හොත් නියමය මෙම ලෙ  දේ
ඉ  න්,  කාටත් දුක් පැමිණෙයි ත  දේ

124 අ  ර,  නෙහි පවිටෙක් නැත මා තු  ලා
පෙ ර,  පවකිති'පිද තිරිසන් කු  ලා
සු  ර,  ගත වන් බිසවට ලොබ වෙ  ලා
ගොර,  තර දුක් විය මට දුන් ක  ලා

125 ම  ත්,  වුණ මම කම් සැපතෙහි අටි  න්
ක  ත්,  සමඟවැ වැසලා මිත තුටි  න්
ල  ත්,  සැප දුන් නැති වීයෙහෙම් පිටි  න්
අ  ත්,  පිට'පව පලදුන් සැටි දුටි  න්

126 වෙ ල,  දකු සහ යන බිසවක් දු  කා
දු  ල,  රු දුලට අසුවී නො වල  කා
එ  ල,  දුන් ගෙන'වුත් කම් සැප ත  කා
බ  ල,  ගිරිලෙණ ලා'හර දී රැ  කා

127 උ න්, සමගින් කම් සැප විඳිම් නා
අ න්, අප කුල සි දෙනුන් හරිමි නා
ම න්, කල එම නො දූනුම්කම් ගැ ණා
දූ න්, මට පැමුණුණි දුක් අපම ණා

128 ඉ න්, අප කුල සි දෙනුන් දුටු තැ තේ
උ න්, වත කෙ සෙ බලතෙම් දෙවිය තේ
පි න්, නැණ මඳ, තිරිසන් ගැ තේ
දූ න්, ලිංයා තිර නැති වග නො දූනු තේ

129 පි ය, සුතනඹුවන්වත් නැත මෙ දෘ
පි ය, යුරු සිඹිතෙමි මම කවර දෘ
ගි ය, කල අඹු දරු මා හැර සෙ දෘ
වි ය, මට මේ දුක් සිහබා ස දෘ

130 තු රු, පති සස ලප ලෙස සඹගි තේ
ද රු, දෙදෙනෙක් වත තුරු වසම් තේ
දු රු, කර ම වෙතට තුබු තද සෙ තේ
කරු, මය ම යි මගෙ උන් සැහ වු තේ

131 සැ ම, සැප දෙන හිමි හට කර ම දෘ
ස ම, දරු දසයක් ඇති වත් ව දෘ
ක ම, නැති හොර හිමියෙක් දුටු ස දෘ
පෙ ම, වෙති කත් ඔහුට ම වැඩි ත දෘ

132*අ ප, සිය කුල සි දෙනුන් සිටිය දී
කැප, ගෙණ බිසවක් සමගින් යෙ දී
අ ප, කල නො තරම් කම් මෙ ලොව දී
ස ප, ලව අත් පිට දුක් වන ල දී

133 මෙ ලෙස එම සී ර ද
වියො දුක් කිය ඇති ලෙ ද
ඇවිද මුළු වන මැ ද
නො දූකැ දරුවන් සමග බිස ව ද

134 යලිදු ඒ ඒ තැ න
තුරු ලිය ලැහැබ් බලමි න
ල සොවින් වෙවුලමි න
කියයි දුක් මුසු තෙපුල් මෙලෙසි න

* මුල් පිට පතෙහි මෙහි අංකය 133 සේ යෙදී ඇත.

135 තුරු හිමි වලඳමිනා, ලිය ලිය, ලෙල දෙන අතු අති නා
සා මුව දරු රැගෙනා, බිගු රැවු, සුරතල් පිය බසි නා
මුව රඳ මුදු දසනා, පුල් මිල්, මනහර දුල් වකි නා
අඹ පල පුශ තෙනෙනා, දිගු තිල්, දල නෙත'ගින් වැහෙ නා

136 පිණි බිදු නෙත් දලිනා, පරපුටු, නද හඬයෙන් හඬ නා
තුරු ලිය දුක නොමිනා, සිත් පිත්, නැති නොප මදුක ගැ නා
මෙලෙසටි හඬන තැනා, මම දුන්, බිසවුන් දරු දෙදෙ නා
නොම දුක මිගෙ නෙතිනා, කොලෙසක, වැවෙමි දිවි ලදි නා

137 මෙම හිමි'තුරු නොමිනේ, සුදු වෙල, තුරු සළු හැර ලමි නේ
දුල කොක වැල සොබනේ, මුතු හර, කඩ සර ඉසනෙ තැ නේ
රඟ දෙන සල සලනේ, සිකි පිල්, වරල උනා ලමි නේ
ගඟුලැලි කඳුළු මෙනේ ඉස ඉසා, වලපිත ගිරි ලිය නේ

138 නොපි මිගෙ දුක දුකලා, සිත් නැති, මෙලෙසට හඬනක ලා
එක දිවි ලෙස වැසැලා. සතතින්, පස් කම් සැප විඳ ලා
මට වියො ගිනි දීලා, අඹු දරු, සැඟවී මා හැර ලා
ගිය බව සිතෙන කලා, එකතින්, නො තිබෙයි ම පණ න ලා

139 ති ල් දිගු සිනිදු කෙසා, සෙව'ලැති බිගු පෙල සුතිල ව සා
ලො ල් වන තිලිපුලැසා සරණින මුව රඳ දසන රු සා
දු ල් වැළ කුල සරසා, තනහස, රල සළු පටිනි ව සා
වි ල් කන මෙවන තිසා, සිටි නොපි ම සුගඹු තුදුටු දු සා

140 මෙ වෙනෙහි විසු තිතිනේ, බලතර නද නෙද නෙදෙවිය නේ
වියො දුක් ගිනි කදිනේ මට වන් හදවත දසි තදි නේ
නිදි මත නැත එයිනේ, විකකුත්, බඩගිනි මට නොදු නේ
නොකිනැකි නද දුකිනේ, මගෙ දිවි, නොරුකෙයි අද මෙයි නේ

141 උර පිය පලු සමගා, පුල් මල්, වැද එන මඳ සුළ ගා
ගොර ගිනි සිළුසෙ ඇඟා, වැද දසි, සඳ ගිම දුනින ර ගා
මසු'රඩ ඇත විහගා, නද වනි, දෙ කනට යවුල් ර ගා
මගෙ අඹු දරු, නො ලගා, විය ඉන් මට වනි මේ දුක් සු ගා

## ගම් නැසීම

142 සී ර ද මෙ බඳු වන සෝ දුක් තෙපලමි න
බෝ ලෙ ද මිග හිමය මැද ඇවිද නැන තැ න
කෑ ම ද නො ලැබ සිය ගත දුබලව ගොසි න
ඒ ල ද තිසා පිටිසර ගමකට පැමි න

143 සි පි ස ද  එ ගම් වැසියෙක් දුක එ සි ර  ද
කි ය වැ ද  සිතට එ කිසව තතු පැවසි සෙ  ද
ම න ත ද  වෙමිතෝ'විට ඔහු හැර ගොස් තො  ද
සි රි ල ද  එ පුර වට සැදි ගම්වලට වැ  ද

144 සෙ ත  සඩ සිය ගණන් එක වීට ගසත මෙ  ත
පැ ත  පැත තැනින් තැත ගොස් තද කරණ දි  ත
ද ත  ගත කන් පැලී වලහෙනු'තුරු ගොසි  ත
තැ ත  තැනා මළ හ ඒ ඒ ගම්වල තොම්  ත

145 ප ටු නු  යම් තියම් ගම් එ දනව් වල  ට
වැ ටු නු  සෙනෙ'ව් බහු වැදූ ලොව තසත වි  ට
ගැ ටු නු  දනෝ එකතුව ගොස් එ නුවර  ට
සි ටි නු  බැරිය මන කොලහළ සාළ කල  ට

146 යු ග ඳු රැ  මූදුන බබලන සරකර අයු  ර
පි වි තු රැ  තෙදින් හැම දන තඹර නද ක  ර
වි සි තු රැ  සිහසුනෙහි වැඩ හිඳ ගෙන පව  ර
බු වි සු රැ  තුමා මෙ ලෙසින් ඇසිය පෙම ක  ර

## වැසියන්ගේ පැමිණිලි

147 ග ම  ගම වැසි දනෝ මෙ පුරට ඇවිත් සෙ  ද
ති ම  තො ව හඩා වැලපීමෙන් දුකින් ත  ද
කි ම  කොලහල කළේ මගෙ කිසි දෙසකට  ද
ම ම  එ ම අසමි ඇති සැටි කියව කී ස  ද

148 හි මි ස ද  තුඹ දෙසෙක් කිසි කලෙක වත් නො  ද
මි ග ර ද  තුමෙක් හිමයෙන් අවුදින් මේ ස  ද
න ද න ද  කර අප රටවල සත් තොම  ද
එ හ ලෙ ද  වැනසූ බව බැරි කියනු මහ ර  ද

149 අ ප දෙ ගු රැ න්  අප මයිලන් මුතුන් හු  ද
අ ප අ ඹු ව න්  අප දරුවන් සොහොයුරැ  ද
අ ප මි තු ර න්  වැඩතරුවන් හැම දෙන  ද
නැ සු සැ ටි දු න්  සොයි ලෙසකින් කියනෙමු  ද

150 අ ප ම ණ  ඉසුරැ ඇති දද වෙළඳ ගොවි කු  ල
හැ ෂ ද න  වනසමින් අප ගම් අගම් කා  ළ
වි ද ස න  කර තෙරපු බල මහ බල සෙබ  ළ
දූ ටු තැ න  මැරිය පෙන්වාලා තමා බ  ල

151 පි රි ස ද  සොමි උවන පියසුරු රණ තිස  ර
මි ද ර ද  දුත්මිවෙ'චි මැද දෙස ඇති පව  ර
සු ර ර ද  ලියෝ'චි රුසිරු'ති අඟණන් මතා හැ  ර
මි ග ර ද  ගම් මැදට පැන මැරිය තද ක  ර

152 ක ත' බ ර ණී න්  සැරසූ කිරි බොන ලද  රු
පැ න  අ වු දි න්  කද කර මිරුවසි කෙස  රු
ගු ණ  නැණයෙන්  අග පත් හිමි සඳ මහ  රු
වෙ න  ති රි ස න්  නැසූ වග කියනු ද කවු  රු

153 ලෝ ව ර කි නා  පින්වත් තිරිඳුනි දූන  ව
මෙ ම ලෙ සි නා  නැසූවොත් අපගෙ මුළු ර  ට
කි ම ලැ බෙ නා  පල ඉන් මෙ බිය දුරුකො  ට
නො ව ල සි නා  සෙන කල මැනව මෙ අප  ට

154 මෙ ලෙ ස ට  ගම වැසි නැම දෙන එ රදුට සැල කළ විනසි  න
ලෙ ව න ට  පැමුණුණු ඒ බියට වනු රද තුම තද ළ සොවි  න
සු ද ය ට  ගොස් මිහිඳු මරණ විලසට රුස්කර මැතිග  ණ
මො න ව ට  අණ දී වදුළ ඉස්ක මෙ ලෙස ලොවට පෙමි  න

155 බ ල න ර  යුද කර පෙර දිනුමට සෙනෙනැති ඇමතිවරු  ති
රු දු න ර  මින රදෙක් අවුත් අප සතු රට නසන බැවි  ති
පු ව ත ර  සිවුරඟ සෙන් ගෙන ගොස් යුදකර *එහු මරමි  ති
දු රු ක ර  එවි අප රට පත් විපත් එ බිය නොප බලයෙ  ති

156 ස සෝ බ න  රදු වදහල බස අසමින් මැතිවරු නැම දෙ  න
එ ම ස න  යෙන් අණබෙරකර මහ සෙන් රුස් යන විලසි  න
ස ර ස න  සැර තඹු අඹයටි සඳනක් ඇ නත'වි රුගෙ  ණ
අ ප ම ණ  සිවුරඟ සෙන් සහ තිරිඳුන් වැදූ අවසර ගෙ  ණ

157 ප ස තු රු  ගොස කර පෙරටුව ගොඩ යන සිඳු රද විලස  ට
යු ද ක රු  මහ සෙනග ගොසින් එම සී රද හිට පියස  ට
නො ම තු රු  වට කරමින් අවිහසන් අවි ගැවසෙන තරම  ට
වී සි තු රු  අවි ලෙළවා සිය දහස් විදුලි ගසන රඟ  ට

158 ර ණ  බෙර කරවා රුදු රන ඔල්වරසන් දෙමින් කුරි  රු
වස ණ  සුවහස් ගසන විලස කල රණ නොස අසා නොස  රු
ව න  මැද ඔත්තලින් නැගිට කර බුරවා සොඳ විසිතු  රු
පැ න  අහසට ඔබමොබ බමනා කරු සිය විදුලි අසු  රු

---

* එහු

159 ප ල කරමින් සි රද විකුම් තද කර වැද සෙනඟ මැද ව
දු ල තර ඇත් අස් සමඟින් දුටු දුටු සත මරණේම වි ව
බ ල යුදයෙන් සිත් බිය ගෙනැ කටු බැදිවල දැනැ විඟස ව
එ ල වා ගෙන එනැ යි සිතා පසු බලමින් දුවන කල ව

160 සි ර දුට අසු නොවී සිපිය ඉතිරි හඳුන් එන බව දැ ක
සි ර දුම ය යි සිතා ඉතා තද බිය ගෙන දිවි නොව ල ක
වෙ ර ඇඳි වත් කවු දූවටී ඉරී රුදුණු බව්ත් නො දැ ක
දු ර ට ගෙ: සින් වැටී ගත්තු මරණින් ගැලවී වැදූ දු ක

161 මෙ ලෙ ස ව කටු ඇනී අයෙක් සියල් සිරුර ලේ ගාගෙ ණ
සි න දු ව සන් පැළුණු අයෙක් සමහරු අප නෙ වතුරෙ ණ
වි ග ස ට දුව වැටී අයෙක් අත පය තුනවිය බිඳගෙ ණ
කැ ල ය ව වැද ඒ ඒ තැන සැඟවී සිට මරණ බියෙ න

162 දැ ල දි බරණ ඇඳි වත් අවි දස’තුරු තැන තැන දම්මි න
මු ල දි දෙඩා ගිය සව මැත සිතා තදින් ලජ්ජායෙ න
කොල අතු ඇඳ ලේ පෙරමින් ගිය ගිය තැන්වලින් සෙමි න
ශු ල වා ගෙන දණ පණිණක් එක තැනක්ව රුස්ව සොදි න

163 වි ය රු වැටුණු අය විලසට කිසිවක් නො ම දැන එමි වි ව
රු දු රු ලෙසට කඩා වැළප ඉලවි විළම් දී එ ම වි ව
කො ස රු සුදෙන් මැරුම් නොකා ආ බව සිතමින් බලය ව
සො දු රු නිරිඳු වෙතට අදිත් සිරි දද වැද කිවු මෙලෙස ව

164 මි ග කියා සිහ යුදට ගිය සෙබළුන් කොටේන් එක සෙබලෙකු ත්
මි ග රදුගෙ ඉදිරියට යන ලෙස අබියකුත් නොත් බිය කොහෙ ත්
මි ග පතිහු තද අසා දෙ සවන් පැළී මිලහුය නොයෙක් ස ත්
මි ග රදුට අසුවෙමින් මැරු ඇත් අස් මිනිස් ගණනක් නොමැ ත්

165 ශු තු රු වුණු අපි දිද් ගෙ සින් මිහ කටු ලැහැප්විල වැදී ලා
ව තු රු අබරණ නත’පි ද සත්‍ුරු තැනි න්තැන මිහ දමා ලා
සි රු රු සිදූ බිඳූ ගොසින් තැන තැන පැහැර ගල් මුල් ඇනී ලා
සි වු රු පෙරවූ විලස රත් විය මෙ අප ඇඟ ලේ රැඳී ලා

166 ලොවට අගපත් හිමි සඳිනි පඩි නොලැබෙතත් අප හැමට අදසි ව
අ ප ට බැරිමය යුද කරන්නට තද විකුම් මිග රදකු ලඟ සි ව
නු ඹ ට අපගෙන් වැඩක් ඇතහොත් කුමට ඇරියෙද මෙබඳු සටන
දූ න ට මිගිඳකු ලවා අප මැරවුමෙන් වන පල මොකද නිරිඳු ව

167 මෙ ලෙස සැල කල ස	ද
සිහ යුදට ගිය මැති ස	ද
රද සිතට දුක් වැ	ද
ඔවුන් තුටු කර තෙපුල් දී සො	ද

168 සැර පිටත ඔවුනැ'	ම
මැතින් ගෙන්වා එවලෙ	ම
ලෙව් සතට කර පෙ	ම
මෙ ලෙස පැවසී වදන් මතර	ම

169 මැති වරුනී මසු දහසකින් බැඳි පියල්ලක් ගෙණැ තබා ඇතුපි ට
අ ති දරුණු මිග රදුගෙ ඉස සිදැ යමෙක් ගෙණවුත්
දුනොත් මෙ අප ට
ච ති සුරුද සහ මෙ රන් දහසද ඔහුට දෙන බව කියා තුටුවිකො ට
ඉ ති සියලු වගු රටෙහි අප සතු ලවව් අණ බෙර ඉතා විහස ට

## සිංහයා මැරීම

170 මැති සඳහු මෙ ලෙසි	න
ලැවූ අණ බෙර අසමි	න
එ මිග රද පුත් ව	න
සිංහබා නම් කුමරු විගසි	න

171 ගොසින් තම මවු වෙ	ත
අණබෙර ලැව් එ පුව	ත
දන්වා ලා තැව	ත
මෙ ලෙස පැවසී වදන් තොම රු	ත

172 අ ම් ම මම ගොසින් සී රදහු මරමි	න
දූ ම් ම හිස ගෙනැත් වගු රදූ දක්වමි	න
නි ම් ම නැති නොයෙක් යස ඉසුරු ලබමි	න
ර ම් ම වත සුවෙන් දවසරිමි කී තැ	න

173 එ බසට මිගිඳු වෙ	ත්
සිත ඇති ඉතා බලව	ත්
බිසෝ සඳ යනප	ත්
මෙ ලෙස පැවසී පුතුට පෙම යු	ත්

174 පු ත එ ලෙසින් ඇතත් තොප බල විකුම් ස	ර
තැ ත දෙ ලොවින් වැඩක් මැරුවොත් පිය කොස	ර
න ත ඉසුරෙන් පිරුණත් එම වෙයි තොස	ර
සි ත තබමින් මෙ වග නොයය යුදට එ කොස	ර

175 මෙ ලෙ ස  එ බිසව දෙ වරක් ම නවතමින් සිටි සඳ එ කුම  රු
එ ලෙ ස  තෙ වැනි ව ලැවූ අණ බෙර අසා නොජ මවටත් සො රු
ස තො ස  වී එම අණ බෙරය නවතමින් සපැමිණ රජු කා  රු
සි යැ ස  ලෙස රැකි තමා පිය වන සිරදු මරණෙමි කිව  රු

176 නි රි ඳු  එ බසට පිණා සතුටින් සුහද කුමරුනි විකුම් සරුව  න
මි ගි ඳු  හිස ගෙණැ දුනොත් මෙ අපට සෙනෙවිරත්
          තනතුරුද සමගි  න
තො ම ඳු  තෙ සා සැව් ඉසුරු දී තොප තුටු කරන්නෙමි
          කී සඳ එ නර  ණ
ප සි ඳු  එකුමරු නිරිඳු පදසර නැමැදූ අවසර
          රැගෙණැ විගසි  න

177 පි වි ස  වනයට එ සී රද දූකැ වරෙන් සිහ රද ළුදට විගසි  න
කි බ ස  අසමින් ඉතා සතුටු වැ මිගිඳු එ කුමරු ළහට එන තැ න
වි ග ස  විස පෙව් කරල් හීයක් රැගෙණැ කෙසරුට
          විදපි සරො සි  න
එ ලෙ ස  විදී ඒ සැරය ආපසු බලා වැටුනෙය මිගිඳු කුළුණෙ  න

178 දෙ වෙ නි  වර විදි හී ගසත් එම ලෙසට බිම හුනු බව ද දූකෙ  ලා
තෙ වෙ නි  එකුමරු විදින බව දුටු සී රදහු මෙත් අඩු වෙ  ලා
න දි නි  එ සැරය සිරුර වදිමින් සිදුරු කර බිම හුනු කෙ  ලා
බෙ ලෙ නි  වැඩි සීරදහු එ තැනම වැටුනි සය බල සුන් වෙ  ලා

## සිංහ විලාප

179 සැ ර ප හ රි න්  වෙහෙසට පත් එ සී ර  ද
දූ කැ වි ග සි න්  සිහබා කුමරු මන න  ද
පෙර බැ ති යෙ න්  රැකි බව සිහි කර එ ස  ද
මෙ ම වි ල සි න්  දුක් මුසු බස් කියයි න  ද

180 ම ම,  තොප දකිනට ආවෙමි අ  නේ
කි ම,  මට දුක් දුන්නේ මෙලෙසි  නේ
පෙ ම,  වන තොප දකිනොත් දරුව  නේ
මෙ ම,  තොප දුන් දුක් මට නො ම දූ  නේ

181 සු න,  නා'ඹුවන් දක්නට ආ නි  සා
සි න,  ලැදි නො ව මට විදි බව අ  සා
ව න,  සඳ වන් තොප මවු මියුලැ  සා
සි න,  දුක් නො වැ ඉදිනෙද කොයි ලෙ  සා

182 දු ක්, විදෑ පෙර තොප ඇති කල ස දා
එ ක්, ගුණ ලවයක් නැතිවම හ දා
දු ක්, මට දුන් ඝොරතර ලෙස අ දා
ම ක්, කර ඉවසමි දූන් පුත ස දා

183 එ ම, මිග රද මෙලෙසින් කී ක ලා
කු ම, රිදු සිහබා නම් දුක් වෙ ලා
ත ම, අත තුබු දුනු හී බැහැර ලා
ල ම, දිය අත ගැසමින් අසු හෙ ලා

184 පෙ ර, තම මවු සමගින් තුන් දෙ නා
තො ර, නොව රැකි බව සිහියට ගෙ නා
ම ර, ණට පත් සිරදූට වැඩි ඡන නා
ත ර, ලසොවින් හැඩි මෙ ම කියමි නා

185 ගජ කුඹු පළ පලා, බුදිමින් ඉස මෝ ළා
තොම හිඳ වල තුලා, සුතනා'ඹුවන් ලො ලා
ඇවිදින් හුදෙකලා, මරණට පත් වෙ ලා
තිබෙන මෙ නුඹ බලා, විය මට දුක් ද ලා.

186 වන මැද එක ලෙසේ, ඇවිදූ නොමඳ ලෙ සේ
ගෙණතෙක පලරසේ, ලා ගිරි ලෙණ කු සේ
දී අප රුති ලෙසේ, ඇති කලෙ දෙ සක සේ
ඉන් පල දුනි මෙසේ, නුඹට මේ දුක් රැ සේ

187 යක් දරු නිති ලෙසේ, වාවිති දුක් රැ සේ
යක් මවු පිය කුසේ, නො වාවිති ය එ සේ
පෙර සිට එන බසේ, බොරු නැති බව මෙ සේ
දූන් අත් පිට ලසේ, දුටුවෙමි තතු ලෙ සේ

188 මට පිය පිය වතා, මිග රද මැරුවෙ තා
මම ලොව සියලු දතා, ගරහයි තො මදි තා
පර ලොවැ රුදුවතා, සිව් අවසෙහි දි තා
දුක් විඳ තො පමණා, මිදෙම්ද කොයි දි තා

189 අප සිය ඇස ලෙසා, රැක වැඩු තොවල සා
මිග රද ගුණ රැසා, සිතට නොගෙණ මෙ සා
ශිවිස තිරිදු බසා, නපුරක් කළ ති සා
දෙ ලොවින් දුක් රැසා, මට විය එක ලෙ සා

190 මෙ ලෙස කුමර වරු,  හඬමින් සිරි ව  රු
මිග රද  කත් පුරු,  අසමින් එම ස  රු
විගස  දෙයැස ඇරු,  බලමින් එ කුම  රු
පෙර විදි දුක් තරු,  පවසයි මෙම යු  රු

191 පෙර දි නේ  තොප මව'ගනේ  වෙලඳකුගෙණේ
සෙතෙකස යෙ  නේ
ස ම ගි නේ  ඔහු මහ වෙනේ මැද යත තැනේ මව දකිමි  නේ
කර සෙ නේ  එකහට මෙනේ තද කරමිනේ ගොස් වත් තැ  නේ
බිය ගෙ නේ  එ වෙළඳ ගණේ ඇය හරිමිනේ බැඳිවත් දි  නේ

192 අ ද රි නා  එම වරඟ'නා පිට තබමිනා ගොස් විගසි  නා
ගි රි ලෙ ණා  සිටුවා ගණා පල රසයෙනා තුටු කරමි  නා
උ ම 'ග ණා  සභි'සුරු මෙනා රන් රස මෙනා තද බැතියෙ  නා
ස ත ති නා  රති සැපතිනා මන පිණමිනා වසනා දි  නා

193 අ ප ස ඳ  දරු පිළිසිඳ කුස සිටි සඳ දෙල දුක් වැ  ඳ
ව න මැ ඳ  විඳ රැති ලෙඳ පල රස යොඳ දී දෙල මූ  ඳ
දි වි ලෙ ඳ  රකිනා ලඳ ම විසින් එඳ සිට ගැබ සො  ඳ
පි රි ස ඳ  මස් විළි රුඳ විය තද ලෙඳ එ කතට සෙ  ඳ

194 එ ම වී ටා  ඔගෙ දෙහොතටා වැදූ දෙදෙනටා දරු
පෙම් කො  ටා
පි ට ත ටා  මම ගොදුරටා තො ම ගොස් සිටා
තද තො ම කො  ටා
එ ක ත ටා  වැදූ දු සිටා රිසි රිසි වීටා රස'හර සෙ  ටා
වි කු ම ටා  දන බිඳ කොටා තැන තැන සිටා ගෙණැ දී තු  ටා

195 ස ඳ මෙ නේ  වන සිඹිමිනේ තද සතුටිනේ දරු වඩමි  නේ
සු බ ගු ණේ  සුත් මොහොතිනේ බත් දෙවමිනේ සත් මස කිනේ
එ ම දි නේ  තම තබමිනේ දෙ දෙනම ගෙණේ දරු
කෙළිම්  නේ
මෙ ලෙසිනේ  පුතු සමගිනේ දුව රකිමිනේ දවසරිමි  නේ

196 ව ය සි නා  දරු එ දෙදෙනා හට සොළොස් වස පිරෙනා තු  රු
ම වි සි නා  තද දුක් ගෙණා රැකියෙමි දිදී රස අමයු  රු
අ ද රි නා  තොපි මෙ ලෙසිනා ඇති කල නිසා ඔට මෙ නපු  රු
අ ද දි නා  විය නො සිරිනා තොප පවතිවා හිමි දිව යු  රු

197 ච ත කලා පති සිරි සුලා දිලි පිරි සාලා පති ලපතු ලා
තො විකලා මට එක් වෙලා සිරි මවු කලා සහ ගුණ ව ලා
ම ත කලා තොප තංකලාවද මෙම කලා මා සිහි ක ලා
තොවමූලා කිය තොප බලා මගෙ දුක් තැලා දුන් ගියෙ ප ලා

198 ස තො ස වී කුමරු හට මරණ පත් ක ලා
මෙ ලෙ ස පෙර විඳපු දුක් රුස කියත ක ලා
එ ලෙ ස දරු කුමරු විදි සැරෙති තද බ ලා
වි ග ස සැග වුණත සි සී රදුගෙ පණ ත ලා

199 කුමරු සඳ දුත එ සී රදු මල බව එ සඳ දුක් වැද තොම ඳ
තිරිඳු සඳ බස් ගිවිස සෙද පිය මිගිඳු විඳ මැරුවෙමි සුග ඳ
කියමි තෙද හඬමින් අමද යලි කඩුව ඇද මිඟිඳු ගෙ පිය ඳ
සිරස සිඳ ගෙණ මගට වැද එත කලට එද ගම් වැසි සමු ඳ

200 එ බව අසා නෙක පඬුරු රුසා ගෙණ මහව බැසා
කුමරුට දි යැ සා
රට ව ත සා සිරි මිගිඳු තසා'පව සෙත සලසා
කල පිහිට ති සා
සියලු දිසා මවහි එක විලසා පල විය තො ලසා
ඔබ විකුම් ර සා
තෙ තුති බසා පවසා මෙ ලෙසා හැම පඬුරු රුසා
දී එම විග සා

201 එක ලෙසි තා පල යුරු තෙලිතා ගොඩ බැස ද වතා
සිඳු රදු විසි තා
තොව පමණා පසතුරු ගොසිතා කුඩ කොඩි රැගෙතා
වසමින් ගුව තා
දෙත තොමිණා ඔල් වර හඬිතා නෙක තුති ගොසිතා
හැම දතා කර තා
මෙ බඳු මි තා මහ පෙරහරිතා කුමරිඳු සොබතා
නුවරට පැමි තා

## රදගනගේ වැලපීම

202 සිපිය සඳ තම එමුත් සඳ සුර පුරට වැද සත් දිත ගත ඳ
කුමරු සඳ ගෙණ ආ මිගිඳු හිස දකිත ලෙද මවු බිසෝ ස ඳ
සමග එද නැගණි ද තො රදු ගොස් එම මිගිඳු හිස
වැලඳ බ ඳ
සිරස ග ද අත ගසමිතෙ ද හැඬුව යි එ ලඳ කියමින් මෙලෙ ඳ

203 පෙ ර දි නේ  මට ලොබයෙනේ පිට තබමිනේ ගෙණ
ගොස් ව  නේ
ග ල් ලෙ නේ  මා ලා ගඟේ රත් රස මෙනේ පල
කරු සෙ  නේ
තැ න තැ නේ  'විඳූ මහ වනේ පල රස අනේ ගෙණ දීග  නේ
වෙ න වෙ නේ  සළු'බරණිං ත් තුනු සරසනේ මය
දින දි  නේ

204 පෙ ර ක ලා  දරු හැප් වෙලා දෙළ දුක් වෙලා මා සිටි ක  ලා
උ ද ක ලා  වම් හැම දෙලා එම පසිඳලා දුක් දුරු ක  ලා
මූ හු ක ලා  සින් පසු එලා ගැබ වැදු කලා දරු මත ක  ලා
තො ම් හෙ ලා  බිම් දෙතොතලා ගණ සිඹ දුලා වත පෙම්ක  ලා

205 එ ම වැ ඳූ  පුතු සමඟ දූ යත එ පසිඳූ දරු අප බ  ඳූ
මෙ හ රි ඳූ  දූත කාමූ දූ සිත දිව බඳූ ශෝභාසස රු  ඳූ
අ ම බ ඳූ  හැම රස යෙදූ හර දී එ දූ දරු රුක සැ  ඳූ
හි මි ස ඳූ  ඇති ගුණ සඳූ මබ පිරිසිඳූ සම විය ඉ  ඳූ

206 ව ය සි නා  සොළසක් වනා  තුරු මේ දෙදෙනා දරු සමඟි  නා
අ ප ගැ ණා  මහ දුක් ගෙනා  රැකි තිතිංයෙනා
සිය නෙත මෙ  නා
ඔ බ ගු ණා  එම නොම් දූනා  සැර පහරිනා විඳූ මර මි  නා
මෙ ම වි නා  ස ය ක ර මි නා  හලෙ පුතු විනා කවුරුද වෙ  නා

207 හි මි ස ඳ  පල වැල සඳ'පට වන මැද ගිය කල සෙ  ඳ
ලෙ න හි ඳ  සැඟවී එද අපි නොම රඳ මෙහි ආ ස  ඳ
න ද ලෙ ද  සිත දුක් වැද ගිරි ලෙණ ංදලා නොම් හි  ඳ
ර ට මැ ඳ  විත් මෙම ලෙද දුක් විඳූ වදලේ අප ස  ඳ

208 පලතුරු වල සොඳ,  දිනු බෝ නුග ස  ඳ
එම්තුරු වල සෙඳ,  නැසුමට ගිය ලෙ  ඳ
මෙ හි මි හ ට ම ඳ,  ම පුත් කුමරු වි  ඳ
මැරුවේය පිය රඳ,  ඉන් මට දුක් න  ඳ

209 න න තු රු සි රි ප නා,  ගොසින් නිරිඳු වෙ  නා
ම ර ණේ මි  ප ව ස නා,  කියමින් නො තව  නා
ම බස නො ගෙණ සිනා,  විඳූ මැරි සිය පි  නා
අ නේ ම ගේ පු නා,  කල පව නද ඉ  නා

210 මේ ලොවැ සැපත තිරු, නැති වහ මම්දු රු
ම පුතුට කී මෙ රු, ගොසින් මටත් සො රු
සිය පියා විඳු ම රු, කල පව ගොර ත රු
දුක් විඳැ සිව් තිරු, ගෙවෙන ද කොයි ව රු

211 තලවතැ දිනු තලා, දවසි එ හැම ත ලා
එම ලෙස නොවැ මූලා, නුඹට ම දෑ වෙ ලා
ම කුසින් බිහි වෙලා, වැඩි වීය පැමිණි ලා
සිටි මේ කුමරු දූලා, නුඹ නැසි රුදු වේ ලා

212 නුඹ තිරිසන් නිසා, කිසිවක් නො විම සා
නොම හිඳැ ලෙණ කුසා, ඇවිදිත් අප නි සා
හිමි මල බව අසා, යලි දෑකැ සිය ඉ සා
මට වත් දුක් රැසා, කියනෙම් කොයි ලෙ සා

213 මෙ ලෙස ඒ රද'හ ත
සමග දූ දරු තුන් දෙ න
සි රද ගුණ කියමි ත
හඬා වැලපී තිසෝ වූ තැ න

## සිහබා කුමරු රජවීම

214 සියලු ම එ වගු ර ට
වසත දත ගණ සෙට දෙ ට
සිහබා කුමරිඳු ට
අනත තුති කොට තුටු වැ එව වි ට

215 ඇමති වරු හැම දෙ න
අව මගුල් වෙස් ගණිමි න
අපමණ පෙරහරි න
මියිඳු හිස ගෙණ දවා හරිමි න

216 තුවරු හැම දෙන එක්ව සොයමින් පවර මැතිගණ සමගි නා
සොඳුරු එපුරට තුදුරු මිහ හිම වතක් දෑක එහි සපැමි නා
ඵතුරු ලිය මුල් ගල් උගුළුවා එකිෂ සමකරු සදමි නා
ඈදුරු වරු වඩු සතර තෙරපත් කැඳවමින් රැස් කරමි නා

217 ඉඳුරු පුරවර අපුරු මාහැගි උතුම් නුවරක් කරමි නා
සොඳුරු එ පුරට පවර සිහබා පුරය යන නම තබමි නා
අසිරු සිහබා කුමරු හට එ ම නුවර රජ සිරි දෙවමි නා
මහරු සිහවල්ලිය කුමරි අග බිසෝ සාර තැබූ එම දී නා

218 එරද එබීසව සමග දස රජ දමින් ලෙව් සත රකිත අත රු
නොමද මහ පින් බලැති දෙ තිසක් කුමරු ලබමින් පියත රු
නිබද පුරඳුරු සිරින් බබලා සියලු සැප විඳැ කෙලව රු
සුහද නෑ සිය දුක් මුහුද ලා කෙළෙල් කලුරිය ගොරත රු

## විජය රජ හා පරපුර

219 ප ව ර  එ රජුගෙ කුමරු නතුරෙන් විජයබා නම් දෙට කුමරව  ර
ස ත ර  තුම මොක් පුරට සපැමිණි දිනම නැව'රු අවුත් සිරිස  ර
ප ත ර  ලක්දිව තම්මැන්න නම් පුරට ගොඩබැස යකුන් දුරුක ර
වි ත ර  නැති සව් සිරිත් රජ කාලෙ මෙ ලක පළමු ව මිනිස් වසන ර

220 මෙ ම  රදුව සත්වෙනිව සිරිලක රජ පැමිණි තද
තෙදට දින ක  ර
හි ම  කිරණ බඳු යසින් බැබලූ දෙවෙනි පැතිස්
තරණ දුරුක  ර
අ ම  ඇදුරු සුත දඹදිවින් වැඩි මිහිඳු මා හිමි
සඳහු දුටු ව  ර
පෙ ම  සිතින් බණ අසා සතුටු ව තෙ රුවනෙහි
සැදූහැති ව බලත  ර

221 බු දු ස සු න්  හිරු උදා කරවිය මෙලක'ඹර දිටු අඳුරු හරැත  ර
පි ළි වෙ ළි න්  ලක් දිවෙහි ඉන්පසු රජ කරපු රජ තුමෝ පැණසර
ත ද බැ ති න්  බුදු සසුන් රැකැ වැඩි දියුණු කරමින් තමන් දිරි'සුර
ස ම සි ති න්  නෙක කුසල් කරමින් ලද හ සුර තර
ඉසුරු නොවිත  ර

## සතු පුවත

222 මෙ ල ක ට  රජ පැමිණි නිරිඳෝ පවා හැ  ම
මෙ ලෙ ස ට  අනත පින් කරමින් පමා නො  ම
ති ලො ව ට  උතුම් සැප ලත්හු ය නිමාව  ම
ක දි ම ට  පින් කරව් සුදනනි අසා මෙ  ම

223 ප ව ර  රජ සිහ නිරිඳු සිරි පද කමල සෙව් මැති
තුරෙන් සසොබ  න
නො හැ ර  පැවතා දිසාපති පිළිවෙළින් නෙක සව්
ඉසුරු ලබමි  න
ස ත ර  වන යුද මැද කෝරළේ දිසාපතිඳුට මුනුපුරු ව  න
තු ස ර  හර ගිර තුසර ඍර හර සදිසි යසසින්
බැබලු නොපම  න

224 ක ල ණ  සිරි දූරු කොළඹ වාසල දෙවෙනි මහ
මුදලිඳුගෙ නන්ද  න
නො මි න  පර දෙස වදන් සමගින් සතර නොරතුර
සිත සෙ දූන ගෙ  ණ
පැ මි ණ  මාතර පුරට කොන්සේජුවේ තුප්පහි නම
ලබාගෙ  ණ
ව ස න  හෙන්ද්‍රික් සරම් මුඟවෙටි මුදලි සඳු කළ
යදුම පිළි ගෙ  ණ

225 ස ක ව සි ත් එක් දහස් සත් සිය දෙ සාලිසකට
පැමිණී මෙව සේ
රි ක ග යෙ න් යුත් බක් මසෙහි පුර පැලවිය ලත්
සිකුරු දව සේ
තෙ ක සි රි ත් සැදි ගොඩපිටිය මහ වෙහෙර තිරතුරු
වසත සුව සේ
සි ක පෙ මි ත් රැකි කිරම දම්තද යති මෙ කවි කරු
තිමවි සිත සේ

226 ස සි ය විජයබා නරනිඳුහුගෙ පුව ත
මෙ සි ය ඛසින් කවි කල නෙක විරිත යු ත
දෙ සි ය සවිස්සක් කවියෙන් තිම මෙ පො ත
ඇ සි ය යුතු ය සුදනන් තුටු කරතෙ සි ත

227 මි ත් වෙ ත් වා සිංහලු සත් ඔවුනොවුන් හ ට
සි ත් වෙ ත් වා පින් කරමින් නැසුරුම ට
සෙ ත් වෙ ත් වා මෙ ලොවැ සව් ලෙව් සතුන් හ ට
අ ත් වෙ ත් වා මිතු මොක් පුර අප හැම ට

228 අ ම පි ය බ ස් දුන් තුන් ලොව හිමි සුග ත
ගු ණ නි ය රැ ස් පලමු ව පල කල අන ත
මෙ ම සි ය බ ස් මල් දම නමැති කවි පො ත
ලොවැ සි ය ව ස් පවතිවා තුටු කරු නෙ ස ත

——— නිමි ———

# අන්වය අර්ථය හා විස්තර

## නමව් මුනි සරණ

1 සු බ අග අප වග දුන් සත්නට සො ද
බ ඹ සුර සුර නර මතැසැදූ සිරි ප ද
පොබ යන විනෙ දන ගණ සර දින ර ද
ලොබ බැඳැනමදිමි එ සුගත් දම් ර ද

**අන්වය:** සොඳ සුබ අග අපවග සත්නට දුන්, බඹ සුර නර මතැ සිරි පද සැදූ විනෙ දන සර ගණ පොබයන, දින රද, එ සුගත් දම් රද ලොබ බැඳ නමදිමි.

**අර්ථය:** යහපත්, සුබ, උතුම් නිවන් සැප ලෝ සතහට ගෙන දුන්නා වූ ද, බඹුන්, දෙවියන් හා මිනිසුන්ගේ හිසින් තම සිරිපා වෙත වැඳුම් ලැබුවා වූ ද, හික්ම විය හැකි ජනයා නමැති නෙළුම් මල් සමූහය පුබුදු කරවීමට සූර්යයා වැනි වූ ද, එ සුගත් දම් රදුණන් වූ බුදුන් වහන්සේ ඉතා අසාවෙන් වදිමි.

**විස්තර:** අග – ශ්‍රේෂ්ඨ

විනෙදන – හික්ම විය හැකි ජනයා

සරගණ – නෙළුම් මල් සමූහය. විල් සමූහය කියා ද අරුත් කිව හැකිය. එහෙත් හැම විලක්ම හිරු නිසා පුබුදු නොවේ. සමහර විල්වල ඇත්තේ හඳ එළියෙන් පිබිදෙන මල්ය. සමහර විල්වල හිරු රැසින් පිබිදීමට කිසිවක් නැත. එ හෙයින් මෙහි ගැලපෙන්නේ නෙළුම්මල් සමූහය යන අර්ථය ය.

2 සු ර දෙට අයැදුම පිළිගෙණ මොනව ට
ව ර දෙ සතර මග පල මොක් පළ කො ට
සු ර නට සුර සුගතිඳු දෙසූ දහම ට
තො ර නො ව නමදිමි අදරින් තුති සො ට

**අන්වය:** සුර දෙව් අයදුම මොනවට පිළි ගෙන, වර දෙ සතර මග පල මොක් පළ කොට, සුරනට සුර සුගතිඳු දෙසූ දහමට තොර නොව, අදරින් තුති සොට නමදිමි.

අර්ථය: උසස් ම දේවයා වූ මහ බඹුගේ ආරාධනාව හොඳින් පිළිගෙන, උතුම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයත්, එම ඵලත්, නිවණත්, පෙන්වා දෙමින් දෙවියන්ගේත් දෙවියන් වූ, සුගත් බුදු රදුන් දෙසූ දහම්ට අත් නො හැරම සතුති කරමින් ආදරයෙන් නමදිමි.

විස්තර: සුර දෙට- දේවගණයාගේ නායකයා යන අදහසින් යෙදුණු වචනයකි. මේ සහම්පති මහ බඹු ය.

දෙ සතර මගඵල- සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මගත්, සතර පලත්.

3 සි රි ගණ වදහල සදහම් සිතෙල ට
පි රි සිදු රන් පා වන් සුත දිතිඳු ට
සැ රි යුත් මුගලන් ඈ මහ සඟන ට
පි රි සතුටින් මම නමදිමි හැම වි ට

අන්වය: සිරි ගණ වදහල සදහම් සිතෙලට පිරිසුදු රන් පා වන්, දිතිඳුව සුත, සැරියුත් මුගලන් ඈ මහ සඟනට හැම විට මම පිරි සතුටින් නමදිමි.

අර්ථය: බුදුන්වහන්සේ වදාරන ලද සදහම් නමැති සිංහ තෙල දැරිමට පිරිසුදු රත්රන් පාත්‍රයක් වැනි වූ, බුදුන් වහන්සේගෙන් පැවතෙන සැරියුත් මුගලන් ආදි මහ සංඝයා වහන්සේට මම හැම විට ම ඉතා ම සතුටින් නමස්කාර කරමි.

විස්තර: සිරි ගණ - ඓශ්වර්යයෙන් ගහන බුදුන්

රන් පා - රත්රන් පාත්‍රය-සිංහ තෙල් දැරීමට සමත් වන්නේ රන් බඳුනක් පමණකැයි අදහස් කෙරේ.

4 බ ඹ සුර පති සුර ගුරු සුර ගුරු න ත
නැ බ සර සිරි සර සරකර බරණෙ ත
බ ඹ සත ඈ හැම සුර ගණ කර මෙ ත
සු බ සෙත දී රකු මේ හැම ලෙව් ස ත

අන්වය: බඹ සුරපති, සුර ගුරු, අසුර ගුරු, නපා, නැබසර, සිරිසර, සරකර, බරනෙත, බඹ සත ඈ හැම සුර ගණ මෙත කර, සුබසෙතදී මේ හැම ලෙව් සත රකු.

අර්ථය: මහ බඹු, ශක්‍රයා, බ්‍රහස්පති, සිකුරු, නාථදේවයා (අනන්ත හෝ ඊශ්වර) විෂ්ණු, ශ්‍රීකාන්තා, සූර්යයා, බරණෙත්, සරස්වතී ආදි මේ දේව ගණයා මෙත් වඩා, මේ සියලු ලෝ සතුන් යහපතත්, සෙතත්, දී රකිත්වා.

5 තුන් ලොව ඇති හැම රුවනට තුඹු ව ත
තුන් සිත සතුටු ව වැඳැ පිදූ හැම දෙ ත
තුන් සැප දීමෙන් සුව පත් කරව ත
තුන් රුවනට වැඳ පුදමින් මෙ ලෙසි ත

අන්වය: තුන් ලොව ඇති හැම රුවනට උතුම් වන, තුන් සිත සතුටු ව වැඳැ පිදූ හැම දෙන තුන් සැප දීමෙන් සුවපත් කරවන, තුන් රුවනට මේ ලෙසින් වැඳ පුදමින්.

අර්ථය: තුන් ලොවෙහි ඇත්තා වූ හැම රුවන්වලට ම වඩා උතුම් වූත්, තුන් සිත පහදා ගෙන වැඳ පිදූ සියලු දෙන දෙව් මිනිස් හා නිවන් යන තුන් සැප දී සැපවත් කරවන, බුදුන් දහම් සඟුන් යන තෙරුවනට මෙසේ වැඳ පුදා

විස්තර: තුන් ලොව- කාම රූප අරූප යනුවෙන් ද, ස්වර්ග, මර්ත්‍ය පාතාල යනුවෙන් ද බෙදිය හැකි ය.

තුන් සිත- පිනක් කිරීමට පෙරත්, කරද්දීත්, පසු වත් ඇති වන සිතෙහි ස්වභාවය.

6 හැම සඳ ලෙව් සත සුවපත් කරමි ත
සිත ලෙද ආසිරි දී රක්නා මෙ ත
එක ලෙද ලො සසුන රැක නිති බබල ත
තද තෙද දෙවියන් යදූ මෙත් කරමි ත

අන්වය: හැම සඳ ලෙව් සත සුව පත් කරමින, සිත ලෙද ආසිරි දී රක්නා මෙන. එක ලෙද ලො සසුන රැක නිති බබලන තද තෙද දෙවියන් මෙත් කරමින යදූ,

අර්ථය: කවදත් ලෝ වැසියන් සැපතට පත් කරමින්, කැමති පරිදි ආසිරි දී ඔවුන් රැකීම සඳහා, ලෝකයත් ශාසනයත් එක ලෙසින් සුරකිමින් හැම විට ම වැජැඹෙන සපිර සාර, තේජාන්විත දෙව් වරුන්හට මෛත්‍රියෙන් ආයාචනා කර,

විස්තර: තෙරුවන් වැඳීමෙන් පසු ලෝක පාලක හා ශාසන පාලක දේව සමූහයාට වැඳ පින් දීම පැරණි කවියන්ගේ සිරිත ය. මෙහි කියැවෙන්නෝ හතර වෙති. නාවන් නො කියැවුණු දෙවි වරුන් විය හැකි ය. නැතහොත් මේ කව අනවශ්‍ය වේ.

7 පෙර මෙම සිරි ලක පලමු ව රජක ල
ව ර තර එ විජයබා රජහුගෙ දූ ල
ප ර පුර ගෙණ හැර දක්වමි මනක ල
ක ර 'දර සුදුනෙනි'සව් එහි පිළිවෙ ල

අන්වය: පෙර මෙම සිරි ලක පලමු ව රජ කල වර තර දුල එ විජයබා රජහුගෙ මනකල පරපුර ගෙන හැර දක්වමි. සුදනෙනි, එහි පිළිවෙල අදර කර අසව්.

අර්ථය: පුරාණයේදී මේ ලක් දිව පළමුවෙන් ම රජ බවට පැමිණි, ඉතා උසස් ලෙස බැබළී ඒ විජය රජ තුමන්ගේ සිත් ගන්නා සුළු රසවත් පර පුර විස්තර කරමි. යහපත් ජනයින් එහි පිළිවෙල ආදරයෙන් ඇසිය යුතු ය.

විස්තර: ඡේක ප්‍රයෝග අනුව නම් පලමු ව යනු පළමු ව, යනුවෙන් යෙදිය යුතු ය. එ විජයබා යන තැන 'එ' යනුත්, දුල, මනකල යන විශේෂණ පදත් යොදා ඇත්තේ මාත්‍රා සම්පූර්ණ කිරීම සඳහා බව පෙනේ. එ වැනි සක්ක ගැසීම් වලින් කවියාගේ දුබල තාව පිළිබිඹු වේ.

විජය බා: මේ කියැවෙන්නේ මෙ රට පළමු වෙනි ආර්ය රජ වූ විජය රජු ය. මහාවංසාදියෙහි පවා ඔහුගේ නම සඳහන් වන්නේ විජය යනුවෙනි.

8 සි සි ර කර හර සිසිර හර ගිරි පඬෙර සුර ගජ කිරණ සොඳ රස
අ ම ර ගඟ තුඟු තරඟ රඟ හෙළ විපුල යස රැස පතල දස දෙස
ත ඹ ර කර' සුරු යුගත දිලියෙන අනත තද තෙද ගහණ දිය කුස
ස ත ර මර මර මත මතඟ මත බිඳි අනගි විකුමෙන් සදිසි තත පස

අන්වය: සිසිර කර, හර, සිසිර, හරගිරි පඬර, සුර ගජ, කිරි අණ සොඳ රස, අමර ගඟ තුඟු තරඟ රඟ හෙළ විපුල යස රැස දස දෙස පතල, යුගත දිලියෙන තඹර කර අසුරු දිය කුස අනත තද තෙද ගහන, සතර මර මත මතඟ මත බිඳි අනගි විකුමෙන් තතපස සදිසි,

අර්ථය: චන්ද්‍රයා, මුතු පට, පිනි, කෛලාසකූටය, සුදු නෙළුම්, දිව්‍ය හස්තියා, කිරි මුහුද, සොඳ මල් පොකුරු, සුර ගඟෙහි උස්ව නැඟෙන තරංගයන් ආදිය සම වූ සුදු පැහැයෙන් යුතු විසාල කීර්ති කදම්බය සැම දෙසෙහි පතළා වූ ද, යුගාන්තයෙහි බබලන සූර්යයා මෙන් ලෝකය හුළු තිම් නැති තද තෙදින් පිරුණ වූ ද, සතුරු මාරයින් නමැති මත් ඇතුන්ගේ හිස් බිඳීමෙන් ලද උසස් වික්‍රමයෙන් සිංහයකු සමාන වූ ද,

විස්තර: කිරණ: කිරි + අණ. කිරි මුහුද යි. ක්ෂීර අර්ණව යන්නෙන් බිඳී ආවේ ය.

කීර්තිය කවි සමයෙහි සුදු පැහැයෙන් යුතු සේ හැඳින්වේ. මෙහි කීර්තිය සම කිරීමට ගන්නා ලද්දේ සුදු පැහැති වස්තු ම ය.

හර ගිරි: මේ කෛලාශ කූට පර්වතය යි. සුදු පැහැයෙන් බබලන මේ කඳු මුදුනෙහි ඊශ්වරයා වෙසෙති යි සැලැකේ.
පඬර: සකු පුණ්ඩරීක ශබ්ද යි. සුදු නෙළුම් වලට නමකි.

9 දිරි බෙලෙන් දිනු මදුරු ගිරි රද සොමි ගුණෙන් පිරි සරද දද රද
නත ගුණෙන් මහ වියත් ජයගත් ගැඹුරු ගුණෙන් පැරදූ සිඳු රද
ලොව සතුන් හට උතුම් දෙගුරුන් ගුරුන් මිතුරන් හරණ තිවරද
සුර නරන් මිණි කිරුළු මුදුනත සැදූ සිරි පද කමල් ඇති සොඳ

අන්වය: දිරි බෙලෙන් මදුරු ගිරි රද, සොමි ගුණෙන් පිරි සරද දද රද දිනූ නත ගුණෙන් මහ වියත් ජය ගත්, ගැඹුරු ගුණයෙන් සිඳු රද පැරදූ, ලොව සතන් හට උතුම් තිවරද දෙගුරුන් ගුරුන් මිතුරන් හරණ, සුර නරන් මිණි කිරුළු මුදුනත සැදූ සොඳ සිරි පද කමල් ඇති.

අර්ථය: ස්ථිර භාවයෙන් මන්දර පර්වත රාජයා ද, සෞම්‍ය ගුණයෙන් සරත් සමයෙහි පූර්ණ චන්ද්‍රයා ද පැරදවූ, නොයෙකුත් ගුණයන්ගෙන් විශාල ආකාශය ද, ගම්භීර ගුණයෙන් මහා සමුද්‍රය ද පැරදවූ, ලෝවැසියන් හට උතුම් තිවැරදි මව්පියන්, ගුරුවරයින් හා මිතුරන් වැනි වූ දෙව් මිනිසුන්ගේ මැණික් සහිත ඔටුනු මුදුනෙහි තම ශ්‍රී පාද නමැති නෙළුම් මල් තැබූ.

විස්තර: මදුරු ගිරි: මන්දර පර්වතය නොහොත් මහා මේරු පර්වතය.

වියත්: ආකාශය. සකු. විය: ශබ්ද යි.

හරණ: සමාන වන. ගුත්තිලයෙහි ද

උ දු දිනිඳු කර හරණේ
වි දු අඳුරු දිසි කිරණේ

යන තැන්හි ද හරණේ යනු යෙදී ඇත්තේ සමාන යන අරුත්හි ය.

10 සතර දස බුදු නැණ ද සබ් නැණ සබල නැණ බල දසය දසය ද
සතර දෙසා විදු අසට ආවෙණික දහම් නොපසක් සරණ දහම ද
සතර වෙසරද සතර ඉදිපා සතර සිවටන් බොදහ සත්වි ද
සතර පිළිසිඹි පත ද යන ඈ අනන ගුණ මිණි පිරුණු සිඳු ර ද

අන්වය: සතර දස බුදු නැණ ද, සවි නැණ සා බලු; නැණ බල දසය දසය ද, සතර දෙසා විදු, දස අට ආවෙණික දහම්, නො පසක් සරණ දහම ද, සතර වෙසරද, සතර ඉදිපා, සතර සිවටන්, සත් විද බොදග, සතර පිළිසිඹි පත ද යන ඈ අනත ගුණ මිණි පිරුණු සිඳු රද.

අර්ථය: දස සතරක් වූ බුද්ධ ඥානය ද, ෂඩ් අභිඥානය ද, කාය බල හා ඥාන බල දසය බැගින් ද, අෂ්ට විද්‍යා ද, දස අටක් වූ ආවේණික ධර්ම ද, පසළොසක් චර්ණ ධර්ම ද, චතුර් වෛශාරද්‍ය ඥාන ද,

( 54 )

සතර ඉද්ධි පාද ද, සතර සති පට්ඨාන ද, භේද සතකින් යුතු බෝධි අංග ද, සිව් පිළි සිඹියා පත ද යනාදි නොයෙකුත් ගුණ නමැති මැණික් පිරුණු සමුද්‍ර රජයා වැනි වූ

විස්තර:

බුදු නුවණ 14. ඉන්ද්‍රිය පරෝ පරියත්ත, ආසයානුසය, යමක පාටිහීර, මහා කරුණා සමාපත්ති, සබ්බඤ්ඤුත. අනාවරණ, සෝවාන් මාර්ග, සකෘදාගාමි මාර්ග, අනාගාමි මාර්ග, අර්හත් මාර්ග, අර්ථ ප්‍රතිසම්භිදා, ධර්ම ප්‍රතිසම්භිදා, නිරුක්ති ප්‍රතිසම්භිදා හා ප්‍රතිභාන ප්‍රතිසම්භිදා සම්බන්ධ ඤාණ දස සතර.

ඤාණ බල දශය:- ස්ථාන අස්ථාන දන්නා නුවණ, කාලත්‍රයවර්ති කර්ම සමාදානයන්ගේ යථාභූත විපාක දන්නා නුවණ; නානා ධිමුක්තිකත්ව දන්නා නුවණ, ඉන්ද්‍රිය පරාවරතා දන්නා නුවණ, ධ්‍යාන විමෝක්ෂ සමාධි සමාපත්තීන් සංක්ලේශ ව්‍යවදාන ව්‍යුත්ථාන දන්නා නුවණ, පූර්ව නිවාස දන්නා නුවණ, චුති උත්පත්ති දන්නා නුවණ, ආශ්‍රව ක්ෂය දන්නා නුවණ

ෂට් අභිඥා:- ඉර්ධිවිධ ඥාන, දිව්‍ය ශ්‍රොත්‍ර ඥාන, පරචිත්ත විජානන ඥාන, පූර්වේ නිවාස ඥාන, දිව්‍ය චක්ෂුර් ඥාන, ආශ්‍රවක්ෂයකර ඥාන.

චතුර් වෛශාරද්‍ය ඥාණ:- බුදු බවය, ආශ්‍රව ක්ෂය බවය, අන්තරායකර ධර්මය, නීයානික ධර්මය, යන මේ සතර පිළිබඳ පැවැති නුවණ සතර.

ඉර්ධි පාද සතර:- ඡන්දිද්ධි පාද, චිත්තිද්ධිපාද, විරියිද්ධි පාද, වීමංසිද්ධිපාද යන සතර.

සතර සතිපට්ඨාන:- කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානු පස්සනා, හා ධම්මානු පස්සනා, ය.

සප්තබොධ්‍යංග:- සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, හා උපෙක්ඛා,

සිවු පිළිසිඹියා:- අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යන නුවණ සතර.

අෂ්ටවිද්‍යා හා පසළොස්චරණ ධර්ම;- විදර්ශනා නුවණ, මනෝමය ඉර්ධි නුවණ, ඉර්ධි ප්‍රභේද දන්නා නුවණ, දිව්කන, පර සිත් දන්නා නුවණ, පෙර විසූ කඳ පිළිවෙල දන්නා නුවණ, දිව ඇස.

ආශ්‍රව ක්‍ෂය නුවණ, යන අට දැනීම අෂ්ට විද්‍යාය. ප්‍රාතිමෝක්‍ෂ සීලය, ඉන්ද්‍රිය සංවර සීලය, භොජනයෙහි පමණ දැනීම, නිද්‍රවර්ජිත කිරීම, ශ්‍රද්ධාව, හිරිය, අපත්‍රපාය, බහුශ්‍රැත බව, පරාක්‍රමය, සිහිය, ප්‍රඥාව, ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය, යන පසළොසචරණ ධර්ම වේ.

11 ස ත ර  අව මග අවරණය කර සුර පුරට මග සැරසූ මතහ  ර
ස ම ර  සුර දෙට පැරදු තුන් සිය විසි අටක් වර ලකුණු සිරිද  ර
ත ඹ ර  කර කුල කමලකර පොබය නම් සහ මොහඳුරව සැඩක ර
ස ම ර  කළ සත් සමර සමරෙන් මිදෙන සදහම් දෙසූ ගරුත  ර

අන්වය: සතර අව මග අවරණය කර සුර පුරට මත හර මග සැරසූ සමර, සුර දෙට පැරදු තුන් සිය විසි අටක් වර ලකුණු සිරි දර, ත ඹර කර කුල කමල කර පොබය නට සහ මොහඳුරට සැඩ කර, සමර කළ සත් සමර සමරෙන් මිදෙන ගරුතර සදහම් දෙසූ.

අර්ථය: සතර අපාය මාර්ගයන් වසා, දෙව් ලොවට යන සිත් කළු මාවත සැරසුවා වූ ද, අනංගයා හා ශක්‍රයා රූ සිරියෙන් පරදවමින් තුන් සිය විසි අටක් උතුම් ලකුණු දරුවා වූ ද, සූර්‍ය වංශය නමැති නෙළුම් පිල ප්‍රබෝධ කර වීමට හා මෝහාන්ධකාරය නැති කිරීමට සූර්‍යයා වැනි වූද, සිහි කළ සත්වයන් කාම යුද්ධයෙන් මිදවීම සඳහා උසස් ධර්මය දෙසුවා වූ ද,

විස්තර: සමර: මේ අනංගයාට නමකි. ඊශ්වරයා විසින් දවනු ලැබීමට පෙර ඔහුගේ රූ සිරිය සියල්ලන් අභිභවා පැවැති සේ සැලැකේ.

සමර කළ: ස්මරණය කළ හෙවත් සිහි කළ.

ස, ර, යන දෙ අකුරු අනුප්‍රාස වන පරිදි මේ කවෙහි යෙදී ඇති බව පෙනේ.

12 බු දු  පසේ බුදු මහ රහත් ගණ සමග සක්විති රදහු දියත  ද
සු දු  කිරණ බඳු නිමල ගුණවල අනෙක තවසුන් උතුම් පඹිහු  ද
රූ දු  බලැති යෝ බලන් ඇ සැම පින්වතුන් ඉපදුනු ඉතා හො  ද
ඉ දු  රූ පුර දිනූ මහත් සැපතැති පවර දඹදිව් තෙලෙහි මිනත ද

අන්වය: බුදු පසේ බුදු මහ රහත් ගණ සමග දියතද සක් විති රදහු. සුදු කිරණ බඳු නිමල ගුණ අවල අනෙක තවසුන් උතුම් පඹිහු ද, රූදු බලැති යෝ බලුන් ඇ ඉතා සොඳ හැම පින් වතුන් ඉපදුණු ඉඳුරූ පුර දිනූ මහත් සැපත් ඇති මනහද පවර දඹ දිව් තෙලෙහි,

අර්ථය: බුදු පසේ බුදු මහ රහත් සමූහයා ද, ලොවට සතුටු ගෙනෙදන චක්‍ර වර්ති රජ වරු ද, සඳ වැනි පිරිසිදු ගුණ ගහන නොයෙකුත් තපස් වී වරුන් හා උතුම් පඬි වරු ද, මහත් බල ඇති යෝධ භටයන් ආදි ඉතා යහපත් සියලු පින්වන්තයින් උපන ලෙද, ශක්‍ර පුරය පැරද වූ මහත් සැප සම්පතින් යුතු සිත් අලවන උදුර දඹ දිවෙහි.

විස්තර: සුදු කිරණ: සුදු පැහැති රැස් ඇති හෙයින් මේ චන්ද්‍රයාට නමකි.

ඉඳුරු පුර: ශක්‍රයාගේ පුරය යි. එය නැගෙන හිරින් පිහිටි පස් සැලැසේ. ශක්‍රයා ඉඳුරු දික් හෙවත් නැගෙනහිරට අධිපතියා ය.

13 සවන සුරපුරෙනකඩක් මිහි බට විලස හැම පිරිසුරෙන් බබල න
සවන දම් සඟ දෙ ලොව පිහිටිය සිතා තිසරණ දිවි සෙ සුරකින
සවණ කරදම් පෙවෙන් වැලකි පුරණ දස විද කුසල අපම ණ
සවන ගුණ නැණ' බරණ සිය ගත පැලඳි දන ගණ ගහන හැමදි

අන්වය; සවන සුර පුරෙන් අඩක් මිහි බට විලස හැම පිරි ඉසුරෙන් බබලන, සවන දම් සඟ දෙ ලොව පිහිට ය සිතා දිවි සෙ තිසරණ සුරකින, දම් සවණ කර, පවෙන් වැලකී, අ පමණ දස විද කුසල පුරණ, සවන ගුණ නැණ අබරණ සිය ගත පැලඳි දන ගණ හැම දින ගහන.

අර්ථය: සය වැනි දෙව් ලොවින් කොටසක් පොළවට පතිත වූ කලෙක්හි මෙන් සියලු සැප සම්පතින් බබලන්නා වූ ද, බුදුන්, දහම් හා සඟුන් දෙ ලොවට පිහිට බව දැන තෙසරණ තම පණමෙන් රකිමින්, දහම් අසා පවෙන් වෙන් වී, නොයෙකුත් දස කුසල ධර්මයන් පුරමින්, බුදුන්ගේ ගුණ නුවණ නමැති අබරණ තම ගතෙහි පැලඳ ගත් ජන සමූහයාගෙන් හැම විට පිරුණා වූ ද,

විස්තර: සවන සුර පුර: දෙව් ලෝ සයෙකි. එයින් ඉහළින් ම පිහිටි සවන දෙව්ලොව පරනිර්මිත වසවර්තිය යි.

14 විපුල සැප දල සපිරි මිනසල දවන හය ල රලැති හැමි ස ද
තිසල තිලපෙළ රසල කැල දුල නනම් දලසර සරණ මිනන ද
තුඹුල පල හෙළ මිනග පෙළ නැව් මනඟු වර රද බවන ගිරි ර ද
ලකල වගු නම් පුරවරෙක් විය සිදු රදුගෙ සිරි ඉසිලූ එක ලෙ ද

අන්වය: විපුල සැප දල සපිරි, හැම් සඳ දවන මින කල හයරල රලැති, තිසල තිල පෙළ රසල කැල දුල, නන් අඹ දල සර මිනසඳ සරණ තුඹුල පල හෙළ මිනග පෙළ නැව්, මනඟු වර රද බවන ගිරි රද, සිඳු රදුගෙ සිරි එක ලෙද ඉසුලූ ලකල වගු නම් පුර වරෙක් විය.

**අර්ථය:** මහත් සැප සම්පත් නමැති ජලය පිරුණු, හැම විට දුවන සිත් ගන්නා අශ්ව පෙළ නමැති තරංගයෙන් යුත්, සපිර ගෙවල් පෙළ නමැති වාසස්ථාන පෙළින් බබළන, නොයෙකුත් ආයුධ නමැති මත්ස්‍යයන් සිත් සාළු ලෙස හැසිරෙන, විසාල සුදු ඇතුන් නමැති නැව් සමූහයෙන් ගහන, අනර්ඝ රජ භවන නමැති මේරු පර්වතයෙන් යුත්, මහා සමුද්‍රයේ විලාසය මෙසේ එසා ලෙසම දැරුවා වූ ඉතා අලංකාර වගු නම් උතුම් නුවරක් විය.

**විස්තර:** **දුවන.** සකු ජවන ශබ්දයි. ගමන් ගන්නා යන අර්ථයි.

**රසල** සෑළ: සමුද්‍රය යට ඇතැයි සැලැකෙන වාසස්ථාන මෙයින් අදහස් වේ. රසා තලය යනු පොළවෙන් යට ලෝකය ය. රසා ආලය යනු පොළොවෙන් යට වූ වාසස්ථාන වේ. රසාලය යන්නෙහි බහු වචනය සේ රසල යෙදී ඇත.

15 එ පුර සුපිරි ඉසුරු වතුර එයින් පිටත නොයන විල ස
සතර වතහු මවා ලූවයි දුටුවන් හට සිතෙනා ලෙ ස
විතර නොවන බලැති දස'ට රියන් උසැති පවුර තිදෙ ස
එ පුර අවට බැබලූ තිති දවල රසින් විලස කෙලෙ ස

**අන්වය:** එ පුර සු පිරි ඉසුරු වතුර එයින් පිටත නො යන විලස සතර වතහු මවාලුව යි දුටුවන්හට සිතෙනා ලෙස, විතර නො වන බල ඇති දස අට රියන් උස ඇති ති දෙස පවුර, තිති දවල රසින් කෙලෙස විලස එ පුර අවට බැබළූ.

**අර්ථය:** ඒ නගරයෙහි පිරී ගිය ඓශ්වර්යය නමැති වතුර ඉන් පිට නො වන ලෙස මහා බ්‍රහ්මයා විසින් මවන ලදැයි දකින අයට වැටහෙන දස අට රියන් උස, මහත් බල ඇති කිසි පලුද්දක් නැති එහි ප්‍රාකාරය කෛලාස කූට පර්වතය මෙන් සුදු රැසින් යුතු ව ඒ නගරය වටේට බැබළිණි.

**විස්තර:** **සතර වතහු:** මේ මහා බ්‍රහ්මයා ය. ඔහුට මූණ සතරක් ඇති සේ සලකනු ලැබේ.

**දවල රසින්:** ධවල රශ්මියෙන්, හෙවත් සුදු රැසින්.

16 ඉඳුවර රතු පුල් හෙල්මැලි ඈ පස් පියුමෙන් සුසැදු න
සැමවර නද දෙන බිගු සැත් දියරට හස රදුන් කෙලි න
බලතර කිඹුලන් දැති මූවරුන් සහ රුදු මසුන් ගහ න
පුරඳර පොකුණට සමි විය දියගල එ පුරෙහි බබල න

**අන්වය:** ඉදුවර, රතු උපුල්, සෙල් මැලි ඈ පස් පියුමෙන් සුසැදුණු, හැම වර නාද දෙන බිඟු කැන්, දියරට හස රදුන් සොළිත, බලතර කිඹුලන්, දුනිඹුවරුන් සහ රුදු මසුන් ගහන එ පුරෙහි බබළන දිය අගල පුරඳර පොකුණට සම විය.

**අර්ථය:** ඉන්දීවර, රතු නෙළුම්, සුදු නෙළුම් ආදී පස් පියුමෙන් අලංකාර වූ ද, නිබඳ වම් නාද කරන්නා වූ මී මැසි සමූහයා හා ධෘතරාෂ්ට්‍ර නම් හංස රජයින් ක්‍රීඩා කරන්නා වූ ද, බලවත් කිඹුලන්, දුනි මෝරුන් හා විශාල මත්ස්‍යයන් ගහන වූ ද, එහි බබළන දිය අගල ශක්‍රයාගේ පොකුණ හා සමාන විය.

**විස්තර:** **ඉදුවර:** ඉන්දීවර. මේ නිල් පැහැති නෙළුම් වෙසෙසකි

**පුරඳර පොකුණ:** මේ දෙව් ලොව ඇතැයි සැලැකෙන යොදුන් පන් සියයක් දිග නන්දා නම් පොකුණ ය. දිය අගල පොකුණට උපමා කරන ලද්දේ පොකුණ අලංකාර හෙයින් හා යොදුන් පන් සියයක් දිග හෙයින් විය යුතුය.

17 දස විද රුවනින් නිමි බිතු වැඹ පේකඩ දුව ගෝනැ ස
දඹනද රන් උළු සෙවනැති මිණිකොත් ඇතිනේ සුවහ ස
සුර රද විමනෙව් දිලියෙන තර රද බවනට සිවු දෙ ස
හිර සඳ බඳු රුස් විහිදෙන අපමණ නිල පෙල විය ය ස

**අන්වය:** දස විද රුවනින් නිමි, බිතු, වැඹ, පේකඩ, දුව ගෝනැස, දඹනද රන් උළු සෙවණ ඇති නේ සුවහස මිණි කොත් ඇති, සුර රද බවන එව් දිලියෙන තර රද බවනට සිව් දෙස, හිර සඳ බඳු රුස් විහිදෙන අ පමණ යස නිල පෙල විය.

**අර්ථය:** දස විධ මැණික් වලින් නිම කොරුණු බිත්ති, කණු, කණු හිස්, පරාල ද, නිති රත්රන් උළු සෙවෙණි කොරුණු නොයෙකුත් සිය දහස් ගණන් මැණික් කොත් ද ඇති, ශක්‍ර භවනය මෙන් බැබළෙන රජ මාළිගයට සතර පැත්තෙන් හිරු හා සඳ මෙන් රැස් විහිදුවන නොයෙකුත් අගනා ගෙවල් පේළි ඇත.

**විස්තර:** **වැඹ:** සකු සථම්භ ශබ්දයෙන් බිඳුණේය. කණු වලට යෙදේ.

**පේකඩ:** කණු හිස්.

**දඹ නද රන්:** ඉතා පිරිසිදු නිති රත්රන්. ජාම්බූ නද සවර්ණ

**දස විද රුවන්:** මුතු, මැණික්, වෙරළු මිණි, සක්, සිලා, පබළු, රන්, රිදී මසාරගල්ල හා ලෝහිතාංක යන දස වර්ගය යි.

18 මත හර සක් රුවනින් කළ දෙරටු අටලු සහ බිහි දෙ ර
පුරවර තුර අතුරු නොවන අනත විහිදි සැදි එක යු ර
පුවතර මිණි නිකර සපිරි නන් වන සුදු රතු නිලඹ ර
දෙරදෙර වල සඳ තිබෙන අවන් හලින් නො විය අතු ර

**අන්වය:** මත හර සක් රුවනින් කළ දෙරටු අටලු සහ බිහි දෙර, අතුරු නො වන අනත විහිදි පුරවර තුර එක අයුර සැදි. පුවතර මිණි නිකර සපිරි නන් වග සුදු රතු නිල් අඹර දෙර දෙර වල සඳ තිබෙන අවන් හලින් අතුර නො විය.

**අර්ථය:** සිත් කළු සක් රුවනින් කෙරුණු දෙරටු අට්ටාල හා ඇතුළු වීමේ දෙරටු පිරී ගිය නොයෙකුත් වීදි එම නගරය තුළ එක ලෙස අලංකාර ව ඇත. අනගි මැණික් සමූහයෙ හා නොයෙකුත් වර්ගයේ සුදු රතු නිල් වස්ත්‍ර දෙරක් දෙරක් පාසා සරසා ඇති වෙළෙඳ සැල් වලින් ද එහි ඉඩක් නැත.

**විස්තර:** අටලු: අට්ටාල. ඉතා උස් කණුවලින් යුතු ගොඩනැඟිලි වෙසෙසක්.

බිහිදෙර: සකු බහි වාර ශබ්දයෙන් බිඳුණේ ය.

අඹර: වස්ත්‍ර හා ආකාශ යන අරුත්හි වැටේ. මෙහි වස්ත්‍ර යන අරුතෙහි යෙදී ඇත.

අවන් හල්: ආපණ සාලා හෝ ආපාන සාලා යන වචන දෙකෙන් ම අවන් හල් කියා බිඳී එයි. ආපාන සාලා නම් සුරා සැල් ය. ආපණ සාලා වෙළෙඳ සැල් ය. මේ දෙ වෙනි අරුතෙහිය මෙහි යෙදී ඇත්තේ.

19 සුසැට කලා සිප් පර තෙර පැමිණි අනෙක විදු දනහු ද
යුදට ඉතා නිපුණ සියලු සරම සතර වෙරැති අය ද
ලොවට පිහිට රජ මැති සිටු ඇ තනතුරු ලත් සෙටහු ද
රුවට එපුර දෙවියන් මෙන් සැරු පමණ නැති ව තිබ ද

**අන්වය:** සුසැට කලා සිප් පර තෙර පැමිණි අනෙක විදු දනහු ද, යුදට ඉතා නිපුණ සියලු සරම සතර වෙර ඇති අය ද, ලොවට පිහිට රජ මැති සිටු ඇ තනතුරු ලත් සෙටහු ද, පමණ නැති ව රුවට දෙවියන් මෙන් තිබ්ද එ පුර සැරු.

**අර්ථය:** කලා ශිල්ප හැට හතරෙහි කෙළ පැමිණි නොයෙකුත් පඬිවරු ද, යුධයෙහි ඉතා දක්ෂ හැම යුධ ශිල්පයෙහි ම වියති ඇත්තෝ ද, ලෝකයාට පිහිට සලසා දෙන රජ වරු,

මන්ත්‍රී වරු සිටු වරු ආදී පදවි ලත් ශ්‍රේෂ්ඨයෝ ද, කෙලවරක් නැති ව, දෙවි වරුන් මෙන් රුවින් බබළමින් යැම් විට ඒ නගරයෙහි හැසුරුණෝ ය.

**විස්තර:** සූ සැට කලා සිප්: පුරාණයේදී කෙනකුගේ සැබෑ උගත් කම දක්වීම සඳහා ඔහු සූ සැට කලා ශිල්පයන්හි කෙලපැමිණි බැව් සඳහන් කිරීම සිරිත ය. උගත යුතු හැම විද්‍යාවක් ම පාහේ මීට ඇතුලත් බව පෙනේ. ඒ සූ සැට කලා ශිල්ප පූජාවලිය බලා දත හැකිය.

20 ලකල කමල හරණ සරණ දිව සිළු එව් යුග දහ දූ ල
නිමල කනක රඹ කඳ' යුරු වටොර මදන රියෙ'ව් උකු ල
දවල කිරණ සදිසි වතැති දෙ නුවන් සරි වන නිලුපු ල
සකල රුවින් සුර'ඟන දිනු පුර'ඟන විසුනු ය පුර තු ල

**අන්වය:** සරණ දිවි සිළු එව් දුල දහ යුග, නිමල කනක රඹ කඳ අයුරු වට උර, මදන රිය එව් උකුල දවල කිරණ සදිසි වත ඇති, නිල් උපුල සරි වන දෙ නුවන්, සකල රුවින් සුර අඟන දිනු ලකල කමල හරණ පුර අඟන පුර තුල විසුනු ය.

**අර්ථය:** ඇවිදින පහන් සිළු වැනි බබළන ජංඝා යුග්මයෙනුත්, පිරිසිදු රත්රන් කෙහෙල් කඳන් වැනි වට කලවායෙනුත්, අනංගයාගේ රථය වැනි උකුලෙනුත්, චන්ද්‍රයා සමාන මුහුණෙනුත්, නිල් නෙළුම් සම වන දෙ නෙත්නුත්, යන සියලු රූප ශ්‍රීයෙන් දෙවඟනන් පැරදවූ, අලංකාරයෙන් ශ්‍රී කාන්තාව හා සම වූ කාන්තාවෝ නගරය තුළ විසූහ.

**විස්තර:** කමල: ලක්ෂ්මී, ශ්‍රී කාන්තාව ආදි වශයෙන් හැඳින්වෙන විෂ්ණු දේවයාගේ භාර්යාව ය - මෝ තොමෝ ධන සම්පත්තියට මෙන් ම රූප සම්පත්තියට ද අධිපති සේ සැලකේ.

දෙවියන් කිරි මුහුද කලඹන විට හමු වූ සොළොස් වස්තු අතර මේ ශ්‍රී කාන්තාව ද ගැනේ.

මදන රියෙව් උකුල: නගරයේ ගැහැනුන්ගේ උකුල අනංගයාගේ රථය වැනි යයි වනා තිබේ. උකුල නැඹුරු කමින් රියකට උපමා කල නො හැකි වුවද, කාමුක හැඟීම් වලට වාහනයක් වන හෙයින් උකුළ අනංගයාගේ රියට උපමා කරන ලදැයි සිතිය හැකි ය. කාමා-

න්‍යායෙන් ඉතිරිත්තේ උතුරු උපමා කර ඇත්තේ රිය සකට ය. මෙහිදි ද රිය යනු-වෙන් රිය සක අදහස් කරන ලදැයි ද සිතීම අපහසු නො වේ.

දිව සිළු: දීප ශිඛා යන්නෙහි තද්භවය. දීප යනු පහන් වලට යෙදේ. ශිඛා යනු දැල්ල ය.

දවල කිරණ: සුදු රැස් ඇති කෙසින් චන්ද්‍රයාට නමකි.

21 අගරු සඳුන් දෙව්දුරු කළුවැල් සිරි පල දුරු පොහො න
මහරු තෙරළු පණස කුඹුකු ඈ මල් පල තුරුනි නොමි න
ඉඳුරු නඳුන් උයන විලස සව් ඉසුරෙන් පිරි අපම න
සොඳුරු උයන් පොකුණු දහස් සුවහස් විය එහි තැන තැ න

අන්වය: පොහොසත දුරු අගරු, සඳුන්, දෙව් දුරු, කළු වැල්, සිරි පල, මහරු තෙරලු, පණස, කුඹුකු ඈ නොමින මල් පල තුරු ඇති, ඉඳුරු නඳුන් උයන විලස අපමණ සව් ඉසුරෙන් පිරි, සොඳුරු උයන් පොකුණු දහස්, සුවහස් එහි තැන තැන විය.

අර්ථය: මල් බර අගිල්, සඳුන්, දේව දරු; කළු වැල්, බෙලි, වටිනා පොල්, නොස්, පුවක් ආදි බොහෝ මල් පල තුරු ඇති ශක්‍රයාගේ නඳුන් උයන වැනිවූ බොහෝ සැප සම්පතින් පිරුණු සුන්දර උද්‍යාන ද පොකුණු ද එහි දහස් ගණනින් තැනින් තැන විය.

විස්තර: පොහොසත දුරු: මල් හටගත්.

22 උරණ තරුණ රඹ රණ බිඳ හරණ දෙරණ සතහ පිහි ටි
තරුණ කිරණ හරණ දවල දළ දුරු තද යුදෙහි බුහු ටි
සුරණ වරණ සදිසි සිඟලු සුබ ලකුණෙන් පිරෙමින් සි ටි
වරණ වරණ සෙන් එ පුරෙහි කෙළ සුවහස් විසූ ගැහැ ටි

අන්වය: උරණ තරුණ රඹ අරණ බිඳ හරණ, දෙරණ සත් අඟ පිහිටි තරුණ කිරණ හරණ දවල දළ දුරු, තද යුදෙහි බුහුටි සුරණ වරණ සදිසි සිඟලු සුබ ලකුණෙන් පිරෙමින් සිටි, වරණ වරණ සෙන් කෙළ සුවහස් එ පුරෙහි ගැහැටි විසූ.

අර්ථය. කෝපයෙන් තරුණ කෙසෙල් වනය බිඳ දමන්නා වූ ද, පොළ වෙහි අංග සතක් ගැවෙන්නා වූ ද, බාල ශිරු රැස් සම වූ සුදු පැහැති දළින් යුතු වූ ද, බිහි සුණු යුදෙහි දක්ෂ වූ ද දෙව් ලොව හස්ති රාජයා මෙන් හැම සුබ ලකුණකින් යුතු වූ ද, උතුම

හස්ති සමූහයා කෝටි, සිය දහස් ගණනින් ඒ නගරයෙහි ගැවෙමින් විසූහ.

විස්තර: දෙරණ පිහිටි සතහ: පා සතරත්, සොඬ වැලත්, වලිගයත් ලිංග යත් පොළොවෙහි ගැවීම උසස් ඇතුන්ගේ ලකුණක් සේ සැලකේ.

සුරණ වරණ - දෙවියන්ගේ ඇතා. ඒ ඓරාවණ නම් හස්තියා ය. ශක්‍රයාගේ වාහනය වේ.

වරණ වරණ - උතුම් හස්ති යන අරුතෙහි යෙදී ඇත. පාලි යෙහි වර වාරණ ආදී යෙදුම් බලා යෙදුණකි වර යනු වරණ වී ඇත්තේ එළි සමය සඳහාය.

23 පොරණ නරණ මදර ගිරෙන් කිරිණමතන කරණ කල ට
වරණ නෙවණ දෙසෙහි ඇලැගි නිමල දවල තරහ රඟ ට
අරණ හරණ උරණ රජුන් තද සටනට සපැමිණි වි ට
දෙරණ සරණ හය පෙළ එහි බැබලූ දිව හසුන් ලෙස ට

අන්වය: පොරණ නරණ මදර ගිරෙන් කිරිඅණ මතන කරන කලට නෙවණ වරණ දෙසෙහි ඇලැගි නිමල දවල තරහ රඟට තද සටනට සපැමිණි විට උරණ රජුන් අරණ හරන දෙරණ සරන හය පෙළ එහි දිව හසුන් ලෙසට බැබළී.

අර්ථය: පුරාණයේදී විෂ්ණු විසින් මන්දර පර්වතය ගෙන කිරි සයුර කලඹන විට නොයෙකුත් පැහැයෙන් යුත් බටහිර දෙසෙහි නැගි පිරිසිදු සුදු රැළි මෙන් තද යුදට පැමිණි සතුරු රජුන් නමැති වනය නසා දමා පොළොවෙහි හැසිරෙන අශ්ව සමූහයා එහි දිව්‍ය අශ්වයින් මෙන් බැබළුණේය.

විස්තර: පෙර සුරාසුර යුධයේදී දෙවියන් එක්ව විෂ්ණුගේ අණ පරිදි වාසුකී නාගයා මේරු පර්වතයෙහි පටලවා එය කිරි සයුරට දමා කැලඹවූ බවත්, ඉන් නොයෙක් වස්තුවක් නැගි බවත් හින්දු දේව කථාවන්හි දැක්වේ.

24 සුදු සිඳු යොදමින් මනරම් රන් දද බැඳ තිබෙන අව ට
මුදු විසිතුරු වතුරු අතුරමින් සැරසිලි කළ මොනව ට
රුදු සෙබලන් අවි දරමින් උර සදලා සිටි හැම වි ට
සඳු රිවි මඬලෙව් දිලියෙන රිය පෙළ වැඩි විය කෙළක ට

අන්වය: සුදු සිඳු යොදමින් මනරම් රන් දද අවට බැඳ තිබෙන, මුදු විසිතුරු වතුරු අතුරමින් මොනවට සැරසිලි කළ, අවි දරමින් උර සදලා රුදු යොබලන් හැම විට සිටි, සඳු රිවි මඬල එව් දිලියෙන රිය පෙළ කෙළකට වැඩි විය.

අර්ථය: සුදු සෛන්ධව අශ්වයින් යොදා, ලස්සණ රත් කොඩි වලවට එල්ලා ඇති, නොයෙකුත් වර්ණයන් ගෙන් යුතු චිත්‍ර අතුරා හොඳින් සැරසිලි කරන ලද, ආයුධ සහිතව, යුද ඇඳුම් (සැට්ට) හැඳගත් මහත් යුද සෙබළුන්ගෙන් නිතර පිරුණු කෝටියක-ට ත් වැඩි රථ පන්තිය චන්ද්‍ර හා සූර්‍ය මණ්ඩල මෙන් දිලිසෙමින් පැවැතිණි.

විස්තර: සිඳු: මේ සෛන්ධව නම් අශ්වයෝ ය. ඔවුන් ඉන්දියාවේ සින්ධු පෙදෙසින් ගෙනෙන ලද හෙයින් සිඳු නම් වේ.

චතුරු: මෙය වස්ත්‍ර සඳහා යෙදුණේය. වස්ත්‍ර යන්නෙන් වත් කියා කිදෙනු විනා මෙසේ චතුරු යයි බිඳ ගැන්ම ඡේක ප්‍රයෝග නො වේ.

උරසඳ: උර ඡදන හෙවත් උරහිස් ඇතුළු උඩු කය වැසෙන සේ අඳින යුද ඇඳුමකි. සැට්ටයක් වැනි ය.

25 ස ර සන සර සිරි මඬලග සඳ සක් ඇ තනවි රුගෙ ත
උ ර සඳලා සුර්බිටයන් යුරු උරෙනුර ගැටී සිටි ත
ගොර යුදැට වැදූ එඩියෙන් අඩියක් ඔත් පසු නොතබ ත
ම ර සෙනගට වැඩි පා බල සෙන් එපුරෙහි විසූ වටි ත

අන්වය: සරසන, සර, සිරි, මඬලග, සඳ, සක් ඇ තන් අවි රුගෙන උරසඳ ලා, සුර බිටියන් අයුරු උරෙන් උර ගැටී සිටින ගොර, යුදයට වැද එඩියෙන් අඩියක් ඉත් පසු නොතබන, මර සෙනගට වැඩි වටින පා බල සෙන් එ පුරෙහි විසූ.

අර්ථය: දුන්න, ඊතල, කඩා කඩු, පාරා වළලු සඳ, සංඛ ආදි නොයෙකුත් ආයුධ ගෙන, යුද ඇඳුම් හැඳ දෙව් ලොව යුද සෙබළුන් මෙන් තද බද වෙමින් කිහිසුණු යුදයෙහි පවා මඳක් වත් පසු නො බා එඩිතරව සිටින මාර සේනාවට ද වැඩි වටිනා පාබල සේනාව ඒ නගරයෙහි විසූහ.

විස්තර: සරසන සකු සරාසන ශබ්දයෙන් බින්න යි. සර හෙවත් ඊතලයට ආසනය වන හෙයින් දුන්න සරාසන නම් වේ.

මඬලග- මෙයින් වටකුරු අවියක් කියැවෙන හෙයින් එය පාරා වළල්ල විය හැකි ය.

සඳ- අඩ සඳ හැඩය ඇති අවියකි.

සක් යුද කිරීමෙහිදී පිඹින සංඛ මෙයින් හැඳින්වේ. චක්‍රය හෙවත් වළල්ල යන අරුතට වඩා එය සුදුසු බව පෙනේ.

26 සතත සකත තලත තිනෙත බඹ කත සිරි කත කිවි ගු රු
සවත වතත අනත තරිඳු දිය නෙත් බුද රුදුරු මිතු රු
දියත පසිඳු අනත තැණැති තෙද බල දුරු සමත මෙ මු රු
විතත යසැති එ පුර ඉසුරු වණත සමිති වෙන කොද සු රු

**අන්වය:** සතත, සකත, තලත, තිනෙත, බඹ කත, සිරි කත, කිවි, ගුරු සවත, වතත, අනත, තරිඳු, දිය නෙත්, බුද, රුදුරු මිතුරු, දියත පසිඳු අනත තැණැති තෙද බල දුරු සමත මෙ මුරු, විතත යස ඇති එ පුර ඉසුරු වනත සමයි. වෙන කො සුරු ද?

**අර්ථය:** බ්‍රහ්මයා, විෂ්ණු, හලහඳ, ඊශ්වර, සරස්වතී, ශ්‍රී කාන්තා, සිකුරු, බ්‍රහස්පති, ස්කන්ධ, ගණ දෙවි, අනන්ත නා රජ, චන්ද්‍රයා, සූර්යයා, බුදුහු, වෛශ්‍රවණ, යන ලොව පුරා ප්‍රසිද්ධ අනන්ත ඥානයෙන් යුතු, තේජස් හා බල දුරු, දක්ෂ මේ දේව සමූහයා, මහත් කීර්තියෙන් යුතු ඒ නගරය වර්ණනා කිරීමෙහි සමත් වෙති. ඒ හැර වෙන කවුරු ඒ සඳහා සමත්

වෙත් ද?

**විස්තර:** **සතත:** බ්‍රහ්මයා. සතක් හෙවත් කුඩයක් අතෙහි ඇති හෙයින් (සත් + අත) සතත යයි බ්‍රහ්මයාට යෙදේ.

**සකත:** විෂ්ණු. සකක් හෙවත් හක් ගෙඩියක් අතෙහි ඇති හෙයින් (සක් + අත) මේ විෂ්ණුට යෙදෙන නමකි.

**තලත:** හලහඳ. තල් අත්තක් ඔහුගේ අතෙහි ඇත.

**තිනෙත:** ඊශ්වරයා. ඊශ්වරයාට ඇස් තුනෙකි. එකක් නළලෙහි ය.

**බඹ කත:** සරසවි. සරස්වතිය බ්‍රහ්මයාගේ බිරිය යයි සැලැකේ.

**සිරි කත:** ලක්ෂ්මී. විෂ්ණුගේ භාර්යාව ය.

**කිවි:** සිකුරු දෙවියන්ගේ ගුරුවරයා ය.

**ගුරු:** බ්‍රහස්පති. මේ අසුරයන්ගේ ගුරුවරයා ය.

**සවත:** කඳ කුමරු. මොහුට මුහුණු සයක් ඇත්තේ ලු

**වතත:** ගණ දෙවි. වතෙහි අතක් ඇති හෙයිනි. ගණ දෙවිට ඇත්තේ ඇත් හිසෙකි. එහි සොඬ වැල අත ය.

**අනත:** අනන්ත නා රජ. මොහුට පෙණ දහසකි. මුව දහසකි.

**දියනෙත්:** සූර්යයා. ලොවට ආලෝකය දෙන තැනැත්තා ය.

**රුදුරු මිතුරු:** වෛශ්‍රවණ. මේ යක්ෂයින්ගේ නායකයා වේ.

27 මෙ ලෙ ස පිරි හැම පුරග සිරි නොමිනා, ගරුතර,
එවගු නම් පුරවරෙහි මනනඳ නා
දි යැ ස කුලවර තිලක වන සොබනා, රුපු ගජ,
වනස කල සරි විකුම් සිරි දර නා
තු නැ ස රුපු දිනු අනගි තුනු රුවිනා, සුර පති,
සදිසි සව් සිරි බරින් තිති දිලෙ නා
ස තො ස කරමින් පමණ නැති නෙදනා, වගු නම්,
රජතුමෙක් විය ගුණ දහම් රකි නා

අන්වය: මෙ ලෙස හැම අග පුර සිරි නො මිනා පිරි, ගරුතර, මන නඳනා, එ වගු නම් පුර වරෙහි, දියැස කුල වර තිලක වන, සොබනා රුපු ගජ වනස කල හරි විකුම් සිරි දරනා, අනගි තුනු රුවිනා තුනැස රුපු දිනු, සුර පති සදිසි සව් සිරි බරින් තිති දිලෙනා පමණ නැති නෙ දනා සතොස කරමින්, ගුණ දහම් රකිනා, වගු නම් රජ තුමෙක් විය.

අර්ථය; මෙ සේ සියලු උසස් ම නගර ශ්‍රීයෙන් නො අඩුව පිරුණු දැලැකිය යුතු, සිත් පිනවන, ඒ වගු නම් උතුම් නගරයෙහි (පෙදෙසෙහි), සූර්‍ය වංශය ට තිලකයක් බඳු වූ ද, සතුරන් නමැති ඇතුන් වැනසූ ඊශ්වරයා සමාන වික්‍රමයෙන් යුතු වූ ද, අගනා රූප ශ්‍රීයෙන් අනංගයා පැරද වූ ද, ශක්‍රයා මෙන් සැම සම්පතින් හැම විට බබලන්නා වූ ද, වගු නම් රජ කෙනෙක් බොහෝ ජනතාව සතුටු කරමින් ගුණ දහම් රකිමින් විසී ය.

විස්තර: දියැස කුල: දියැස යනු ලොවට එළිය දෙන සූර්‍යයා ය.

දියැස කුල සූර්‍ය වංශය ය.

තුනැස රුපු: තුනැස යනු ඊශ්වරයා වේ. ඔහුගේ සතුරා අනංගයා ය. තපස් රකිමින් හුන් ඊශ්වරයා-ගේ තපසට බාධා කළ අනංගයා ඔහු නළලෙහි වූ ඇසින් ගිනි දැල් යවා අළු කළේය.

28 ප ව ර දස විද ලකුණු දරු සකසා, මෙමරජ, මෙතින්
ජය ගෙණ කලේ රුපු දනාන සා
වි ත ර නැති තද තෙදින් සරි දියැසා කුළුණෙන්,
අමා කිරණෙව් බැබලි හැම දව සා
අ ම ර ගුරුතන සවන කිවි අටැසා, විදුරත, පැන
මිණි රුවන කර සදි සා
නි ත ර දෙන යදි පණට එක විලසා, තිලිණෙන්,
සුරබි සුර තුරු ගණට කළෙ අය සා

අන්වය: සකසා පවර දස විද ලකුණු දරූ මෙම රජ රුපු ජය ගෙන මෙතින් නො නසා කළේ. දියැසා සරි විතර නැති තද තෙදින්, අමා කිරණ එවි කුළුණෙන් හැම දවසා බැබළී. පැන මිණ රුවනකර සදිසා, අමර ගුරු, නත, සවිත, කිවි අටැසා, විදුරත දිනූ. නිතර එක විලසා යදි ගණට දෙන තිළිණෙන් සුරබී, සුර තුරු, ගණට අයසා කළෙ.

අර්ථය: හොඳින් උතුම් දස විධ රජ ධර්මයෙන් පුරන්නට වූ මේ රජ තුමා තම සතුරන් පරදවා මෛත්‍රියෙන් ඔවුන් නොනසා ඉතිරි කළේය. සූර්යයා මෙන් තිම් නැති තේජසින් ද, චන්ද්‍රයා මෙන් කරුණාවෙන් ද, කවදත් බැබළුණේය. ප්‍රඥා නමැති මාණික්‍යය දැරීමට සමුද්‍රය බඳු ඔහු බ්‍රහස්පති, අනන්ත ස්කන්ධ, සිකුරු, බ්‍රහ්ම හා ශක්‍ර අභිභවා සිටියේය. හැම විටම යාචකයනට එක ලෙස දෙන හෙයින් ත්‍යාගයෙන් සුරබී දෙන, කප් රුක ආදිය ද යට කළේය.

විස්තර: අටැසා: ඇස් අටක් ඇති තැනැත්තා. එ නම් බ්‍රහ්මයා ය.

විදුරත: (විදුරු + අත) අතෙහි වජ්‍රයක් හෙවත් දියමන්ති ආයුධයක් ඇති ශක්‍රයාට නමකි. විදුරවි යනු ද ඔහුට ම මේ හෙයින් යෙදුණකි.

29 නි ස ල  වන දිරි බෙලෙන් මෙර අයුරු, හරිසඳ,
තිරිඳු වැනි සබවසට අතිමිහි  රු
න කු ල  රජ දිනූ හය සරම සතරු, සිව් සැට, කලා
සිප් සමුදුරෙහි පත් එත  රු
වි පු ල  දසවිද දන් වතුන් නිතරු, වෙසතුරු,
තිරිඳුමෙන් දුනි සතන් සිත් සපු  රු
ස කල  රජදම් නොහැර එක අයුරු, රකිමින්,
මෙ රජ සත තුටු කළේ නොම විත  රු

අන්වය: දිරි බෙලෙන් මෙර අයුරු නිසල වන, අති මිහිරා සබ වසට හරි සඳ තිරිඳු වැනි, හය සරම සතරු නකුල රජ දිනූ, සිව් සැට කලා සිප් සමුදුරෙහි එ තරු පත්, විපුල දස විද දන් වතුරෙන් නිතරු සතන් සිත් සපුරා වෙසතුරු තිරිඳු මෙන් දුනි. සකල රජ දම් නො හැරු එක අයුරු රකිමින් මෙ රජ නොම විතරු සත තුටු කොළේ.

අර්ථය: ධෛර්යයෙන් මහා මේරු පර්වතය මෙන් නිශ්චල වන්නා වූ ද, ඉතා මිහිරි සත්‍ය වචන කීමට හරිශ්චන්ද්‍ර රජ වැනි වූ දා

අශ්වාරෝහණයෙහි නකුල රජ පැරද වූ ද, කලා ශිල්ප සැට සතර නමැති සමුද්‍රය තරණය කළා වූ ද, වෙස්සන්තර රජු මෙන් මහත් දශ විධ දානයන්ගෙන් මහ ජනයාගේ සිත් පුරා දුන්නා වූ ද, මේ රජ සියලු රාජ ධර්මයන් සම්පූර්ණයෙන් රකිමින් බොහෝ ජනයා සතුටු කළේ ය.

විස්තර: හරිසඳ නිරිඳු; ජීවිතයටත් වඩා සත්‍ය වචනයට කැමති හරිශ්චන්ද්‍ර රජ තුමා ඉන්දියාවේ අයෝධ්‍ය පුරයෙහි විසුන යි සැලකේ. ඔහුගේ සත්‍ය වාදී බව දෙවියන් අතර ද ප්‍රසිද්ධ විය.

නකුල රජ: මහා භාරතයෙහි එන්නේ කුරු හා පාණ්ඩව රජ වරුන් අතර පැවති යුද්ධයක විස්තර ය. මේ දෙ ගොල්ල ම නෑදෑයෝ වෙති. පාණ්ඩව කුමරුවෝ සොහොයුරු පස් දෙනෙකි. ඔවුන්ගේ වැඩි මල් තැනැත්තේ යුධිෂ්ඨිර ය. ඔවුනතරින් නකුල අශ්වාරෝහණයෙහි ප්‍රසිඩ විය. ඔහුගේ ප්‍රසිඩිය ගැන,

පැරකුම්බා සිරිතෙහි ද

වි ම ල උබය රිවිමිළු ණිකු අකිල බුවන රාජ රාජ
උ ද් ල ලකුණ ගරුඩ රෝහ හයා රෝහ නකුල රජ
යනුවෙනුත්,

කෝකිල සන්දේශයෙහි

ප ත ග කුලශ පැරකුම් රජුගෙ කුමරි ඳු
ස ත ග පිහිටි මිහි මතඟුන් තුරඟ රු ඳු
නි ස ග නැගී පවනෙව් විහිදුවා උ ඳු
ලෙසැඟ විය උදේනි නකුල දෙ තිරි ඳු

යනුවෙනුත් දක්වේ.

30 එ පු ර 'ඔර මැති බදුරු තුරු පබඳ, මැද තිති
දිලෙන ලෝ වැඩ පිණිස රජ තරි ඳ
ප ත ර අමිතුරු සතුරු රජ සමුඳ, සියපත්, මුකුළු විය
එක ලෙසට ලෙව් සැම ඳ
ප ව ර නෑ සිය මිතුරු කොඳ නොමඳ, පොබ විය,
ගුණ සුවඳ රැස් දෙසතුදෙස විහි ඳ
ල ත ර තුබු දුක් අඳුරු හැම නොරඳ, දුරු විය,
මෙත් කිරණ සත් ලොවට වැද තිබ ඳ

අන්වය: ඒ පුර අඹර බඳුරු මැති තුරු පබඳ මැද නිති ලෝ වැඩ පිණිස රජ තරිඳු දිලෙත. පතර අ මිතුරු සතුරු රජ සමූද සිය පත් එක ලෙසට ලෙව් සැම ද මුකුළු විය. නො මඳ පවර නෑ සිය මිතුරු කොද, ගුණ සුවඳ රුස් දෙසතු දෙස විහිද පොබ විය. මෙත් කිරණ සත් ලොවට තිබඳ වැදූ. ලතර තුබු දුක් අඳුරු සැම නො රඳ දුරු විය.

අර්ථය: ඒ නගරය නමැති අහසෙහි යහපත් මන්ත්‍රීන් නමැති තාරකා සමූහය මැද, හැම විට ලොවට වැඩ තකා රජ තුමා නමැති චන්ද්‍රයා බැබැලෙද්දී පැතිර සිටි සතුරු රජ සමූහයා නමැති නෙළුම් මල් එක් ම පිළිවෙලට ලොව සැම ද හැකිළී ගියේ ය. බොහෝ වූ උතුම් ඥතීන්, සේවකයන් හා මිත්‍රයින් නමැති කොඳ මල්හි ගුණ සුවඳ රුස් හැම දිසාවක ම විහිදී පොබ විය. මෛත්‍රී රශ්මි සමූහය සත්වයා වෙතට නිතර වැදී සිත්හි තුබු දුක් අඳුරු අතුරුදන් විය.

විස්තර: පබඳ: ප්‍රබන්ධ ශබ්දයෙන් හින්න යි. එකට බැඳුණු යන අරුත් ඇති මෙයින් සමූහයක් අදහස් වේ.

ලතර: පෙළෙහි 'ලතර' යි යෙදුණ ද, මෙය 'ළතර' විය යුතු. ළ + අතර හෙවත් සිත තුළ යනු අදහස යි.

31 එ ර ද දිනිසුරු තද තෙදින් දිලෙනා, රද නිය,
සොඳුරු යුගඳුරු මුදුන්පත් කෙණෙ නා
නොමිඳ රෝ දුක් දුබික් බිය නොමිනා ගනඳුරු,
අතුරුදන් විය මිහි තෙලෙහි තිඹෙබ නා
සු හ ද නෑසිය වර තඹර අරණා, නද විය,
ඔවුන් සහ සපදනට මදු දෙමි නා
දු හ ද රුපු මහවත්නු ලෙව් වසනා තැන තැන,
ගියෝ මහ වනලැහැප් වැද සෙදි නා

අන්වය: තද තෙදින් දිලෙනා එ රද දිනිසුරු සොඳුරු රද නිය යුගඳුරු මුදුන් පත් කෙණෙනා මිහි තෙලෙහි තිඹෙනා නො මඳ රෝ දුක් දුබික් බිය ගණඳුරු නොමිනා අතුරුදන් විය. ඔවුන් සහ සපදනට මදු දෙමිනා සුහද නෑ සියවර තඹර අරණා නද විය. ලෙව් වසනා දුහද රුපු මහ වත්නු මහ වන ලැහැප් වැදූ, සෙදිනා තැන තැන ගියෝ.

අර්ථය: මහත් තේජසින් බැබැලෙන ඒ රජ නමැති සූර්යයා සුන්දර වූ රජ නීතිය නමැති යුගන්ධර කඳු මුදුනට පත් විට, ලොවෙහි ඇති බොහෝ වූ රෝග, දුර්භික්ෂ සනාන්ධකාරය බොහෝ

සෙසින් නැති වී ගියේ ය. ඔහු සවකීයයන් නමැති මී මැස්සන්-
නට මිඹු දීමෙන් නෑදෑ මිතුරු වර පෙළුම් වනය ප්‍රබෝධ විය.
ලොවෙහි වසන දුෂ්ට සතුරන් නමැති මහ මුහුණෝ වනගත වී
නැතින් නැත සැඟවී ගියහ.

විස්තර: යුගඳුරු: මේ මහා මේරු පර්වතය වටා පිහිටි අඩසින් එකි
නෙකට මිරි සත් කුල පව්වලින් එකකි. යුගන්ධර,
ඊශධර, කරවික, සුදර්ශන, නේමින්ධ, විනතක හා
අශ්වකර්ණ යනු ඒ සත් කුල පව්ය.

32 පෙ ර සුසිරි නෙලු'ඹ'ලින් දිනු ලකලා, වගුපුර
තඹර කර මැද දිලෙන නිති විපු ලා
තො ර නො ව ම ගුණ සුවඳ පිරි නිමලා, දස රද,
දහම් පිවිතුරු මූව රදිති අව ලා
ස ර අටට සිප් කොමල දලිනුදුලා, සත වෙත,
පතල මහ මෙත් සෙමි සිරිති බබ ලා
ව ර මිතුරු නෑ සපද නඳ කරලා, දිලුමෙන්,
කමල සිරි ලදි එ රජ කල් සිය ලා

අන්වය: පෙර සු සිරි නෙළුම් අලින් දිනු ලකලා විපුලා වගු පුර තඹර
කර මැද නිති දිලෙන, තොර නො එම, නිමලා ගුණ සුවඳ
පිරි, දස රද දහම් පිවිතුරු මූවරදිති අව ලා, සර අට'ට සිප්
කොමල දලින් උදුලා, සත වෙත පතල මහ මෙත් කෙමි
සිරිති බබලා, වර මිතුරු නෑ සපද නඳ කරලා දිලුමෙන්,
එ රජ සියලා කල් කමල සිරි ලදි.

අර්ථය: පෙර අත් බැව්හි පුරන ලද සුසිරිත නමැති නෙළුම් අලයන්
උපන ලැබ, අලංකාර විශාල වගු පුරය නමැති නෙළුම් මල
මැද හැම විට බැබැලෙන, සම්පූර්ණයන් පිරිසිදු ගුණ නමැති
සුවඳින් පිරුණු, දශ රාජ ධර්ම නම් වූ පිරිසිදු මකරන්දයන්
ගැවසුණු, සාර සූසැට ශිල්පයන් නම් වූ මෘදු පෙති වලින්
දිලෙන, සත්වයා කෙරෙහි පතලා වූ මහා මෛත්‍රිය නමැති
කර්ණිකාවේ ශෝභාවෙන් බබලන, උතුම් නෑ දූ මිතුරන්
නමැති මී මැස්සන් සතුටු කරවන, ඒ රජ තුමා හැම කල්හි
නෙළුම් මලක ශෝභාව දැරුවේ ය.

විස්තර: මේ කවෙන් රජ තුමා නෙළුම් මලකට උපමා කර තිබේ.

අටට – අට + අට. මේ සැට සතර දක්වීමට යෙදිණි.

දලින් – දල යනු සාමාන්‍යයෙන් කොළ වලට යෙදේ. එහෙත්
මෙහි යෙදී ඇත්තේ පත්‍ර – මල් පෙති වලට ය.

33 සතර වත සර රුදු මුව තඹරා, සිරිසඳ,
නිතර විසු වර රුසිරු උර මැදු රා
සතර සදහම් සබා සිත අතරා, දුසිරිත,
දුරින් දුරු කර ලමින් එක පැහැ රා
සතර අව දුක් මුලින් සිඳ උදුරා, මොක් සිරි,
ලබනු වස් පින් කර වැජඹි නිත රා
සතර සඟරාවතින් දන නිතරා, තුටු කර,
රජ කරණ සඳ එ රජ තාරමපු රා

අන්වය: සතර වත සර මුව තඹරා රුදු, වර රුසිරු උර මැදුරා සිරි සඳ විසු, එ රජ, සතර සදහම් සිත අතරා තබා, දු සිරිත එක පැහැරා දුරු කර ලමින්, සතර අව දුක් මුලින් සිඳ උදුරා මොක් සිරි ලබනු වස් නිතරා පින් කර වැජැඹි; සතර සඟරා වතින් නිතරා දන තුටු කර රජ කරන සඳ.

අර්ථය: සරස්වතිය මුව කමලෙහි ද, ශ්‍රී කාන්තාව උතුම් රූප ශ්‍රීයෙන් යුත් උර මඩලෙහි ද ලැබූ ඒ රජ තුමා ශාස්තෘන් වහන්සේ-ගේ සද්ධර්මය සිය තුළ තබා, දු සිරිත සම්පූර්ණයෙන් දුර ලා සතර අපා දුක් මුලින් උපුටා, නිවන් සැප ලැබීම් වස් නිතර පින් කරමින්, සතර සංග්‍රහ වස්තුවෙන් ජනයා සතුටු කර රජ කරන විට.

විස්තර: සතර අව: නිරය, තිරිසන්, ප්‍රේත, හා අසුර ලෝක
සතර සඟරා වත: දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව හා සමානාත්මතාව යන, රජකු තුළ තිබිය යුතු ගති ගුණ හතර.

34 මෙලෙස කළ දිය න ද
එ රදු ට උතුම් ගුණ බ ද
දූ වත කලිඟු ර ද
බිසෝ රුවනක් වීය මත න ද

අන්වය: මෙ ලෙස දිය නද කළ උතුම් ගුණ බද එ රදුට, කලිඟු රද දූ වත මත නද බිසෝ රුවනක් වී ය.

අර්ථය: මෙ ලෙසින් ලෝකය සතුටු කළ, උතුම් ගුණයෙන් යුත් ඒ රජුට, කලිඟු රටෙහි රජ තුමාගේ දූවක වූ පියකරු උතුම් බිසවක් වූවා ය.

විස්තර: බිසෝ රුවනක්: ස්ත්‍රී රත්නය, සක්විති රජුනට පහළ වෙන එක් රත්නයකි.

35 සුරඟණ පරදව  තා
එ බිසව රුවැති අපම  තා
තලලතෙහි වරඟ  තා
සැදූ තිලකෙව් බැබලි හැමදි  තා

අන්වය: සුරඟන පරදවන අ පමණ රුව ඇති එ බිසව වරඟන නලලතෙහි සැදූ තිලකෙව් හැම දින බැබැළි.

අර්ථය: දිව්‍ය ස්ත්‍රීන් පරදවන තරමේ බොහෝ රූප ශෝභාවෙන් යුත්, ඒ බිසෝ තොමෝ උතුම් කාන්තාවන්ගේ නලලෙහි සැදූ තිලකයක් විලස හැම දින බැබළෙන්නට වූවාය.

36 සැමතිරි ලකුණු දූ  රූ
ගුණයෙන් සපිරි සිසියු  රූ
එ බිසවගෙ පියකා  රූ
රුසිරු සැකෙවින් කියමි විසිතු  රූ

අන්වය: සැම ඉතිරි ලකුණු දූරූ සිසි අයුරු ගුණයෙන් සපිරි, පිය කරු එ බිසවගෙ රුසිරු සැකෙවින් කියමි.

අර්ථය: සියලු ම ශ්‍රේෂ්ඨ ස්ත්‍රී ලක්ෂණයෙන් යුතු ව, චන්ද්‍රයා සමාන ගුණයෙන් යුත්, දූකුම් කළ ඒ බිසවගේ රූප ශ්‍රිය කොටින් වර්ණනා කරමි.

37 ව ර ල මියුරු පිල් අයු  රු-පටු
න ල ල ඔ දද රද මෙන් දිලි පව  රා
උ දු ල දෙබැම නිඹ පත  රා-දිසි
ල ක ල ගගණ රණ' කුස ලෙස නිත  රා

අන්වය: වරල මියුරු පිල් අයුරු, පටු නලල පවිරු අඹ දද රද මෙන් දිලි. උදුල දෙ බැම නිඹ පතුරු දිසි. ගගණ රන් අකුස ලෙස නිතරා ලකල.

අර්ථය: ඇගේ කෙස් කලඹ මොනර පිලක් මෙන් ද, සිහින් නලල උතුම් අඹ සඳ මෙන් ද බැබැළිණි. පැහැපත් දෙ බැම නිඹ පත්‍ර මෙන් පෙනිණි. නැහැය රන් හෙණ්ඩුවක් මෙන් නිතර අලංකාර විය.

38 සු නි ල නෙතිදු වර හර  නා-නව
ප බ ල දලසෙ දෙදර දිලි නොම  නා
නි ම ල දසන් කොද පෙළා-සුනු
ක ම ල සදිසි විය එ බිසව මුහු  නා

අන්වය: සුනිල නෙත් ඉඳුවර හරනා, නව පබල දල සෙ ඳෙද අදර තොළිනා දිලි. නිමල දසන් සොඳ පෙළිනා යුතු, එ බිසව මුහුණා කමල සදිසි විය.

අර්ථය: තද නිල් පැහැති ඇස් මහනෙල් මල් සම විය. අළුත් පුවාල පත්‍ර මෙන් දෙ තොල් බොහෝ සේ බැබළිණි. පිරිසිදු දත් කොඳමල් පෙළක් බඳු වූ ඒ බිසවගේ මුහුණ නෙළුම් මලක් හා සම විය.

39 ගෙල කුමුකු විට සෙ සිබ ලා–පිරි
දු ල පියයුරු රන්හස පැටි යුව ලා
අ ල ගඳ රඳ කර සග ලා–වර
ම ලු විය රිය සක සිරි ගත් උකු ලා

අන්වය: ගෙල කුමුකු ව ටිසෙ බබලා, පි පිරිය යුරු රන් හස පැටි යුවලා දුල. කර සගලා අලගඳ රඳ, උකුලා වර මලවිය රිය සක සිරි ගත්.

අර්ථය: බෙල්ල පුවක් ගසක වට වූ කඳක් මෙන් ද, පුන් පියයුරු රන්වන් හංස පැටවුන් යුවළක් මෙන් ද ශෝභාවත් විය. දෙ අත් සර්පයකු මෙන් විය. උකුළ අනංගයාගේ උතුම් රථ චක්‍රයෙහි ශෝභාව දුරී ය.

40 ච ර ණ සාරෙවූ මුදු වටො රා–දන
දි ලෙ න උතුරු සිඳු බුබුලු සෙ නිත රා
ත රු ණ තැඹිලි මල් අයු රා–දඟ
ම ද න සතුටු කර බැබලි තොව රා

අන්වය: මුදු වටොරා චරණ සර එව්. දණ, උතුරු සිඳු බුබුලු සේ නිතරා දිලෙන. තරුණ තැඹිලි මල් අයුරු දඟ මදන සතුටු කර තොවරා බැබැළි.

අර්ථය: මෘදු වට වූ කලවා යුග්මය ඇත් සොඬ වැන්න. දණ හිස් උතුරු මුහුදෙහි දිය බුබුලු මෙන් නිතර බැබැළේ. තරුණ තැඹිලි මල් මෙන් ජංඝා (කෙණ්ඩ) යුග්මය සරාගී හැඟීම් ඇති කරවමින් නිතර බැබළුණි.

විස්තර: වරණ සාරෙව් මුදු වටොර කලවා වට බව දැක්වීම රුමත් බව දැක්වීමේ ලකුණකි. කලවා ඇත් සොඬට හැඩය අනුව උපමා කිරීම වරදක් නැතත්, මුදු වටොර ඇත් සොඬට උපමා කිරීම සුදුසු ය යි සිතිය නො හැකි ය. ඇත් සොඬෙහි මුදු බවක් නැති හෙයිනි.

41 කොම ල සුපිපි සර සදි සා–පද
යු ව ල මලවි රද තුටුකල තෙලෙ සා
නි ම ල කනක පලු විල සා
ල ක ල ඇඟිලි පෙළ දිලි පද සර සා

අන්වය: කොමල සුපිපි සර සදිසා, පද යුවල තෙ ලෙසා මලවි රද තුටු කෙළෙ. නිමල කනක පලු විලසා දිගු ලකළ ඇඟිලි පෙළ පද සරසා දිලි

අර්ථය: සුලලිත, සු පිපුණු පෙළුම් මල් මෙන් පා යුවල නොයෙක් අයුරින් අනංගයා සතුටු කළේ ය. පිරිසිදු රන් පත්‍ර මෙන් දිග, ලක්‍ෂණ ඇඟිලි පෙළ පා පියුම්හි බැබැළිණි.

විස්තර: මලවි රද මේ අනංගයාට නමකි. ඔහුගේ දුන්නෙහි ඊ පස් මල් හෙයිනි ඔහුට මලවි (මල් + අවි) යි යෙදෙන්නේ.

42 ව ර වදන සු පිරි සඳිනා–පද
ස රැ' ගිලි දල රැඳි අම බිඳු ලෙසිනා
තො ර තොව දිලි නිය පෙලි නා–යස
ස ර එබිසව රූසිරි කෙ වණා

අන්වය: වර වදන සු පිරි සඳිනා, පද සර ඇඟිලි දල රැඳි අම බිඳු ලෙසිනා, නිය පෙළිනා තොර තො ව, යස සර දිලි එ බිසව වෙර රූසි රු කෙ වනා ?

අර්ථය: ශෝභන මුහුණ නමැති සම්පූර්ණ චන්ද්‍රයාගෙන්, පාද පද්මයෙහි ඇඟිලි නමැති පෙතිවල රැඳුණු අමෘත බින්දු මෙන් නිය පෙළින් යුතු ව, කීර්ති සාරයෙන් බැබැළෙන ඒ බිසවගේ රූපශ්‍රිය කවුරුන් විසින් වැනිය හැකි ද?

43 හෙ ල් මැලි සිවුමැලි කොම ලී–මිහි
ප ල් මිහිලොල් ලොබ කළ පුල්කම ලී
දු ල් සිරිකල් දිනු ලක ලී–නැම
කා ල් මුදුනත මල් කඩමෙන් බැබ ලී

අන්වය: හෙල් මැලි සිවුමැලි කොමලී, ළිහි පල් මීහි ලොල් ලොබ කළ පුල් කමලී, දුල් සිරි කල් දිනු ලකළී, හැම කල් මුදුනත මල් කඩ මෙන් බැබැළී.

අර්ථය: සුදු නෙළුම්හි ඇති සුකුමාල භාවයෙන් යුතු කෝමල ඒ බිසව, රජ තුමින් නමැති මී මැස්සාගේ ආදරය දිනාගත් පිපුණු නෙළුම් මලකි. ශෝභමාන ශ්‍රී කාන්තාව පැරද වූ අලංකාරයෙන් යුතු ඇ, හැම කාන්තාවකගේ ම මුදුනෙහි මල් කඩක් මෙන් බැබැළෙන්නට වූවා ය.

විස්තර: ළිහි ලොල්: මධු ලෝල. මේ මී මැස්සාට නමකි
හැම කල්: හැම කාන්තාවක ම.

| | |
|---|---|
| 44 සු ර තු ර මනහර | හරණා-යදි |
| න ද ක ර නිරතුර දෙන සර | තිළිනා |
| ග රු ත ර පුරදර | අඟණා-පුරු |
| හැ ම ව ර එබිසව ඉසුරෙන් | දිලුණා |

අන්වය: යදි නද කර නිරතුර දෙන සර තිළිනා, මනහර සුර තුර හරණා. ගරුතර පුරදර අඟනා අයුරු ඒ බිසව හැම වර ඉසුරෙන් දිලුණා.

අර්ථය: යාචකයන්ගේ සිත් සතුටු කර දෙන්නා වූ සාරවත් ත්‍යාගයන් නිසා මෝ තොමෝ දිව්‍ය වෘක්ෂයක් හා සමාන වූවා. ගරුතර ශක්‍රයාගේ ස්ත්‍රීන් මෙන් ඒ බිසව හැම දා ඓශ්වර්යයෙන් දිලෙන්නට වූවා ය.

විස්තර: සර තිළිනා: සාර වූ ත්‍යාගයන් නිසා. සර යනු මේ කවෙහි බොහෝ තැන හි යෙදී ඇත්තේ සාර යන අරුතෙහි ය.

පුරදර: පුරන්දරයා යනු ශක්‍රයාගේ නමකි. පෙර අත් බැව්හි දී සතුරන්ගේ පුරයන් විනාශ කර ලූ හෙයින් ඔහු පුරන්දර නම් විය.

| | |
|---|---|
| 45 ස ත ත පමද සිරි | ගිරිඳු-සරි |
| අ න ත ගැඹුරු පැනයෙන් ලොවැ | පසිඳු |
| ස ම ත සතුන් මත | සුසැදු-මිණි |
| ස හි ත කිරුළු මෙන් දිලි එම | රජඳු |

පුස්තකාලය.
සිරි වජිරාරාමය.
බම්බලපිටිය.



**අන්වය:** සතත පමද, සිරි, ගිරිදූ, සරි අනත ගැඹුරු පැණසෙන් ලොවැ පසිදූ; සමත සාතුන් මත සූ සැදූ; මිණි සහිත කිරුළු මෙන් එම රජ දූ දිලි.

**අර්ථය:** සරස්වතිය, ශ්‍රී කාන්තාව හා පාර්වතිය සමාන අනන්ත ගැඹුරු නුවණින් ලෝකයෙහි ප්‍රසිද්ධ සමර්ථ කාන්තාවන් මුදුනෙහි සැදූ මැණික් ඔබ්බවනලද ඔටුනු මෙන් ඒ රජ කුමාරිකාව වැජැඹුණාය.

**විස්තර: සතත පමද:** සතත යනු අතෙහි කුඩයක් (සතක්) ඇති හෙයින් බ්‍රහ්මයාට යෙදෙන නමකි. ඔහුගේ ප්‍රමදව හෙවත් භාර්‍යාව සරස්වතිය ය.

**ගිරිදූ:** මේ ඊශ්වරයාට භාර්‍යාව වූ පාර්වතියයි. ඇ මේරු පර්වතයෙහි දියණිය වශයෙන් සලකනු ලැබේ.

46 සිරිපති පුරපති නතනා–ගුරු
තුරුපති පසුපති රතිපති සුමනා
ගණපත සහ මෙමුරු ගනා–හැර
නො සමති කිමට වෙන අය ඇගුනා

**අන්වය:** සිරි පති, සුර පති, නතනා, ගුරු, තුරු පති, පසු පති, සුමනා, ගණපති, සහ මෙ මුරුගණා හැර වෙන අය ඇ ගුණ, කිමට නො සමති.

**අර්ථය:** විෂ්ණු, ශක්‍ර, අනන්ත, බ්‍රහස්පති, චන්ද්‍ර, ඊශ්වර, සුමන, ගණදෙවි යන මේ දේව සමූහයා හැර වෙන කිසිවෙක් ඇගේ ගුණ කීමට සමත් නොවෙති.

**විස්තර: සිරිපති:** විෂ්ණු සිරි පති වනුයේ, ඔහු සිරි කාන්තාගේ සැමියා හෙයිනි.

**පසුපති:** මොහෙන්ජොදාරොවෙහි මෑතක දී සොයා ගන්නා ලද පුරා වස්තු අතර ඊශ්වරයා සතුන් විසින් පිරිවරන ලදු ව සිටින පුරාවස්තු ද සොයාගෙන තිබේ. ඔහු පුරාණයේ පටන් ම පසු පති යනුවෙන් හැඳින්වේ. මේ කාවෙහි දැක්වෙන දෙවි වරුන් තෝරාගෙන තිබෙන්නේ සැලකිල්ලෙන් නො වේ. මේ සියලු දෙවියන්, වර්ණනා කිරීමෙහි සමතුන් ලෙස නො සැලකෙන හෙයිනි.

47 මෙ ලෙස රුසිරු ගුණ ගයනා–සොඳ
එ බි ස ව අග මෙහෙසුන් සාර පෙමිණා
ස හො ස ව සුරපති සිරිනා–නොව
වෙ න ස සඳේ ලප ලෙස විසු දෙ දෙණා

**අන්වය:** මෙ ලෙස රුසිරු ගුණ ගයනා, සොඳ එ බිසව පෙමිනා අග මෙහෙසුන් සාර, සහොස ව සුර පති සිරිනා වෙනස නො ව, සඳේ ලප ලෙස දෙ දෙනා විසු.

**අර්ථය:** මෙසේ රූප ශ්‍රීයෙන් ද, ගුණයෙන් ද, අනූන වූ ඒ යහපත් බිසව ප්‍රේමයෙන් අග මෙහෙසුන් සාර ගෙන සතුටින් ශක්‍රයා මෙන් රජු පසුවිය. වෙනස් නො වී, සඳ හා එහි සස ලපය මෙන් ද දෙ දෙන පසු වූහ.

**විස්තර:** මේ සාව ගැල පීම සදෙස් බව පෙනේ.

48 පුව හ ර එවගු නම් නරවර ණා
ම න හ ර බිසව සමගින් යෙහෙ ණා
පි ය න ර එපස් කාම් සැප නොමි' නා
සි හ යුර විඳින කල සහහොසි නා

**අන්වය:** එ වගු නම් පුවහර නර වරණා මන හර බිසව සමගින් යෙහෙනා, පිය නර එ පස්කාම් සැප නොමිනා සහ හොසිනා සිත අයුර විඳින කල,

**අර්ථය:** ඒ වගු නම් වූ උතුම් රජ තුමා, තම පිය සාරු බිසව හා හොඳින් ප්‍රසන්න ලෙස බොහෝ සේ පස් කාම් සැප සිත් පරිදි විඳින විට

**විස්තර:** එ පස් කාම්, යන මෙහි එ යනු අනවශ්‍ය පදයකි. මාත්‍රා පිරවීම සඳහා යෙදුණකි.

49 ය ස පිරි එ රජු, වෙනුවට සතු ටා
කු ස දරු ගැබෙක්, විය එ බිසව ටා
බි ස වුන් එ බව, කී කල රජු ටා
අ ස මින් සතුටු, නරනිඳු එවි ටා

**අන්වය:** යස පිරි එ රජු සතුටා වෙනුවට, එ බිසවටා කුස දරු ගැබෙක් විය. බිසවුන් එ බව රජුටා කිකල, එ විටා අසමින් සතුටු නරනිඳු

**අර්ථය:** කීර්තිමත් ඒ රජු සතුටු වන පිණිස ඒ බිසවගේ කුසයෙහි දරු ගැබක් හට ගත්තේ ය. ඒ බව බිසව රජුට කීවිට ඒ අසා සතුටට පත් රජතුමා.

50 රැ ස් කාරවමින්, නුවරුන් සිය ළු
දෙ ස් නොව එ පුර, සරසා ලකු ළු
තොස් වඩවමින්, සතියක්ම මු ළු
වි ස් තරව ගැබ, පෙලහර කර ළු

**අන්වය**: සියලු නුවරුන් රැස් කරවමින්, දෙස් නො ව, එ පුර ලකුළු සරසා, මුළු සතියක් ම තොස් වඩවමින්, විස්තර ව ගැබ පෙළහර කරළු.

**අර්ථය**: සියලු නුවර වැස්සන් එක් තැන් කරවා, කිසි වරදක් ඇති නොවන පරිදි නගරය අලංකාර කොට සරසා, සතියක් පුරා සතුටු වඩවමින් සම්පූර්ණ ලෙස ගැබ් පෙරහර කර විය.

**විස්තර**: **ගැබ පෙලහර**; මේ සදෙස් යෙදුමකි. පෙලහර යනු පෙළහර-ය යි පළමුවෙන් ශුද්ධ විය යුතු. පෙළහර යන්නෙහි අර්ථය ප්‍රාතිහාර්යය යනු ය. එහෙන් එය මෙ තැනට නො ගැලපේ. මෙ තැන යෙදිය යුත්තේ පෙරහර යන වචනය යි. ගැබ් පෙරහර යනු දරු ගැබ ආරක්ෂා කිරීමේ උත්සව ක්‍රමයකි. පෙරහර යන්නෙහි අර්ථය ආරක්‍ෂා කිරීම යනුයි.

51 පි ළි මිණි මදෙස, තුල දිලි තොමි තා
පි ළි බිඹු රුවක්, ලෙස බබලමි තා
පි ළි සිඳ පටන්, දසෙකඩ මසි තා
වි ළි රද පැහැර, එ බිසව කුසි තා

**අන්වය**: පිළිමිණි මදෙස තුළ තොමිතා දිලි පිළිබිඹු රුවක් ලෙස බබළමිතා, පිළිසිඳ පටන් දස එකඩ මසිතා විළි රද පැහැර එ බිසව කුසිතා,

**අර්ථය**: පළිඟු මිණියෙන් කොරුණු පෙට්ටියක් තුළ බොහෝ සෙයින් දිලි සෙන ප්‍රතිබිම්බයක් ඇති රූපයක් මෙන් බබළමින් පිළිසිඳ ගෙන මාස නවය හමාරක් ගිය තැන විළිරුදු ඇති කරවා ඒ බිසවගේ කුසින්,

**විස්තර**: **විළිරද**. මේ ප්‍රසව වේදනා ය. දරුවකු මව් කුසින් බිහි වීමේදි මවට ඇති වන වේදනා.

52 නි ක් මූනු සඳක් සේ මේගැබෙ කින්
දු ක් නො ව කිසි'න් සුබ යෝගය සින්
එ ක් කුමරියක් පසුහා ව සැණෙ සින්
දු ක් සිත මිදිය දෙගුරුන් නිසැ කින්

**අන්වය:** මේ ගැබෙකින් නික්මුණු සඳක් සේ, කිසිත් දුක් නො ව, සුබ යෝගයකින්. සැණෙකින් එක් කුමරියක් පසුත ව. දෙ ගුරුන් දුක් සිත හි සැසින් මිදි ය.

**අර්ථය:** වලා කුළක් තුළින් නික්මුණු සඳක් මෙන් කිසි දුකක් නැති ව, යහපත් වේලාවක. ක්ෂණයකින් එක් කුමාරිකාවක් ඉපදී, දෙමා පියන්ගේ සිතෙහි තිබුණු දෙම්නස් ගතිය සම්පූර්ණයෙන් නැති කළාය.

**විස්තර:** **සුබ යෝගයකින්**. ග්‍රහ ශාස්ත්‍රය අනු ව යහපත් ග්‍රහයන් එක් තැන් ව සිටි සුභ අවස්ථාවක. යෝගය යනු යෙදීම, හෙවත් එකට ගැටීම ය.

53 තුට වත කුමරි වැදූ එ බිසව ටා
සාට යුතු නිමවමින් පෙර ලෙස ටා
ඉට කිරි මවුන් තෝරා සොඳ ටා
සැට දහසක් ම සලසා එවි ටා

**අන්වය:** තුට වත කුම වැදූ එ බිසවටා, පෙර ලෙසටා සාටයුතු නිම වමින් සොඳටා ඉට කිරි මවුන් තෝරා, එවිටා සැට දහසක් ම සලසා.

**අර්ථය:** සතුටු වඩවන ඒ කුමාරිකාව වැදූ බිසවට පෙර සිරිත් පරිදි සාට යුතු සලසවා, හොඳින් යහපත් කිරි මවුන් සැට දහසක් ම තෝරා ගෙන,

**විස්තර:** **ඉට**. ඉෂ්ට යන්නෙන් බිඳුණු ඉටු යන පදය මෙහි එළිසමය සඳහා මෙ සේ යෙදිණි.

කිරි මවුන් සැට දහසක් තෝරූහ යි කීම අතිශයෝක්ති අලංකාරයක් පමණකි.

54 පින් සර කුමරි, යට එ උපන් දා
රන් කිරි දෙමින්, සුබ මොහොත් යො දා
තන් රූකාවලුන්, තබමින් නො ම දා
අන් සියලු දෙය, සිදුකර එම දා

**අන්වය:** ඒ උපන් දා පින් සර කුමරියට සුබ මොහොත් යොදා, රන් කිරි දෙමින් නො මඳ තන් රූකාවලුන් තබමින්, එම දා අන් සියලු දෙය සිදු කර.

**අර්ථය;** කුමරිය උපන් දින ඇට සුබ මොහොතින් රන් කිරි කට ගා, බොහෝ රූකාවල් ද, තබා, එ දින ම තවත් බොහෝ කටයුතු සලස්වා.

**විස්තර:** මෙහි 'එ උපන්ද' යනු දුබල යෙදුමකි. එ යනු සක්ත ගැසීමකි.

55 වි සි තු රු  දවල, සතයට සුස  ද
තු බු තු රු  අතගි, සිහසුනෙහි මැ  ද
යු ග ඳු රු  මුදුන, බබලන දිනි  ද
ලෙ ස ග රු  එ රද, වැඩ හිද එ ස  ද

**අන්වය:** විසිතුරු දවල සත යට සුසද තුබු, උතුරු අතගි සිහසුනෙහි මැද යුගඳුරු මුදුන බබලන දිනිද ලෙස ගරු එ රද, එ සද වැඩ හිද,

**අර්ථය:** විචිත්‍ර සර ඇති සුදු කුඩය යට මිනා නොව සද නිබුණු උසස් අනර්ඝ සිංහාසනයෙහි මැද, යුගන්ධර පර්වත මුදුනෙහි දිලි සෙන සූර්‍යයා මෙන් ඒ ගරු රජතුමා එ විට වැඩ හිද.

**විස්තර:** උතුරු: උත්තර ශබ්දයෙන් බිදිආයේය. උසස් යනු මෙහි අදහස යි **දවල සත**. රජුන්ගේ සිංහාසනයට උඩින් ඇති ශ්වේත ඡත්‍රයකි.

56 වෙ ද ස ත  නිපුණ, බමුණන් මහ  රු
ත ම වෙ ත  ගෙන්ව, මින් සිත අයු  රු
සෙ ද බ ත  බුලත, දිලා' තතු  රු
ඇ ති සි ත  මෙ ලෙස, කී එ තර වි  රු

**අන්වය:** වෙද සත නිපුණ මහරු බමුණන්, සිත අයුරු තමාවෙත ගෙන්ව මින්, සෙද බත බුලත දිලා, අනතුරු එ තරවිරු ඇති සිත මෙ ලෙස කී.

**අර්ථය:** වේදයෙහි සොළ පැමිණි වටිනා බමුණන් සිත් පරිදි තමා වෙත ගෙන්වා, වහා බත් බුලත් දී සංග්‍රහ කර, ඒ රජතුමා තම සිතෙහි අදහස් මෙ සේ කීවේ ය.

**විස්තර: වෙද සත**: ඍග්, යජුර්, සාම හා අථර්ව යනුවෙන් වේදය චතුර් විධ ය. මෙයින් අථර්ව වේදය අනායසී වේදයක් වසයෙන් සලකා බොහෝ බමුණන් විසින් බැහැර කරන ලදි. සෙසු ත්‍රි වේදය දත සිටිම බමුණන්ගේ උගත් කමෙහි ප්‍රධාන අංගය විය.

57 ස ත ර වෙද සොළ පැමිණි බමුණනි මදුව ඇග ඇති ලකුණු බලමි න
වි ත ර කර සුබ අසුබ වෙත වෙත සොයා තෝරු සපර නැණැසි න
ල ත ර සැක හැර මෙ මට කි සඳ තොපට නිබෙනා කුසල් කරමි න
නි ත ර රැක්මට මහත් දන දෙමි තිලිණ කොට එම ගණිව් විගසි න

**අන්වය:** සතර වෙද සෙල පැමිණි බමුණනි, ම දුව ඇඟ ඇති ලකුණු බලමින. සතර නැණැ, සිත විතර කර සුබ අ සුබ වෙන වෙන සොයා හෝරා. තොපට තිබෙන කුසල් කරමින ළහර සැක හැර මේ මට කි සඳ, නිතර රක්මට මහත් දන තිළිණ කොට දෙමි. විගසින එම ගනිව්.

**අර්ථය:** සතර වේදයෙහි සෙල පැමිණි බමුණනි, මගේ දියණියගේ ශරීර ලක්ෂණ බලා, තොපගේ ශාස්ත්‍ර ඥනයෙන් විස්තර සහිත ව සුබ අ සුබ වෙන වෙන හෝරා බලා, තොපගේ ඥනයේ ප්‍රමාණ යෙන් සිතෙහි සැක හැර මට කි විට, හැම දැ ජීවත් වීමට ප්‍රමාණ වන තරම් ධනයක් තෑගි වසයෙන් දෙමි. වහා එය පිළි ගනු මැනවි.

**විස්තර:** ශරීර ලක්ෂණ බලා ඵලා ඵල කිම සඳහා නෛමිත්තකයන් ගෙන් වූ සැටි මෙහි විස්තර වේ.

**තොපට තිබෙනා කුසල් කරමින**. තොපට හැකි පමණින්.

58 මෙ ලෙසට ඵ වගු ර ද
පැවසූ සඳෙහි මින ත ඳ
දද වරහු නිවර ද
සතර නැණැසින් බැලූ මෙම ලෙ ද

**අන්වය:** මෙ ලෙසට මිනතඳ ඵ වහු රද පැවසූ සඳෙහි නි වරද දද වරහු මෙම ලෙද සතර නැණැසින් බැලූ.

**අර්ථය:** මෙ සේ සිත් සතුටු කරවන ඒ වගු රජ තුමා කි විට, කිසි දෙසක් නැති උතුම් බමුණෝ මෙ සේ ශාස්ත්‍ර ඥනයෙන් බැලූහ.

59 ඵ කුමරියගෙ සොබ න
තිසැකින් ඇඟ ලකුණු දූ න
නැවත ද පසුත වූ න
නැකත හෝරා රැස ද සොයමි න

**අන්වය:** සොබන ඵ කුමරියගෙ ඇඟ ලකුණු තිසැකින් දූන, නැවත ද පසුත වුණ නැකත හෝරා රැස ද, සොයමින.

**අර්ථය:** රූ මත් ඒ කුමාරිකාවගේ ශරීර ලක්ෂණ ති සැක වම බලා දූන, නැවතත් ඇය උපන් නැකත ද, හෝරාව ද, රාශිය ද සොයා,

විස්තර: නැකත: කුම්භ නැකතකින් උපති දරුණු බලන ලදී. අස්විද බෙරණ, කැති, රෙහෙණ, මුවසිරිස, අද, පුනාවස පුස, අස්ලිස, මා, පුවපල්, හත, සිත, සා, විසා, අනුර, දෙට, මුල, පුවසල, උතුරුසල, සුවන, දෙනට, සියාවස, උත්‍ර පුටුප, පුවපුටුප, හා රේවති යනුවෙන් නැකැත් විසි හතකි.

හෝරා: ඒ ඒ ග්‍රහයනට නියමි වේලාව මෙයින් හැඳින්වේ. රවි, චන්ද්‍ර, කුජ, බුධ, ගුරු, ශුක්‍ර, ශනි, රාහු, කේතු යනුවෙන් ග්‍රහයෝ නව දෙනෙකි.

රාශ :මේ, රාශිය හෙවත් ලග්නය යි, මේෂ, වෘෂභ, මිථුන, කටක, සිංහ, කන්‍යා, තුලා, වෘශ්චික, ධනු, මකර, කුම්භ, මීන යනු දොළොස් රාශයි.

60 බොලු පඩිලා එ තැ ත
ගැණගෙණ සුබා' සුබ දූ ත
එ රදහට පිය ව ත
මෙ සේ පැවිසූ අගුණ මතු ව ත

අන්වය: එ තන බොලු පඩි ලා, ගැණ ගෙන සුබ අසුබ දූත, පිය වන එ රදහට මතු වන අ ගුණ මෙ සේ පැවැසූ.

අර්ථය: එ තැන්හි කවඩි බෙල්ලන් හෙලා, ගණන් කර, සුබ අසුබ දූත, මතු ඇති විය හැකි අ ගුණ එව පිය රජුට මෙසේ ඔව්හු කීහ.

විස්තර: බොලු පඩි: නිමිති සැරුවන් සුබාසුබ දූන ගැන්ම සඳහා හෙළන කවඩි බෙල්ලන්.

61 හිමි සඳ එ කුමරි තොමො මතක ලා
පිරි සඳ මෙන් යොවුනඟ පත් ක ලා
තොම හිඳ මෙ පුරෙන් ගොස් සැඟවි ලා
රුදු තද මිගිඳෙක් හට අසුවෙ ලා

අන්වය: හිමි සඳ, මතකලා එ කුමරි තොමො, පිරි සඳ මෙන් යොවුන් අඟ පත් කලා, තොම හිඳ, මෙ පුරෙන් සැඟවිලා ගොස්, රුදු තද මිගිඳකුහට අසු වෙලා.

අර්ථය: හිමි සඳිනි, රූමත් ඒ කුමාරිකාව, පිරුණු සඳ මෙන් ස පිරුණු තරුණ වියට පත් විට, මෙහි නො සිට, මේ නගරයෙන් පැන ගොස් සිංහයකුට අසු වී,

විස්තර: මිහිදෙක්හට අසුවෙලා, යනු වැරදි යෙදුමකි. මිහිදෙක් හට යනු මිහිදකුහට කියා ශුද්ධ විය යුතු ය.

62 එම, සිරද හට සරණ ව තො සා
සැම සැප හැර මහ වන මැද වැ සා
සාම, නැති දුක් විදිතෙය පව් ති සා
මෙම අගුණය පැමිණෙයි නො ව ල සා

අන්වය: තොසා, එම සිරදහට සරණ ව සැම සැප හැර මහ වන මැද වැසා, පව් තිසා සාම නැති දුක් විදිතෙ ය. නො ව ලසා මෙම අ ගුණය පැමිණෙයි.

අර්ථය: සතුටින් ඒ සිංහ රාජයාට භාර්යාව වී, සියලු සැප අත්හැර, මහ වනය මැද ජීවත් වෙමින්, පෙර පව් නිසා, මෙ සේ පලක් නැති ලෙස දුක් විඳින්නී ය. වැඩි කල් නොගොස් මේ අ ගුණය පැමිණේ,

විස්තර: සාමනැති දුක්: පලක් නැති දුක්.

63 දද වරහු මෙ ලෙස ට
අසා කී බස් එ රදු ට
තද දුක් වැද සිත ට
මෙ ලෙස සලකා නැණින් එම වි ට

අන්වය: මෙ ලෙසට එ රදුට දද වරහු කී බස් අසා සිතට තද දුක් වැද, එම විට නැණින් මෙ ලෙස සලකා,

අර්ථය: මෙ සේ ඒ රජුට උතුම් බමුණන් කී බස් අසා රජු සිතෙහි මහත් ශෝකයෙන් එ වේලෙහි නුවණින් මෙ සේ කල්පනා කර,

64 සැහවී නොයන ලෙ ස
එක් ටැඹ ගෙයක් නො ව ල ස
සදවමින් කර උ ස
ලමින් රුකවල් අවට දස දෙ ස

අන්වය: සැහවී නො යන ලෙස, නො ව ලස, උස කර එක් ටැඹ ගෙයක් සදවමින් අවට දස දෙස රුකවල් ලමින්,

අර්ථය: කුමරියට සැඟවී යැමට අ පහසු වන පරිදි වහා ම උසින් යුතු එක් කණුවකින් යුතු ගෙයක් සදවා, හැම පැත්තෙන්ම රුකවල් ලවා,

විස්තර: වැඹ: සකු ස්තම්භ ශබ්දයෙන් බිඳුණේය. සාණුවකි. එක් වැඹ ගෙයක වහලය බිම ගැටෙන සේ සෑදිය හැකි හෙයින් ඉන් පිට වීම අපහසු ය.

65 එ විමන තුළැ ලමි න්
නො දක්වා හැම පිරිමි න්
එ කුමරිය වඩමි න්
සුරැක ගන්නෙමි සිතා ල පෙමි න්

අන්වය: එ විමන තුළැ ලමින්, හැම පිරිමින් නො දක්වා, එ කුමරිය වඩමින් ල, පෙමින් සුරැක ගන්නෙමි සිතා.

අර්ථය: ඒ විමානය තුළ හිඳුවා කිසි පිරිමියකු නො දකින ලෙස, කුමරිය හදා වඩමින් ආදරයෙන් රැක ගනිමි යි සිතා.

විස්තර: හැම පිරිමින්: මෙය කිසි පිරිමින් යි යෙදීම වඩා උචිත ය.

66 වඩු සත කෙළ පැමි ණි
වඩුවන් රැස් කරවමි ණි
එ රද තුම ගුණ මි ණි
ඇරඹි විමනක් කරන විලසි නි

අන්වය: වඩු සත කෙළ පැමිණි, වඩුවන් රැස් කරවමිනි, ගුණ මිණි, එ රද තුම විමනක් කරන විලසිනි ඇරඹි.

අර්ථය: වඩු ශිල්පය නිමාවට දත් වඩුවන් රැස් කර, ගුණ නමැති මැණික් වලින් සැරසුණු ඒ රජතුමා විමානයක් කරවීමට පටන්ගත්තේය.

67 නො ම දු රැ රජ මිමනට එක් පෙදෙස සා
පි වි තු රැ කර බිම සදමින් විගස සා
වැ ඩ ක රැ මොහොතක සිටවූ වැඹය සා
පු ර ඳු රැ පහයෙව් සැදවූ විමන සා

අන්වය: රජ බවනට නොම දුරැ එක් පෙදෙසසා, විගසසා බිම පිවිතුරැ කර සදමින්, වැඩ කරැ මොහොතක සිටවූ වැඹයෙසා පුරඳුරැ පහය එව් විමනක සැදවූ.

අර්ථය: රජ මාළිගාවට සමීප එක් තැනෙක වහා ම බිම පිරිසිදු කර සඳ යහපත් වෙලාවක සාණුවක් සිටුවා, ශක්‍ර භවනය වැනි විසාල ගෙයක් සැදවී ය.

**විස්තර:** වැඩකරු: වැඩකරු යනු යහපත් යන අරුත් ඇත්තේ ය. වැඩ දයක යන අරුතෙහි ම මෙය වැටේ.

කාව්‍යශේඛරයෙහි

පුරන දම් බුදුකුරු-එකල බෝසත් වැඩකරු

යනුවෙනුත්, කුස්තන්තිනු හටනෙහි

වැඩකරු අප හිමි මහ සෙන් රැගෙ නෝ
මඩවල ගම රැදින සැතැපෙමි නෝ

යනුවෙනුත් මෙය යෙදී ඇත.

68 සොඳුරු විලස හැම කටයුතු නිමවමි න
විදුරු ගිර සෙ එහි අවටින් බබල න
පවුරු පදනමුත් බඳවා තරයෙ න
අතුරු නැති ව මුර සිටුවා තැන තැ න

**අන්වය:** හැම කටයුතු සොඳුරු විලස, නිමවමින, විදුරු ගිර සෙ එහි අවටින් බබලන පවුරු පදනමුත් තරයෙන බඳවා, තැන තැන අතුරු නැතිව මුර සිටුවා.

**අර්ථය:** සියලු කටයුතු හොඳින් නිම කර, දියමන්ති පර්වත මෙන් එහි වටේට බබළන ප්‍රාකාර පදනම් ද ස්ථිර ලෙස බන්දවා, තැනින් තැන නො කඩවා මුර තබා.

**විස්තර:** පදනම්. පවුරු පදනම් සාමාන්‍යයෙන් යුද වැදීමේදී බඳවන බලකොටු වේ.

69 අපමණ කිරි මව ගණ සහ කුමරි ද
එවිමණ තුළ ලා වැඩුමට යුතු ලෙ ද
නොපමණ මහ සැප දී පිරිවරට ද
සුරකිණ ලෙස සැලසී නරනිඳු ස ද

**අන්වය:** අපමණ කිරි මව ගණ සහ කුමරි ද, යුතු ලෙද වැසුමට එ විමන තුළ ලා, නො පමණ මහ සැප දී, පිරිවරට ද සුරකින ලෙස නරනිඳු සද සැලසී.

**අර්ථය:** බොහෝ කිරි මව් සමූහයා සමග කුමරිය ද නිසි පරිදි වැඩීමට ඒ විමන තුළ රඳවා බොහෝ සැප දී ඔවුන් රැකීමට පිරිවර ද රජ තුමා සැලසවී ය.

70 මෙලෙස වලා තුළ වැඩෙනා පුර ස ද
විලස කෙමෙන් වැඩෙමින් එ කුමරි ස ද
සතොස වඩන දුටුවන් සිරි සත ලෙ ද
සොළසැ විරිදි වී යොවුනෙන් පිරිස ද

අන්වය: මෙ ලෙස වලා තුළ වැඩෙනා පුර සඳ විලස එ කුමරි සඳ කෙමෙන් වැඩෙමින්, සිරි කත ලෙද දුටුවන් සතොස වඩන සොළසැවිරිදි වී යොවුනෙන් පිරි සඳ,

අර්ථය: මෙ සේ වලා කුලක් තුළ වැඩෙන පූර්ණ චන්ද්‍රයා මෙන් ඒ කුමාරිකාව ක්‍රම ක්‍රමයෙන් වැඩී, ශ්‍රී කාන්තාව පරිදි දුටු දුටු දනන්ගේ සිත් සතුටු කරවන සොළොස් වියට පැමිණි තරුණ බවෙන් පිරී සිටින විට.

71 සො බ න කනක ගිරි මුදුනත රඟ දෙන රන් මයු රා
හ ර ණි සුමුදු දිගු වරලස තිල් ව බැබළී නොව රා
වැ සු න අඹක් මේ ගැබකින් සඳුගේ සිරි අයු රා
න ඳ න වේය දුටු දන මන ඇගෙ තලලත පව රා

අන්වය: සොබන කනක ගිරි මුදුනත රඟ දෙන රන් මයුරා හරණි, සුමුදු දිගු වරලස නොවරා තිල් ව බැබැළී. අඹක් මේ ගැබකින් වැසුණු සඳුගේ සිරි අයුරා, ඇගෙ පවරා තලලත දුටු දන මන නඳන වේය.

අර්ථය. ශෝභන වූ රත්රන් පර්වතයක් මුදුනෙහි නටන රන් මොණරකු බඳු ඇගේ ඉතා මෘදු, දිගු කෙස් කළඹ සම්පූර්ණයෙන් ම තද නිල් පැහැයෙන් බැබළිණි. කොටසක් වලා කුලෙකින් වැසුණු චන්ද්‍රයාගේ ශෝභාව ගත් ඇගේ උතුම් නළල් තලය දුටු දුටු අයගේ සිත සතුටු වේ.

විස්තර: ශෝභන රත්රන් පර්වතය මත වූ මොනරාගේ පිල් කළඹ ඇගේ කෙස් කළඹට උපමා කර තිබේ. මෙහිදී රත්රන් පර් වතය කුමරියගේ සිරුරට උපමා වේ. මෙහි දක්වෙන චිත්‍රය කාව්‍ය කර්තෘනුගේ දස්කමට දෙස් දෙයි.

72 බ ඹ කත දිනු එ කතගෙ දෙව් දුනු සරි බැම සහ ලා
නි ඹ පත මෙන් බබලයි දුටු ලෙව් සත සිත ලොබ ලා
ර ඹ පැල වන් යුග පත් නැහැ රණකුස සිරි උසු ලා
බි ඹ පල වැනි රතු දෙඅදර සම විය දල පබ ලා

අන්වය: බඹ කත දිනු එ කතගෙ දෙව් දුනු සරි බැම සහලා, දුටු ලෙව් සත සිත ලොබලා නිඹ පත මෙන් බබලයි. යුග පත් රඹ පැල වන් නැහැ රන් අකුස සිරි උසුලා. බිඹ පල වැනි රතු දෙ අදර පබලා දල සම විය.

අර්ථය: සරස්වතියටද වඩා උසස් වූ ඒ කුමරියගේ දෙව් දුනු සමාන බැම යුවල ලෝක වාසීන්ගේ සිත්හි ආදරය ඇති කරවා, කොහොඹ කොළ මෙන් බැබැලේ. කොළ දෙකක් සහිත කොමල් පැලයක් වැනි නැහැය රත්රන් සොණ්ඩුවක ශෝභාව දැරීය. බිම්බ ඵල වැනි රතු දෙ තොල් පබළු පත් සමාන විය

විස්තර: යුග පත්: පත් යුග යනු පද පෙරළිම වෙදුණු තැනකි. පත්‍ර යුග්මය, කොළ දෙක.

73 ඉඳුවර ඉඳු නිල් මිණි සරි එ කුමරි දිගු නුව නා
සිරි සර දෙ අදර දලු දිව් කෙමි මුව සර රඳ නා
සුදු තර දත් මුවරද පෙළ සම විය නිති දිලෙ නා
පිය කර තුන් හිර රැඳි ගෙළ සක ජය ගෙණ සොබ නා

අන්වය: එ කුමරි දිගු නුවනා ඉඳුවර, ඉඳු නිල් මිණි සරි. සිරි සර දෙ අදර දලු, දිව් කෙම, මුව සර රඳනා නිති දිලෙනා සුදු තර දත් මුවරද පෙළ සම විය. පිය කර තුන් හිර රැඳි ගෙළ සක ජය ගෙන සොබනා.

අර්ථය: ඒ කුමරියගේ දිගු දෙ නෙත්, නිල් මහනෙල් හා ඉන්ද්‍ර නීල මාණික්‍ය සම විය. ශෝභමාන වූ, දෙ තොල් නමැති පෙති වලින් ද, දිව නමැති කර්ණිකාවෙන් ද යුත් මුහුණ නමැති නෙළුම් මලෙහි රැඳෙමින් නිතර බැබලෙන ඉතා සුදු දත් එහි මකරන්ද (මල් රේණු) හා සම විය. මනහර ඉරි තුනක් රැඳුණු බෙල්ල, සක් ගෙඩියක ශෝභාව ද පරදවා බැබලේ.

විස්තර: කුමරියගේ මුහුණ නෙළුම් මලකට උපමා කෙරේ. දෙ තොල් එහි පෙති ය. ඇගේ දිව එහි කෙමිය වේ. දත් මල් රේණු වලට උපමා කෙරේ.

74 එරවණ කර කත මල් දම් වැනි විය ඇගෙ දෙක රා
සපිරුණ පියයුරු යුග රන් තිසර රහුද අයු රා
පියවත නැබ රන් පියුමෙකි වසා රොද'ලි, තිත රා
සසොබන සිහිනිහ මද රද දුනු මිට වැනි පව රා

අන්වය: ආගෙ දෙ කරා ඵරවණ කර කත මල් දම් වැනි විය. සපිරුණ පියයුරු යුග රන් තිසර රදහු අයුරා. පියවත නැබ වසා රොද අලි තිකරා රන් පියුමෙකි. සසොබන සිහින් ඉහ පව්රා මද රද දුනු මිට වැති.

0001856



අර්ථය: ඇගෙ දෙ අත් ඓරාවණ ඇතාගේ හොඬෙහි වූ කාන්තිමත් මල් දම් වැන්න. පිරුණු පයෝධර යුග්මය රත්රන් හංස රාජයින් හා සමාන වේ. ප්‍රිය උපදවන නාභිය විසා රෝද නමැති මී මැස්සන් සමූහයෙන් ගහන රත් රන් නෙළුම් මලකි. ශෝභමාන ඇගේ සිහින් ඉඟ උතුම් අනංග රාජයාගේ දුන් නෙහි මිට වැනි වේ.

විස්තර: විසා රොද: නාභියෙන් පහළට ඇති සිහින් කෙස් වැල
මද රද දුනු මිට: අනංගයාගේ දුන්න උක් දණ්ඩකින් සැදුණේ ය. එහි මිට ඉතා සිහින් ය.

75 උතුරු එ කත යොවුන් ගඟෙහි පුලින තලෙව් උකු ලා
සොඳුරු වටොර මින රම් රඹ කඳ සිරි ගෙන බබ ලා
උතුරු සයුර නැගි බුබුලෙව් සපිරුණු දණ සහ ලා
මියුරු ගෙලෙ'ව් දුටු දන මින පිණවන දහ යුව ලා

අන්වය: උතුරු එ කත උකුළා යොවුන් ගඟෙහි පුලින තල එව්. සොඳුරු වට උර මින රම් රඹ කඳ සිරි ගෙන බබලා. සපිරුණු දණ සහ ලා උතුරු සයුර නැගි බුබුලු එව් දුටු දන මන පින වන දහ යුගලා මියුරු ගෙල එව්.

අර්ථය: ඒ උතුම් කුමරියගේ උකුළ තරුණ විය නමැති ගඟෙහි වැලි තලාව වැන්න. සුන්දර වට කලවා පියකරු කෙසෙල් කඳන්හි ශෝභාව දරයි. පිරුණු දණහිස් දෙක උතුරු සයුරෙන් නැගුණු දිය බුබුලු සමාන වේ. දුටු දුටු අයගේ සිත් පිනවන ජඞ්ඝා යුග්මය මොනරුන්ගේ බෙල්ල වැනි වේ.

76 රත ඟිලි දල සුසැදුනු එ කුමරිවර පද තඹ රු
ගත දිලි යෙන මෙ බඳු රුවින් ජය ගෙන කත් නිත රු
සිත දිලි වන යොවුන් සයුර සපැමිණ සිට එත රු
නැත පිලි රූ ලිය මෙ කතට සුර සර හැර ලො'ත රු

අන්වය: එ කුමරි වර පද තඹරා රත් ඇඟිලි දල සු සැදුණු. ගත දිලියෙන මෙ බිඳු රුවින් නිතරා කත් ජය ගෙන. සිත් ඇදිලි වන යොවුන් සයුර සපැමිණී සිටි එ තරා, මෙ කතට පිළි රූ ලිය සුර සර හැර ලො තරා නැත.

අර්ථය: ඒ කුමරියගේ උතුම් පා නැමති නෙළුම් මල් රත් පැහැති ඇඟිලි නමැති පෙති වලින් අලංකාර විය. මෙ බඳු බබළන රූප ශ්‍රීයෙන් නිතර සියලු කාන්තාවන් පරදවා, තරුණ විය නම් වූ සාගරයට පැමිණ සිටින විට ඇයට සමාන ස්ත්‍රියක් දිව්‍ය අප්සරාවන් හැර මෙ ලොව නැත.

**විස්තර:** එ තරා: එ විට, ඒ කාලයේ. කවි සිළුමිණෙහි බොහෝ සර්ගයන් පටන් ගැනෙන්නේ එ තර යන පදයෙන් සමගිනි.

සුර සර–දිව්‍ය අප්සරාවන්. අප්සර වෙනුවට සර පමණක් යෙදී ඇත.

77 මෙ බ ළු අනගි ලකුණු දුරු එ කුමරි සිරි රඳ නා
තොම ළු වරඟනන් තලලත තිලකෙව් දිසි සොබ නා
ක රි ළු විලස කලා සපිරි යොවුනඟ පත් වෙමි නා
ප සි ළු ව මුලු දඹ දිවැ තුළ බැබලූ රූ සිරි නා

**අන්වය:** මේ බළු අනගි ලකුණු දුරු සිරි රඳනා එ කුමරි, තොමළු වරඟනන් තලලත තිලකෙව් සොබනා දිසි. කලා සපිරි කරිළු විලස යොවුන් අඟ පත් වෙමිනා, මුලු දඹදිව තුළ රූ සිරිනා පසිළු ව බැබළූ.

**අර්ථය:** මෙ වැනි අගනා ලක්ෂණයන්ගෙන් යුතු ශෝභා සම්පන්න ඒ කුමාරිකාව බොහෝ උතුම් කාන්තාවන්ගේ නළලෙහි තිලකයක් මෙන් ශෝභමාන වූවා ය. කලාවන්ගෙන් පිරුණු චන්ද්‍රයා මෙන් තරුණ වියෙන් සම්පූර්ණ ව, මුලු දඹදිව පුරා රූප ශ්‍රීයෙන් ප්‍රසිද්ධ වී බැබළුණා ය.

**විස්තර:** කලා සපිරි කරිළු: චන්ද්‍රයා කලාවන් දහසයකින් යුතු ය. සම්පූර්ණ චන්ද්‍රයා මේ දහසය කලාවන්ගෙන් පිරේ.

78 දි ව ම තු රෙ න් දපණය කළ නා මෙනෙවිය ලෙසි නා
න ව දි මු තෙ න් වැසි නොදිලුන සඳ මෙන් සොමි කිර ණා
ලො ව පි රි මි න් නො දුසා ම එක් පා විමනෙහි වස නා
සි ව ක ත ව න් එකුමරි සඳ පස්කම් රස නොදු නා

**අන්වය:** දිව මතුරෙන් දපණය කළ නා මෙනෙවිය ලෙසිනා, නව දිමුතෙන් වැසි නො දිලුණු සොමි කිරණා සඳ මෙන්, ලොව පිරිමින් නො දුසා ම පස්කම් රස නො දුනා, එක් පා විමනෙහි වසනා සිව කත වන් එ කුමරි සඳ,

**අර්ථය:** දිව්‍ය මන්ත්‍රයෙන් දපණය කරන ලද නාග කන්‍යාවක මෙන් ද, අළුත් වලා කුළෙන් වැසීම නිසා බැබළීමක් නැති සෞම්‍ය රශ්මියෙන් යුත් චන්ද්‍රයා මෙන් ද, ලෝකයෙහි පිරිමින් නො දුටු, පස් කම් රස ද නො දුටු එක් මැණ ගෙයි වසන පාර්වතිය වැනි ඒ කුමාරිකාව,

**විස්තර:** දිමුත: සකු, ජීමූත ශබ්දයෙන් බිඳී ආයේ ය වලා කුළකි
එක් පා: එක තණුවකින් යුත්,

79 ය හ ලු ළියන්ගෙන් ඇසූ කල පස් කම් රස වෙසෙ සා
සි ය ලු ගතෙහි ඇවිලී ගිය රාග ගින්න නෙලෙ සා
ම හ ලු දෙමව් පියනට වත් ලජ්ජා නැති පිණි සා
සි ය ලු ලොවෙහි ගින්නක් නැත රාග ගින්න විල සා

අන්වය: යහළු ළියන්ගෙන් පස් කම් රස වෙසෙසා ඇසූ කල, සියලු ගතෙහි රාග ගින්න නෙ ලෙසා ඇවිලී ගිය. මහලු දෙ මව්පියනට වත් ලැජ්ජා නැති පිණිසා, සියලු ලොවෙහි රාග ගින්න විලසා ගින්නක් නැත.

අර්ථය: මිතුරියන්ගෙන් පංචකාම සම්පත්තිය ගැන අසන්නට ලැබුණු විට මුළු ශරීරය පුරා ම නොයෙකුත් විදියෙන් රාග ගින්න ඇවිලී ගියේ ය. මහලු දෙ මව්පියන් කෙරෙහි වත් ලැජ්ජාවක් ඇති නො කරන හෙයින් මුළු ලෝකයේ ම රාග ගින්න සම වූ තවත් ගින්නක් නැත.

විස්තර: රාග ගින්න: සකු රංජ් ධාතුවෙන් නිපන් රාග යන්නෙන් අදහස් කෙරෙන්නේ යමක් කෙරෙහි ඇති වන ආසාව හෙවත් ඇලීම ය. මෙහි දක්වෙන්නේ කාමුක හැඟීම් මුදුන් පත් කරවා ගැන්මේ ආසාව යි.

80 ර ද සො ර සතුරන් දිය ගිනි යන රුදු බිය මෙ ප සා
අ ද ග ර නා පොළොන් මතඟ සිහ දිවි වග වල සා
ත ද ගො ර යක් බූ රකුසන් ගෙන් වන බිය වෙසෙ සා
සෙද නො ර නො ව රාග ඇල්ම ඇතිහට වෙයි අව සා

අන්වය: රද, සොර, සතුරන්, දිය, ගිනි යන රුදු මෙ පසා බිය, අදගර නා, පොළොං, මතඟ, සිහ, දිවි, වග, වලසා, තද ගොර, යක්, බූ, රකුසන්ගෙන් වන බිය වෙසෙසා සෙද නොර නො ව රාග ඇල්ම ඇතිහට අවසා වෙයි.

අර්ථය: රජ, සොර, සතුරන්, ජලය, ගින්න යන මේ විසාල පස් මහ බිය ද, පිඹුරු, නා, පොළොං, ඇත්, සිංහ, කොටි, ව්‍යාඝ්‍ර වලස්, බිහිසුණු යක්ෂ, රාක්‍ෂස, ආදි භූතයන්ගෙන් වන භය විශේෂ ද නොතොර ව, ඔහා ම, රාග ඇල්ම ඇති අයහට අවශ්‍යයෙන් ම සිදු වේ.

විස්තර: අදගර: සකු අජගර ශබ්දයෙන් බින්න යි.
මතඟ: සකු මාතංග ශබ්දයෙන් බිඳී ආයේ ය.
බූ-භූත යනු අමනුෂ්‍යයන් සඳහා යෙදෙන්නකි.

81 ලො ව ඇති හැම බිය හැම දුක් හැම විපත් ද නපු රු
තො ව ලහ පැමිණෙයි රාගාලය කලහට තිබො රු
සු ව විදැ විසු එ කුමරි සඳ රාග සිතින් රුදු රු
ලො ව පවතින විලස රාජ කුලයට කළෙ නිස රු

අන්වය: ලොව ඇති හැම බිය, හැම දුක්, හැම නපුරු විපත් ද, රාගාලය කලහට නො වලහ පැමිණෙයි නි බොරු. සුව විඳැ විසු එ කුමරි සඳ රුදුරු රාග සිතින් ලොව පවතින විලසට රාජ කුලයට නිසරු සෙළෙ

අර්ථය: ලෝකයෙහි ඇති හැම බිය, දුක් හා නපුරු විපත් රාගයෙන් මත් වූ අය කෙරෙහි නො නැවති පැමිණෙති යි යනු සත්‍යයක් ම ය. සැප විඳිමින් හුන් ඒ කුමාරිකාව නපුරු රාග සිතින් යුතු වූ හෙයින් ලොව නො මැකෙන කැළලක් පරිදි රාජ කුලයට නින්දා ගෙන දුන්නී ය.

විස්තර: මෙහි නිසරු යනු නිගරු ය යි විය යුතු යි.

82 එ ලෙ ස ට කුමරි තොම් ද, පස් කම් රසෙහි නොමඳ,
ඇලුමෙන් උමතු කතසෙ කිසිත් නො දු නා
ග හ සෙ ට දිනිඳු පවර, අත් හැර විළඹු නිකර, පත් සඳ
අවර ගිරට පබා රැගෙ නා
ඇ ය හ ට පිහිට දෙ ගුරු, කිරි මව් සමඟ ඇමති, මූර කළ
සෙබළ යො බළ, යෙහෙළි අඟ නා
මෙ හැ ම ට ඝොර ගෙයින්, නික්මී හැරිය දෙරින් වේ මඟ
ගෙවා ගොසින්, ඇතුළු පුරෙ නා

අන්වය: එ ලෙසට කුමරි තොම් ද, පස්කම් රසෙහි නො මඳ ඇලුමෙන් උමතු කත සෙ කිසිත් නො දනා, ගහ සෙට පවර දිනිඳු විළඹු නිකර අත් හැර, පබා රැගෙනා අවර ගිරට පත් සඳ, ඇයහට පිහිට දෙ ගුරු කිරි මවු සමඟ ඇමති, මූර කළ සෙබළ, යො බළ, යෙහෙළි අඟනා මෙ හැමට ඝොරා ගෙයින් නික්මී හැරිය දෙරින් ඇතුළු පුරෙනා වේ මඟ ගෙවා ගොසින්.

අර්ථය: එ සේ කුමාරිකාව ද, පංච කාම රසයෙහි බොහෝ වූ ඇල්මෙන් පිස්සියක මෙන් කිසිවක් නො දැන, ග්‍රහයන්ගේ නායක උතුම් සූර්‍ය්‍යා විල් තැමති කාන්තාවන් සමූහය අත් හැර, තම ප්‍රභාව ද රැගෙන බටහිර පර්වතයට පැමිණි විට, නොහොත් හවස් වූ විට, ඇයට පිහිට පිණිස සිටි දෙ මා පියන්, කිරි මවු වරුන්, ඇමති, මූර භටයන්, යෝධයන්, මිතුරියන්, ආදි මේ සියල්ලනට හොරා දෙර හැර ගෙයින් පිටත් වී, නගරය මැදින් වීදි ගෙවා ගොස්.

27

විස්තර: පස් කාම රස: ඇස්, කන්, නාසය, දිව යන ඉන්ද්‍රියන් පිනවීමත් ස්පර්ශ රසයත්, පස් කම් රස ලෙස හැඳින් වේ. එනෙත් මේ කවෙහි පස් කම් රස යනුවෙන් දක්වෙන්නේ මෙසෙසින් ස්පර්ශ රසය බව පෙනේ.

83 ති ල ඹ ර තැගුණු සොඳුරු, උල්කාපාත අයුරු,
මැඩගෙන අඳුරු රුදුරු, මහව පැමි ණා
හැ ම ව ර යකුන් වසන, මහ අමු සොහොන් තිබෙන,
නෙක ඝොර සපුන් ගහණ, එ මහ මගි නා
පි රි ව ර වෙමින් දිලෙන, නැම තරු කැලන් බැහැර,
හරිමින් තනි ව දුවන, සඳුගෙ සිරි නා
දි ව ස ර ලෙසින් තනි ව, කම් සැප ලොබින් එදින,
කිසි බිය නො වී එ යන, සඳෙහි ලසි නා

අන්වය: තිල් අඹර තැගුණු සොඳුරු උල්කා පාත අයුරු රුදුරු අඳුරු මැඩගන, මහව් පැමිණා හැම වර යකුන් වසන මහ අමු සොහොන් තිබෙන, නෙක ඝොර සපුන් ගහන, එ මහ මගිනා පිරිවර වෙමින් දිලෙන හැම තරු කැලන් බැහැර හරිමින් තනි ව දුවන සඳුගෙ සිරිනා, දිවසර ලෙසින් තනි ව, කම් සැප ලොබින් එ දින කිසි බිය නො වී ලසිනා එ යන සඳෙහි.

අර්ථය: තිල් අහසෙහි උදවූ සුන්දර උල්කාපාතයක් මෙන් බිහිසුණු අන්ධකාරය මැඩ ගෙන මහට පැමිණ, කවදත් යක්ෂයින්හට නිවාස වූ මහ අමු සොහොන් තිබෙන, නොයෙක් ඝෝර සර්පයන්ගෙන් ද ගහන ඒ මහ මගින් පරිවාර තාරකා සමූහය අත් හැර තනිව ම දුවන චන්ද්‍රයාගේ ශෝභාවෙන් දිව්‍ය කන්‍යාවක මෙන් තනි වී කාම සම්පතෙහි ලෝභ ව එ ද කිසි බියක් නැති ව වහාම යන විට.

විස්තර: උල්කාපාත: අහසින් වැටෙන ගිනිබෝල වෙසෙසකි. වල්ගාතරු එ යන:මෙහි එ යනු මාත්‍රා පිරවීම සඳහා යෙදුණකි.

84 නෙක බඩු රැගෙන එ විට, වෙළඳම් පිණිස එ රට
සපැමිණි වෙළඳු පෙරට, පැමිණි එර දු
දැ ක එම වෙළඳු සොඳට; සතුටු ව, තමන් වෙතට,
කැඳ වූ වෙළඳ දෙටුව, වී ය බිරි දු
දු ක හැර එවුන් සමඟ, විඳිමින් එ කම් සැපත,
ලළ රට නමැති රටට, යන සෙ පසි දු
සැ ක තොව දෙ දෙනා එ දින උමය ග තිසුරු සිරිත,
වන මැද්තුරට පැමිණ, ගියෝ එ රු දු

**අන්වය:** එ විට නෙක බඩු රැගෙන වෙළෙඳම් පිණිස එ රට සපැමිණි වෙළඳු පෙරට පැමිණි එ රද දූ දුක, එම වෙළඳු සොඳට සතුටු ව තමන් වෙතට කැඳවූ. (ඈ) වෙළඳ ඳදටුට කිරිඳු වී ය. දුක හැර එවුන් සමග එ කම් සැපත විඳිමින් ලළු රට නමැති පසිදු රටට යන සේ සැක නො ව, දෙ දෙන එ දින, උමයගත ඉසුරු සිරින එ රුදු වන මැද තුරට පැමිණ ගියෝ.

**අර්ථය:** එ විට නොයෙකුත් බඩු සහිත ව වෙළෙඳාම් සඳහා එ රටට ආ වෙළෙඳුන් ඉදිරියට ඒ රජ කුමරිය පැමිණියා ය. ඇය දුටු වෙළෙන්දේ සතුටු වී, ඈ තමන් වෙතට කැඳවූහ. නායක වෙළෙන්දට ඈ භාර්යාව වූවා ය. සිතෙහි දුක හැර ඔවුන් හා කම් සැප විඳ විඳ, ලාට රට නමැති ප්‍රසිද්ධ රටට යන ලෙස කිසි සැකක් බියක් නැති ව ඒ දෙ දෙන එදා ඊශ්වර හා පාර්වතියගේ ශෝභාවෙන් ඒ මහා වනය මැදින් යන්නට වූහ.

**විස්තර:** ලළු රට: ලාට රට නම් වූ මෙය උතුරු ඉන්දියාවේ කොටසකි.
උමයගනිසුරු: උමගත + ඉසුරු. මෙවැනි අස්වාභාවික ලෙස සන්ධි වූ පද කීපයක් ම මේ කාවෙහි එයි.

85 ස ත් ද ලි නා සල දලිනා කුදු දලිනා දිගු දලි නා
හෙ ම් ද ලි නා කිරි දලිනා සිරි දලිනා සිරි පෙලි නා
සු ග ද ලි නා තුන් දලිනා සිව් දලිනා පස් දලි නා
සැ දි එ ව නා යන දෙදෙනා දුටු එදිනා තුටු සිති නා

**අන්වය:** එ දිනා තුටු සිතිනා යන දෙ දෙනා සත් දලිනා, සල දලිනා, කුදු දලිනා, දිගු දලිනා, හෙම් දලිනා, කිරි දලිනා, සිරි දලිනා, සිරි පෙලිනා, සුග දලිනා, තුන් දලිනා, සිව්දලිනා, පස් දලිනා සැදි එ වනා වනා දුටු.

**අර්ථය:** එ දින සතුටු සිතින් යන දෙ දෙන රුක් අත්තන, බෝ, මී උක්, අරළු, කිරිපලු, ඇද්දෙමට, බෙලි. කොබෝලීල, එරබදු, හී රුක් හා පස් පැති කොළවලින් යුතු ගස් ආදී වෘක්ෂයන් ගෙන් පිරුණ ඒ වනය දුටහ.

86 සොරක දි රා රිටුමනරා කුමුකු තුරා එ කළුහ රා
ප ර ම ද රා එසමදරා තිදර ද රා අගරු තු රා
සු ව ද හ රා දවලහරා පණස වරා මිදි තුව රා
පු තු මෙ තු රා වන අතුරා කුමරි වරා දුටි එ ව රා

අර්ථය: ගොර, කිහිරි, කොහොඹ, මහර, පුවක්, කළුවර, පර, මදරා, සමදරා, දේවදාරු, අගිල්, සුවඳ ගෙනෙන සුදු සඳුන්, කෝන්, වරා, මිදි, තගර යන මේ ගස් වනය තුළ කුමරිය දුටුවා ය.

87 ලි ය ස බ ඳ තුරු සමුඳු මල් පල ඳු සිටි එ ස ඳ
වැ ද ස ප ඳ එහි තිබඳු මල්හි හිඳ කල තින ඳ
සො ඳ සු ව ඳ ඇති තිබඳු වන සමුඳු ඇසුව න ඳ
එ ව න මැ ද එ විඳ විඳු දෙදෙන සෙඳු ගියෝ එ ඳ

අන්වය: ලිය සබඳු තුරු සමුඳු මල් පල ඳු සිටි එ සඳ, එහි තිබඳු වැද, සපඳු මල්හි හිඳු කල තිනඳු තිබඳු සොඳ සුවඳු ඇති වන සමුඳු තඳු ඇසුව, දෙ දෙන එ වන මැද එ විඳ විඳු සෙඳු එඳු ගියෝ

අර්ථය: වැල් හා සම්බන්ධ වූ ගස් සමූහය මල් හා ගෙඩි දරමින් සිටින අතර මී මැස්සෝ එහි නිතර වැස මල්වල හිඳ නාද කරති. නි තොර ව; සොඳ සුවඳින් යුත් වන ගහනයෙහි සතුටු සිතින් ඒ නාද අසමින් දෙ දෙන සුවයෙන් එහා මෙහා එඳු වනය මැදින් ගියෝ ය.

විස්තර: සපඳු: ෂට් පදිනු. පා සයක් ඇති හෙයින් මී මැස්සෝ ෂට් පදිනු වෙති.

88 ම ලි තව්ලා ලියෙහි වෙලා සිටි ලකලා රුකින'ව ලා
ප ල බ ර ලා අතු නැමිලා මුහු කරලා එම ඉදි ලා
තෙදද කැලා කන එ කලා බිම වැටිලා තුබු එප ලා
ගෙන අවුලා වෙන අවුලා නොදූනෙකලා ගියෝ ප ලා

අන්වය: මලින් අවලා ලියෙහි වෙලා සිටි ලකලා රුකින් අවලා පල බර ලා, අතු නැමිලා මුහු කර ලා එම ඉදිලා, තෙ දද කැලා එකලා කන, බිම වැටිලා තුබු එපලා අවුලා ගෙන, වෙන අවුලා නො දූන, එ කලා පලා ගියෝ.

අර්ථය: මල් ගැවසී වැල් එතී සිටි අලංකාර ගස් වල ගෙඩි බර වී අතු නැමී ගියේ ය. මෝරා ඉදී ගිය එම ගෙඩි නොයෙකුත් පක්ෂීන් විසින් කා දමා බිම වැටී තිබුණෙන් ඒවා අවුලා ගෙන, වෙන කිසිත් අවුලක් නො දූන එ කල ඔව්හු පලා ගියහ.

විස්තර: වෙන අවුලා: වෙන කිසි විපතක් හෝ (ඉදිරියට) වන්නා වූ විපතක්.

89 ද ද ති ක රා එවන තුරු තුරු සිසරු හිඳ නොව රු
ඉ දු ණෙ වරු එපෙල ඉරා රසය උරා බී මදු රා
තු ටිනොතරා උතුන් කරා පැන පියරා හඬන ස රා
කු ම රි ව රා සවන් පුරා ඇසිනොවරා යන අත රු

අන්වය: දද තිකරා එවන තුරු නො වරු තුරු සිස් අරු හිඳ, එවරු ඉදුණු එ පෙල ඉරු මදුරා රසය උරු බී එ තරු තුටින් උතුන් කරු පැන, පියරු හඬන සරු යන අතරා කුමරි වරු නො වරු සවන් පුරු ඇසි

අර්ථය: පක්ෂි සමූහයා ඒ වනය තුළ හැම තැන ම ගස් මුදුන්හි හිඳ, ඒ කාලයේ ඉදුණු ගෙඩි ඉරු මිහිරි රසය බී, එ විට ම සතුටින් ඔවුනොවුන් කරු පැන කරන ප්‍රිය නාදයන් ඒ කුමාරිකාව යන ගමන් ම කන් පුරා හොඳින් ඇසුවා ය.

විස්තර: පිය රා: ප්‍රිය රාවයන්, නාදයන්
සරා: ස්වර, ශබ්ද.

90 ර ඹ අ ර ණා බිඳ හරණා නද සාරණා නෙක වර ණා
තු ටු සිති නා රුව් දෙමිනා තිති රහනා මියුරුග ණා
ස ර ඟ ගණා විදූ මරණා එහි සරණා සබර ග ණා
දූක එ ව නා යන දෙදෙනා තුටු සිතීනා ගියො එ දි නා

අන්වය: රඹ අරණා බිඳ හරණා නද කරනා නෙක වරණා, තුටු සිතිනා රුව් දෙමිනා තිති රහනා මියුරු ගණා, සරඟ ගණා විදූ මරනා එහි සරනා සබර ගණා එ වනා දූකා තුටු සිතිනා යන දෙ දෙනා එ දිනා ගියො.

අර්ථය: කෙසෙල් වනය බිඳ දමමින් නාද කරන නොයෙකුත් ඇතුන් ද, සතුටු සිතින් නාද දෙමින් තියුණු නටන මොනර සමූහයන් ද, මුවන් විද මරමින් එහි හැසිරෙන වැදි රංචු ද ඒ වනයෙහි දූක සතුටු සිතින් ඒ දෙ දෙන එදින යන්නට වූහ.

විස්තර: සරඟ: සකු සාරඟ ශබ්දයෙන් බිඳි ආදේශය. සරඟ යනු මුවෝ ය.
සබර: සකු ශබර ශබ්දයි. මේ වැද්දෝ ය.

91 නෙ ග ජ රු ලා මැද පැනළා මුදුන පලා රුගෙන මො ලා
ක න එ ක ලා විකුම්බලා ඇති ලකලා මිහිදු කැ ලා
නෙ මු ව කැ ලා බිය කරලා විසු එකලා නෙක සදු ලා
දූ කනො ව ලා සිත බියලා දෙ දෙන කලා ගියෝ ව ලා

**අන්වය:** නෙ ගජ රැලා මැද පැනලා මුදුන පලා මොල රැගෙන එ කලා කන විකුම් ඇති ලකලා මිගිඳු සැලෑ බලා, නෙ මුව කැලා බිය කරලා එකලා විසු නෙක සදුලා නො වලා දුකා සිත බිය ලා කලා දෙ දෙන වලා ගියෝ,

**අර්ථය:** නොයෙකුත් ඇත් සමූහයන් මැදට පැන, ඔවුන්ගේ හිස් මුදුන් පලා, මොල රැගෙන තනි ව සැමින් වික්‍රමය පෙන්වන සිංහයන් බලා, බොහෝ මුවන් බිය ගෙන්විමින් තනි ව වසන ව්‍යාඝ්‍රයන් ද හොඳින් දුක සිතෙහි බියත් පෙම්වත්හු දෙ දෙන වනයෙහි ගමන් ගත්හ.

**විස්තර:** සදුලා: සකු ශාර්දූල ශබ්දයෙන් බිඳුණේ ය. ශාර්දූල යනු ව්‍යාඝ්‍රයෝ ය.

කලා දෙදෙනා: කාන්ත ශබ්දයෙන් බිඳුණු කල යනු පෙම්වතුන් අදහස් කෙරෙන පදයකි, දෙ දෙන + එකලා යනුවෙන් ද මීට අරුත් කිව හැකි ය.

92 ම ග දෙ ප සා සිටි සරසා නෙ තුරු රැසා එක විල සා
එ ව න නි සා සිටිය විසා හැම දවසා සිල් විම සා
හැ ර අ ල සා වඩින උසා රැකි තවසා නෙක තව සා
ය න එ ලෙසා කුමරි තොසා දුක සකසා ගිය තොල සා

**අන්වය:** මග දෙ පසා එක විලසා සරසා සිටි නෙ තුරු රැසා වසා සිටිය එ වන නිසා හැම දවසා සිල් විමසා, අලසා හැර, උසා වඩින තවසා රැකි නෙක තවසා එ ලෙස යන කුමරි තොසා දුක සකසා නො ලසා ගිය.

**අර්ථය:** මග දෙ පස එක පරිදි අලංකාර කරමින් සිටි නොයෙකුත් තුරු පෙළ විසින් වසා සිටි ඒ වනය ඇසුරු කර, හැම ද සිල් රකිමින් අලස කම් හැර, උත්සාහ වඩමින් තපස් රකින බොහෝ තවුසන්, එ පරිදි යමින් සිටි කුමාරිකාව දුක සතුටු ව හොඳින් වහ වහා ගියා ය.

**විස්තර:** සිල් විමසා: සිල් රැක.
සකසා: පාලි සක්කච්චං. පදයි හොඳින්. මනා සේ.

93 ඉ දු රු ස ඳ මන නන්ද කැළු නන්ද සරමෙ න්ද
පි පි නොමඳ නෙත කුන්ද අර වින්ද හස ක න්ද
ඇ ති හැ ම ඳ පිරි වන්ද කර මෙන්ද දළක න්ද
දු වි එ ස ඳ සර නන්ද දුක් සින්ද මන බ න්ද

අන්වය: ඉඳුරු සඳ මින නන්ද කල නන්ද සර මෙන් ද, නො මඳ පිපි නෙක කුන්ද, අරවින්ද, සස සන් ද සැමි ද ඇති, චන්ද සර මෙන් ද දල සන්ද පිරි, මන බන්ද දුක් සින්ද සර කන්ද එ සඳ දුටි.

අර්ථය: ශක්‍රයාගේ සිත සතුටු කල නන්දා පොකුණ මෙන් ද, බොහෝ සේ පිපුණු නොයෙක් කුන්ද, නෙළුම්, හා හංස සමූහයන් සැම ද ඇති, සඳ රැස් වැනි වූ ද, දිය කඳින් පිරුණු, සිතෙහි දුක් සිඳ දමන විල් පෙළ එ විට දකින ලදී.

විස්තර: ඉඳුරු: ඉන්ද්‍ර, වේද කාලයෙහි ඉන්ද්‍ර යනුවෙන් වෛදිකයන්ගේ නායක දෙවියා හැඳින් විණි. බෞද්ධයින්ගේ ශක්‍ර දෙවියාටද ඉන්ද්‍ර යනුවෙන් අවිශේෂයෙන් යෙදේ.

94 සො ද එ ම ගා සිටිය ලඟා මත මතගා අනෙක ව ගා
පැත මූ ර ගා යනෙන මිගා නෙක සරගා කෙළින ර ගා
නැ ගි ගි ර ගා කිඳුරු රඟා සිටින රඟා එම නර ගා
යන මේ ර ගා කුමරි මිගා නොව ම ලඟා ගිය එම ගා

අන්වය: සොඳ එ මගා ලඟා සිටිය අනේක වගා මත මතගා, පැත මූර ගා මගා යන එන නෙක සරගා කෙළින රඟා, ගිරි අගා නැගී කිඳුරු රඟා සිටින එම රඟා නරගා, මේ රඟා මගා යන කුමරි ලඟා නො ව ම, එ මගා ගිය.

අර්ථය: යහපත් ඒ මාර්ගයෙහි ළං ළං ව සිටි නොයෙකුත් මර්ගයන්හි මත් ඇතුන් ද, සෑ යමින් පැන පැන මාර්ගයෙහි යමින් මුවින් සෙල්ලම් කරන අයුරු ද පර්වත මුදුනට නැගී කිඳුරන් ක්‍රීඩා කරන හැටි ද බලමින්, මෙ සේ කුමාරිකාව ඉක්මිතින් ඒ මාවතෙහි ගමන් ගත්තා ය.

විස්තර: නරගා: මේ නරඹා යනු වෙනුවට එළිසමය රැකෙන සේ යෙදූ දුබල යෙදුමකි.

කිඳුරු: කින්නර ශබ්දයෙන් බිඳී ආයේ ය. මේ වනයෙහි මෙන් ම දියෙහි ද ඇතැයි සැලැකෙන එක් ජීව කොට්ඨාශයකි. මොවුන්ගේ සිරුරෙන් අඩක් මනුෂ්‍ය යන්ගේ මෙනි.

95 මෙ බ ඳු වන සිරි බලා එ කුමරි වෙළඳ දෙටු සමගින් එ ද
ප සි ඳු වන මැද සුදුසු ඉඩමක රැ නවාතැන් ගත් ස ද
නොමඳු තද රළු පරළු බලතර මිග රදෙක් අවිදින් සෙ ද
වෙළ ඳු දූකැ උන තුරට සෙන හඩ විලස නදකැරැ පිනු ස ද

අන්වය: එ කුමරි මෙ බඳු වන සිරි බලා එදා වෙළෙඳ දෙටු සමගින් පසිඳු වන මැද සුදුසු ඉඩමක රැ නවාතැන් ගත් සඳ, නො මිඳු තද රළු, පරළු බල තර මිග රදකු සෙද අවිදින් වෙළඳු දූකැ උන් අතුරට සෙන හඩ විලස නද කරැ පිණු සඳ.

අර්ථය: ඒ කුමාරිකාව මෙ වැනි වන සෞන්දර්‍යය බලමින් ගොස්, එ දින වෙළෙඳ නායකයා සමග ඒ ප්‍රසිද්ධ වනය මැද සුදුසු තැනක රැ නවා තැන් ගත් විට, බොහෝ තද පරුෂ බලවත් සිංහ රාජයකු වහා පැමිණ වෙළෙඳුන් දැක, ඔවුන් මැදට සෙන හඬ වැනි නාද කර පැන්න විට දී.

විස්තර: මිග රදෙක්...පිණූ සඳ, යනු වැරදි යෙදුමකි. මිග රදෙක් යනුවෙන් පෙර විබත්හි සිටින කර්තෘ උක්ත වන ක්‍රියාවක් මෙහිනැත. එය මිග රදකු සි ශුධ විය යුතු ය.

96 එ න ද අසමින් වෙළඳු බිය ගෙන බිසව ඇරලා ගිය ක ලා
නොමද රුසිරෙන් සුරඟණක මෙන් දිලෙන
එ තරුණ බිසව දුක ලා
සි ර ද රති සැප විඳිම් සිතමින් පැමිණී බිය හැර පසන් කර ලා
එ ල ඳ තම පිට ඉඳුවමින් ගෙන ගොසින් ගිරිලෙන තුලෙහි ලා

අන්වය: එ නද අසමින් වෙළඳු බිය ගෙන බිසව ඇර ලා ගිය කලා, නො මිඳ රුසිරෙන් සුරඟනක මෙන් දිලෙන එ තරුණ බිසව දුකලා, රති සැප විඳිම් සිතමින් සි රද, පැමිණී බිය හැර පසන් කර ලා, එ ළඳ තම පිට ඉඳුවමින් ගෙන ගොසින්, ගිරි ලෙන තුලෙහි ලා.

අර්ථය: ඒ නාදයෙන් බියට පත් වෙළෙන්දෝ බිසව එ තැන ම දමා පැන ගියහ. අතිශය රූප ශ්‍රීයෙන් දෙවඟනක මෙන් බබළමින් සිටි ඒ තරුණ කුමරිය දුටු සිංහ රාජයා ඇය හා රති සැප විඳින අදහසින්, ඇයට පැමිණි බිය පහ කර ඇ සනසවා, තම පිටෙහි හිඳුවා ගෙන ගොස් ගල් ලෙනක් තුළ තැබී ය.

විස්තර: පැමිණී බිය. මේ කුමරියට පැමිණි බිය යි.

97 ර ති සැපත විඳ එ ලඳ සමඟින් සත් දිනක් එහි වසමි නා
රුති ගොදුරු කත පිණිස පිටතට යන්ට නික්මී සැකයෙ නා
නි ති නොයත මේන් එ කත වෙත'තක ගල් දෙරක්
එහි වසමි නා
නැති සියලු උපකරණ ගෙන දී බිසව සිත තුටු කරමි නා

අන්වය: එ ලඳ සමඟින් රති සැපත විඳ, එහි සත් දිනක් වසමිනා, රුති ගොදුරු කත පිණිස පිටතට යන්ට නික්මී, එ කත නිති වෙත අතක නො යන මෙන් සැකයෙනා ගල් දෙරක් එහි වසමිනා, නැති සියලු උපකරණ ගෙන දී බිසව සිත තුටු කරමිනා.

අර්ථය: කුමරිය සමඟ රති සැප විඳ, එහි සතියක් වැස, තමන් කැමති ආහාර සතු සඳහා සිංහයා පිටතට යැමට පිටත් විය. කුමරිය වෙත දෙසක යති සි සැකයෙන් ලෙන ගල් දොරකින් වසා, අවශ්‍ය සියලු උපකරණ සොයා දී ඇය සතුටු කර,

විස්තර: රුති; කැමති යන අරුත් ඇති රුචි යන්න අනු ව සැදුණු වචනයකි. අලගියවන්නයන් ද, රුචි වෙනුවට රුති යනු යෙදූ හැටි.

කුස ජාතකයෙහි

නැති යන බස් නො කියමිනා–රුති රුති දේ ගෙන දෙමිනා
නිති සුත පෙම් වඩවමිනා–ඇති කළ අම්මෙයි සොදිනා

යනාදි තැන් වලින් පෙනේ.

98 ස නො ස විය යුතු තමන් සිය කුල සිහ දෙනුන්වත්
ලොබ නො කොට හැ ර
එ අ ස යන එන ඇතුන් දුටුවත් ගොදුරු ආලය
සිතිනි දුරු කා ර
නි දෙ ස දෙව්ඟණ සිරින් බබලන බිසව සහ
සිහ රදහු ගොරත ර
මෙ ලෙ ස තිරිසන් මිනිස් එ දෙදෙන සදේ ලප ලෙස
විසූ පෙමක ර

අන්වය: ස නොස විය යුතු තමන් සිය කුල සිහ දෙනුන්වත් ලොබ නො කොට හැර, එ අස යන එන ඇතුන් දුටුවත් ගොදුරු ආලය සිතිනි දුරු කර, ගොර තර සිහ රදහු සහ නි දෙස දෙව්ඟන සිරින් බබලන බිසව මෙ ලෙස තිරිසන් මිනිස් එ දෙ දෙන සදේ ලප ලෙස පෙම කර විසූ.

අර්ථය: ප්‍රිය කළ යුතු තම ජාතියෙහි සිංහ ධෙනුවන් හට පවා ආසා නැති ව, තමන් අසළින් යන ඇතුන් දුටුවත්, කෑම කෙරෙහි ආසාවක් ද නැත් ව සිටි, ඒ බිහිසුණු සිංහ රාජයා හා දෙසක් නැති ව දෙවගනක මෙන් බබළන තිසව යන මේ තිරිසන් මිතිය් දෙ දෙන සඳ හා එහි ළපය මෙන් වෙනස් නොවී ප්‍රේම යෙන් පසු වූහ.

විස්තර: සඳේ ළප ලෙස යනු, සඳ හා එහි ළපය ලෙස යනු විය යුතු ය.

99 ක රු මයෙන් පෙර මෙ ලෙස මිගිඳුට අසුව වසනා තිසව වා
ද රු ගැබෙක් විය මහත් පින් ඇති සිහි ව මවු පිය එම වි වා
දූ රු ව ආ බව සිතා ඔවුනැර ඉතා තද දුක් විඳින කල වා
දූ රු තෙ දෙළ දුක් ලකුණු එබිහව දරු පතට වන විලස වා

අන්වය: පෙර කරුමයෙන් මෙ ලෙස මිගිඳුට අසුව වසනා තිසවටා, මහත් පින් ඇති දරු ගැබෙක් විය. එම විටා මව් පිය සිහි ව, ඔවුන් ඇර දූරු ව ආ බව සිතා, ඉතා තද දුක් විඳින කලටා, දරු පතට වන විලසටා, එ බිහව තෙ දෙළ දුක් ලකුණු දූරු.

අර්ථය: පෙර පවින් මෙ සේ සිංහයකුට අසු වී වසන කුමරිය කුස බොහෝ පින් ඇති දරුවෙක් පිළිසිඳ ගත්තේය. එ විට මව් පිය සිහි වී, ඔවුන් අත් හැර ආ බව සිතා දුක් විඳින විට, දරු ගැබක් ඇති වූ විට ඇති වනපරිදි ඒ බීහව නොයෙකුත් දෙළ දුක් ලකුණු දූරුවා ය.

100 සොඳු රු සිහිනිහ ඉතා දළවිය සුරත්'දර සුදුමැලි වියේ
ම හ රු රන් කඳ ලෙසට බැබළුනු පිරි සිරුර සුදු මැලි වියේ
ත ඹු රු වන් වත මලානික විය පියයුරන් පුබු කළු වියේ
බ දු රු රති කෙළි ඇලුම් මඳ විය දුඹුලැඹුල් රස පිය වියේ

අන්වය: සොඳුරු සිහින් ඉහ ඉතා දළ විය. සු රත් අදර සුදුමැලි වියේ. මහරු රන් කඳ ලෙසට බැබැළුණු පිරි සිරුර සුදු මැලි වියේ. තඹුරු වන් වත මලානික විය. පියයුරන් පුබු කළු වියේ. බඳුරු රති කෙළි ඇලුම් මඳ විය. දුඹුල් ඇඹුල් රස පිය වියේ.

අර්ථය: ඇගේ සුන්දර වූ සිහින් ඉහ ඉතා කර්කශ වී ය. තද රතු දෙ තොල් සුදුමැලි විය. අගනා රන් කඳක් මෙන් බැබැළුණු පුෂ්ටිමත් ශරීරය සුදුමැලි වී ගියේ ය. නෙළුම් මලක් මෙන් වූ මුහුණ මලානික වී ය. තන පුඩු කළු විය. උතුම් රති ක්‍රීඩාව කෙරෙහි ආසා අඩු විය. වියළි ඇඹුල් රස ප්‍රිය විය.

විස්තර: දෙල දුක් ලකුණු මෙහි විස්තර විය. දෙල දුක් ලකුණු විස්තර වශයෙන් කාව්‍යශේඛරයේ තුන් වෙනි සර්ගයේ දක්වේ.
බදුරු: සකු භද්‍ර ශබ්දයෙන් බිඳී ආයේය. යහපත්, උතුම් යන අරුත් ඇත.

101 මෙ යු රු දෙල දුක් ලකුණු දක එම මියිදු තැන තැන
ඇවිද වන මැ ද
මි යු රු පල වැල ගෙනැත් කවමින් වෙනත් උවටැන්
කරන එම ස ද
එ ද රු ගැබ මොහොරමින් දසෙකඩමස් පිරී මෙන්
පැහැර විළි ර ද
කු ම රු කුමරිය යන දෙ බිත්තක් පසුත කළෙ එම
බිසව මන න ද

අන්වය: එම මියිදු මෙඅයුරු දෙල දුක් ලකුණු දක, වන මැද තැන තැන ඇවිද, මියුරු පලවැලගෙනැත් කවමින්, වෙනත් උවටැන් කරන එම සඳ, එ දරු ගැබ මොහොරමින් දස එකඩ මස් පිරී මෙන් විළි රද පැහැර, එම බිසව මනනඳ කුමරු කුමරිය යන දෙ බිත්තක් පසුත කළා.

අර්ථය: ඒ සිංහයා මෙ බඳු දෙළ දුක් ලකුණු දක, වනය පුරා ඇවිද මිහිරි ගෙඩි වර්ග ගෙනැවිත් කවමින් ද, වෙනත් උපස්ථාන කරමින් ද, සිටිද්දී, ඒ දරු ගැබ වැඩී මාස නවය හමාරක් ගත වීමෙන් පසු ව ප්‍රසව වේදනා ඇති වී, එම බිසව පියකරු කුමරුවකු හා කුමරියක යන සොහොයුරකු හා සොහොයුරියක පසුත කළා.

විස්තර: දෙබිත්තක්: සහෝදර සහෝදරියන් දෙ දෙනකු.
පල වැල: පලා එල යන්නෙන් බිඳී ආයේය. ලොකු කුඩා ගෙඩි

102 එ ස ද දෙ ගුරු වර සොඳී නා-සෙද,
පැ හැ ද තරිඳු රුස් වන් මෙන් කිර ණා
සු භ ද කුමරුනට සොබ නා-යළි
පෙ ම ද ව බත් දී ලා සත් මසි නා

අන්වය: තරිඳු රුස් කිරණා වන් මෙන්, එ සඳ දෙ ගුරු වර සෙද සොඳිනා පැහැද, සුභද සොබනා කුමරුනට යළි පෙමද ව සත් මසිනා බත් දීලා.

අර්ථය: සඳ රුස් කිරි මුහුදට වැටුණාක් මෙන්, එ වේලෙහි දෙ මව් පියෝ වහා පැහැදී, යහපත්, රූ බර කුමරුවාට නැවතත් ප්‍රේමයෙන් තෙත් ව, සත් මසින් බත් දී,

විස්තර: කිරණ: කිරි + අණ. ක්ෂීරාර්ණවය, කිරි මුහුද.
පෙමද: ප්‍රේමාද්‍ර යන්නෙන් බිඳිණි. ප්‍රේමයෙන් තෙත් වී.

103 කුමරුට සිහබා නම් නා–නං
කුමරිට සිහවල්ලිය යන නම් නා
මෙලෙසට නම් ලත් දෙ දෙ නා–පුර
තරිඳුව සම වී වැඩුණහ කෙමෙ නා

අන්වය: කුමරුට සිහ බා නම්නා, නං කුමරිට සිහ වල්ලිය යන නම්නා මෙ ලෙසට නම් ලත් දෙ දෙනා, පුර තරිඳුව සම වී කෙමෙනා වැඩුණාහ.

අර්ථය: කුමාරයා සිංහබා යනුවෙන් ද, ඔහුගේ නැගනිය වූ කුමරිය සිංහ වල්ලි යනුවෙන් ද, නම් ලැබූහ. මෙ සේ නම් ලද ඒ දෙ දෙනා පුර පක්ෂයෙහි චන්ද්‍රයා මෙන් ක්‍රමයෙන් වැඩුණෝ ය.

විස්තර: නං කුමරිට: නැගනිය වූ කුමරියට.

104 සක්විති මිහි පති සදි සා–සක්
රුවන ලැබූ, සිත තුටු කර වීග සා
දුක් නො ව මව් පිය සතො සා–සක්
දෙක මෙන් කුමරුන් රැකිහු ය වෙසෙ සා

අන්වය: සිත තුටු කර වීගසා සක් රුවන ලැබූ සක්විති මිහිපති සදිසා මව් පිය දුක් නො ව සතොසා සක් දෙක මෙන් වෙසෙසා කුමරුන් රැකිහු ය.

අර්ථය: සිත සතුටු කරමින්, වහා චක්‍ර රත්නය ලද චක්‍රවර්ති රජු මෙන්, මව් පිය දෙ දෙන දුකක් නැති ව සතුටින් ඇස් දෙක මෙන් විශේෂයෙන් දරුවන් දෙ දෙන රක්ෂා කළහ.

විස්තර: සක් රුවන: චක්‍ර වර්ති රජ කෙනකුට ලැබෙන රත්න හතකි· හස්ති, අශ්ව, පරිනායක, ගෘහපති, මාණික්‍ය, ස්ත්‍රී, හා, චක්‍ර රත්න යනු වෙති·

සක් දෙක: මෙහි සක් යනු ඇස් ය මෙය සකු චක්ෂුඃ, පාලි චක්ඛු ශබ්දයන්ගෙන් බිඳී ආයේ ය.

105 සිහබා කුමරිඳු සඳු වා–වස්
සොළොස සපිරි සඳ හොස් මවු වෙන වා
සුරතල් කෙපුලෙන් එවි වා–තම,
වෙනස අසයි ඔවගෙන් මේ ලෙස වා

අන්වය: සිහ බා කුමරිඳු සඳුවා වස් සොළස සපිරි සඳ, මව් වෙතවා ගොස්, එ විටා සුරතල් තෙපුලෙන් මවගෙන් මේ ලෙසටා තම වෙතස අසයි.

අර්ථය: සිංහ බාහු කුමාරයාට දහසය වියෙ සම්පූර්ණ වූ විට, ඔහු මව සමීපයට ගොස්, සුරතල් වචනයෙන් තම මවගෙන් මෙ සේ තමාගේ ( හා පියාගේ ) වෙතස අසයි.

106 සො දු රු මැණියනි නද නා-මෙම,
න පු රු වෙණෙහි තිරතුරු ව ම වස නා
කෙස රු ට ද අපි දෙදෙ නා-පිය,
අ යු රු නො වන්නට කාරණ කුම නා

අන්වය: සුගම යි.

අර්ථය: ප්‍රිය වඩන සුන්දර වූ මැණියෙනි, මේ නපුරු කැලෑවෙහි නිතර ම ජීවත් වෙන කේසර සිංහයාට ජාතක ව උපන් අපි දෙ දෙන පියා මෙන් නො ව වෙන සවරූප දරන්නේ කුමන හේතුවක් නිසා ද ?

107 මෙ ලෙ ස ඇසූ විට කුම රු- යළි
එ බ ස ට එ බිසව පවසයි මේ යු රු
දි යැ ස කුලග තිලක යු රු-දස,
දි යැ ස සදිසි වගු තිරිඳුට් මහ රු

අන්වය: කුමරු මෙ ලෙස ඇසූ විට, එ බසට යළි බිසව මෙයුරු පවසයි.

108 ද ව නොයෙක් සැපතින් වැඩි ලා-මම්,
බෝව කරපු පවකින් පෙර මෙ ක ලා
මේ ව න මැදට ම වැදි ලා-විත්,
සී ර ද හට අසු වීමෙන් මෙ ක ලා

අන්වය: දියැස කුල අග තිලක අයුරු දස දිය ඇස සදිසි මහරද වගු තිරිඳුට ද ව, නොයෙක් සැපතින් වැඩි ලා මම් පෙර බෝව කරපු පවකින් මෙ කලා, මේ වන මැදට ම වැදිලා විත් මෙ කලා සී රද හට අසුවීමෙන්.

අර්ථය: කුමාරයා මෙ සේ ඇසූ විට, ඊට බිසව නැවතත් මෙ ලෙසින් පිළිතුරු දෙන්නී ය. සූර්‍ය වංශයට තිලකයක් බඳු ලෝක දහයට ඇසක් වැනි, ශ්‍රේෂ්ඨ වගු රජතුමාට ජාතක ව, බොහෝ සැපතින් යුතු ව වැඩී, එ හෙත් පෙර කරන ලද දරුණු පවකින් දැන් මෙ සේ වනයට වැද, සිංහ රජයාට අසු වී.

විස්තර: දියැස කුල, ලෝකයෙහි ඇස ලෙස සූර්යයා සැලැකේ. දියැසකුල යනු සූර්ය වංශය යි.

109 දූ න් විඳුනා දුක් නොම දේ-හැම,
අ න් තිම කර කියනට බැරි මෙ ස දේ
වෙ න් ව උපන් බව මෙ ලෙ දේ-පුත,
මෙ න් න මෙ කාරණ ය සි කී එ ස දේ

අන්වය: දූන් විඳිනා නො මදේ දුක් හැම මෙ සදේ අන්තිම කර කියනට බැරි. පුත, වෙන් ව උපන් බව මෙ ලෙදේ මෙන්න මේ කාරණය යි එ සදේ කී.

අර්ථය: දූන් මා විඳිනා බොහෝ දුක් සියල්ල සීමාවක් කර කිය නො හැකි ය. මෙන්න මේ හේතුව නිසා ය ඔබ සිංහයාට වෙනස් ව ඉපදීම යනුවෙන් කිසව කීවා ය.

110 මෙ ලෙ ස කිසෝවර කී බ සා-ඇසූ,
නී දෙ ස සිංහබා කිමරිඳු විම සා
දි ගැ ස කෙනෙක් පෙර දව සා-මෙමි,
වි ල ස මිගෙක් සහ විසූවෙද කෙ දෙ සා

අන්වය: සුගම යි.

අර්ථය: මෙ සේ උතුම් කිසව කී වදන් ඇසූ නිර්දෝෂී සිංහ බාහු කුමාරයා කල්පනා කර බලා, පෙර මේ අයුරු කො තැනක ගැහැනියක් සිංහයකු හා ජීවත් වී දූ යි.

විස්තර: මිගෙක් සහ විසුවෙද යනු සදෙස් ය. මිගකු සහ විසුවෙ ද යනුවෙන් මෙය ශුද්ධ විය යුතු ය.

111 ය න බස කියමින් එක ලා-ගුණ
නැ ණ බල ඇති කුමරිඳු සඳ ලක ලා
ව න යෙන් යන මෙන් සිත ලා-ගැල
වෙ න උවමක් කළෙ මෙ ලෙසින් තුමූ ලා

අන්වය: යන බස එ කලා කිය මින්, ලකල, ගුණ නැණ ඇති කුමරිඳු සඳ වනයෙන් යන මෙන් සිත ලා මෙ ලෙසින් තුමූලා ගැලවෙන උවමක් කළෙ.

අර්ථය: යන වචන කියමින් ගුණ නැණ ඇති ඒ උදාර කුමාරයා වනයෙන් පැන යැමට සිතා ගැලවීමට මෙ ලෙස ඥනවන්ත උපායක් කළේ ය.

**විස්තර:** **නූ මුලා:** මෝඩ නො වූ, නො රැවටෙන, ඥානවන්ත.
**උවමක්:** උවම යනු උපමාව යන්නෙන් බිඳී ආ වචනය යි. මෙහි උවම යනු යෙදී ඇත්තේ උපාය වෙනුවට ය.

112 මි ග ප ති  ගොදුරට ගිය විට වල  ටා
ර ති ප ති  සම වන් කුමරිඳු රුව  ටා
බ ලැ ති  බව දැන ගැණුමට ඔහු  ටා
බ ර ඇ ති  මහ ගල් දෙර හැර පිට  ටා

**අන්වය:** මිග පති වලටා ගොදුරට ගිය විට, රුවටා රති පති සම වන් කුමරිඳු ඔහුටා බල ඇති බව දැන ගැනුමට, බර ඇති මහ ගල් දෙර පිටටා හැර.

**අර්ථය:** සිංහයා කැලයට ආහාර සොයා ගිය අතර, රූපයෙන් අනංගයා හා සම වූ කුමාරයා, ඔහුට ශක්තිය ඇති තරම දැන ගැනීම සඳහා බර ඇති ඒ ගල් ලෙන් දෙර පිටට ඇර.

113 දූ ර  ට පතස් යොදුනක් ගොස් නො ලසි  න
පෙ ර  වරු අවුදින් ගල් දෙර වසමි  න
පෙ ර  සිටි විලසට හුන් සඳ ගිරි ලෙ  න
ගොර  සී රද සපැමිණී ඒ නොමදැ  න

**අන්වය:** නො ලසින පතස් යොදුනක් දූරට ගොස්, පෙර වරු අවුදින් ගල් දෙර වසමින පෙර සිටි විලසට ගිරි ලෙන හුන් සඳ, ඒ නොම දැන ගොර සී රද සපැමිණී.

**අර්ථය:** වහා පතස් යොදුනක් දූරට ගොස්, දහවල් වීමට පෙර, පෙර වරුවෙහි ම ආ පසු විත්, ගල් දෙර වසා පෙර සිටි පරිදි ලෙනෙහි සිටි විට පැමිණි සිංහ රාජයා, ඒ කිසිත් නො දැක්කේය.

**විස්තර:** යොදුන සැතපුම් 16 ක දුර ය යි සලකනු ලැබේ.

114 මෙ ම ලෙ ද  තම බල විමසා එ දි  නා
පෙ ර ලෙ ද  සී රද ගොදුරට ලොබි  නා
ගි ය ස ද  වන මැද දිනයක සෙදි  නා
ම වු ල ද  නැඟණිය යන එම දෙ දෙ  නා

**අන්වය:** එ දිනා මෙම ලෙද තම බල විමසා, පෙර ලෙද සී රද ගොදුරට ලොබිනා වන මැද ගිය සඳ, එක දිනෙක සෙදිනා මවු ලඳ, නැඟණිය යන එම දෙ දෙනා.

**අර්ථය:** එ දා මෙසේ තමාගේ ශක්තිය පරීක්ෂා කර බලා, පෙර පරිදි සිංහ රාජයා කෑම සොයා වනයට ගිය අතර, එක්දි තෙක වගා තම මව හා නැගණිය යන දෙ දෙන (රැකෙන,)

115 ත ම දෙ කරත හිඳුවා නික්මෙමි නා
හැ ම බිය ඇති එම වන පෙත මැදි නා
තොම දුරු මහෙකින් දිවගෙන ගොසි නා
ග ම කට සැපමිණි මිනිසුන් වස නා

**අන්වය:** තම දෙ කරත හිඳුවා නික්මෙමිනා, හැම බිය ඇති එම් වන පෙත මැදිනා, තොම දුරු මහෙකින් දිව ගෙන ගොසිනා, මිනිසුන් වසනා ගමකට ස පැමිණි.

**අර්ථය:** තමාගේ කරෙහි හිඳුවාගෙන පිටත් ව ඒ භිහිසුණු වනය මැදින් කොටි පාරක් දිගේ ගොස් ජනයා වසන ගමකට පැමිණියේ ය.

116 තො ම තු රු සෙවනෙහි දන ගණ හැසිරෙ න
වි සි තු රු මහ තුගයක් දැක බබල න
එ කු ම රු එම රුක් සෙවනෙහි උන් තැ න
තො ර තු රු අසමින් ගම් වැසි හැම දෙ න

**අන්වය:** දන ගණ තොම හැසිරෙන තුරු සෙවණෙහි බබලන විසිතුරු මහ තුගයක් දැක, එ කුමරු එම රුක සෙවණෙහි උන් තැන, ගම් වැසි හැම දෙන තොරතුරු අසමින්.

**අර්ථය:** ජන සමූහයා නොගැවසෙන රුක් සෙවණෙහි බබළමින් තිබුණු ලස්සණ තුග ගසක් දැක, කුමාරයා එහි සෙවණෙහි සිටි විට, ගම් වැස්සෝ කරුණු එහි විත් විස්තර අසන්නට වූහ.

117 එ කා ල බිසව මයිල් රජුගෙ පුත් වන කුමරෙක් ගරු න ර
ප බ ල සෙනෙවිරත් තනතුරු ලබා වැජඹි එ ම පුරව ර
ල කා ළ බිසව කි තොරතුරු තො වරදවා ඇසූ එ ම ව ර
සෙ බ ළ කෙනෙක් ගොස් එ පුරට සෙනෙවි රදුට සැලකළ ව ර

**අන්වය:** සු ගම යි.

**අර්ථය:** ඒ කාලයෙහි එම බිසවගේ මාමා කෙනකු වන රජකුගේ, පුත් කුමරෙක් උසස් බල වත් සෙනෙවිරත් තනතුරු ලබා, ඒ ම පෙදෙසෙහි විසී ය. රූමත් බිසව කී තොරතුරු හරි හැටියට අසා ගත් එක් භටයෙක්, ඒ පුවත එම සෙනෙවි රත් තුමා හට දැන්විය.

**විස්තර: සෙනවි රත්:** රජුගේ සේනාවන්හි නායක පදවිය දැරුවේ සෙනෙවි රත් තුමා ය. පුරාණයේ රජුගේ පුරෝහිතයා හා සෙනෙවි රත් තුමා ඉතා බලවත් නිලධාරි දෙ දෙන ය

118 එ බ ස අසා ඉතා සතුටු සෙනෙවි රදහු එ පුර සම ත
බෙර ස විලස සම කරවා ලද පස් මල් ඉසැ මගව ත
නි.යැ ස මිතුරු නුවර විලස සැරසිලි කර නිමවි අන ත
එ ලෙස වෙනෙන් ආ තුන්දෙන මඟුලෙන් සැඳවා තම වෙ ත

**අන්වය:** එ බස අසා ඉතා සතුටු සෙනෙවි රදහු, එ පුර සමත බෙර ඇසැ විලස සම කරවා, මගවත ලද පස් මල් ඉසැ, තියැස මිතුරු නුවර විලස අනත සැරසිලි කර නිම වී. එ ලෙස වෙනෙන් ආ තුන් දෙන මඟුලෙන් තම වෙත සැඳවා.

**අර්ථය:** ඒ පුවත අසා බොහෝ සතුටට පත් සෙනෙවිරත් තුමා, ඒ නගරය පුරා බෙර ඇසක් මෙන් සම තලා කරවා, මාර්ගයෙහි පස් මල් ඉස, කුවේරයාගේ පුරය මෙන් නොයෙකුත් සැරසිලි කර වී ය. එ මෙන් ම, වනයෙන් ආ තුන් දෙන උත්සවාකාරයෙන් තමා සමීපයට සැඳවී ය.

**විස්තර:** **සමත:** සමස්ත ශබ්දයෙන් බිඳ ගන්නා ලද්දකි. මුලු, සම්පූර්ණ යන අරුත් ඇත.

**ලද පස් මල්:** ලාජා සහිත පස් මල්. එ නම්, පොරි, අබ, සමන් පිච්ච, ඊ තණ, හා සුන් සාල්.

**තියැස මිතුරු:** තියැස යනු ඊශ්වරයා ය. ඔහුට ඇස් තුනකි. ඔහුගේ මිත්‍රයා කුවේරයා ය. අලකා පුරය ඔහුගේ නුවර සි.

119 ස රි ව ත සුරහණ එ බිසව රුවන් රුසෙක සිටුවා සෙ ද
සි රි ත විලස සෙනෙවි රදුට අබිසෙස් කරමින් මතන ද
පි රි යත සර තිරිසන් හට අසුව පළමු විදි දුක් ත ද
සි රි කාත සිරිපති විලසින් එ දෙදෙන සැප විදිනා ස ද

**අන්වය:** සුරහන සරි වත එ බිසව සෙද රුවන් රුසෙක සිටුවා, සිරිත විලස මිතනද සෙනෙවි රදුට, අබිසෙස් කරමින්, තිරිසන්හට අසු ව පළමු විදි තද දුක් පිරියත සර, සිරි පති, සිරි කාත විලසින් එ දෙ දෙන සැප විදිනා සඳ.

**අර්ථය:** දෙවඟන සමාන වූ ඒ බිසව වහා මැණික් මණ්ඩපයක සිටුවා චාරිත්‍රානුකූල ව, ඒ ශෝභන සෙනෙවි රත් තුමා හට අභිෂේක කරවා, තිරිසන් සතකුට අසු වී පළමුවෙන් වින්ද මහත් දුක් කෙළවර කර, ඒ දෙ දෙන විෂ්ණු හා ශ්‍රී කාන්තාව මෙන් සැප විඳිමින් පසුවෙද්දී.

**විස්තර:** **රුවන් රුසෙසා:** රත්න රාශියසා. මේ මැණික් ඔබ්බවන ලද මණිඩපයක් විය යුතු ය.

**අබිෂෙස් සාර:** අභිෂේක සාර. රජ වරුන් ඔටුනු පැළඳීමේදී අභිෂේක කිරීම සිරිත ය. තෙල් වගයක් හිසෙහි ගා සාරන උත්සවයකි.

**පිරියත සාර:** පර්යන්ත සාර; කෙළවර සාර.

120 ගො දු රු පිණිස ගිය සී රද නද සාර පැන ඇතුන් මැද ට
රු ඳු රු නියෙන් ඔවුන් සිරස පලමින් මොල සාමින් සොඳ ට
ගැ ඹු රු කෙසර නද සාරමින් සතුටින් පිණ පිණා එවි ට
සො ඳු රු තමන් බිසවුන් සහ පස්සාම් සැප විඳින ලෙස ට

**අන්වය;** ගොදුරු පිණිස ගිය සී රද නද සාර ඇතුන් මැදට පැන, රුදුරු නියෙන් ඔවුන් සිරස පලමින් සොඳට මොළ සාමින්, එ විට ගැඹුරු සොසර නද සාරමින් සතුටින් පිත පිනා සොඳුරු තමන් බිසවුන් සහ පස් සාම් සැප විඳින ලෙසට.

**අර්ථය:** ආහාර පිණිස ගිය සිංහ රාජයා නාද සාරමින් ඇතුන් මැදට පැන, රෞද්‍ර නිය වලින් ඔවුන්ගේ හිස් පලා, මොළ සා, ගැඹුරු ලෙස සිංහ නාද සාරමින් ප්‍රීතියෙන් පිත පිනා, තම සුන්දර බිසව සමග සාම් සැප විඳීම සඳහා.

**විස්තර:** පස් සාම් සැප විඳින ලෙස යනු මෙය 'සාම් සැප විඳින ලෙස' යනු විය යුතු.

121 වි ග ස ට ගිරි ලෙණට අවුත් බලා දෙ දරු සහ බිසව ද
එ ම වි ට නො ම දූසා බලවත් සෝ ගිනි ඇවිලි තම හ ද
ද ස න ට වැනී වැනී බලා නෙත් සාදුලැලි ගලා නොම ද
නා ම හ ට ඉවසිය නො හැකි ව විලාප බස් කියයි මෙ ලෙ ද

**අන්වය:** විගසට ගිරි ලෙනට අවුත් දෙ දරු සහ බිසව ද බලා, එම විට නොම දූසා, තම හද බලවත් සෝ ගිනි ඇවිලී, දස අතට වැනී වැනී බලා, නො මඳ නෙත් සාදුලැලි ගලා තමහට ඉවසිය නො හැකි ව මෙ ලෙද විලාප බස් කියයි.

**අර්ථය:** වහා ගල් ලෙනට වීත්, දරු දෙ දෙන හා බිසව ඇද්දැ යි බලා නො දූසා, හදවත මහත් සෝ ගිනි ඇවිලී, දස අතට වැනෙමින් බලා හිඳ බොහෝ සෙයින් සාදුලු වගුරුවා, ඉවසිය නො හැකි ව මෙ සේ විලාප කියන්නට විය.

122 එ ක, දිවි ලෙස විසු ම බිසෝ ස ඳ
නො ක සුරහල් බස් දෙන හැම ස ඳ
ස ක, සුරු මගෙ දරු දෙදෙනා සො ඳ
කි ක, ළුක දකිනෙමි මම සිත ලෙ ඳ

**අන්වය:** එක දිවි ලෙස විසු ම බිසෝ සඳ, හැම සඳ නොක සුරහල් බස් දෙන සක අසුරු මගෙ සොඳ දරු දෙ දෙන, මම සිත ලෙඳ කි සලක දකිනෙමි.

**අර්ථය:** මා හා එක පණ වැනි ව විසු මගේ බිසවත්, කාවදත් නොයෙකුත් සුරහල් වදන් පවසන මගේ ඇස් වැනි යහපත් දරු දෙ දෙනාත්, සිත් පරිදි මට කාවද දකින්නට ලැබෙත් ද ?

**විස්තර:** සකු. චක්ෂුඃ ශබ්දයෙන් බිඳුණු පදයකි. ඇස් යන අරුති සි.

123 අ න්, තිරිසන් සත් ලොව නො කළ දේ
දූ න්, කළ මට ළය දුක් විය ත දේ
සු න්, කළ හොත් නියමය මෙම ලෙ දේ
ඉ න්, කාටත් දුක් පැමිණෙයි ත දේ

**අන්වය:** අන් තිරිසන් සත් ලොවැ නො කළ දේ කළ මට දූන් ළය තදේ දුක් විය. මෙම ලෙදේ නියමය සුන් කළහොත්, ඉන් කාටත් තදේ දුක් පැමිණෙයි.

**අර්ථය:** අනෙක් තිරිසන් සතුන් ලෝකයෙහි නො කරන ලද වැඩ කළා වූ මගේ සිතට දූන් බෙහෝ සේ දුක් වැදේ. මෙ සේ නියම චාරිත්‍රයන් කඩ කළහොත් ඉන් කාටත් බොහෝ දුක් පැමිණේ.

**විස්තර:** නියමය සුන් කළහොත්, යනතැන නියමය යනුවෙන් දක්වෙන්නේ ඒ ඒ සත්වයන්හට නියම ජීවිතය යි. තිරිසතුන් මනුෂ්‍ය සත්‍රින් හා විසීම එ සේ නියමය සුන් කිරීමකි.

124 අ ර, නෙහි පවිටෙක් නැත මාතු ලා
පෙ ර, පවකිති'ඉිද තිරිසන් කු ලා
සු ර, හත වන් කිසවට ලොබ වෙ ලා
ගොර, තර දුක් විය මට දූන් ක ලා

**අන්වය:** අරණෙහි මා තුලා පවිටෙක් නැත. පෙර පවකින් තිරිසන් කුලා ඉපිද, සුරහත වන් කිසවට ලොබ වෙලා මට දූන් කලා ගොර තර දුක් විය.

**අර්ථය:** වනයෙහි මා හා සමාන පව් කාරයෙක් නැත. පෙර පවකින් තිරිසන් යෝනියෙහි ඉපදුණු මා, දෙවඟනක වැනි කිසවට ආලය කළ නිසා, මට දූන් මහත් දුක් පැමිණියේ ය.

**විස්තර:** සුරඟන යනු මේ සාවෙහි සෑම තැන ම යෙදී ඇත්තේ සුරගණ කියා සඳෙස් ව ය.

125 ම ත්, වුණ මම සාම් සැපතෙහි අටි ත්
සා ත්, සමඟවැ වැසලා මත තුටි ත්
ල ත්, සැප දූන් නැති වීයෙහෙම පිටි ත්
අ ත්, පිට පව පලදුන් සැටි දුටි ත්

**අන්වය:** සාම් සැපතෙහි අටින් මත් වුණ මම, මත තුටින් සාත් සමඟ වැ වැසලා ලත් සැප දූන් එකෙම පිටින් නැති වී ය. අත් පිට පව පල දුන් සැටි දුටින්.

**අර්ථය:** සාම සම්පත්තිය විඳීමේ අදහසින් මත් වූ මා ප්‍රීතියෙන් කිසව හා වැස ලද සැපත දූන් සම්පූර්ණයෙන් ම නැති විය. මේ ආත්මයේ දී ම පව පල දුන් සැටි දුටිමි.

**විස්තර:** මම යනු මෙහි උක්ත වී නැති හෙයින් එය සඳෙස් ය. එය මා විය යුතු ය.

නැති වී යෙහෙම පිටින්. මෙය ද ඉතා දුබල යෙදුමකි.
දුටින් යනු දුටිම් වෙනුවට යෙදුණකි.

126 වෙ ළ, දකු සඟ යත කිසවක් දූ සා
දු ල, රූ දූලට අසුවී නො වල සා
එ ල, දුන් ගෙන'වුත් සාම් සැප න සා
බ ල, ගිරිලෙණ ලා'හර දී රැ සා

**අන්වය:** වෙළුදකු සඟ කිසවක දූකා, දුල රූ දූලට අසු වී නො වළකා සාම් සැප තකා එ ළදුන් ගෙන අවුත් බල, ගිරි ලෙන ලා අහර දී රැකා,

**අර්ථය:** වෙළෙන්දකු හා කිසවක දූක, ඇගේ බබළන රූපය නමැති දූලට අසු වී ඉන් නො වැළකී, සාම් සැප විඳින පරිදි, ඒ ස්ත්‍රිය ගෙන අවුත්, ගල් ගුහාව තුළ දමා කෑම දී ආරක්‍ෂා කර,

**විස්තර:** කිසවක් යනු පෙර විබත් හෙයින් එය 'කිසවක' යනු විය යුතු ය රූ දූල. මේ රූ දූල යනු මාත්‍රා හානියෙන් සැදූ වචනයකි.

127 උ න්, සමගින් සාමි සැප විඳිමි තා
අ න්, අප කුල සි දෙනුන් හරිමි තා
ම න්, සාළ එම නො දනුම්සාම ගැ ණා
දූ න්, මට පැමුණුණි දුක් අපම ණා

**අන්වය:** අන් අප කුල සි දෙනුන් හරිමිතා, උන් සමගින් සාමි සැප විඳිමිතා මන් සාළ එම නො දනුම් සාම ගැතා දූන් මට අපමණ දුක් පැමුණුණි.

**අර්ථය:** අප ජාතියේ වූ සිංහ ධෙනුවන් අත් හැර, ඒ සත්‍රිය හා සාමි සැප විඳීමෙන් මා සාළ නො තරම් සාම නිසා දූන් මට බොහෝ දුක් විඳීමට සිදු විය.

**විස්තර:** **මන් සාළ.** මේ ග්‍රාම්‍ය ව්‍යවහාරයකි.

128 ඉ න්, අප කුල සි දෙනුන් දුටු තැ නේ
උ න්, වත සො සෙ බලතෙමි දෙවිය නේ
පි න්, නැණ මඳ, තිරිසන් ගැ නේ
දූ න්, ලියො තිර නැති වග නො දනු නේ

**අන්වය:** සු ගම සි.

**අර්ථය:** එ හෙයින් අප තිරිසන් ජාතියෙහි වූ සිංහ ධෙනුවන් දුටු විට, දෙවියනි, ඔවුන්ගේ මුහුණ සො සේ බැලිය හැකි ද? පින්නෙන් හා නුවණින් අඩු තිරිසන් ජාතියෙහි උපන් නිසා දූන් සාලයෙහි සත්‍රීන්ගේ ස්ථිර පිළිවෙතක් නැතී බව මට නො දැනිණි.

**විස්තර:** ලියො යනු ප්‍රථමා විභක්ති රූපයක් වූව ද මෙහි එය උක්ත වන ක්‍රියාවක් නැති හෙයින් ඒ වැරදි යෙදුමකි.

129 පි ය, සුතනඹුවන් වත් නැත මෙ ද
පි ය, යුරු සිඹිනෙමි මම සාවර ද
ගි ය, සාළ අඹු දරු මා හැර සෙ ද
වි ය, මට මේ දුක් සිහබා ස ඳ

**අන්වය:** පිය සුතන් අඹුවන් වත් මෙ ද නැත. අඹු දරු මා හැර සෙද ගිය සාල මම සාවර ද පියයුරු සිඹිනෙමි. සිහ බා සඳ මට මේ දුක් විය.

**අර්ථය:** ආදරණීය දරුවෝ වත් බිරිඳ වත් දූන් නැත. බිරිඳ හා දරුවන් මා හැර ගිය විට මම සාව ද බිරිඳගේ පයෝධර සිඹින්නෙමි ද? සිංහ බාහු නිසා මට මේ දුක් පැමිණියේ ය.

පුස්තකාලය.
සිරි වජිරාරාමය.

130 තු රු, පති සස ලප ලෙස සමගි තේ
ද රු, දෙදෙනෙක් වන තුරු වසමි නේ
දු රු, කර ම වෙතට තුබු තද සෙ නේ
කා රු, මය ම යි මගෙ උන් සැඟ වු නේ

**අන්වය:** තුරු පති, සස ලප ලෙස සමගිතේ දරු දෙ දෙනකු වන තුරු වසමිනේ ම වෙතට තුබු තද සෙනේ දුරු කර උන් සැඟවුණේ මගෙ කාරුමය ම යි.

**අර්ථය:** චන්ද්‍රයා හා සස ලපය මෙන් වෙන් නො ව, දරුවන් දෙ දෙනකු වන තුරුත් මා හා ජීවත් ව, ඈ මා කෙරෙහි තුබූ සෙනෙහය අත් හැර සැඟ වී ගියේ මගේ පූර්ව කර්මය නිසා ම යි.

**විස්තර:** **උන්**: මෙහි උන් යනුවෙන් හැඳින් වූයේ බිසව ය.

**කාරුමය**: පූර්ව කර්මය පල දීම.

දරු දෙ දෙනෙක් වන තුරු යනු වියරණ දොසකි. 'දෙ දෙනකු' විය යුතු.

131 සැ ම, සැප දෙන හිමි හට කර ම ද
ස ම, දරු දසයක් ඇති වත් ව ද
කා මි, නැති හොර හිමියෙක් දුටු ස ඳ
පෙ ම, වෙති කත් ඔහුට ම වැඩි ත ද

**අන්වය:** සැම සැප දෙන හිමිහට ම ද කර, සම දරු දසයක් වඩා ඇතිවත් කාම නැති හොර හිමියකු දුටු සඳ කත් ඔහුට ම වැඩි තද පෙම වෙති.

**අර්ථය:** සියලු සැප දෙන ස්වාමියාට ම ජාතක කර දරුවන් දස දෙනකු, වඩා සිටියත්, කිසි ප්‍රයෝජනයක් නැති හොර හිමියකු දුටු විට ගැහැනු ඔහුට ම වැඩියෙන් ප්‍රේම කරති.

**විස්තර:** හොර හිමියෙක් දුටු සඳ, යන තැන හිමියෙක් යනු වියරණ දොසකි. එය පෙර විබතින් නො සිට හිමියකු යි අනුක්ත විය යුතු යි.

132 අ ප, සිය කුල සී දෙනුන් සිටිය දී
කෑප, ගෙණ බිසවක් සමගින් යෙ දී
අ ප, කල නො තරම් කාම් මෙ ලොව දී
ස ප, ලවු අත් පිට දුක් වන ල දී

**අන්වය:** අප සිය කුල හැප සි දෙනුන් සිටියදී බිසවහා සමඟින් යෙදී ගෙන, අප කාල නො හරම් කාම මෙ ලොව දී සපල ව, අත් පිට දුක් වත ලදී.

**අර්ථය:** අපට කැප (නියම) තිරිසන් ජාතියෙහි සිංහ ධෙනුවන් සිටිද්දී බිසවහා සමග වැස අප කාල අ ශික්ෂිත ක්‍රියාව මේ ලොකයේ දී ම පල දී පෙනි පෙනී ම දුක් පැමුණුණි.

**විස්තර:** බිසවක් යනු, බිසවහා විය යුතු.

133 මෙ ලෙස එම සි ර ද
වියො දුක් කියා ඇති ලෙ ද
ඇවිද මුළු වත මැ ද
නො දුකා දරුවන් සමග බිසව ද

**අන්වය:** එම සි රද මෙ ලෙස ඇති ලෙද වියො දුක් කියා මුලු වත මැද ඇවිද; දරුවන් සමග බිසව ද නො දුකා.

**අර්ථය:** ඒ සිංහ රජයා මෙ සේ ඇති තාක් වියෝග දුක කියමින් වනය පුරා ඇවිද, දරුවන් හා බිසව නො දුටුවේ ය.

134 යලිදු ඒ ඒ තැ න
තුරු ලිය ලැහැබ් බලමි න
ල සොවින් වෙවුලමි න
කියයි දුක් මුසු තෙපුල් මෙලෙසි න

**අන්වය:** යලි දු ඒ ඒ තැන තුරු ලිය ලැහැප් බලමින, ළ සොවින් වෙවුලමින මෙ ලෙසින දුක් මුසු තෙපුල් කියයි.

**අර්ථය:** නැවතත් ඒ ඒ තැන් වල ගස් වැල් හා ලිය ගොමු අතර බලා, සිත සෝකයෙන් වෙවුලමින් මෙ සේ දුක් මුසු වචන කියන්නට විය.

135 තුරු හිමි වලඳමිනා, ලිය ලිය, ලෙල දෙන අතු අති නා
සා මුව දරු රැගෙනා, බිඟු රැවු සුරතල් පිය බසි නා
මුව රඳ මුදු දසනා, පුල් මල්, මනහර දුල් වති නා
අම පල යුග තෙනෙනා, දිගු නිල්, දල නෙත'ගින් වැහෙ නා

**අන්වය:** ලෙල දෙන අතු අතිනා ලිය ලිය තුරු හිමි වලඳමිනා, සා මුව දරු රැගෙනා, බිඟු රැව් සුරතල් පිය බසිනා, මුවරඳ මුදු දසනා, පුල් මල් මනහර දුල් වතිනා, අම පල යුග තෙනෙනා, දිගු නිල් දල නෙත් අගින් වැහෙනා,

136 පිණි බිඳු නෙත් දලිනා, පර පුටු, නද හඬයෙන් හඬි නා
තුරු ලිය දුක නොමිනා. සිත් පිත්, නැති තොප මිදුක ගැ නා
මෙලෙසට හඬන තැනා, මම දුන්, කිසවුන් දරු දෙද නා
නොම දුක මගෙ නෙතිනා, කෙලෙසක, වැවෙමි දිවි ලදි නා

අන්වය: පිණි බිඳු නෙත් දලිනා, පර පුටු නද හඬයෙන් හඬිනා තොමිනා තුරු ලිය දුක, සිත් පිත් නැති තොප ම දුක ගැනා, මෙ ලෙසට හඬන තැනා, කිසවුන්, දරු දෙ දෙනා මගෙ නෙතිනා නොම දුක මම දුන් දිවි ලදිනා කෙ ලෙසක වැවෙමි.

අර්ථය: සෙලවෙන අතු නමැති අතින් වැල් නමැති සත්‍රින් ගස නමැති හිමියන් වැළඳ ගෙන, දරුවන් වැනි එදුරන් ගෙන, ප්‍රිය වචන වැනි මී මැසි රාවයෙන්, යුතු ව, මෘදු දත් වැනි මල් රේණු වලින් ද, සුන්දර ව බබළන මුහුණ වැනි පිපුණ මලින් ද, පිය යුරු යුග වැනි මිහිරි ගෙඩි වලින් ද, ඇස් වැනි දිගු තිල් පැහැති කොළ අගින් වැහෙන

කඳුලු වැනි පිණි බිඳු වලින් ද, හැඬිම් නමැති පරපුටු නාදයෙන් ද යුතු බොහෝ ගස් වැල් දුක, සිංහයා මෙ සේ කී ය.

"සිත් සතන් නැති තොප මගේ දුක ගැන මෙ සේ හඬන විට කිසව හා දරු දෙ දෙන දැසින් තො දුක, පණ ඇති සතකු වූ මම කෙ සේ සැනසෙම් ද ?"

විස්තර: මෙහි එක වර්ණනාව බොහෝ සෙසින් අලගියවන්නයන්ගේ කුසජාතකයෙහි එන උයන් වැනුමෙහි

"එවුයන ලිය ලියන් තුරු හිමි වැළඳ ගෙ න
ලෙලදෙන අතු අතින් සා මුව සුතන් ගෙ න
සුපිපෙන පත් ලවන් යුත් කුසුමන් වති න
නලවන වැන්න බිගු සන් සුරතල් බසි න"
යන කවට සමාන ය.

137 මෙම හිම'තුරු තොමිනෝ, සුදු වෙල, තුරු සළු හැර ලම් නෝ
දුල කොක වැල සොබනෝ. මුතු හර, කඬ කර ඉසතෙ තැ නෝ
රඟ දෙන සල සලනෝ, සිකි පිල්, වරල උනා ලම් නෝ
ගගුලැලි කඳුළු මෙනෝ ඉස ඉස, වලපිත ගිරි ලිය නෝ

අන්වය: මෙම හිම අතුරු තො මිනෝ සුදු වෙල උතුරු සළු හැර ලම්නෝ දුල කොක වැල සොබනෝ මුතු හර කඬ කර තෙ තැනෝ ඉසෑ, නෝ සල අසල රඟ දෙන සිකි පිල් වරල උනා ලම්නෝ, කඳුළු මෙනෝ ගගුලැලි ඉස ඉස වලපිත නෝ ගිරි ලිය,

**අර්ථය:** මෙම හිම වනය ඇතුලෙහි බොහෝ සේ සුදු වලා කුළු නැමති උතුරු සළු මුදා හරිමින්, බබලන කොක් වැල නමැති ශෝභමාන මුතු වැල කඩා තැන තැන විසි කර, නොයෙකුත් ගල් අසල නටන මොනරුන්ගේ පිල් නමැති කෙස් කලප් විහිදා, සාදුළු මෙන් දිය පහරවල් විහිදුවමින් වැලපෙන නොයෙක් පර්වත නමැති කාන්තාවෙනි,

**විස්තර:** ගඟුලැලි ගඟුල් + ඇලි. පර්වතයන්ගෙන් ඇද හැලෙන දිය ඇලි

138 තොපි මගෙ දුක දැකලා, සිත් නැති, මෙලෙසට හඬනක    ලා<br>
එක දිවි ලෙස වැසැලා, සතතින්, පස් කම් සැප විඳ    ලා<br>
මට වියො ගිනි දීලා, අඹු දරු, සැඟවී මා හැර    ලා<br>
ගිය බව සිතෙන කලා; එකතින්, නො තිබෙයි ම පණ න    ලා

**අන්වය:** සිත් නැති තොප මගෙ දුක දැකලා මෙ ලෙසට හඬන කලා, එක දිවි ලෙස වැසලා, සතතින් පස් කම් සැප විඳැලා, මට වියො ගිනි දීලා අඹු දරු මා හැර ලා සැඟ වී ගිය බව සිතෙන කලා එකතින් ම පණ නලා නො තිබෙයි.

**අර්ථය:** අප්‍රාණී වූ තොප, මගේ දුක දැක මෙ සේ හඬද්දී, එක පණ මෙන් සිට නොකඩවා, (පස්) කම් සැප විඳ මට වියෝග ගින්න දී මගේ බිරිඳ දරුවන් සහ මා අත් හැර පැන ගිය බව සිතෙන විට, ඒකාන්තයෙන් ම මගේ ජීව හුස්ම නැති වේ.

**විස්තර:** සතතින්. නිර තුරු, නො කඩවා. මේ තත්සම පදයකි.

එකතින්. සකු එකාන්ත ශබ්දයෙන් භින්න යි.

'තොපි මගෙ දුක දැකලා' යන තැන තොපි යනු වැරදි ය. එය අනුක්ත ව තොප විය යුතු.

139 නි ල් දිගු සිනිඳු කෙසා, සෙවලැති බිඟු පෙළ සුනිල ව    සා<br>
ලො ල් වන නිලිපුලැසා සරණින මුව රද දසන ර    සා<br>
දු ල් වැළි කුල සරසා, තනහස, රළ සළු පටිනි ව    සා<br>
වි ල් කත මෙවන නිසා, සිටි තොපි ම සුනඹු නුදුටු ද    සා

**අන්වය:** සෙවල නිල් දිගු සිනිඳු කෙසා ඇති, බිඟු පෙළ සු නිල වසා ලොල් වන නිල් උපුල් ඇසා, සර ආනන, මුවරඳ දසන රසා දුල් වැලි සරසා උකුළ, නන හස, රළ සළු පටිනි වසා, මෙ වන නිසා සිටි විල්කත, තොපි ම සුනඹු ඇසා නු දුටු ද ?

අර්ථය: දිය සෙමෙල් නමැති නිල් දිගු සිනිඳු කෙසින් ද, මී මැසි සමූහයා නමැති තද නිල් වන් රෙදින් ද, සිත් ලොබ කරවන නිල් මහනෙල් නමැති ඇසින් ද, නෙළුම් මල් නමැති මුහුණින් ද, මල් රේණු නමැති දත් පෙළින් ද, බබළන වැලි තලා නමැති උකුලෙන් ද, යුතු ව, හංසයින් නමැති පියවුරු දිය රළ නමැති සළු පටින් වසා මේ වනය ඇසුරු කර සිටින විල් නමැති කාන්තාවෙනි, නොපි මගේ බිරිද හා දරුවන් නො දුටුවහු ද?

විස්තර: මෙ වන නිසා. මේ වනය ඇසුරු කර, සමීප ව.
සැවැත් නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩ,
ඈ යෙදුම් සමාන ය. මේ යෙදුම්

140 මෙ වෙනෙහි විසු තිතිනේ, බලතර තද තෙද නෙදෙවිය නේ
වියො දුක් ගිනි කඳිනේ මට වන් හදවත දසි තදී නේ
නිදි මත නැත එයිනේ, ටිකකුත්, බඩගිනි මට නොදූ නේ
නොකීහැකි තද දුකිනේ, මගෙ දිවි, නොරැකෙයි අද මෙයිනේ

අන්වය: මෙ වෙනෙහි තිතිනේ විසු, බලතර තද තෙද නෙ දෙවියනේ මට වන් වියො දුක් ගිනි කඳිනේ, තදිනේ හදවත දසි එයිනේ නිදි මත නැත. මට ටිකකුත් බඩ ගිනි නො දූනේ. මෙයිනේ නො කි හැකි තද දුකිනේ මගෙ දීවි නො රැකෙයි.

අර්ථය: මේ වනයෙහි නිතර වාසය කළාවූ බලවත්, තද තේජසින් යුත් නොයෙකුත් දෙවියනි, මට ඇති වී තිබෙන වියෝග දුක නමැති ගිනි කඳ නිසා හෘදය වස්තුව තදින් දූවේ. එ හෙයින් මට නිදි මත නැත. මඳක් වත් බඩ ගිනි නො දූනෙයි. මෙ සේ කිව නො හැකි තරම් තද දුක නිසා මගේ ජීවිතය නො පවතියි.

විස්තර: මෙ කාව්‍යෙහි බස ඉතා ග්‍රාම්‍ය බව පෙනේ.

141 උර පිය පලු සමඟා, පුල් මල්, වැද එන මඳ සුළ ඟා
ඝොර ගිනි සිළුසෙ ඇඟා, වැද දයි, සඳ ගිම දුනී තර ඟා
මියු'රඹ ඇත විහඟා, නද වනී, දෙ කනට යවුල් ර ඟා
මගෙ අඹු දරු, නො ලඟා, විය ඉන් මට වනී මෙ දුක් සු ඟා

අන්වය: උර පිය පලු සමඟා පුල් මල් වැද එන මඳ සුළඟා, ඝොර ගිනි සිළු සෙ ඇඟා වැද දයි. සඳ තරඟා ගිම දුනී. මියුරු අඹ ඇති විහඟා නද දෙ කණට යවුල් රඟා වනී. මෑග අඹු දරු ළඟා නො වීය. ඉන් මට මෙ දුක් සුඟා විය.

අර්ථය: සඳවතට ප්‍රිය වූ, කොල, පිපුණු මල් ආදිය හා ගැටී එන මන්ද මාරුතය කුරිරු ගිනි දලු මෙන් සිරුරෙහි වැදී දවයි. චන්ද්‍රයා නිසා අනංගයා හෙවත් කාමුක හැඟීම් පිළිබඳ ග්‍රීෂ්මය ඇති විය. මිහිරි හඬින් යුත් කුරුල්ලන්ගේ නාදය කන් සදකට උල් අනින්නාක් මෙන්න. මගේ බිරිඳ හා දරුවන් මගෙන් වෙන් වූයෙන් මට මේ සා දුක් ඇති විය.

විස්තර: නරඟා ගිම. නරඟ යනු අනංගයා ය.

කාව්‍ය ශේඛරයෙහි ද, මෙය

නරඟ ගිම් පසු කොට-පසු ව ස පැමිණි සොලොස් වසර ට' යනුවෙන් දක් වේ.

එම් කවෙහි එන විලාප වැනුම, කුවේණි අස්නෙහි

" සුපුන් සඳ උදය'ගින් දිලි යමට සේ පෙනේ
හමින මඳ නල සඳුන් සිහිල් ගිනි සේ දැනේ
සුවඳ මල් පෙති අතුළ යහන කටු සේ දැනේ
මෙ සඳ මෙ වියෝ දුකින් කෙ ලෙස වැවෙමි අනේ" හා

අලගියවන්නයන්ගේ කුසජාතකයෙහි

" සිහිල් සොම් තරිඳු රිවි මෙන් දිසේ යා
කොවුල් නද ඇසෙයි යකු හඩ ලෙසේ යා
ලකල් පබාවති සහ නොමවැසේ යා
මෙකල් මෙ මා සිතු තලවමි කෙ සේ යා "

යන වැනුම් හා සමාන ය.

142 සී ර ද මෙ බඳු වන සෝ දුක් තෙපලමි න
බෝ ලෙද මහ හිමය මැද ඇවිද තැන තැ න
කෑ ම ද නො ලැබ සිය ගත දුබලව ගොසි න
ඒ ල ද නිසා පිටිසර ගමකට පැමි න

අන්වය: සී රද මෙ බඳු වන සෝ දුක් තෙපලමින, මහ හිමය මැද තැන තැන බෝ ලෙද ඇවිද, කෑම ද නො ලැබ, සිය ගත දු බල ව නොසින, ඒ ලද නිසා පිටිසර ගමකට පැමිණ.

අර්ථය: සිංහ රජයා මෙ සේ තමාට වූ වියෝග ශෝකයෙන් නැඟුණු දුක ගැන කියමින්, මහ වනය මැද තැනින් තැන බොහෝ සේ ඇවිද, ආහාර ද නො ලබා, ශරීරය ද වැහැරී ගොස්, ඒ කාන්තාව සොයමින් එක් ගමකට පැමිණියේ ය.

විස්තර: වන සෝ දුක්. මෙහි වන යනු විරහ, වියෝග, ප්‍රේම යන අරුත්හි වැටේ. හංස සන්දේශයෙහි ද

“ලොලව වන දතත් ලේ බීමෙන් තොම ද
රතුව ගියේදේ සත සැක කරන ල ද”

යන තැන්හි ත් මේ වචනය මෙම සේ යෙදී ඇත.

143 සි ටි ස ද එ ගම් වැසියෙක් දුක එ සී ර ද
බි ය වැද සිතට එ බිසව තතු පැවසි සෙ ද
ම නනද වෙමිනෝ'විට ඔහු හැර ගොස් නො ම ද
සි රි ල ද එ පුර වට සැදි ගම්වලට වැ ද

අන්වය: එ ගම් වැසියෙක් එ සී රද දුක සිටි සද, සිතට බිය වැද, සෙද එ බිසව තතු පැවැසි. එ විට මනනද වෙමින් ඔහු හැර ගොස්, නො මද සිරි ලද එ පුර වට සැදි ගම් වලට වැද.

අර්ථය: ගම් වැසියෙක් ඒ සිංහ රජයා දැක බිය පත් ව වහා ම ඒ බිසවගේ තොරතුරු ඔහුට කීවේ ය. එයින් සතුටට පත් සිංහයා ඔහු අත හැර ඒ නගරය අවට වූ බොහෝ සැපතින් පිරුණු ගම් වලට වැදී.

144 සෙ න හඩ සිය ගණන් එක විට ගසන මෙ න
පැ න පැන තැනින් තැන ගොස් නද කරණ දි න
ද න ගත කන් පැලී ලෙහෙනු'තුරු ගොසි න
තැ න තැන මල හ ඒ ඒ ගම්වල නොමි න

අන්වය: සු ගම යි.

අර්ථය; එක විට සෙණ හඩ සිය ගණනක් ගසන්නාක් මෙන් තැනින් තැන පනිමින් සිංහයා නාද කරන විට ඒ ඒ ගම් වල බොහෝ ජනයා කන් පැලී ලේ උතුරා යනමෙන් මිය ගියහ.

විස්තර: ලෙහෙනුතුරා. මේ ලෙහෙ උතුරු විය යුතු.

145 ප ටු නු ගම් නියම් ගම් එ දනව් වල ට
වැ ටු නු සෙනෝ'ව් ඔහු වැදූ ලොව නසන වි ට
ගැ ටුනු දනෝ එකතුව ගොස් එ නුවර ට
සි ටි නු බැරිය මහ කොලහල කළ කල ට

අන්වය: පටුනු ගම්, නියම් ගම්, එ දනව් වලට වැටුණු සෙන එව් ඔහු වැදූ ලොව නසන විට, ගැටුණු දනන් එකතු ව එ නුවරට ගොස් සිටිනු බැරිය යි මහ කොලහල කළ කලට.

**අර්ථය:** මුහුදු බඹ ගම්, නගර බද ගම් හා ජන පද වලට වැටුණා වූ හෙණයක් මෙන් සිංහයා පැන රට විනාශ කරන විට කැලඹීමට පත් ජනයා එහි ප්‍රධාන නගරයට ගොස් විසීමට පිළිවෙලක් නැතැයි කැලඹීම් ඇති කල එට.

**විස්තර:** ගැමුණු: කැලඹුණු යන අරුත් ඇත. සකු-සට්ත ශබ්දයි.
දමනෝ: යනු වියරණ දෙසකි. එය දනත් යනු විය යුතු.

146 යු ග ඳු රු මුදුන බබලන සර කර අයු ර
පි වි තු රු තෙදින් හැම දන තඹර තද ක ර
වි සි තු රු සිහසුනෙහි වැඩ හිඳ ගෙන පව ර
බු වි සු රු තුමා මෙ ලෙසින් ඇසිය පෙම ක ර

**අන්වය:** සු ගම යි.

**අර්ථය:** යුගන්ධර පර්වතය මුදුනෙහි බබලන්නා වූ සූර්යයා මෙන්, නො කැලැල් තේජසින් සියලු ජනයා නමැති නෙළුම් මල් සතුටු කරවමින්, අලංකාර සිංහාසනයෙහි වැඩ හිඳ, උතුම් රජ තුමා ආදරයෙන් මෙ සේ ඇසී ය.

**විස්තර:** බුවිසුරු: බු + ඉසුරු සකු. භුවනෙශ්වර ශබ්ද යි.
සර කර: සර හෙවත් නෙළුම් මල් පුබුදු කරවන හෙයින් සූර්යයා සර කර නම්.

147 ග ම ගව වැසි දනෝ මෙ පුරට ඇවිත් සෙ ද
නි ම නො ව හඩා වැලපීමෙන් දුකින් න ද
කි ම කොලහල කලේ මෙගෙ කිසි දෙසකට ද
ම ම එ ම අසමි ඇති සැටි කියුව කී ස ද

**අන්වය:** සු ගම යි.

**අර්ථය:** "ඒ ඒ ගම් වල ජනයා මේ නුවරට වහා ඇවිත්, බොහෝ සේ හඬා වැලපි තද දුකින් යුතු ව මහත් කැලඹීම් ඇති කරන ලද්දේ මාගේ කිසි යම් වරදක් නිසා ද? ඇති සැටි මට විස්තර කරව්. මම එය ඇසීමට කැමැත්තෙමි" යි රජ තුමා කී විට.

148 හි මි ස ද නුඹ දෙසක් කිසි කලෙක වත් නො ද
මි ග ර ද තුමෙක් හිමයෙන් අවුදින් මෙ ස ද
න ද න ද කර මෙ අප රටවල සත් නොම ද
එකලෙද වැනසූ බව බැරි කියනු මහ ර ද

**අන්වය:** හිමි සඳ, කිසි කලක වත් නුඹ දෙසක් නොද? මෙ සඳ මිග රද තුමකු හිමයෙන් අවුදින් නද නද කර මෙ අප රටවල නො මඳ සත් එක ලෙද වැනසූ බව මහ රද, කියනු බැරි.

අර්ථය: ස්වාමීනි, කිසි ම කලෙක ඔබගෙන් අපට කිසි දෙයක් නො වීය. දූත් සිංහ රාජයකු තැලයෙන් අවුත් මහා නාද කරමින් අපගේ මේ ගම් පෙදෙස්හි බොහෝ සත්වයින් සම්පූර්ණයෙන් විනාශ කළ අයුරු විස්තර කිරීම අ පහසු ය.

විස්තර: මේ අප රටවල: මින් අදහස් වන්නේ අපගේ ගම් පෙදෙස් හි යනු ය. කියනු බැරි. කීම දුක් සහගත ය.

149 අ ප දෙ ගු රු න් අප මයිලන් මූතුන් හු ද
අ ප අඹු ව න් අප දරුවන් සොහොයුරු ද
අ ප මි තු ර න් වැඩකරුවන් හැම දෙන ද
නැසූ සැ වි දූ න් නොයි ලෙසකින් කියනෙමු ද

අන්වය: සු ගම යි.

අර්ථය: අපගේ දෙ මව් පියන්, මාමා වරුන්, ආනා මූතුන්, භාර්‍යාවන්, දරුවන්, සහෝදර සහෝදරියන්, මිත්‍රයන්, වැඩ කාරයින් ආදි සියලු දෙන විනාස කරන ලද සැටි දූත් කෙ සේ කිය හැකි ද?

27 OCT 2010

150 අ ප ම ණ ඉසුරු ඇති දද වෙලඳ ගොවි කු ල
හැ ම ද න වනසමින් අප ගම් අගම් ක ල
වි ද ස න කර නෙරපු බල මහ බල සෙබ ල
දූ වූ තැන මැරිය පෙන්වාලා තමා බ ල

අන්වය: අ පමණ ඉසුරු ඇති දද, වෙළෙඳ, ගොවි කුල හැම දන වනසමින්, අප ගම් අ ගම් කලවුන් විදසන කර නෙරපු බල මහ බල සෙබල, දුටු තැන තමා බල පෙන්වාලා මැරිය.

අර්ථය: බොහෝ සම්පත් ඇති, බමුණු, වෙළෙඳ හා ගොවි කුලයන්හි නොයෙකුත් ජනයා විනාශ කරමින් අපගේ ගම් නැති කල සතුරන් මුලිනුපුටා පලවා හළ මහත් බලයෙන් යුත් සෙබළෝ දුටු දුටු තැන සිංහයා විසින් ඔහුගේ බලය පෙන්වා මරා දමන ලදහ.

විස්තර: දද-බමුණෝ දද හෙවත් ද්විජයෝ වෙති. පළමුවෙන් මව් කුසින් බිහිවීමෙනුත්, දෙ වනුව පූන නූල කර ලෑමෙනුත් ඔව්හු දෙ වරක් උපන් අය ලෙස සලකනු ලැබෙති. බමුණුන් ද්විජ (දද) හෙවත් දෙ වරක් උපන් අය වන්නේ එ හෙයිනි.

විදසන කර: විධ්වංසනය කර. සමූලඝාතනය කර.
අගම් කළ යනු අගම් කළවුන් කියා ගත යුතු ය.

161 පි රි ස ඳ සොමි උවන පියයුරු රණ තිස ර
මි ද ර ද දුනුමිටෙ'ව් මැද දෙස ඇති පව ර
සු ර ර ද ලියෙ'ව් රුසිරු ති අඟණන් නො හැ ර
මි ග ර ද ගම් මැදට පැන මැරිය නද ක ර

අන්වය: මිග රද ගම් මැදට පැන, නද කර, පිරි සඳ සොමි උවන, රණ තිසර පියයුරු, මද රද දුනු මිට එව් මැද දෙස ඇති, පවර සුර රද ලිය එව් රුසිරු ඇති අඟනන් නො හැර මැරි ය.

අර්ථය: සිංහ රාජයා ගම්වලට පැන ශබ්ද කර, පිරුණු සඳ වැනි සෞම්‍ය මුහුණු වලින් ද, රන්වන් හංසයින් බඳු පයෝධර වලින් ද අනංගයාගේ දුන්න වැනි සිහින් ඉඟටියෙන් ද යුතු, රූප ශ්‍රීයෙන් උතුම් දෙවඟනන් හා සම වූ කාන්තාවන් අන් නො හැර මරා දැමී ය.

152 න න' බ ර ණී න් සැරසූ කිරි බොන ලද රු
පැ න අ වු දි න් නද කර මැරුවයි කෙස රු
ගු ණ නැණයෙන් අග පත් හිමි සඳ මහ රු
වෙ න ති රි ස න් නැසූ වග කියනු ද කවු රු

අන්වය: කෙසරු පැන අවුදින් නද කර, නන් අබරණින් සැරසූ කිරි බොන ලදරු මැරුවයි. ගුණ නැණයෙන් අග පත් මහරු හිමි සඳ, වෙන තිරිසන් නැසූ වග කවුරු කියනු ද?

අර්ථය: කේසර සිංහයා පැන ඇවිත් නාද කර, නොයෙක් ආභරණයන්ගෙන් සරසනු ලැබූ, කිරි බොමින් සිටි ළදරුවන් මරා දැම්මේ ය. ගුණයෙන් හා නුවණින් අග තැන් පත් උසස් රජතුමනි, සිංහයා වෙන තිරිසන් සතුන් නැසූ වගක් කවුරු කියත්. (එය ඉතා සුළු දෙයකි)

153 ලො ව ර කි නා පින්වත් තිරිඳුනි දැන ව
මෙ ම ලෙසි නා නැසූවොත් අපගෙ මුළු ර ට
කි ම ලැබෙනා පල ඉන් මෙ බිය දුරු කො ට
නො ව ල සි නා සෙත කළ මැනව මෙ අප ට

අන්වය: දැනව ලොව රකිනා පින්වත් තිරිඳුනි, අපගෙ මුළු රට මෙම ලෙසිනා නැසුවොත් ඉන් ලැබෙනා පල කිම? ඉන් මෙ බිය දුරු කොට, ලසිනා නොව මෙ අපට සෙත කළ මැනව.

**අර්ථය:** දූතයි ලෝකයා ආරක්ෂා කරන පින්වත් රජ තුමනි, මේ විදියෙන් අපගේ මුලු රට ම විනාශ වීමට ඉඩ ඇරියොත් කුමන යහපතක් වේ ද? එ හෙයින් මේ බය දුරු කර වහා අපට යහ පතක් කර දුන මැනවි.

**විස්තර:** ලසිනා නො ව. ප්‍රමාද නො ව. ලස යනු ප්‍රමාදය යි,

154 මෙ ලෙ ස ට   ගම් වැසි හැම දෙන එ රදුට සැලකල විගසි   න
ලෙ ව න ට   පැමුණුණු එ බියට වගු රද තුම තද ල සොවි   න
යු ද ය ට   ගොස් මිගිඳු මරණ විලසට රැස්කර මැතිග   ණ
මො න ව ට   අණ දී වදුල සේක මෙ ලෙස ලොවට පෙමි   න

**අන්වය:** මෙ ලෙසට ගම් වැසි හැම දෙන එ රදුට සැලකල විගසින, වගු රද තුම, ලෙවනට පැමුණුණු එ බියට තද ල සොවින, මැති ගණ රැස් කර, යුදයට ගොස් මිගිඳු මරන විලසට ලොවට පෙමින මෙ ලෙස මොනවට අණ දී වදුල සේක.

**අර්ථය:** මෙ සේ ගම් වැසියන් සියලු දෙන ඒ රජ තුමාට පැමිණිලි කළ විට ලෝ වැසියනට පැමිණි තිබෙන බය නිසා මහත් සිත් ශෝකයට පත් වගු රජ තුමා ඇමති මඬුල්ල රැස් කරවා යුඩයට ගොස් සිංහයා මරන ලෙස ලෝකයා කෙරෙහි ආදර-යෙන් මේ සේ අණ කළේ ය.

155 බ ල ත ර   යුද කර පෙර දිනුමට සෙනෙහැති ඇමතිවරු   නි
රු දු න ර   මිග රදෙක් අවුත් අප සතු රට නසන බැවි   නි
පු ව ත ර   සිවුරඟ සෙන් ගෙන ගොස් යුදකර එහු මරමි   නි
දු රු ක ර   එවි අප රට පත් විපත් එ බිය තොප බලයෙ   නි

**අන්වය:** පෙර බලතර යුද කර දිනුමට සෙනෙහෙ ඇති ඇමති වරුනි, රුදු තර මිග රදකු අවුත් අප සතු රට නසන බැවිනි, පුවතර සිවු රඟ සෙන් ගෙන ගොස් එහු මරමිනි, තොප බලයෙනි අප රට පත් විපත් එ බිය දුරු කර එව්.

**අර්ථය:** පෙරදී කිහිසුණු යුද්ධ කර ජය ගැනීමෙහි ආසා දක් වූ ඇමති වරුනි, ඉතා විශාල සිංහයකු පැමිණ අප රට විනාශ කරන හෙයින් අපගේ ප්‍රසිඩ චතුරංගනිය සේනාව ගෙන ගොස් උහු මරා, තොපගේ බලයෙන් අපගේ රටට වී තිබෙන විපත් හා බිය දුරු කළ මැනවි.

**විස්තර:** සිවුරඟ සෙන්. ඇත්, අස්, රිය, පාබල යන, රජකු සතු සතර ප්‍රකාරයේ බල ඇණි.

මිග රදෙක් අවුත් යනු වියරණ දොසකි. මිග රදකු කියා ශුඩ විය යුතු.

156 ස සො බ න රදු වදහල බස අසමින් මැතිවරු හැම දෙ න
එ ම ස ණ යෙන් අණබෙරකර මහ සෙන් රුස් වන විලසින
ස ර ස න සැර කඩු අඬයටි සඳසක් ඈ සත'වි රැගෙ න
අ ප ම ණ සිවුරඟ සෙන් සඟ තිරිඳුන් වැදැ අවසර ගෙ ණ

**අන්වය:** මැති වරු හැම දෙන ස සොබන රදු වදහල බස අසමින් මහ සෙන් රුස් වන විලසින එම සණයෙන් අණ බෙර කර, සරසන, සැර, කඩු, අඬයටි, සඳ, සක් ඈ සත් අවි රැගෙන, අ පමණ සිව් රඟ සෙන් සඟ තිරිඳුන් වැදැ අවසර ගෙන.

**අර්ථය:** මන්ත්‍රි වරු සියලු දෙනා යහපත් රජ තුමන් කී වචන අසා, මහ ජනයා එකතු වන ලෙස එම මොහොතෙහි ම අණ බෙර ලවා, දුනු, හී, කඩු, අඬයටි, චක්‍රායුධ, පාරා වලලු ආදි නොයෙකුත් ආයුධ සහිත ව, බොහෝ වූ චතුරංගනිය සේනාව ද ගෙන, රජු වැඳ අවසර ලබා,

**විස්තර:** සණයෙන් ක්ෂණයෙන් යන්නෙන් බිඳ ගන්නා ලද්දකි.

අඬයටි; අඬක් යෂ්ටියක් වූ ආයුධයකි. කඩුවක් හා සමාන ව තලයකින් ද මිටකින් ද යුතු ආයුධයක් බව පෙනේ

**සක්:** චක්‍ර ශබ්දයෙන් හෝ ශංඛ ශබ්දයෙන් බිඳී ආයේ ය. චක්‍ර ශබ්දයෙන් බිඳුණේ නම් මෙය වළල්ලකි. ශංඛ ශබ්දයෙන් බිඳුණේ නම් යුදයෙහි ගෙන යන ජයශංඛ වේ.

157 ප ස තු රු ගොස කර පෙරටුව ගොඩ යන සිඳු රද විලස ට
යු ද ක රු මහ සෙනඟ ගොසින් එම සී රද සිරි පියස ට
නොමතුරු වට කරමින් අවියෙන් අවි ගැවසෙන තරම ට
වි සි තු රු අවි ලෙලවා සිය දහස් විදුලි ගසන රඟ ට

**අන්වය:** පෙරටු ව පස තුරු ගොස කර, ගොඩ යන සිඳු රද විලසට එම සී රද සිරි පියසට යුද කරු මහ සෙනග ගොසින් අවියෙන් අවි ගැසෙන තරමට නොම තුරු වට කරමින්, සිය දහස් විදුලි ගසන රඟට විසිතුරු අවි ලෙලවා.

අර්ථය: ඉදිරියෙන් පංචාංග තූර්ය නාද කරමින්; ගොඩ ගමන් ගන්නා ලද සමුද්‍ර රාජයා පරිද්දෙන්, සිංහ රාජයා සිටි පෙදෙසට ඒ යුදට සැරසුණු සේනාව ගොස්, ආයුධ එකිනෙකට හැපෙන තරමට ඉඩක් නැති ව වට කර ගෙන, සිය දහසක් විදුලි කොටන්නාක් මෙන් ඒ විචිත්‍ර ආයුධ සොලවමින්.

විස්තර; පස තුරු: ආතතය, විතතය, ආතත විතතය, ඝනය, සුසිරය යන පංච තූර්ය භාණ්ඩ, පස තුරු සේ හැඳින් වේ.

158 ර ණ බෙර කරවා රුදු තර ඔල්වරසන් දෙමින් කුරි රු
සෙ ණ සුවහස් ගසන විලස කළ රණ ගොස අසා කෙස රු
ව න මැද ඔත්පලින් නැගිට කර බුරවා සොඳ විසිතු රු
පැ න අහසට ඔබමොබ බමනය කරා සිය විදුලි අසු රු

අන්වය: රණ බෙර කරවා, රුදු තර ඔල්වරසන් දෙමින්, කුරිරු සෙන සුවහස් ගසන විලස කළ රණ ගොස කෙසරු අසා, වන මැද ඔත් පළින් නැගිට සොඳ විසිතුරු කර බුරවා අහසට පැන සිය විදුලි අයුරු ඔබ මොබ බමනය කරා.

අර්ථය: යුද බෙර ශබ්ද කර, මහත් සේ ප්‍රීති නාද පවත්වමින්, කෲර සෙන දහසක් ගසන්නාක් මෙන් කරන ලද යුද්ධ ඝෝෂාව ඇසූ කේසර සිංහයා වන මැද ඔහු සිටි තැනින් නැගිට, ඉතා අලංකාර කෙසරු සලා, උඩ පැන, සිය ගණනක් විදුලි මෙන් තැනින් තැන කරකැවී.

විස්තර: රුදු තර: රුදු යනු විශාල යන අරුත් ඇත්තේ ය. බොහෝ දෙන රුදු යනු රෞද්‍ර ය යි වරදවා අරුත් කියන බව පෙනේ.

තර යනු සංස්කෘත හා පාලියෙහි අධිකාර්ථයෙහි යෙදෙන නිපාතයකි.

කර බුරවා; කරෙහි වූ කේසර (ලොම්) කර යනුවෙන් අදහස් වේ. බුරවා යනු සලා යනුවෙන් අරුත් කිව හැකිය. කර ඔසවා කියා ද ගැනීම අ පහසු නො වේ. එ විට බුරවා යනු අභිරුය්හ යන්නෙන් බිඳ ගත්තක් විය යුතු ය.

159 ප ල කාරමින් සිරද විකුම් නද කරා වැද සෙනඟ මැද ව
දු ල තර ඇත් අස් සමගින් දුටු දුටු සත මරණෝම වි ව
බ ල යුදයෙන් සිත් බිය ගෙනැ කටු බැදිවල පැනැ විගස ව
එ ල වා ගෙන එනැ යි සිතා පසු බලමින් දුවන කල ව

**අන්වය:** සි රද විකුම් පල කරමින් නද කර සෙනග මැදට වැද, දුල තර ඇත්, අස් සමඟින් දුටු දුටු සත මරන එම විට, බල යුදයෙන් සිත් බිය ගෙනැ විගසට කටු බැඳි වල පැනැ, එලවා ගෙන එතියි සිතා පසු බලමින් දුවන කලට.

**අර්ථය:** සිංහ රාජයා වික්‍රමය පෙන්වමින් නාද කර, සෙනග අතරට පැන, ශෝභන ඇතුන්, අශ්වයින් හා දුටු දුටු අනෙකුත් සතුන් ද මරන විට, යුද්ධ භටයෝ, ඒ යුද්ධයෙන් බියට පත් ව, වහ වහා කටු සහිත නැලැවලට පැන, සිංහයා තමන් ලුහු බඳිතී යි සිතමින් ආ පසු බල බලා දුවන විට,

**විස්තර:** මරණෙම විට. මරන + එම විට යනු අදහස යි. එසේ මරන විට යනු අදහස් වේ. මේ ඉතා දුබල යෙදුමකි.

160 සි ර දුට අසු නොවී සිටිය ඉතිරි හසුන් එන බව දු ක
සි ර දුම ය යි සිතා ඉතා තද බිය ගෙන දිවි නො වල ක
වෙ ර ඇඳි වත් කටු දුවරී ඉරී රුඳුණු බවත් නො දු ක
දු ර ට ගොසින් වැටී ගත්තු මරණින් ගැලවී වැදූ දු ක

**අර්ථය:** සිංහ රජයාට අසු නො වී ඉතිරි වූ අශ්වයින් එනු දුක, ඒත් සිංහයා ම ය යි සිතා, මහත් බියෙන් යුතු ව, නො නැවතී දිව, තමන් ඇඳ සිටි ඇඳුම් ද කටුවල පැටලී ඉරී රුඳුණු බව පවා නො දුක, මරණයෙන් බේරී දුකින් යුතු ව ඈතට පැන ගත්හ.

**විස්තර:** නො වලසා දිව. නො නැවතී දිව.

161 මෙ ලෙ ස ට කටු ඇනී අයෙක් සියල් සිරුර ලේ ගාගෙ ණ
සි න ද ට කන් පැළුණු අයෙක් සමහරු අප ගත වතුරෙ ණ
වි ග ස ට දුව වැටී අයෙක් අත පය තුනටිය බිඳගෙ ණ
කැ ල ය ට වැද ඒ ඒ තැන සැඟවී සිට මරණ බියෙ න

**අන්වය:** සු ගම යි.

**අර්ථය:** මෙ සේ සමහරෙක් කටු ඇන ගෙන මුළු සිරුරෙහි ම ලේ, තවරා ගත්හ. සිංහ නාදයට කන් පැළුණු සමහරෙක් ඇඳුම්ද ගැලවී ගොස්, වහා දුව වැටී, අත් පා හා තුනටිය ද පොඩි කරගෙන, කැලයට පැන මරණ බියෙන් තැනින් තැන සැඟවී සිටියහ.

**විස්තර:** අපගත වතුරෙන. වතුරු යනු මේ කවෙහි වස්ත්‍ර යන්නෙන් බිඳ ගන්නා ලද්දකි. ඉවත ගැලවුණු ඇඳුමෙන් යුතු ව යනු අදහස යි.

162 පැ  ළ දි බරණ ඇඳි වත් අවි පසතුරු තැන තැන දමමි  න
මූ  ල දි දෙඩා ගිය කට මැන සිතා තදින් ලජ්ජායෙ  න
කොල අතු ඇඳ ලේ පෙරමින් ගිය ගිය තැන්වලින් සෙමි  න
ග  ල වා ගෙන පණ පමණක් එක තැනකට රැස්ව සොඳි  න

අන්වය: සු ගම සි.

අර්ථය: පැළඳ සිටි ආභරණ හා ඇඳ සිටි වස්ත්‍ර ද, පංචාංගික තූර්‍ය භාණ්ඩ ද, තැතින් තැන දමා මූලින් තමා වහසි බස් කීයෙන් ඒ ගැන ලජ්ජා වී, කොළ අතු හැඳ, ලේ පෙරෙමින් ඒ ඒ ගිය තැන් වලින් යන්තමට ජීවිතය පමණක් බේරා ගෙන, ඔව්හු එක් තැනකට රැස් වූහ.

163 වි ය රු වැටුණු අය විලසට කිසිවක් නො ම දැන එමවි  ව
රු දු රු ලෙසට හඬා වැළප ඉලව් වලම් දී එ ම වි  ව
කෙසරු යුදෙන් මැරුම් නොකා ආ බව සිතමින් බලය  ව
සොඳුරු තිරිඳු වෙතට අවුත් සිරි පද වැඳ කිවු මෙලෙස  ව

අන්වය: එ ම විට වියරු වැටුණ අය විලසට කිසිවක් නොම දැන, රුදුරු ලෙසට හඬා වැළප, ඉලව් වලම් දී, කෙසරු යුදෙන් මැරුම් නො කා ආ බව බලයට සිතමින්, සොඳුරු තිරිඳු වෙතට අවුත් සිරි පද වැඳ මෙ ලෙසට කිව්.

අර්ථය: එ විට උමතු වූ අය මෙන් කිසිත් නො දැන, බිහිසුණු ලෙස හඬා වැලපී, මෘත දේහයන් පිළිබඳ කටයුතු ද කර, සිංහයා හා යුද වැද මැරුම් නො කා ආ බව පමණක් තම බලය වසයෙන් සිතමින්, යහපත් රජ තුමා ඉදිරියට පැමිණ, පා වැඳ මේ සේ කී හ.

විස්තර: ඉලව් වලම්. මෘත දේහයන් පිළිබඳ අදහන හා හුමදන කටයුතු.

164 මි ග කියා සිහ යුදට ගිය සෙබළුන් කෙරෙන්
එක සෙබලෙකු  ත්
මි ග රදුගෙ ඉදිරියට යන ලෙස අබියකුත් නොතිබිය
නොහෙ  ත්
මි ග පතිහු තද අසා දෙ සවන් පැළී මළහුය
නොයෙක් ස  ත්
මි ග රදුට අසුවෙමින් මැරු ඇත් අස් මිනිස්
ගණනක් නොමැ  ත්

අන්වය: මිග කියා සිහ යුදට ගිය සෙබළුන් කෙරෙන් එක සෙබලෙකුත් මිග රදුගෙ ඉදිරියට යන ලෙස නොහෙත් අබියකුත් නො තිබි ය. නොයෙක් සත් මිග පතිහු තද අසා දෙ සවන් පැළී මළහු ය. මිග රදුට අසු වෙමින් මැරු ඇත් අස් මිනිස් ගණනක් නොමැත්.

**අර්ථය:** එහසි බස් කියා සිංහයා හා යුද්ධ කිරීමට ගිය යුද්ධ භටයන් අතරින් එක භටයෙක් වත් සිංහයා ඉදිරියට යෑමට අඩියක් නො තැබී ය. බොහෝ දෙනෙක් සිංහ නාදය අසා කන් පැළී මළහ. සිංහයාට අසු වී මරණයට පත් ඇතුන්ගේත්, අසුන්ගේත්, මිනිසුන්ගේත්, ගණනෙහි සීමාවක් නැත.

**විස්තර:** මැරු. මරණයට පත් යන අදහස දීමට යෙදුණකි.

165 ඉ තු රු වුණු අපි දිව ගෙසින් මහ කටු ලැහැප්වල වැදී ලා
ව තු රු අබරණ තන'වි පසතුරු තැතින් තැන මග දමා ලා
සි රුරු සිදු බිදු ගොසින් තැන තැන පැහැර ගල් මුල් ඇනීලා
සි වු රු පෙරවූ විලස රත් විය මෙ අප ඇඟ ලේ රැඳී ලා

**අන්වය:** සු ගම සි.

**අර්ථය:** ගැලවී ගත් අප දුව ගොස් මහා කටු ලැහැප් වල සැඟවී, ඇඳුම් පැළඳුම්, නොයෙක් ආයුධ හා පංචාග තූර්ය භාණ්ඩ, මග තැන තැන දමා, මග වැටී, ගල් මුල් වල හැපී ශරීර තුවාල කර ගෙන, ලේ තැවරුණු හෙයින්, අප සිවුරු පෙරවූ කලෙක්හි මෙන් ලේ වලින් සිරුර රත් වී ගියේ ය.

166 ලොවට අගපත් හිමි සඳිනි පඩි නොලැබෙතත් අප
හැමට අද සි ට
අ ප ට බැරිමය යුද කරන්නට තද විකුම් මිග
රදකු ලඟ සි ට
නු ඹ ට අපගෙන් වැඩක් ඇතහොත් කුමට ඇරියෙද
මෙබඳු සටන ට
දූ ත ට මිගිඳකු ලවා අප මැරවුමෙන් වන පල
මොකද නිරිඳු ට

**අන්වය:** ලොවට අග පත් හිමි සඳිනි, අප හැමට අද සිට පඩි නො ලැබෙතත්, තද විකුම් මිග රදකු ළඟ සිට යුද කරන්නට අපට බැරිම ය. නුඹට අපගෙන් වැඩක් ඇතහොත් මෙ බඳු සටනට කුමට ඇරියෙද? දූතට මිගිඳකු ලවා මැරවුමෙන් නිරිඳුට වන පල මොකද?

**අර්ථය:** ලෝකයට නායක වූ ස්වාමිනි, අප සියලු දෙනාට අද පටන් පඩි නො ලැබෙතත්, මහා වික්‍රමයෙන් යුත් සිංහයකු ඉදිරියට ගොස් යුද්ධ කිරීමට අපට බැරි ය. ඔබට අපගෙන් ප්‍රයෝජනයක් ඇතොත් මෙ වැනි යුද්ධයකට අප කුමක් හෙයින් යැවුවෙහි ද? සිංහයකු ලවා අප මැරැවුමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද?

විස්තර: මෙහි භාෂා විලාශය ඉතා ග්‍රාම්‍ය ය.

167 මෙ ලෙස සැල කළ ස ද
සිහ යුදට ගිය මැතී සෙ ද
රද සිතට දුක් වැ ද
ඔවුන් තුටු කර තෙපුල් දී සො ද

අන්වය: සිය යුදට ගිය මැතී සෙද මෙ ලෙස සැල කළ සද, සිතට දුක් වැද රද ඔවුන් තුටු කර සොද තෙපුල් දී

අර්ථය: සිංහයා හා යුදට ගිය මැති වරුන් වහා මෙ සේ කියා සිටි විට, සිතෙහි ශෝක හටගත් රජ තුමා ඔවුන් සතුටු කරමින් යහපත් වචන කියා,

168 හැර පිටත ඔවුනැ' ම
මැතින් ගෙන්වා එවලෙ ම
ලෙව් සතට කර පෙ ම
මෙ ලෙස පැවසී වදන් මතර ම

අන්වය: ඔවුන් ඇම පිටත හැර, එවලෙ ම මැතින් ගෙන්වා, ලෙව් සතට පෙම කර, මනරම වදන් මෙ ලෙස පැවසී.

අර්ථය: ඔවුන් සියලු දෙන පිටත් කර යවා, එ වේලෙහි ම මන්ත්‍රීන් කැඳවා ලෝක වාසීන් කෙරෙහි වූ ආදරයෙන්, මෙ සේ යහපත් වචන කීය.

169 මැති වරුනි මසු දහසකින් බැඳි පියල්ලක් ගෙණැ
තබා ඇතුපි ට
අ ති දරුණු මිග රදුගෙ ඉස සිඳැ යමෙක් ගෙණවුත්
දුනොත් මෙ අප ට
ව ති සුරුද සහ මෙ රන් දහසද ඔහුට දෙන බව කියා
තුටු කො ට
ඉ ති සියලු විගු රදෙහි අප සතු ලවව් අණ බෙර
ඉතා විගස ට

අන්වය: මැති වරුනි, මසු දහසකින් බැඳි පියල්ලක් ගෙනැ ඇතු පිට තබා අති දරුණු මිග රදුගෙ ඉස සිඳ යමකු මෙ අපට ගෙනැවුත් දුනොත්, වත් ඉසුරු ද සහ මෙ රන් දහස ද ඔහුට තුටු කොට දෙන බව කියා ඉති අප සතු සියලු වගු රටෙහි ඉතා විගසට අණබෙර ලවව්.

අර්ථය: මන්ත්‍රී වරුනි, මසුරන් දහසකින් යුත් පොට්ටනියක් ඇතකු පිට තබා, ඉතා දරුණු සිංහයාගේ හිස කපා ගෙන දුන් කෙනකු හට ඒ රන් දහසත්, තවත් සම්පතුත් තුටු පඬුරු කර දෙන බව කියා, අපගේ මේ වගු රට පුරා වහා අණ බෙර ලවව්.

**විස්තර:** යමෙක් ගෙනැවුත් දුනොත් යන තැන්හි යමෙක් යනු සදෙස් හෙයින් එය යමකු කියා ශුඩ විය යුතු.

ඉති. සංස්කෘත හා පාලි භාෂාවන්හි 'මෙසේ' යන අරුත් ඇති නිපාත පදයකි. යමකු කී වදන් අවසන මෙය යෙදේ.

170 මැති සඳහු මෙ ලෙසි න
ලැවු අණ බෙර අසමි න
එ මිග රද පුත් ව න
සිංහබා නම් කුමරු විගසි න

171 ගොසින් තම මවු වෙ න
අණබෙර ලැවූ එ පුව න
දන්වා ලා නැව න
මෙ ලෙස පැවසී වදන් නොම රු න

**අන්වය:** මැති සඳහු මෙ ලෙසින ලැවු අණ බෙර අසමින එ මිග රද පුත් වන සිංහ බා නම් කුමරු විගසින තම මවු වෙත ගොසින්, අණ බෙර ලැවූ එ පුවත දන්වාලා නැවත නො රුත වදන් මෙ ලෙස පැවසී.

**අර්ථය:** මන්ත්‍රිවරුන් මෙ සේ ලැවූ අණ බෙර අසා, ඒ සිංහයාගේ පුත්‍රයා වූ සිංහබාහු කුමාරයා, වහා තම මව සමීපයට ගොස්, අණ බෙර මගින් දැන්වූ පුවත කියා යළිත් අසතුටු දායක වචන මෙ සේ කියන්නට විය.

**විස්තර:** නොම රුත. රුචි නොම වී යන්නෙන් සකස් කර ගත් රුත නොම යනු, පද පෙරළි කර යෙදුණු සැටි යි.

172 අ ම් ම මම ගොසින් සී රදහු මරමි න
දූ ම් ම හිස ගෙනැත් වගු රදූ දක්වමි න
නි ම්ම නැති නොයෙක් යස ඉසුරු ලබමි න
ර ම ම වන සුවෙන් දවසරිම් සී නැ න

**අන්වය:** සු ගම යි.

**අර්ථය:** මෑණියෙනි, මම ගොස් සිංහ රජයා මරු, වහා ම හිස ගෙන ඇවිත් වගු රජුට දක්වා, නිමක් නැති බොහෝ සම්පත් හා කීර්තිය ද ලබා ඉතා සැපතින් කල් යවමි යි කී විට.

**විස්තර:** දූම්ම: දූන් ම යනු එළි සමය සඳහා සකස් කර ගත් දූ බල යෙදුමකි.
රම්ම: රම්‍ය යන්නෙන් බිඳිණි.

173 එ බසට මිගිඳු වෙ ත්
සිත ඇති ඉතා බලව ත්
බිසෝ සඳ යහප ත්
මෙ ලෙස පැවසි පුතුට පෙම යු ත්

**අන්වය:** මිගිඳු වෙත් ඉතා බලවත් සිත ඇති යහපත් බිසෝ සඳ එ බසට පෙම යුත් පුතුට මෙ ලෙස පැවසි.

**අර්ථය:** සිංහයා කෙරෙහි බොහෝ සෙනෙහය ඇති ඒ යහපත් බිසව එම වචනයට පිළිතුරු වසයෙන් තම පෙම් වත් පුතුට මෙ සේ කීවා ය.

174 පු ත එ ලෙසින් ඇතත් තොප බල විකුම් ස ර
නැත දෙ ලොවින් වැඩක් මැරුවොත් පිය කෙස ර
න ත ඉසුරෙන් පිරුණත් එම වෙයි නොස ර
සි ත තබමින් මෙ වග නොය යුදට එ කෙස ර

**අන්වය:** පුත, එ ලෙසින් තොප බල විකුම් සර ඇතත්, පිය කෙසර මැරුවොත් දෙ ලොවින් වැඩක් නැත. නත ඉසුරෙන් පිරුණත් එම නො සර වෙයි. මෙ වග සිත තබමින් එ කෙසර යුදට නො ය.

**අර්ථය:** පුත්‍රය, එ සේ තොපගේ බලය හා වික්‍රම සාරය ඇතත්, තම පියා වූ කේසර සිංහයා මැරුවොතින් දෙ ලොව ම පිරිහේ. අනන්ත සැපතින් පිරී ගියත් එහි සාරයක් නැත. මේ බව සිතෙහි තබා ගෙන, සිංහයා හා යුද්ධයට නො යනු.

**විස්තර:** **නත**. අනන්ත ශබ්දයෙන් බිඳිණි.

175 මෙ ලෙ ස එ බිසව දෙවරක් ම නවතමින් සිටි සඳ එ කුම රු
එ ලෙ ස නෙ වැති ව ලැවූ අණ බෙර අසා ගොස් මවටත් සො රු
ස තො ස වී එම අණ බෙරය නවතමින් සපැමිණ රජු සා රු
සි යැ ස ලෙස රැකි තමා පිය වන සිරදු මරණෙමි කි ව රු

**අන්වය:** මෙ ලෙස එ බිසව දෙ වරක් ම නවතමින් සිටි සඳ, එ කුමරු එ ලෙස නෙ වැති ව ලැවු අණ බෙර අසා මවටත් සොරු ගොස්, සතොස වී එම අණ බෙරය නවතමින් රජු සාරු සපැමිණ, සිය ඇස ලෙස රැකි තමා පිය වන සි රදු මරණෙමි කි වරු.

**අර්ථය:** මෙ සේ බිසව විසින් දෙ වතාවක් ම නවත්වන ලද කුමාරයා තුන් වෙනි වර හඬ නැඟි අණ බෙරය අසා, මවට ද හොරා ගොස් සතුටින් අණ බෙරය නවත්වා, රජු වෙත පැමිණ තමා ඇසක් මෙන් රකින ලද තම පියා වූ සිංහයා මැරිය හැකි බව කී විට.

176 ති රි ඳු එ බසට පිණා සතුටින් සුහද කුමරුනි විකුම් සරුව ත
මි හි ඳු හිස ගෙණැ දුනොත් මෙ අපට සෙනෙවිරත්
නතපුරුද සමගි ත
තොමඳු තෙසා සව් ඉසුරු දි තොප තුටු කරන්නෙමි
කි සඳ එ නර ණ
ප සි ඳු එ කුමරු නිරිඳු පදසර නැමැදූ අවසර
රුගෙණැ විගසි ත

**අන්වය:** නිරිඳු එ බසට සතුටින් පිනා, විකුම් සරු වතද සුහ කුමරුනි, මෙ අපට මියිඳු හිස ගෙන දුනොත්, සෙනෙවිරත් නතපුරු ද සමයිනි තො මඳු තෙසා සව් ඉසුරු දි තොප තුටු කරන්නෙමි එ නරණ කි සඳ, පසිදු එ කුමරු නිරිඳු පද සර නැමද විගසින අවසර රුගෙන.

**අර්ථය:** ඒ බසට සතුටු වූ රජතුමා, "වික්‍රමයෙන් සාර වූ යහපත් කුමාර යාණෙනි, සිංහයාගේ හිස අපට ගෙන දුනහොත්, සෙනෙවිරත් නතපුර ද බොහෝ වු නොයෙකුත් සැප සම්පත්ද දී තොප සතුටු කරන්නෙමි" යි කි විට, ඒ ප්‍රසිඬ කුමාරයා රජුගේ පා පියුම වැඳ වහා අවසර ගෙන.

**විස්තර:** නරණ: නරසින්හට නායක වූ යන අරුතෙහි රජුට යෙදේ. මේ පදය මෙම කාවෙහි අනවශ්‍ය ය.
**පදසර:** පා නමැති නෙළුම් මල්.

177 පි වි ස වනයට එ සි රද දූකෑ වරෙන් සිහ රද යුදට විගසි ත
කි බ ස අසමින් ඉතා සතුටු වැ මිගිඳු එ කුමරු ළඟට එන නැත
වි ග ස විස පෙව් කරල් හියක් රුගෙණැ කොසරුට
විදපි සරොසි ත
එලෙස විදි ඒ සැරය ආපසු බලා වැටුනෙය මිගිඳු කුළුණෙ න

**අන්වය:** වනයට පිවිස එ සී රද දූකෑ, සිහ රද යුදට නො ලසින වරෙන් කි බස අසමින් ඉතා සතුටු වැ, මිගිඳු එ කුමරු ළඟට එන නැන විගස විස පෙව් කරල් හියක් රුගෙනැ රොසින කොසරුට විදපි. එ ලෙස විදි ඒ සැරය මිගිඳු කුලුණෙන ආ පසු බලා වැටුණෙ ය.

**අර්ථය:** වනයට ඇතුළු වී ඒ සිංහ රාජයා දැක, "සිංහ රාජය, වහා මා හා යුදට එනු" යි කි වදන් අසා සතුටට පත් ‍සිංහයා කුමාරයා සමීපයට එන විට විස පොවන ලද තපුරු ඊ තලයක් කෝප- යෙන් කුමාරයා විසින් විදින ලදී. ඒ හි තලය සිංහයා තුළ වූ කාරුණාව නිසා ආ පසු වැටිණි.

**විස්තර: සාරල් ගියක්.** සාරල් යනු, සකු බරල ශබ්දයෙන් බිඳී ආයේ ය. බරල යනු හද, දරුණු, තපුරු යන අරුත්හි වැටේ. දරුණු හි තලයක් යනු අදහසයි

**මියිඳු කුළුණෙහ:** සිංහයා තම පුතා කෙරෙහි දක්වූ කාරුණාව ඒ නිසා හී තලයෙන් උහට තුවාල නො වී ය. 'වරෙන් සිහරද සුදට' ආදිය ග්‍රාම්‍ය සෙදුම් ය.

178 දෙ වෙ නි වර විදි හී ගසත් එම ලෙසට බිම හුනු බව ද දක ලා
තො වෙ නි එ කුමරු විදිත බව දුටු සී රදහු මෙත් අඩු වෙ ලා
ත දි නි එ සැරය සිරුර වදිමින් සිඳුරු සාර බිම හුනු ත ලා
බෙ ලෙ නි වැඩි සී රදහු එ තැනම වැටුනී කාය බල සුන් වෙ ලා

**අන්වය:** සු ගම යි.

**අර්ථය:** දෙ වෙනි වර විදින ලද ඒ තලය ද එ සේ ම බිමට වැටුණු බව් දුටු කුමරු තුන් වෙනි වරට ද විද්දේ ය. එ විට සිංහයාගේ සිතෙහි වූ මෛත්‍රිය අඩු වූයෙන්, ඒ ඊය උගේ සිරුර සිදුරු සාර බිම වැටිණි. මහත් බලවත් සිංහ රාජයා සිරුරෙහි ශක්තිය නැති වී එ තැන ම වැටුණේ ය.

179 සැ ර ප හ රි න් වෙහෙසට පත් එ සී ර ද
දකා වි ග සි න් සිහබා කුමරු මත හ ද
පෙර බැතියෙන් රැකි බව සිහි සාර එ ස ද
මෙම වි ල සි න් දුක් මුසු බස් කියයි ත ද

**අන්වය:** සැර පහරින් වෙහෙසට පත් එ සී රද මතනද සිහබා කුමරු විගසින් දකා, පෙර බැතියෙන් රැකි බව සිහි සාර, එ සඳ, මෙම විලසින් තද දුක් මුසු බස් කියයි.

**අර්ථය:** ඊ තල පහරින් තුවාල වූ ඒ සිංහ රජයා ප්‍රිය වඩන සිංහ බාහු කුමරුන් වහා දක, පෙර තමන් ඔහු ආදරයෙන් ආරක්ෂා, සාළ අයුරු සිහි සාර, මෙ සේ ඉතා දුක් මුසු වදන් කියන්නට විය.

180 ම ම, තොප දකිනට ආවෙමි අ නේ
කි ම, මට දුක් දුන්නේ මෙලෙසි නේ
පෙ ම, වන තොප දකිනොත් දරුව නේ
මෙ ම, තොප දුන් දුක් මට තොම ද නේ

**අන්වය:** මම තොප දකිනට මෙහි ආවෙමි. අනේ, මට මෙ ලෙසිනේ දුක් දුන්නේ කිම? දරුවනේ, පෙම වන තොප දකිනොත්, මෙම තොප දුන් දුක් මට තොම දනේ.

**අර්ථය:** මම තොප දැකීමට පැමිණියෙමි. අහෝ! මට මෙ සේ දුක් ඇති කරන ලද්දේ කුමක් හෙයින් ද? දරුවෙනි, ආදරය ඇති කරවන තොප දැක්මට ලැබෙතොත්, මට මේ තොපගෙන් වූ දුක් නො දැනේ.

181 සු හ, න'ඹුවන් දක්නට ආ නි සා
සි හ, ලැදි නො ව මට විදි බව අ සා
ව හ, සඳ වන් තොප මවු මියුලැ සා
සි හ, දුක් නො වැ ඉඳිනෙද කොයි ලෙ සා

**අන්වය:** සුහන්, අඹුවන් දක්නට ආ නිසා, සිත ලැදි නො ව, මට විදි බව අසා, වත සඳ වන් තොප මවු මියුලැසා, සිත දුක් නො ව කොයි ලෙසා ඉඳිනෙ ද?

**අර්ථය:** දරුවන් හා බිරිඳ දැකීමට පැමිණි හෙයින්, සිතෙහි කිසි ආදරයක් නැති ව, මට මෙ සේ තොප විඳින ලද බව අසා, සඳ වැනි මුහුණක් ඇති, මුව දෙනුන්හට බඳු ඇස් ඇති තොපගේ මව සිතෙහි කනගාටු නැති ව සිටී ද?

**විස්තර: මියුලැසා:** මියුල් + ඇසා. මුව දෙනුන්ගේ වැනි චකිත වන ඇස් ඇත්තී. මෙය රූමත් කාන්තාවන් සඳහා යෙදෙන පදයකි. මුව දෙනුන්ගේ වැනි ඇස් ඇති වීම කාන්තාවන්ගේ රූමත් බවෙහි අංගයක් සේ සැලැකේ. සංස්කෘත කාව්‍යයන්හි 'මෘගාක්ෂි' යනුවෙන් ද දැක්වෙන්නේ මේ පදය ම ය.

182 දු ක්, විඳැ පෙර තොප ඇති කාළ ස දැ
එ ක්, ගුණ ලවයක් නැතිවම හ දැ
දු ක්, මට දුන් ගොරතර ලෙස අ දැ
ම ක්, කර ඉවසම් දූන් පුත ස දැ

**අන්වය:** දුක් විඳැ පෙර තොප ඇති කාළ සඳැ, එක් ගුණ ලවයක් හදැ නැති ව ම අදැ මට ගොරතර ලෙස දුන් දුක්, පුත සදැ, දූන් මක් කර ඉවසම්.

**අර්ථය:** දුක් විඳිමින් පෙර තොප රැකි කල්හිත්, කිසි ම ගුණයක් හදවතෙහි නැති ව අද මට බොහෝ දරුණු ලෙස දුන් දුක්, දූත් පුතණුවෙනි, මම කෙ සේ ඉවසම් ද?

**විස්තර:** **ඈති කල සඳ**-ඈති කළ විට ද, ඈති කළ තමුත් යනු අදහස යි.
**ගුණ ලවයක්**-ගුණ බිඳක්.
**අඳ**-අද යනු එළිසමය සඳහා යොදා ගත් සැටි ය.

183 එ ම, මිග රද මෙලෙසින් කී සා ලා
කු ම, රිඳු සිහබා නම් දුක් වෙ ලා
ත ම, අත තුබු දුනු හී බැහැර ලා
ල ම, දිය අත ගසමින් අසු හෙ ලා

**අන්වය:** මෙ ලෙසින් එම මිග රද කී සාලා සිහ බා නම් කුමරිඳු දුක් වෙලා තම අත තුබු දුනු හී බැහැරලා ළමදිය අත ගසමින් අසු හෙලා,

**අර්ථය:** සිංහයා මෙ සේ කී විට සිංහ බාහු කුමාරයා දුක් වී, තම අතෙහි තිබූණු, දුනු හා ඊ තල පසෙක දමා, පපුව මැද අත් ගසමින් කඳුලු හෙලා,

**විස්තර:** **අසු**: සකු අශ්‍රු, පාළි අස්සු ශබ්දයෙන් බිඳී ආයේ ය. කඳුලු.

184 පෙ ර, තම මවු සමගින් තුන් දෙ නා
තො ර, තොව රැකි බව සිහියට ගෙ නා
ම ර, ණට පත් සිරදුට වැඩියෙ නා
හ ර, ලසොවින් හැඩි මෙ ම කියමි නා

**අන්වය:** පෙර තම මවු සමගින් තුන් දෙනා තොර තො ව රැකි බව සිහියට ගෙනා, මරණට පත් සි රදුට වැඩියෙනා, හර ළ සොවින් මෙම කියමිනා හැඩි.

**අර්ථය:** පෙර දි තමන්ගේ මව ඇතුළු තමන් ති දෙනා හොඳින් ආරක්ෂා කළ අයුරු සිතමින්, මිය ගිය සිංහ රාජයාට ද වඩා මහත් සිත් ශෝකයෙන් මෙ සේ කියමින් හඬන්නට විය.

**විස්තර:** **ළ සොවින්**. සිතෙහි සෝකයෙන්.
**මෙම කියමිනා**: මෙම යනු මෙ සේ යෙදීම අනුචිත ය.

185 ගජ කුඹු පළ පලා, බුදිමින් ඉස මො ළා
තොම හිඳ වල තුලා, සුතත' ඹුවන් ලො ලා
ඇවිදින් හුදෙකලා, මරණට පත් වෙ ලා
තිබෙන මෙ තුඹ බලා, විය මට දුක් ද ලා

**අන්වය:** ගජ කුඹු පල පලා ඉස මොළා බුදිමින්, වල තුළා තොම හිඳ, සුත අඹුවන් ලොලා ඇවිදින්, උදකලා මරණට පත් වෙලා තිබෙන මෙ තුඹ බලා මට දළා දුක් විය.

**අර්ථය:** ඇතුන්ගේ හිස් මුදුන් පලා මොලකමින්, වනයෙහි නො හිඳ, අඹු දරුවන් ලොබින් ඇමිඳ, හනි ව ම මරණයට පත් වී සිටින නුඹ දුසා මට මහත් සතාගාටු ඇති වේ.

**විස්තර:** **දලා.** දළ යනු දැඩි හෙවත් හද යන අරුත් දෙයි. සකු දෘඪ ශබ්දයෙන් බිඳිණි.

**තිඹෙන මෙ නුඹ:** මෙය සිටින මෙ නුඹ කියා වුවහොත් වඩා යොගා වේ.

186 වන මැද එසා ලෙසේ, ඇවිදූ තොමද ලෙ සේ
ගෙණතෙසා පලරසේ, ලා ගිරි ලෙණ කු සේ
දී අප රුනි ලෙසේ, ඇති සාලෙ දෙ සක සේ
ඉන් පල දුනි මෙසේ, නුඹට මෙ දුක් රු සේ

**අන්වය:** වන මැද එසා ලෙසේ ඇවිදූ. තොම මඳ ලෙසේ තෙසා පල රසේ ගෙන, ගිරි ලෙන කුසේ ලා, අප රුනි ලෙසේ දී, දෙ ඇසක සේ ඇති සාලෙ. ඉන් නුඹට මෙ දුක් රුසේ පල දුනි.

**අර්ථය:** වනය තුළ හැම තැන ඇවිදිමින්, බොහෝ සේ නොයෙකුත් මිහිරි පලතුරු ගෙන, ගල් ලෙන තුළ දමා. අපට කැමති පරිදි දෙමින්, ඇස් දෙක මෙන් නුඹ අප රැක්කෙහි ය. එ හෙයින් මේ දුක් සියල්ල පල දුනි.

**විස්තර:** **දෙසක සේ:** දෙ + ඇසක + සේ; ඇස් දෙකක් මෙන්

187 යක් දරු නිති ලෙසේ, වාවිති දුක් රු සේ
යක් මවු පිය කුසේ, තො වාවිති ය එ සේ
පෙර සිට එන බසේ, බොරු නැති බව මෙ සේ
දුන් අත් පිට ලසේ, දුටුවෙමි නතු ලෙ සේ

**අන්වය:** යක් දරු නිති ලෙසේ දුක් රුසේ වාවිති. යක් මවු පිය එසේ කුසේ නො වාවිති ය, පෙර සිට එන බසේ බොරු නැති බව මෙ සේ, දූන් ලසේ අත් පිට ලෙසේ දුටුවෙමි.

**අර්ථය;** යක්ෂ දරුවෝ නිතර ම දුක් විදීමට සමත් වෙති. එහෙත් යක් මව් පියෝ තම කුස ගින්න ඉවසීමට නො සමත් වෙති. පෙර සිට එන මේ කියමන බොරු නැති බව මෙ සේ දැන් සෙමින් වුව ද ඇස් ඉදිරි පිට ම තත් වූ පරිදි අවබෝධ කර ගතිමි.

**විස්තර**: යක්ෂ දරුවන් බඩගිනි ඉවසීමට සමත් වෙතත්, ඔවුන්ගේ දෙමා පියනට එය බැරිය යන පැරණි කියමන සැබෑ බව කුමරුට දැන් පෙනේ. තමාට මේ දුක් ඉවසිය හැකි වුව ද තම පිය සිංහයාට බැරි බව ඔහුට පෙනෙන හෙයිනි.

188 මට පිය පිය වනා, මිග රද මැරුවෙ නා
මෙ ලොව සියලුදනා, ගරහයි නො මදි නා
පර ලොවැ රුදුවනා, සිව් අවයෙහි දි නා
දුක් විඳ නො පමණා, මිදෙම්ද කොයි දි නා

**අන්වය**: මට පිය වනා පිය මිග රද මැරුවෙනා, මෙ ලොව සියලු දනා නො මදිනා ගරහයි, පර ලොවැ රුදු වනා සිව් අවයෙහි දිනා නො පමණා දුක් විඳැ කොයි දිනා මිදෙම් ද?

**අර්ථය**: මගේ පියා වූ අදරැති සිංහයා මැරුවෙන්, මේ ලෝකයේ හැම දෙනෙක් ම මට බොහෝ සේ ගරහති. පර ලොවදී ඉතා මහත් (රෞද්‍ර) හතර අපායෙහි ඉපදී කෙළවරක් නැති දුක් විඳ කවදා එයින් මට ගැලවිය හැකි ද?

**විස්තර**: **රුදු**: මෙහි අර්ථය 'විසාල' වුව ද මෙහි යොදා ඇත්තේ රෞද්‍ර යන අදහස දීමට බව පෙනේ.
**සිව් අවය**: නරකය, ප්‍රේත, අසුර හා තිරිසන් යන සතර අපාය.

189 අප සිය ඇස ලෙසා, රැක වැඩූ නොව ල සා
මිග රද ගුණ රැසා, සිතට නො ගෙණ මෙ සා
ගිවිස නිරිඳු බසා, තපුරක් කළ නි සා
දෙ ලොවින් දුක් රැසා, මට විය එක ලෙ සා

**අන්වය**: අප සිය ඇස ලෙසා නොව ලසා රැකා වැඩූ මිග රද මෙ සා ගුණ රැසා සිතට නො ගෙන නිරිඳු බසා ගිවිස තපුරක් කළ නිසා මට දෙ ලොවින් එකා ලෙසා දුක් රැසා විය.

**අර්ථය**: තමන්ගේ ඇස මෙන් අ ප්‍රමාද ව අප ආරක්ෂා කරමින් හදා වැඩූ සිංහයාගේ මේ තරම් ගුණ සමූහය නො සලකා රජු හා පොරොන්දු වී තපුරු දෙයක් කළ හෙයින් මට දෙ ලොවෙහි ම එකා පරිදි දුක් රාශියක් පැමිණේ.

**විස්තර**: **මේ සා**: මේ තරම්.

190 මෙ ලෙස කුමර වරා, හඬමින් සිටි ව රා
මිග රද කාන් පුරා, අසමින් එම ස රා
විගස දෙයැස ඇරා, බලමින් එ කුම රා
පෙර විඳි දුක් තරා, පවසයි මෙම යු රා

**අන්වය:** කුමර වරු මෙ ලෙස හඬමින් සිටි වරා, මිග රද එම සරා කන් පුරා අසමින්, විගස දෙ ඇස ඇරා, එ කුමරා බලමින් පෙර විඳි දුක් තරා මෙම අයුරා පවසයි.

**අර්ථය:** උතුම් කුමාරයා මෙ සේ හඬමින් සිටින අතර, සිංහයා එම හඬ හොඳ හැටි අසා වහා දෙ නෙත ද හැර, කුමාරයා දෙස බලමින් තමා පෙර වින්ද බොහෝ දුක් ගැන මෙ සේ කියයි.

**විස්තර:** සිංහයා ඇස් හැර බලා නැවතත් කථා කරන බවක් මේ කවෙන් කියැවෙතත්, ඔහු මිය ගිය බව මීට පෙර 184 වෙනි කවෙ හි 'මරණට පත් සි රදුට වැඩියෙනා' යන තැන්හි සඳහන් විය.

**එම සරා:** එම සවරය–එම කට හඬ.

191 පෙර දි නෝ තොප මව'හනෝ වෙළඳකුගෙණෝ
සෙනෙහස යෙ නෝ
ස ම ගි නෝ ඔහු මහ වෙනෝ මැද යන තැනෝ මව දකිමි නෝ
සාර සෙ නෝ එකතට මෙනෝ නද කරමිනෝ ගොස් වන් තැ නෝ
බිය ගෙ නෝ එ වෙළඳ ගණේ ඇය හරිමිනෝ බැදිවන් දි නෝ

**අන්වය:** පෙර දිනෝ තොප මවහනෝ සෙනහසයෙනෝ වෙළඳකුගෙනෝ සමගිනෝ ඔහු මහ වෙනෝ මැද යන තැනෝ මා දකිමිනෝ, එ කතට මෙනෝ සෙනෝ සාර, නද කරමිනෝ ගොස් වන් තැනෝ, එ වෙළඳ ගණේ බිය ගෙනෝ ඇය හරිමින් බැදි වන් දිනෝ.

**අර්ථය:** පෙර දවසක තොපගේ මව ප්‍රේමයෙන් යුතු ව වෙළෙන්දකු සමග මහ වනය මැදින් යන විට ඔවුන් දැක, ඇය කෙරෙහි සිතෙහි ඇල්මෙන් මම නාද කරමින් ඔවුන් අතරට පැන්නෙමි. බියට පත් වෙළෙඳ සමූහයා ඇය අත් හැර කැලයට පැන්න විට,

**විස්තර:** වෙළඳකු ගෙණෝ යනු වෙළෙන්දකුගේ කණ්ඩායමක් කියා ද ගත හැකි ය.

දෙ වෙනි පදයේ, ඔහු යනු මෙහි අනවශ්‍ය පදයකි.
**මෙනෝ:** සිතෙහි,

192 අ ද රි නා එම වරහනා පිට තබමිනා නොස් විගසි නා
ගි රිලෙණා සිටුවා ගණා පල රසයෙනා තුටු කරමි නා
උ ම' හ ණා සහි'සුරු මෙනා රන් රස මෙනා නද බැනියෙ නා
ස ත ති නා රති සැපතිනා මන පිණිමිනා වසනා දි නා

**අන්වය;** සු ගම සි.

අර්ථය: ආදරයෙන් එම උතුම් කාන්තාව පිටෙහි තබා ගෙන නොයෙක් වනාන්තර ගල් ලෙනෙහි රඳවා, මිහිරි පලතුරු මලින් සතුටු කරවමින් ඊශ්වරයා හා උමයංගනාව මෙන් ද, රත්රන් හා රසදිය මෙන් ද භක්තියෙන් යුතු ව, නිබඳ රති සැපතින් සිත් පිනවමින් සිටින අතර.

විස්තර: උමඟනා සහිසුරු මෙනා; උමඟනා සහ ඉසුරු මෙනා. ඊශ්වර හා පාර්වතිය මෙන්.

රන් රස මෙනා: රත් රන් රස දිය හා එකට ගැලපෙන හෙයින් පෙම් වතුන් එක් ව වසන විට යෙදෙන උපමාවකි මේ.

කාව්‍ය ශේඛරයෙහි ද,

"සි ලි ලේ බිඳු නො ලග වන පොකුරු පත මෙන
නො ඇලේ ඇ සිතු හිමි දෙස මිස තැනෙක වෙන
වි පු ලේ බැඳි සෙනෙහස ඉන් ඔවුනොවු න
එ ක ලේ වීසූ සමගි ව රන් රස ලෙසි න"

යනුවෙන් මේ උපමාව දක්වේ.

193 අ ප ස ඳ දරු පිළිසිඳ කුස සිටි සඳ දෙල දුක් වැ ද
ව න මැ ද විද රුති ලෙද පල රස යොද දී දෙල මු ද
දිවි ලෙ ද රකිනා ලද ම විසින් එද සිට ගැබ සො ද
පි රි ස ද මස් විළි රුද විය තද ලෙද එ කතට සෙ ද

අන්වය: අප සඳ කුස දරු පිළිසිඳ සිටි සඳ දෙල දුක් වැද, වන මැද ඇවිද රුති ලෙද පල රස යොද දී දෙල මුද, ම විසින් එ ද සිට දිවි ලෙද රකිනා ලද සොඳ ගැබ, මස් පිරි සඳ, එ කතට සෙද විළි රුද තද ලෙද විය.

අර්ථය: අප නිසා කුසයෙහි දරුවන් පිළිසිඳ දෙළ දුකින් ඇ සිටි විට, වනය තුළ ඇවිද, කැමති පරිද්දෙන් පලතුරු යුෂ ගෙන දී මම ඇගේ දෙළ සන්සිඳවීමි. එ තැන් සිට මා විසින් පණ මෙන් රකින ලද, සොඳ දරු ගැබට නියම මාස ගණන පිරී ඇයට මහත් සේ ප්‍රසව වේදනා ඇති විය.

විස්තර: මස් පිරි සඳ. දස එකඩ මසක් පිරිමෙන් පසු.

194 එ ම වී වා මගෙ දෙහොතටා වැදූ දෙදෙනවා දරු
පෙම් කො වා
පි ට ත වා මම ගොදුරටා නො ම ගොස් සිටා
තද නො ම කො වා
එ ක ත වා වැදූ දූ සිටා රිසි රිසි විටා රස'හර සෙ වා
වි කු ම වා දත කිය කොටා තැන තැන සිටා ගෙණෑ දී තු වා

අන්වය: එම විටා මගෙ දෙහොතටා වැදූ දරු දෙ දෙනවා පෙම් කොටා, මම ගොදුරටා පිටතබා නොම ගොස් සිටා තද නොම කොටා, වැදූ දූ සිටා එ කතවා රිසි රිසි විටා සෙටා රස අහර විකුමටා දත කිය කොටා, තැන තැන සිටා තුටා ගෙන දී.

අර්ථය: එ වේලෙහි මගේ දූතට වදන ලද දරු දෙ දෙන හට පෙම් කර අහර පිණිස වත් මම පිටතට නො ගොස්, නාදයක්ද නො කර සිටියෙමි· දරු ලද දින සිට ඒ කාන්තාවට ඇ කැමති හැම විටෙක ම, වික්‍රමයෙන් ජනයා කිය ගන්වා නොයෙක් තැන්හි සිට සතුටින් අගනා රස ආහාර ගෙන දී.

විස්තර: විකුමටා, විකුමයෙන් යනු එළිසමය සඳහා යොදා ගත් සැටි යි·

195 ස ද මෙ නෝ මිත සිඹිමිනෝ හද සතුටිනෝ දරු වඩමි නෝ
සු බ ගු ණේ සුත් මොහොතිනෝ බත් දෙවමිනෝ සත් මස කිනෝ
එ ම දි නෝ නම් තබමිනෝ දෙ දෙනම නෙළණි දරු
කෙළිමි නෝ
මෙලෙසිනෝ පුතු සමගිනෝ දුව රකිමිනෝ දවසරිමි නෝ

අන්වය: සු ගම සි.

අර්ථය: සඳ වැනි මුහුණු සිඹිමින්, මහත් සතුටින් දරුවන් වඩමින්, සත් මසකට පසු ශුභ මොහොතක බත් කවා, එ දින ම නම් ද තබා දරු දෙ දෙන ගෙන සෙල්ලම් කරමින්, මෙ සේ පුතු හා දුව, රැක ගෙන කල් යවමින්.

විස්තර: එම දිනේ නම් තබමිනෝ: නම් තැබීමට සත් මසක් ගත වන තෙක් බලා සිටීම සාමාන්‍ය සිරිත නො වේ.

196 ව ය සි නා දරු එ දෙදෙනා හට සොළොස් වස පිරෙනා තු රු
ම වි සි නා හද දුක් ගෙණා රැකියෙමි දිදි රස අඹුයු රු
අ ද රි නා තොපි මෙලෙසිනා ඇති කළ තිසා මට මෙ නපු රු
අ ද දි නා විය නෙ සිරිනා තොප පවතිවා හිම් දිව යු රු

අන්වය: එ දරු දෙ දෙනා හට වයසිනා සොලොස් වන පිරතා තුරු ම විසිනා තද දුක් ගෙනා අම් අසුරු රස දිදී රැකීයෙමි. අදරිනා තොප මෙ ලෙසිනා ඇති කළ තිසා මට අද දිනා මෙ තපුරු විය. නෙ සිරිනා තොප දිවයුරු හිමි පවතිවා.

අර්ථය; ඒ දරුවන් දෙදෙනාම දහසය වයස පිරෙන තෙක් ම බොහෝ වෙහෙස ගෙන දිව බොජුන් වැනි අහර කෙන දෙමින් රැක් කෙමි. ආදරයෙන් මෙ ලෙස් තොප ඇති දූඩි කල හෙයින් මට මේ තපුර සිදු විය. නොයෙකුත් ශ්‍රියෙන් යුතු ව තොප හිරු පවතිනා තෙක් ජීවත් වේවා.

විස්තර: ම විසිනා රැකීයෙමි, හා තොපි ඇති කළ යිසා යන තැන් වියරණ දෙස් සහිත ය. මම රැකියෙමි හා තොප ඇති කල තිසා ආදි වසයෙන් මේ ශුඩ විය යුතු ය.

197 ච න ක ලා පති සිරි සුලා දිළි පිරි කලා පති ලපතු ලා
තොවිකලා මට එක් වෙලා සිටි මවු කලා සහ ගුණ ව ලා
ම න ක ලා තො ප නං කලාවද මෙම කලා මා සිහි න ලා
තො වමූලා කිය තොප බලා මගෙ දුක් කැලා දූන් ගියෙ ප ලා

අන්වය: චන කලා පති සිරි උසුලා දිළි, පිරි කලා පති ලප තුලා, තො විකලා මට එක් වෙලා සිටි ගුණ අවලා මවු කලා සහ මන කලා තොප නං කලාව ද, මෙම් කලා මා සිහි කලා, දූන් පලා ගිය මගෙ දුක් කැලා තොප බලා තො ච මූලා කිය.

අර්ථය: මූහුණ චන්ද්‍රයාගේ සෝභාවෙන් යුතු වූ ද, පූර්ණ චන්ද්‍රයා හා සස ලපය මෙන් වෙනස් නො ව, මා හා එක් ව සිටියා වූ ද, ගුණයෙන් පිරි තොපගේ මවට ද, ප්‍රිය එඩවන තොපගේ නැඟනියට ද, දූන් මා සිහි වූ විට, දූන් මරණයට පැමිණෙන මගේ දුක් රැස බලා ඇති සැටියෙන් කියව.

විස්තර: කලා පති: චන්ද්‍රයා. චන්ද්‍රයා කලා දහසයකින් යුතු ය.

මවු කලා: මැණියන් වූ කාන්තාව. කලා යනු කාන්තාව යන අරුත්හි වැටේ.

නං කලා: නැඟනිය වූ කාන්තාව.

198 ස තො ස වී කුමරු හට මරණ පත් කා ලා
මෙ ලෙ ස පෙර විඳපු දුක් රැස සියන කා ලා
එ ලෙ ස දරු කුමරු විදි සැමරෙති තද බ ලා
වි ග ස සැඟ වුනෙ සිසී රදුගෙ පණ න ලා

අන්වය: මරණ පත් කලා කුමරු හට ස තොස වී, මෙ ලෙස පෙර විදපු දුක් රුස කියන කලා, එ ලෙස දරු කුමරු විදි තද බලා සැරෙහි සි රදුගෙ පණ නලා විගස සැඟවුණෙයි.

අර්ථය: මරණයට පත් විට ද, කුමාරයා කෙරෙහි සතුටින්, තමා පෙර විඳින ලද දුක් රාස මෙ සේ කියද්දී, පුත් කුමරුවා විසින් විදින ලද දරුණු හී පහරින් සිංහ රාජයාගේ ප්‍රාණ වායුව වහා සැඟවී ගියේ ය.

199 කු ම රු ස ඳ දැන එ සී රද මළ බව එ සඳ දුක් මැද නොම ඳ
ති රි ඳු ස ඳ බස් ගිවිස සෙඳ පිය මිගිඳු විද මැරුවෙමි සුහ ඳ
කි ය මි නෙද හඬමින් අමඳ යළි කඩුව ඇද මිගිදුගෙ පිය ඳ
සි ර ස සි ඳ ගෙණු මහට වැද එන කලට එද ගම වැසි සමු ඳ

අන්වය: කුමරු සඳ එ සී රද මළ බව දැන එ සඳ නො මඳ දුක් වැද, සෙඳ තිරිඳු සඳ බස් ගිවිස, සුහද පිය මිගිඳු විද මැරුවෙමි. කියමින් එ ද අමඳ හඬමින්, යළි කඩුව ඇද ද පිය මිගිඳුගෙ සිරස සිඳ ගෙනැ එ ද මහට වැද එන කලට ගම් වැසි සමුද.

අර්ථය: සිංහයා මළ බව දුටු කුමාරයා ඒ විට බොහෝ දුක් වී වහා, 'රජුගේ වචනය අදහා යහපත් පිය සිංහයා විද මැරවෙමි'යි කියමින් බොහෝ සේ හඬා, නැවතත් කඩුව ගෙන සිංහයාගේ හිස කපා, එ දින මාවතට බැස එද්දී ගම් වැසි සෙනග

විස්තර: අමඳ මඳ නො වූ හෙවත් බොහෝ සේ.

200 එ බව අසා නෙක පඬුරු රුසා ගෙණැ මහට බැසා
කුමරුට දියැ සා
රට ව න සා සිරි මිගිඳු නසා'පම සෙත සලසා
කළ පිහිට ති සා
සි ය ළු දී සා වෙහි එක විලසා පළ විය නො ලසා
ඔබ වික්‍රම් රු සා
නෙ තුති බසා පවසා මෙ ලෙසා හැම පඬුරු රුසා
දී එම විග සා

අන්වය: එ බව අසා, නෙක පඬුරු රුසා ගෙන මහට බැසා, රට වනසා සිරි මිගිඳු නසා අපට සෙත සලසා කළ පිහිට නිසා, සියළු දිසාවෙහි එක විලසා නොලසා ඔබ වික්‍රම රුසා පළ වීය (යි) දියැසා කුමරුට මේ ලෙසා නේ තුතී බසා පවසා, එම විගසා හැම පඬුරු රුසා දී.

අර්ථය: එ ( කුමාරයා එන ) බව අසා නොයෙකුත් තෑගි ගෙන මහජන බැස, "රට විනාශ කරමින් සිටි සිංහයා මරා අපට යහපත සලසා දුන් නිසා, සෑම පැතිවල එක පරිදි වනා ම ඔබගේ වික්‍රමයන් ප්‍රකට වීය" යි, ලොවට ඇසක් වන් කුමාරයාට මෙසේ බොහෝ සතුති වචන කියා, එ වේලෙහි ම සියලු තෑගි ද දී.

201 එ ක ලෙ සි නා පල යුරු නෙලිනා ගොඩ බැස දවනා
සිඳු රදු විසි නා
නොව ප ම ණා පසතුරු ගොසිනා කුඩ කොඩි රැගෙනා
වසමින් ගුව නා
දෙන නොමිණා ඔල් වර හඬිනා නෙක තුති හොසිනා
හැම දන කර නා
මෙ බ ඳු ම නා මහ පෙලහරිනා කුමරිඳු සොබනා
නුවරට පැමි නා

අන්වය: එක ලෙසිනා පල නෙලිනා විසිනා ගොඩ බැස දවනා සිඳු රදු අයුරු පමණා නො ව; කුඩ කොඩි රැගෙනා ගුවනා වසමින් පසතුරු ගොසිනා හැම දන නො මිනා දෙන ඔල්වර හඬිනා, නෙක තුති ගොසිනා කරනා මෙ බඳු මනා මහ පෙලහරිනා සොබනා කුමරිඳු නුවරට පැමිණා.

අර්ථය: එකා කාර ව ( කල්පාන්තයෙහි හමන ) ප්‍රලය වායුව නිසා ගොඩ බිමට වැද දුවන සමුද්‍ර රාජයා මෙන්, කෙළවරක් නැති ව කුඩ කොඩි ගෙන අහස වසමින්, පංචාංගතූර්ය නාද පතුරවමින්, සියලු ජනයා දෙන බොහෝ වූ ප්‍රීති ඝෝෂාවෙන් ද නොයෙක් සතුති ඝෝෂාවෙන් ද මෙ සේ මහත් ප්‍රාතිහාර්යයෙන් යුතු ව ශෝභමාන කුමාරයා නුවරට පැමිණියේ ය.

විස්තර: පල නෙලිනා: ප්‍රලය වායුව. කල්පාන්තයෙහි ලෝක විනාශය සඳහා හමන වායුව.

202 සි ටි ය ස ඳ තම එමුත් ඇඳ සුර පුරට වැද සත් දින ගත ද
කු ම රු ස ඳ ගෙණැ ආ මිහිඳු හිස දකින ලෙඳ මවු බිසෝ ස ද
ස ම ග එ ද නැගණි ද නො රඳ ගොස් එම මිහිඳු හිස
වැලඳ බ ද
සි ර ස හ ඳ අත ගසමිනෙ ද හැඬුව සි එ ළඳ කියමින් මෙලෙ ද

අන්වය: ( සිටිය සඳ ) තම එ මුත් සඳ සුර පුරට වැද සත් දින ගත ද කුමරු සඳ ගෙන ආ මිහිඳු හිස ද කින ලෙඳ, මවු බිසෝ සඳ එ ද නැගණි ද සමග නො රඳ ගොස්, එම මිහිඳු හිස බඳ වැළඳ, සිරස හඳ අත ගසමින් එ ද එ ළඳ මෙ ලෙද කියමින් හැඬුව සි.

අර්ථය: ( කුමරා එ සේ පැමිණ සිටිය කල, ) තම මුත්තණු රජ තුමා පර ලොව ගොස් සත් දිනක් ගත වූ විට, කුමරුවන් ගෙන ආ සිංහ හිස දැකීම සඳහා මවු බිසව එ දා කුමරුගේ නැඟණිය ද සමග, නො නැවතී ගොස්, සිංහ හිස බදා වැළඳ ගෙන තම හිසෙහි හා පපුවෙහි අත් ගසමින් මෙ සේ කියමින් හඬන්නට වූ වා ය.

203 පෙ ර දි යෝ මට ලොබයෙනේ පිට තබමිනේ ගෙණ
ගොස් ව නේ
ග ල් ලෙ නේ මා ලා ගණේ රන් රස මෙනේ පළ
කාරු සෙ නේ
තැ න තැ නේ 'විදූ මහ වනේ පල රස අනේ ගෙණ දීග නේ
වෙ න වෙ නේ සළු' බරණිනේ තුනු සරසනේ ම ය
දීන දී නේ

අන්වයි: සු ගම සි.

අර්ථය: පෙර දවසෙක මා කෙරෙහි ඇලුම් ඇති ව, පිටෙහි තබා ගෙන මා ගෙන ගොස් වනයෙහි ගල් ලෙනක් තුළ රඳවා, රත්රන් හා රස දිය මෙන් ආදරය දක්වා, වනයෙහි තැන තැන ඇවිද රස පල ගෙන දී වෙන වෙන සළු හා අබරණ දිනෙන් දින ගෙන දී මා සැරසුවෙහි ය.

විස්තර: තුනු. සිරුර

204 පෙ ර ක ලා දරු ගැප් වෙළා දෙළු දුක් වෙලා මා සිටි ක ලා
උ ද ක ලා වම් හැම දෙළා එම පසිඳලා දුක් දුරු ක ලා
මූ හු ක ලා සිත් පසු එලා ගැබ වැදු කාලා දරු මත ක ලා
තොම හෙළා බිම දෙනොතලා ගණ සිඹ දුලා වත පෙමක ලා

අන්වය: පෙර කලා දරු ගැබ් වෙලා දෙළු දුක් වෙලා මා සිටි කලා උදකලා ව ම, එම හැම දෙළා පසිඳ ලා දුක් දුරු කළා. එ ලා ගැබ මූහු කලාසිත් පසු මත කලා දරු වැදු කලා, බිම තොම හෙළා දෙනොත ලා ගත දුලා වත සිඹ පෙම කළා.

අර්ථය: පෙර මා දරු ගැබ් ව දෙළු දුකින් පසුවෙද්දී, තනි ව ම ඒ සියලු දෙළ පසිඳවා දුක් දුරු කරන ලදී. එ ලපටි දරු ගැබ මෝරා, සිත් කළු දරුවන් වැදූ විට ඔවුන් බිම නො තබා දෑතට ගෙන පැහැපත් මුහුණු සිඹ ආදරය කරන ලදී.

විස්තර: දරු ගැප් වෙලා. දරු ගැබ් වෙලා යනු අදහස යි.

205 එ ම වැ ඳූ පුතු සමග දූ යන එ පසිදු දරු අප බ ඳූ
මෙ හ රි ඳූ දූන කර මුදු සිත දිවි බඳු සෙනෙහස රැ ඳූ
අ ම බ ඳූ හැම රස යෙදූ අර දී එ දූ දරු රැක සැ ඳූ
හි මි ස ඳූ ඇති ගුණ කඳු ඔබ පිරිසිඳු සම විය ඉ ඳූ

අන්වය: එම වැඳූ පුතු සමග දූ යන එ පසිදු අප බඳු දරු, මෙ හරිඳු දූනැ සිත මුදු කර දිවි බඳු සෙනෙහස රැඳු, අම බඳු හැම රස යෙදූ අහර දී එ දූ දරු රැකැ සැඳූ, පිරිසිඳු ගුණ කඳු ඇති හිමි සඳු ඔබ ඉඳු සම විය.

අර්ථය: අප වැදූ අප වැනි ඒ ප්‍රසිද්ධ පුතා හා දියණිය දුටු මේ සිංහයා සිත මෙළෙක් කර ගෙන සිය පණ මෙන් ඔවුන් කෙරෙහි ඇල්ම කළේ ය. අමෘතය (දිව බොජුන්) හා සමාන රසවත් ආකාර ගෙනදී ඒ දූ දරුවන් රැක ගත්තේ ය. පිරිසිදු ගුණ සමුදායෙන් හෙබි හිමියෙනි, ඔබ චන්ද්‍රයා හා සම වීය.

විස්තර: හරිඳු: හරි + ඉඳු, සිංහ රජයා. හරි යනු සිංහයාට නමකි. ඉඳු: චන්ද්‍රයා ඉඳු හෙවත් ඉන්ද්‍ර යනුවෙන් හැඳින්වේ.

'වතිති සරි ඉන් ඳූ
රුසිරෙන් දල නිඳුන්දු' යන තැන ද නිදසුනි.

206 ව ය සි නා සොළසක් විනා තුරු මෙ දෙදෙනා දරු සමගි නා
අප ගැ ණා මහ දුක් ගෙනා රැකි නිතියෙනා සිය නෙත මෙ නා
ඔ බ ගු ණා එම නොම දනා සැර පහරිනා විදූ මරමි නා
මෙම වි නා සය කරමිනා හළෙ පුතු විනා කවුරුද වෙ නා

අන්වය: වයසිනා සොළසක් විනා තුරු මේ දරු දෙ දෙනා සමගිනා, අප ගැනා මහ දුක් ගෙනා සිය නෙත මෙනා නිතියෙනා රැකී ඔබ එම ගුණා නොම දනා සැර පහරිනා විදූ මරමිනා මෙම විනාසය කරමිනා හළෙ පුතු විනා වෙනා කවුරු ද?

අර්ථය: දහසය අවුරුද්දක් වන තෙක් මේ දරු දෙ දෙනා හා අප ගැන මහත් දුක් විඳ තම ඇස මෙන් හැම විට අප රැක්කෙහි ය. ඔබගේ එම ගුණ නො දැන ඊ තල පහරින් විද මරා මේ විනාසය කරන ලද්දේ පුත් කුමරුවා හැර වෙනෙකකු විසින් නො වේ.

207 හි මි ස ඳ පල වැල සඳ'පට වන මැඳ ගිය කල සෙ ඳ
ලෙ න හි ඳ සැහවී එඳ අපි නොම රඳා මෙහි ආ ස ඳ
න ද ලෙ ඳ සිත දුක් වැඳ ගිරි ලෙණ රඳාලා නොම හි ඳ
ර ට මැ ඳ විත් මෙම ලෙඳ දුක් විඳ වදළේ අප ස ඳ

**අන්වය:** හිමි සඳු අපව පල වැල සඳු වන මැදු සෙදු ගිය කල, ලෙන හිඳු එදු අප සැඟ වී නොම රඳු මෙහි ආ සඳු සිත තද ලෙදු දුක් වැදු ගිරි ලෙන නො ම රඳු ලා හිඳ රට මැදු වින් මෙම ලෙද දුක් විඳෑ වදලේ අප සඳු.

**අර්ථය:** හිමියන් අපට පලතුරු සොයා ඒම සඳහා වනා වනය තුළට ගිය අතර ලෙනෙහි හුන් අප සැඟවී එහි නො රඳු මෙහි ආ හෙයින්, සිතෙහි මහත් දුක් ඇති ව, ගල් ලෙනෙහි නො සිට රට තුළට පැමිණ මෙ සේ දුක් විත්දේ අප නිසා ය.

**විස්තර;** පල වැල සඳා–පල වැල සඳහා.
අප සඳා–අප නිසා.

208 පලතුරු වල සොඳු, දිනු බෝ නුග ස ඳු
එම තුරු වල සෙඳු, නැසුමට ගිය ලෙ ඳු
මෙ හිමි හටම ඳු, ම පුත් කුමරු වි ඳු
මැරුවෙය පිය රඳු, ඉන් මට දුක් ත ඳු

**අන්වය:** සොඳු පල තුරු වල දිනු බෝ නුග සඳු එම තුරු වල සෙඳු නැසුමට ගිය ලෙඳු, මෙ හිමි හටම ඳු ම පුත් කුමරු පිය රඳු විඳු මැරුවෙ ය. ඉන් මට තඳු දුක් (වේ).

**අර්ථය;** සොඳ ගෙඩි ඇති ගස් වල සැදුණු බෝ හා නුග පැල හැම කල්හිම ඒ ගස් ඉක්මනින් විනාශ කරන්නාක් මෙන්, මගේ සැමියාට ම ජාතක ව උපන් පුත් කුමරුවා: ඔහු විද මැරුවේය. එ හෙයින් මට බොහෝ දුක් ඇති වේ.

**විස්තර:** පල තුරු: පල ඇති ගස්. එ වැනි ගස් වල සැදෙන බෝ නුග ආදිය නිසා ඒවා විනාශ වේ.

209 ත න තු රු සි රි ප තා, ඝොසින් තිරිඳු වෙ තා
ම ර ණෙ මි ප ව ස තා, කියමින් නො නව තා
ම බස නො ගෙණෑ සිතා, විඳු මැරි සිය පි තා
අ නේ ම ගේ පුතා, කල පව තද ඉ තා

**අන්වය:** තනතුරු සිරි පතා තිරිඳු වෙතා ඝොසින් මරණෙමි පවසතා නො නවතා කියමින් ම බස සිතා නො ගෙනෑ, සිය පිතා විඳු මැරී. අනේ මගේ පුතා කල පව ඉතා තද.

**අර්ථය:** ඨානාන්තර හා සම්පත් ආසාවෙන් රජු වෙත ගොස් සිංහයා මරන්නෙමැයි පවසද්දී නො නැවතී කී මගේ වචනය සිතට නො ගෙන, තම පියා විද මරන ලදී. අනේ! මගේ පුත්‍රයා කරන ලද්දේ ඉතා තද පවකි.

විස්තර: හො නවතා. නො නැවතී. කීප වරක් ම. බිසව ද වරක් ම පුත්‍රයා වැලැක්වූවා ය.

210 මේ ලොවැ සැපත තිරු, නැති වග මමිඳු රු
මපුතුට කීවරු, ගොසින් මටත් සො රු
සියපිය විදූමරු, කළ පව ගොර ත රු
දුක් විඳැ සිව්තිරු, ගෙවනෙ ද කොෑසි ව රු

අන්වය· මෙ ලොව සැපත තිරා නැති වග ඹම ඉඳුරා ම පුතුට කී වරු මටත් සොරු ගොසින් සිය පිය විදූ මරු කළ ගොරතරු පව සිව් තිරු දුක් විඳැ කොසි වරු ගෙවනෙ ද?

අර්ථය: මේ ලෝකයෙහි සම්පත් සපිර නැති බව මා සම්පූර්ණයෙන් ම මගේ පුත්‍රයාට කී විට මට ද නො දන්වා ගොස් තම පියා මරා කරන ලද මේ බිහිසුණු පාපය සතර අපා දුක් විඳීමෙන් කවර කලෙක ගෙවන්නේ ද ?.

විස්තර: මම කී වරු යනු වියරණ දෙසකි. මා කී වරා යි ශුඩ විය යුතු.

211 තල වනැ දිනු තලා, දවයි එ හැම ත ලා
එම ලෙස නොවැ මූලා, තුඹට ම දා වෙ ලා
ම කුසින් බිහි වෙලා, වැඩි විය පැමිණි ලා
සිටි මෙ කුමරු දූලා, තුඹ නැසි රුදූ වෙ ලා

අන්වය· තල වනැ දිනු තලා එ හැම තලා දවයි. එම ලෙස මූලා නො ව තුඹට ම දා වෙලා ම කුසින් බිහි වෙලා, වැඩි විය පැමිණිලා සිටි දූලා මෙ කුමරු රුදූ වෙලා තුඹ නැසි.

අර්ථය: බට වනයෙහි හටගත් සුළඟ ඒ හැම බට ගස් පුළුස්සයි. එසේ ම මූලා නො වී, තුඹටම ජාතක ව මගේ කුසින් ඉපදී වැඩි වියට පැමිණ සිටි මේ ශෝභන කුමාරයා රෞද්‍ර වී තුඹ නසා දැම්මේ ය.

විස්තර: රුදුවෙලා. රෞද්‍ර වී යන අදහස දීමට යෙදූ සදොස් වචනයකි. මේය රුදුරු වෙලා යනුවෙන් ශුඩ වුවහොත් ය නියම අර්ථය ලැබෙන්නේ.

212 තුඹ තිරිසන් නිසා, කිසිවක් නො විම සා
නොම සිඳැ ලෙණ කුසා, ඇවිදින් අප ති සා
හිමි මල බව අසා, යලි දූකැ සිය ඉ සා
මට වන් දුක් රුසා, කියනෙම් කොයි ලෙ සා

අන්වය: තිරිසන් නිසා කිසිවක් නො විමසා, ලෙන කුසා නොම හිඳ, අප නිසා ඇවිදින් හිමි නුඹ මල බව අසා, යළි සිය ඉසා දූකැ මට වන් දුක් රැසා කොයි ලෙසා කියනෙමි.

අර්ථය: තිරිසන් සතකු වූ හෙයින් කිසිවක් නො බලා, ගල් ලෙන තුළ නො ඉඳ අප නිසා ඇවිත් නුඹ මල බව අසන්නට වී, නැවතත් නුඹගේ හිස ද දූත මට හටගත් දුක කෙ ලෙස කිව හැකි ද ?

විස්තර: සිය ඉසා. සවකිය හිස. තමාගේ හිස. මෙහි සිය යනු යෙදී ඇත්තේ ස දොස් ව ය නුඹ ඉසා යි වී නම් මෙය මීට වඩා යෝග්‍ය ය.

213 මේ ලෙස ඒ රදඟ  න
සමඟ දූ දරු තුන් දෙ  න
සි රද ගුණ කියමි  න
හඬා වැලපී නිසෝ වූ තැ  න

අන්වය: මෙ ලෙස එ රද අඟන, දූ දරු සමග තුන් දෙන සි රද ගුණ කියමින හඬා වැලපී නිසෝ වූ තැන.

අර්ථය: මෙ සේ ඒ රාජ කුමාරිකාව හා ඇගේ දරු දෙ දෙන යන තුන් දෙන සිංහයාගේ ගුණ කියමින් හඬා වැලපී ඔවුන්ගේ ශෝකය තුනී වූ විට.

විස්තර: නිසෝ. නිස්සෝකී යන්නෙන් බිඳිණි.

214 සියලු ම එ වඟු ර  ට
වසන දන ගණ සෙට දෙ  ට
සිහබා කුමරිඳු  ට
අනන තුති කොට තුටු වැ එම වි  ට

අන්වය: එම විට එ වඟු රට වසන සියලු ම සෙට දෙට දන ගණ සිහබා කුමරිඳුට තුටු වැ අනන තුති කොට.

අර්ථය: එ විට ඒ වඟු රටෙහි වාසය කරන සියලු ම උසස්, ජ්‍යෙෂ්ඨ ජන සමූහයා සිංහ බාහු කුමාරයා කෙරෙහි සතුටු වී ඔහුට බොහෝ සේ සතුති කර.

215 ඇමති වරු හැම දෙ  න
අව මඟුල් වෙස් ගනිමි  න
අපමණ පෙරහැරි  න
මිහිඳු හිස සෙණ දවා හරිමි  න

**අන්වය:** සු ගම යි.

**අර්ථය:** අමාත්‍ය වරු සියලු දෙනා ම අව මංගලයට තිසි ඇඳුම් හැඳ, මහත් පෙරහරින් ගොස් සිංහ හිස ආදාහන කළහ.

**විස්තර:** මිය ගිය බලවතුනට සැලකිලි දැක්වීමේ සිරිත මේ කාලයෙන් අනාවරණය වේ.

216 නු ව රු හැම දෙන එක්ව සොයමින් පවර මැතිගණ සමගි නා
සොඳුරු එපුරට නුදුරු මහ හිම වනක් දැක එහි සපැමි නා
එ තු රු ලිය මුල් ගල් උගුළුවා එබිම සම කරු සදමි නා
ඇ දු රු වරු වඩු සතර තෙරපත් කැඳවමින් රුස් කරමි නා

**අන්වය:** නුවරු හැම දෙන එක්ව පවර මැති ගණ සමගිනා සොයමින්, සොඳුරු එ පුරට නුදුරු මහ හිම වනක් දැකැ එහි සපැමිණා. එ තුරු ලිය මුල් ගල් උගුළුවා, එ බිම සම කරු සදමිනා, වඩු සතර තෙර පත් ඇදුර වරු කැඳවමින් රුස් කරමිනා.

**අර්ථය:** නගර වැසියන් සියලු දෙන එක් වී උසස් මන්ත්‍රී සමූහයා සමග තැනක් සොයන්නට වී, සුන්දර වූ ඒ නගරය අසල මහා වන ගහනයක් දැක, එහි ගොස් ගස් වැල් හා ගල් මුල් උදුරා දමා බිම සම කර, වඩු ශිල්පයෙහි කෙළ පැමිණි ආචාර්ය වරුන් කැඳවා, ඔවුන් රුස් කර.

**විස්තර:** එ තුරු ලිය, එ බිම ආදි තැන් වල එ යනු මාත්‍රා පිරවීම සඳහා ගසන ලද සක්ක බව පෙනේ.

217 ඉ දු රු පුරවර අයුරු මාහැඟි උතුම් නුවරක් කරමි නා
සො ඳුරු එ පුරට පවර සිහබා පුරය යන නම තබමි නා
අ බි රු සිහබා කුමරු හට එ ම නුවර රජ සිරි දෙවමි නා
ම හ රු සිහවල්ලිය කුමරි අග බිසෝ කර තැබූ එම දි නා

**අන්වය:** සු ගම යි.

**අර්ථය:** ශක්‍රයාගේ පුරය වැනි අනර්ඝ උතුම් නගරයක් සදවා, ඊට සිංහ බාහු පුරය යි නම් තබා, අභීත සිංහබාහු කුමාරයාට එහි රාජ්‍ය ශ්‍රිය පවරා, උසස් සිංහ වල්ලි කුමාරිකාව අග බිසෝ තනතුරෙහි තැබූ එ දිනෙහි.

**විස්තර:** අබිරු: භීරු යනු 'බිය සුළු' වේ. අ බිරු යනු බිය සුළු නො වන යන අරුත් දෙයි.

මහරු: මහාර්ඝ, මහාර්ඝ යන සකු වදන් වලින් බිඳිණි.

**අර්ථය:** මෙම ලක් දිව නමැති අහසෙහි වූ මිථ්‍යා දෘෂ්ටි නමැති අන්ධකාරය දුරු කර, බුද්ධ ශාසනය නමැති සූර්‍ය්‍යයා උදා කර වී ය. ඉන් පසු ලක් දිවෙහි පිළිවෙලින් රජ පැමිණි නැණ වත් රජවරු තම පණ මෙන් මහත් භක්තියෙන් බුදු සසුන රැක එය වැඩි දියුණු කර ගෙන.

**විස්තර:** දිටු: දෘෂ්ටීන්. ආගම්. මිත් අදහස් කෙරෙන්නේ මිථ්‍යා දෘෂ්ටි ය. බුදු සසුන මෙහි ඒ මට පෙර, මෙ රට වූයේ නොයෙකුත් ක්‍රමයේ මිථ්‍යා ඇදහිලි ය.

222 මෙ ල ක ට රජ පැමිණි නිරිඳු පවා හැ ම
මෙ ලෙ ස ට අනන පින් කරමින් පමා නො ම
ති ලො ව ට උතුම් සැප ලත්හු ය නිමාව ම
ක දි ම ට පින් කරව් සුදනනි අසා මෙ ම

**අන්වය:** මෙ ලකට රජ පැමිණි හැම නිරිඳෝ පවා, පමා නොම මෙ ලෙසට අනන පින් කරමින්, නිමාව ම ති ලොවට උතුම් සැප ලත්හු ය. සු දනනි, මෙම අසා කදිමට පින් කරව්.

**අර්ථය:** මේ ලංකාවෙහි රජ බවට පත් සියලු ම රජ වරු පවා ප්‍රමාද නො ව මෙ සේ බොහෝ පින් කරමින් තුන් ලොවෙහි උතුම් සැප සම්පූර්ණයෙන් ම ලැබුවෝ ය. යහපත් ජනයිනි, මෙය අසා හොඳින් පින් කරව්.

**විස්තර:** ති ලොවට උතුම් සැප: දෙව් මිනිස් සැප කෙළවර ලැබෙන නිවන් සැප.

පමා නො ම, මෙම අසා, ආදිය දුබල යෙදුම් ය.

223 ප ව ර රජ සිහ නිරිඳු සිරි පද කමල සෙව් මැති
තුරෙන් සසොබ න
නො හැ ර පැවතා දිසාපති පිළිවෙළින් නෙක සව්
ඉසුරු ලබමි න
ස ත ර වන යුද මැද කෝරළේ දිසාපතිඳුට මුනුපුරා ව න
තු ස ර හර ගිර තුසර කර හර සදිසි යසසින්
බැබලූ නොපම න

**අන්වය:** පවර රජසිහ නිරිඳු සිරි පද කමල සෙව් ස සොබන මැති අතුරෙන් නෙක සව් ඉසුරු ලබමින නො හැර පැවත ආ දිසා පති පිළිවෙලින් සතර වන යුද මැද කෝරළේ දිසා පතිඳුට මුණුබුරා වන, තුසර, හරගිර, තුසරකර, හර සදිසි යසසින් නොපමණ බැබළු.

අර්ථය: උතුම් රාජ සිංහ රජුගේ ශ්‍රී පාද පද්මය ඇසුරු කළා වූ ශ්‍රේෂ්ඨ මන්ත්‍රීන් අතරින්, නොයෙකුත් සැප සම්පත් ලබා, නො කඩව දිසාපති පිළිවෙළින් පැවත ආවා වූ ද, මැද යුද කෙරුණු සතර කෝරලේ දිසා පතිගේ මුණුබුරා වූ ද, හිම, කෛලාස කූටය, චන්ද්‍රයා හා මුතු පට මෙන් කීර්තිය නිසා බොහෝ සේ බැබළුණු.

විස්තර; රජ සිහ නිරිඳු: මෙහි කියැවෙන්නේ සිය පිය මාසාදුන්නේ රජු මරා සීතාවක රජ බවට පැමිණ, බුදු සසුන අත හැර සිව් ආගම වැළඳ, බුදු සසුනත් සිඟල පොත පතුත් විනාශ කළ පළමු වැනි රාජ සිංහ රජු විය හැකි ය. ඔහු මහා රණ ශූරයකු වූ හෙයින් ඔහුගේ නම මෙ සේ සඳහන් කළා යි සිතිය හැකි වුව ද, බුදු සසුනට හානියක් නො කළ, රටට වැඩ වැඩූ දෙ වෙනි රාජසිංහ රජු ද මින් අදහස් විය හැකි ය.

සතර වන යුද මැද කෝරලේ: මේ කෑගලු දිස්ත්‍රික්කයේ සතර කෝරලයයි. යුද මැද යන විශේෂණයක් ද යෙදී ඇත්තේ මෙහි කෙරුණු යුධ ගැන සැලකීමෙන් විය යුතු ය.

224 ක ල ණ සිරි දූරු කොළඹ වාසල දෙවෙනි මහ
මුදලිඳුගෙ තන්ද න
නො මි න පර දෙස වදන් සමගින් සතර තොරතුර
සිත සෙ දූත ගෙ ණ
පැ මි ණ මාතර පුරට කොන්සේජුවේ තුප්පහි තම
ලබාගෙ ණ
ව ස න හෙන්ද්‍රික් සරම් මූකවෙට් මුදලි සඳු කල
යදුම පිළි ගෙ ණ

අන්වය: කලණ සිරි දූරු කොළඹ දෙ වෙනි වාසල මහ මුදලිඳුගෙ තන්දන නොමිණ පර දෙස වදන් සමගින් සිත සෙ සතර තොරතුරු දූත ගෙන මාතර පුරට පැමිණ කොන්සේජුවේ තුප්පහි තම ලබා ගණ වසන හෙන්ද්‍රික් සමර මූකවෙට් මුදලි සඳු කල අයදුම පිළිගෙන.

අර්ථය: යහපත් ලක්ෂණ දරුවා වූද, කොළඹ දෙ වෙනි වාසල මුදලිඳුගෙ පුත්‍රයා වූ ද, පර භාෂාවන්හි බොහෝ වචනත්, ශාස්ත්‍රයනුත් හොඳින් දැනගෙන මාතරට පැමිණ කොන්සේජුවේ

තුප්පහි තනතුර දරමින් සිටින හෙන්ද්‍රික් සමර මූකවෙට්ටි මුදලි තුමන් කරන ලද ආරාධනය පිළිගෙන.

විස්තර: කොන්ජේජුවේ තුප්පහි නම; මේ පෘතුග්‍රීසින් යටතෙහි වූ තනතුරකි.. එම් වචන දෙක ම පෘතුග්‍රීසි ය.

මුහන්දිරම්: කෝට්ටේ රාජ්‍ය කාලයේදී සිට මේ රට මූකවෙට්ටි වරු සිටියහ.

හංසසන්දේශයෙහිද

සිරිති පසෙක වාසල මූකවෙට්ටි වරුන්
යනුවෙන් මේ ගැන සඳහන් වේ.

සිතාවක සම්ගේ අලගියවන්නයෝ ද මූකවෙට්ටි කෙනෙක් වූහ. ඔහු තෝම්බු ලියූ බව ද කියනු ලැබේ. කෙ සේ වෙතත් මේ මූකවෙට්ටි වරු අධිකරණ නිලධාරීන් කොටසක් බව සැලකිය හැකි ය.

225 ස ක ව සි න් එක් දහස් සත් සිය දෙ සාළිසකට
පැමිණි මෙව සේ
රි ක හ යෙ න් යුත් බක් මසෙහි පුර පැලවිය ලත්
සිකුරු දව සේ
නෙ ක සි රි න් සැදි ගොඩපිටිය මහ වෙහෙර නිරතුරු
වසන සුව සේ
සි ක පෙ මි න් රැකි කිරම දම්නඳ යති මෙ කවි කරු
නිමවි සිත සේ

අන්වය: සක වසින් එක් දහස් සත් සිය දෙ සාළිසකට පැමිණි මෙ වසේ, රික හයෙන් යුත් බක් මසෙහි පුර පැලවිය ලත් සිකුරු දවසේ, නෙක සිරින් සැදි ගොඩපිටියෙ මහ වෙහෙර නිරතුරු සුව සේ වසන, පෙමින් සික රැකි කිරම දම්නඳ යති සිත සේ මෙ කවි කරු නිමවි.

අර්ථය: ශක වර්ෂයෙන් එක් දහස් සත් සිය හතළිස් දෙකක් වූ මේ අවුරුද්දේ සා නැකතින් යුත් බක් මස පුර පැලවියෙහි සිකුරාද දිනයෙහි නොයෙක් ඓශ්වර්යයෙන් යුතු ගොඩපිටිය මහා විහාරයෙහි නිතර සැපතින් වෙසෙමින් භක්තියෙන් සිල් රකින කිරම ධම්මානන්ද හිමියන් විසින් සිත් පරිදි මේ කාව්‍යය ලියා නිම කරන ලදී.

විස්තර: පිසා හය. පිහයන්නෙන් නැකත යනුත් හය යන්නෙන් සා යනුත් අදහස් වේ. මෙ සා නැකත සි.
සිසා. සික්ඛා. සිල්.

226 ස සි ය විජයබා නරනිඳුහුගෙ පුව ත
මෙ සි ය බසින් කවි කල නෙක විරිත යු ත
දෙ සි ය සවිස්සක් කවියෙන් නිමි මෙ පො ත
ඇ සි ය යුතු ය සුදනන් තුටු කර තෙ සි ත

අන්වය: ස සිය විජය බා නරනිඳුහුගෙ පුවත මෙ සිය බසින් නෙක විරිත යුත කවි කල. දෙ සිය ස විස්සක් කවියෙන් නිමි මෙ පොත සු දනන් තෙ සිත තුටු කර ඇසිය යුතු ය.

අර්ථය: විජය රජ තුමාගේත්, ඔහුගේ නෑ දූසිත්ගේත් කථා විස්තරය සිංහල භාෂාවෙන් මම සේ නොයෙකුත් වෘතයනට අනුව කවි කරන ලදී. කවි දෙ සිය විසි හයකින් යුතු මේ පොත සු දනන් තුන් සිත සතුටු කරමින් ඇසීම වටී.

විස්තර: ස සිය: සවකීයයන් සහ. නෑදෑ පරපුර සමග. මේ පොතෙහි විස්තර ව ඇත්තේ විජය රජුගේ මව් පියන් ඇතුළු පර පුරෙහි කථා විස්තරය සි.

දෙ සිය සවිස්සක් කවි: කවි දෙසිය විසි හයක් වනුයේ මේ කවියත් සමගිනි.

තෙ සිත: යමක් කිරීමට පෙර හා පසු ව ඇති වන සිත් ද, එය කිරීමේ දී ඇති වන සිත ද තුන් සිත යනුවෙන් ගණින් ගැණේ.

227 මි ත් වෙ ත් වා සියලු සත් ඔවුනොවුන් හ ට
සි ත් වේ ත් වා පින් කරමින් හැසුරුම ට
සෙ ත් වෙ ත් වා මෙ ලොවැ සව් ලෙව් සතුන් හ ට
අ ත් වෙ ත් වා මතු මොක් පුර අප හැම ට

අන්වය: සියලු සත් ඔවුනොවුන් හට මිත් වෙත්වා. පින් කරමින් හැසුරුමට සිත් වෙත් වා. මෙ ලොවැ සව් ලෙව් සතුන් හට සෙත් වෙත්වා. අප හැමට මතු මොක් පුර අත් වෙත් වා.

අර්ථය: සියලු සත්වයෝ ඔවුනොවුන් කෙරෙහි මිත්‍ර වෙත්වා ! පින් දහම් හි යෙදී ජීවත් වීමට සිත් පහල වේවා ! මේ ලෝකයේ සියලු සත්වයන් හට ශාන්තියක් වේවා! අප සියලු දෙනාටත් අනාගතයේදී මෝක්ෂය හෙවත් නිර්වාණය, අයිති වේවා!

තුප්පහි තනතුර දරමින් සිටින හෙන්ද්‍රික් සමර මූකවෙට්ටි මුදලි තුමන් කරන ලද ආරාධනය පිළිගෙන.

විස්තර: කොන්ජේජුවේ තුප්පහි සාම; මේ පෘතුග්‍රිසින් යටතෙහි වූ තනතුරකි.. මේ වචන දෙක ම පෘතුග්‍රිසි ය.

මුකවෙට්ටි: කෝට්ටේ රාජ්‍ය කාලයේදී සිට මේ රට මූකවෙට්ටි වරු සිටියහ.

හංසසන්දේශයෙහිද

සිරිති පසෙක වාසල මුකවෙට්ටි වරුන් යතුවෙන් මේ ගැන සඳහන් වේ.

සිතාවක සමයේ අලගියවන්නයෝ ද මූකවෙට්ටි කෙනෙක් වූහ. ඔහු තෝම්බු ලියූ බව ද කියනු ලැබේ. කෙ සේ වෙතත් මේ මූකවෙට්ටි වරු අධිකරණ නිලධාරීන් කොටසක් බව සැලකිය හැකි ය.

225 ස ක ව සි න් එක් දහස් සත් සිය දෙ සාළිසකට
පැමිණි මෙව සේ
රි ක හ යෙ න් යුත් බක් මසෙහි පුර පැලවිය ලත්
සිකුරු දව සේ
නෙ ක සි රි න් සැදි ගොඩපිටිය මහ වෙහෙර නිරතුරු
වසන සුව සේ
සි ත පෙ මි න් රැකි කිරම දම්නඳ යති මෙ කව් කරු
නිමවි සිත සේ

අන්වය: සක වසින් එක් දහස් සත් සිය දෙ සාළිසකට පැමිණි මෙ වසේ, රික හයෙන් යුත් බක් මසෙහි පුර පැලවිය ලත් සිකුරු දවසේ, නෙක සිරින් සැදි ගොඩපිටියෙ මහ වෙහෙර නිරතුරු සුව සේ වසන, පෙමින් සිත රැකි කිරම දම්නඳ යති සිත සේ මෙ කව් කරු නිමවි.

අර්ථය: ශක වර්ෂයෙන් එක් දහස් සත් සිය හතළිස් දෙකක් වූ මේ අවුරුද්දේ සා නැකතින් යුත් බක් මස පුර පැලවියෙහි සිකුරුද දිනයෙහි නොයෙක් ඓශ්වර්යයෙන් යුතු ගොඩපිටිය මහා විහාරයෙහි නිතර සැපතින් වෙසෙමින් භක්තියෙන් සිල් රකින කිරම ධම්මානන්ද හිමියන් විසින් සිත් පරිදි මෙ කාව්‍යය ලියා නිම කරන ලදී.

විස්තර: සිඝා හය, සිකයන්නෙන් නැකත යතුත් හය යන්නෙන් සා යතුත් අදහස් වේ. මේ සා නැකත යි.
සිඝා. සිකඛා. සිල්.

226 ස සි ය විජයබා නරනිඳුහුගෙ පුව ත
මෙ සි ය බසින් කවි කල නෙක විරිත යු ත
දෙ සි ය සවිස්සක් කවියෙන් නිමි මෙ පො ත
ඇ සි ය යුතු ය සුදනන් තුටු කර තෙ සි ත

අන්වය: ස සිය විජය බා නරනිඳුහුගෙ පුවත මෙ සිය බසින් නෙක විරිත යුත කවි කල. දෙ සිය ස විස්සක් කවියෙන් නිමි මෙ පොත සු දනන් තෙ සිත තුටු කර ඇසිය යුතු ය.

අර්ථය: විජය රජ තුමාගේත්, ඔහුගේ නෑ දූසින්ගේත් කථා විස්තරය සිංහල භාෂාවෙන් මම සේ නොයෙකුත් වෘතයනට අනුව කවි කරන ලදී. කවි දෙ සිය විසි හයකින් යුතු මේ පොත සු දනන් තුන් සිත සතුටු කරමින් ඇසිම වටී.

විස්තර: ස සිය: සවකියයන් සහ. නෑදූ පරපුර සමග. මේ පොතෙහි විස්තර ව ඇත්තේ විජය රජුගේ මව් පියන් ඇතුළු පර පුරෙහි කථා විස්තරය යි.

දෙ සිය සවිස්සක් කවි: කවි දෙසිය විසි හයක් වනුයේ මේ කවියත් සමගිනි.

තෙ සිත: යමක් කිරීමට පෙර හා පසු ව ඇති වන සිත් ද, එය කිරීමේ දී ඇති වන සිත ද තුන් සිත යනුවෙන් ගණන් ගැණේ.

227 මි ත් වෙ ත් වා සියලු සත් ඔවුනොවුන් හ ට
සි ත් වේ ත් වා පින් කරමින් හැසුරුම ට
සෙ ත් වෙ ත් වා මෙ ලොවැ සව් ලෙව් සතුන් හ ට
අ ත් වෙ ත් වා මතු මොක් පුර අප හැම ට

අන්වය: සියලු සත් ඔවුනොවුන් හට මිත් වෙත්වා. පිංග් කරමින් හැසුරුමට සිත් වෙත් වා. මෙ ලොවැ සව් ලෙව් සතුන් හට සෙත් වෙත්වා. අප හැමට මතු මොක් පුර අත් වෙත් වා.

අර්ථය: සියලු සත්වයෝ ඔවුනොවුන් කෙරෙහි මිත්‍ර වෙත්වා ! පින් දහම් හි යෙදී ජීවත් වීමට සිත් පහල වේවා ! මේ ලෝකයේ සියලු සත්වයන් හට ශාන්තියක් වේවා ! අප සියලු දෙනාටත් අනාගතයේදී මෝක්ෂය හෙවත් නිර්වාණය, අයිති වේවා !

228 අ ම පි ය බ ස් දුන් තුන් ලොව හිමි සුග ත
ගු ණ නි ය ර ස් පලමු ව පල කල අන ත
මේ ම සි ය බ ස් මල් දම් නමැති කව් පො ත
ලොවැසිය ව ස් පවතිවා තුටු කර තෙ ස ත

අන්වය: අම පිය බස් දුන් තුන් ලොව හිමි සු ගත අනත ගුණ නිය රස් පලමු ව පල කල මෙම සිය බස් මල් දම නමැති කව් පොත තෙසත තුටු කර ලොවැ සිය වස් පවතිවා!

අර්ථය: අමෘතය වැනි ප්‍රියවදන් ප්‍රකාශ කලාවූ, තුන් ලොවට නායක සුගත් හිමියන්ගේ අනන්ත ගුණ නුවණ රැශිය පලමුවෙන් ප්‍රකාශ කලා වූ මේ සිය බස් මල් දම් නමැති කව් පොත බොහෝ දෙනා සතුටු කරවමින් ලෝකයේ සියක් අවුරුද්දක් පවතී වා!

විස්තර: සුගත: හොඳින් ගිය මෙවත් සසරින් ගොඩ වූ තැනැත්තා යන අදහස ඇති ව බුදුන් වහන්සේට යෙදෙන නමකි.

නිමි

# Sinhalese - English Glossary

1 විනෙදන–Amenable Folk
ගණසර–Collections of Lotuses
2 අයදුම–Invitation
වර–Noble
මොක්–Deliverance
3 රන්පා–Golden Bowl
4 නැබ–Navel
සුරගණ–Hosts of Gods
5 තුන්රුවන–The Triple Gem
6 ආසිරි–Blessings
8 පඬෙර–White Lotus
කිරණ–Milky Ocean
නනපස–Lion
9 දිරි බෙලෙන්–By Steadfastness
සරද–Autumnal
හරණ–Surpassing. Rivalling
10 ඉදිපා–Psychic Power
11 අවමඟ–Paths to Purgatories
කමලකර–Lotus Pond
12 දියනද–Joy of the World
14 හයරල–Studs of Horses
නිසල–Firm
රසල–Abodes
15 දවලරැසින්–In White Rays
16 ඉදුවර–Blue Lilies
17 ටැඹ පේසාඬ–Pillar Heads
දූව ගෝනැස–Wooden Rafters
නිලපෙළ–Rows of Houses
18 අටලු–Towers
19 සරම සතර–Military Training
20 සරණ–Moving
දිවිසිළු–Flames
දවල කිරණ–Moon
21 තෙරලු–Coconut Trees
පොසොන–Flowers

22 ගැහැවි–Very Closely
වරණ වරණ–Noble Elephants
23 දිවහසුන්–Divine Horses
24 උරසදලා–Armours
25 සරසත–Bow
27 දියැසකුල–Solar Dynasty
28 සසාසා–Well
රුවනසර–The Sea
29 තොමවිහරා–Completely
30 බදුරු–Good, Holy
31 රදනිය–Royal Policy
තඹර අරණ–Lotus Grove
මහවත්හු–Owls
32 තෙලුඹලින්–With Lotus Roots
සොමි–Pericarp
35 වරහන–Noble Women
36 සැකෙවින්–In Brief
37 අඩදද රද–Crescent Moon
38 පබල–Coral
39 අලගද–Serpent
40 ඔබුලු–Bubles
43 හෙල්මැලි–White Lotus
කල්–Women
45 පැනයෙන්–In Wisdom
48 පුවතර–Illustrious
51 පළිමිණි මදෙස–Crystal Casket
53 ඉට–Lucky
කිරිමවුන්–Wet Nurses
55 උතුරු–Worthy
57 ලතර–In the Heart
කුසල්–Skill, Ability
68 යොවුනග–Prime of Youth
66 වඩුසත–Carpentry
67 වැඩසරු–Auspicious
මොහොතක–Moment
රජබවන–Royal Palace
68 පදනම්–Fortifications
සිරිකත–Goddess of Wealth
71 සනක–Golden

74 කර–Trunk
කත–Attractive
අලි නිකර–Swarm of Bees
වසාරොද–Down of Hair
76 සුරසර–Celestial Nymphs
78 දිවමතුරෙන්–With Divine Spell
දිමුත–Cloud
80 අදගර–Python
අවසා–Necessarily
82 පබා–Rays
83 නිලඹර–Blue Sky
උල්කාපාත–Comets
84 වෙළඳ දෙටු–The Chief Merchant
87 සපදු–Bees
88 මුහුකරලා–Matured
89 පියරු–Sweet Melody
90 සරභ–Deer
සබර ගණ–Hunters
91 සදුලා–Tigers
92 සරසා–Decked With
95 පරළු–Rough
96 ගිරිලෙන–Rock Cave
98 එ අස–Close by
100 දළ–Rough
බදුරු–Delightful
101 විලිරද–Pangs of Childbirth
108 අන්තිම කර–Fully
110 මිගෙක්–A Beast
111 උවමක්–Plan, Contrivance
113 පෙරවරු–Fore Noon
115 වනපෙත–Forest Glade
116 සෙවනෙහි–In the Shade
117 සෙනෙවිරදී–As the General
117 සෙබළ සොනෙක්–A Soldier
118 මඟුලෙන්–In Pomp and Honour
119 පිරියතකර–Ending
120 සිරස–Frontals
123 ළය–Heart
125 කාම සැපත–Sexual Pleasure

127 නොදැනුම් කම-Fault
128 තිර-Firm
130 තුරුපති-Moon
131 හොර හිමියෙක්-Paramour
133 වියොදුක්- Sorrow of Separation
134 ලියලැහැප්-Creepers and Bowers
135 ලෙළදෙන-Waving
සුරතල්-Lovable.
මුවරඳ-Pollen
දල-Leaves
136 නෙත් දලිනා-With Tears
සිත්පිත් නැති-Inanimate
137 සුදු වෙල-White Clouds
සිකිපිල්-Plumages of Peacocks
ගලුලැලි-Rock Streams
138 සතතින්-Always
එකනින්-Certainly
පණනලා-Lifebreadth
සුනිල-Dark Blue
139 රළ-Ripples
141 උරපියපළු-Sandal Wood
මඳ සුළහා-Breezes
142 හිමය-Forest
143 ගම් වැසියෙක්-A Villager
144 සෙනහඬ-Thunder
ලෙහෙනුතුරා-Shedding Blood
145 පටුනු ගම්-Ports
නියම් ගම්-Suburbs
දනව්-Provinces
145 ගැටණු-Agitated
146 සරකාර-Sun
පිවිතුරු-Unsullied
විසිතුරු-Variegated
බුවිසුරු-King
147 වැලපීමෙන්-By Lamenting
148 දෙසක්-Fault
මිගරද-Lion
එකා ලෙද-Completely
149 දෙ ගුරුන්-Parents

මයිලන් - Uncles
මුතුන්-Grand Parents
දද-Brahmins
150 විදසතසාර-Annihilated
151 පිරිසඳ-Full Moon
සොමි-Gentle
වුවන-Face
පියයුරු-Breasts
152 ළදරු-Infant
153 පින්වත්-Exalted
නොවලසිනා-Without Delay
154 ලෙවනට-To the World
ළසොවින-With Grief in Heart
මොනවට-Well
අණ - Order
155 දිනුමට සෙනෙහෙඇති-Eager for Victory
පුවතර-Famous
සිව්රඟ සෙන්-Four Fold Army
විපත්-Calamity
156 සැර-Javeline
සඳසක්-Discuss
නනවි-Various Weapons
අවසර-Leave
157 පසතුරු-Five Fold Music
සිඳුරද-Lordly Ocean
157 පියස-Locality
විදුලි-Lightning
158 රණබෙර-War Drums
ඔල්වරසන්- Applauses
සාරබුරවා-Raising the Neck
159 විකුම්-Valour
එලවාගෙන-Chasing
160 වෙර-Body
වත්-Garments
161 ලේ ගාගත-Smeared with Blood
අපගත-Torn off
162 බරණ-Ornaments
ලජ්ජායෙන-In Shame
163 රුදුරු ලෙසට-Fearfully
ඉලව් වලම්-Funeral Rites

සිරිපද-Exalted Feet
164 මිගසියා-Bragging
අඩියකුත්-A Step
165 සාටු ලැහැප්-Thickets
සිවුරු-Robes
166 පඩි-Wages
සටන-Battle
169 පියල්ලක්-Bundle
වතිසුරු-Riches and Glory
ඉති-Thus
170 විගසින-Soon
171 නොමරුන-Disagreeable
172 නිම්ම නැති-Limitless
රම්ම-Pleasant
173 පෙමයුත්-Beloved
174 තන-Much
174 මෙ වග-This Fact
175 දෙවරක්-Twice
175 සතොස වී-Being Pleased
176 විකුම්සරු-Valorous
සවු ඉසුරු-All Prosperity
නරණ-King
පදසර-Lotus like Feet
177 විෂපෙව්-Poisoned
කරල්-Sharp
හියක්-Arrow
සරොසින-In Anger
178 මෙත්-Compassion
සිඳුරු කර-Piercing
කායබල--Bodily Strength
179 වෙහෙසට පත්-Fatigued
බැතියෙන්-In Faith
දුක්මුසු-Sorrowful
180 පෙම්වත-Lovable
181 පුතනඹුවන්-Wife and Children
ලැදි නො ව-Without Affection
මියුලැසා-Fawn Eyed one
182 ගුණලවයක්-A Fragment of Virtue
ගොරහර-Fearful

පුතාසඳ-Dear son
183 බැහැර-Away
ළමදිය-Chest
අසුහෙළා-Shedding tears
184 සිරදු-Lordly Lion
තරළසොවින්-In Deep Sorrow
185 ගජකුඹු-Frontals of Elephants
බුදිමින්-Enjoying
වලතුලා-In the Forest
උදකලා-Alone
186 පල රසේ-Juice of Fruits
ඇති කළෙ-Brought up
187 වාවිති-Bear up
ලසේ-Gradually
තතු ලෙසේ-As it is
188 ගරහසි-Censures
දිනා-Being Born
සිව් අවයෙහි-Four Purgatories
නිරිඳු බසා-The Words of the King
190 එම සරු-That Utterance
191 මහ වෙනේ-Great Forest
බිය ගෙණේ-Frightened
බැදිවන්-Fled to the Forest
193 රන්රස-Gold And Mercury
රති-Erotic
උමඟනා-Wife of Isvara
සතතිනා Throughout
194 රැතිලෙද-As Desired
ගැබ-Foetus
සිඹිමිනේ-Kissing
සුබ ගණේ-At Auspicious Hour
196 අමයුරැ-Like Ambrosia
දිවයුරැ-Sun
197 සාලාපති-Moon
සිරිසුලා-Bearing the Glamour
තංකලා-Sister
ගුණ'වලා-Virtuous
200 පඬුරැ-Presents, Gifts
දීයැසා-An eye of the World

0001856

295



| | | |
|---|---|---|
| | 202 | සිරස හද-Head and Heart |
| 164 | 204 | පසිඳලා-Satisfied |
| | | මුහුකළා-Grown up |
| 165 | 205 | අමබඳු-Like Nectar |
| | 206 | සොළසක්-Sixteen |
| 166 | | නෙත මෙනා-Like an eye |
| | 208 | තුරු-Trees |
| 169 | 209 | තනතුරු-Office, Rank |
| | 211 | හැම නළා-All Bamboos |
| | 213 | නිසෝ වූ තැන-When Grief Ended |
| 170 | 214 | දනගණ-Hosts of Men |
| 171 | | අනන-Innumerable |
| 172 | 215 | අවමඟුල්-Funeral |
| | 216 | හිමවතක්-A Forest |
| 173 | | ඇඳුරුවරු-Master Carpenters |
| 174 | 217 | ඉඳුරුපුරවර-City of Sakra |
| 174 | | මාහැඟි-Very Valuable |
| 175 | | පවර-Great |
| 175 | | අබිරු-Fearless |
| 176 | 218 | ලෙව් සත-The Subjects |
| | | පුරඳුරු-Sakra |
| | 219 | දෙට කුමර වර-The Eldest Prince |
| | | සතර තුම-The Buddha |
| 177 | | මොක් පුරට-Deliverance |
| | | නැවරු-On Board the Ship |
| | 220 | තෙද-Majesty |
| | | දිනකර-Sun |
| 178 | | හිමකිරණ-Moon |
| | | යසින්-Fame |
| | 221 | පැනසර-Wise |
| | | ඉසුරු-Wealth |
| 179 | | නො විතර-In Abundance |
| | 222 | තිලොවට-To the Three Worlds |
| | 223 | තුසර-Snow |
| 180 | 224 | කලණ-Pleasant |
| 181 | 226 | සසිය-With Kith and Kin |
| | | විරිත-Metres |
| | 227 | සව් ලෙව්-All the Beings |
| 182 | 228 | පියබස්-Pleasant Speech |
| | | සුගත-The Buddha |

# බැහැර දෙන පුස්තකාලය

පොත් බැහැර ගෙන යාමට පෙර ඔබ විසින් තෝරා ගන්නා ලද පොත්වල තත්වය හොඳින් පරීක්ෂා කර බලා ඒවායේ පිටුවල හෝ පින්තූර ආදියෙහි අඩුපාඩුවක් හෝ එසේ නැතිනම් ඒ පොත්වලට වෙනත් අන්දමේ හානියක් සිදුවී ඇතොත් ඒ බැව් පුස්තකාලාධිපති වෙත දැනුම් දිය යුතුය.

පහත දැක්වෙන දින හෝ ඊට පෙර මෙම පොත ආපසු භාරදිය යුතුය.

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |


| වර්ග අංකය | ප්‍රවේ· |
|---|---|
| 891.481 SIY | |

කා°

0001856

891.481
SIY